
The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමින

ශ්‍රී බුධ වර්‍ෂ 2564ක් වූ නවම් පුර දියවක ලත් ශනිදින | කාණ්ඩය 112 | පත්‍රය 51 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 පෙබරවාරි 13 සෙනසුරාදා





# කනක් බිහිරි වන ලෙස පහර කෑ සිසුවාට ලක්ෂ 6 1/2ක වන්දියක්

## ගුරුවරයාගෙන් ලක්ෂ 1 1/2 යි

## රජයෙන් ලක්ෂ 5යි

නෙල්කා මැදගෙදර

මාතර පුහුල්වැල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුවරයකු විසින් 15 හැවිරිදි සිසුවකුට පහර දී ශ්‍රවණ හැකියාව අහිමි කිරීම තුළින් එම සිසුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (12) තීන්දු කළේය.

පිට 06

# චෝදනා ගොනු කරන්න පාස්කු කොමිසමේ වාර්තාවක් දෙන්න



කුමුදු හෙට්ටිආරච්චි

පාස්කු ඉරු දින ප්‍රහාරය හා සම්බන්ධ සැකකරුවන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා පාස්කු කොමිසමේ වාර්තාවක් තමා වෙත ලබා දෙන්නැයි නීතිපතිවරයා ජනාධිපති ලේකම්වරයාගෙන් ඊයේ (12) ඉල්ලීමක් කර තිබේ.

පිට 06

## ප්‍රවීණ රංගධර ජයලාල් රෝහණගේ අවසන් කටයුතු හෙට



ප්‍රවීණ රංගධරයකු වූ ජයලාල් රෝහණ මහතාගේ අවසන් කටයුතු හෙට (14) සවස 4.30ට බොරැල්ල කනත්තේ ආදාහනාගාරයේදී සිදු කෙරේ.

පිට 06

## ‘ආදරේට ජීවයක්’

ඔසු පැළ රෝපණ වැඩසටහන අගමැති ප්‍රධානත්වයෙන් හෙට

පිට 6

## ‘දීඝවාපිය අරුණ’ ඇරඹේ



දීඝවාපි චෛත්‍ය රාජයාණන් වහන්සේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අරමුදල් රැස් කිරීමේ ‘දීඝවාපිය අරුණ’ වැඩසටහන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ 07, ශ්‍රී සම්බෝධි විහාරස්ථානයේදී ඊයේ (12) ආරම්භ කෙරුණු අවස්ථාව.

පිට 6

## දේශපාලන පළි ගැනීම් සහ පාස්කු දින ප්‍රහාරය සෙවූ කොමිෂන් වාර්තාවලට විවාදයක් දෙනවා



## ගම සමඟ පිළිසඳරක් 10 වැනි අදියර අද මීමුරේදී

පිට 6

## මුස්ලිම් විවාහ නීති සංශෝධනයට පියවර



## පිරිවෙන්-සීලමාතා අධ්‍යාපන ආයතන 15 දා සිට ඇරඹේ

පිට 6


## පාස්කු ප්‍රහාර පිටුපස දේශපාලන හස්තයක් ඇද්දැයි සැකයි



## බ්‍රිතාන්‍යයේ නව ප්‍රභේදය ප්‍රදේශ රැසකින්

පිට 6

## පාස්කු ප්‍රහාරයේ සුලමුල දැන ගැනීම ජනතාවගේ අයිතියක්



## බැඳුම්කර වංචාවට සම්බන්ධ නිලධාරීන්ට විනය පරීක්ෂණ

කිසිවකු රකින්න අවශ්‍යතාවක් නෑ

මහ බැංකු අධිපති

පිට 6

## කොවිඩ් පාලන මෙහෙය අගයා යුද හමුදාපතිට සම්මානයක්



ක්‍රිසන්ති විතාරණ

කොවිඩ්-19 වසංගතය පාලනය කිරීමේ කාර්ය සාධන බළකායේ ප්‍රධානියා ලෙස නායකත්ව ගති ලක්ෂණ සහ අභියෝගාත්මක භූමිකාව ගෞරවයට පාත්‍ර කරමින් ‘ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රශංසනීය සමාගම්-2020’ සම්මාන උලෙළේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා වෙත විශේෂ සම්මානයක් පිරිනමනු ලැබීය.

පිට 06

පිට 6

## විදෙස් ප්‍රේෂණ කෝටි 127,800ක් දක්වා ඉහළට

## උතුරේ බිම් බෝම්බ ඉවත් කරන්න ජපානයෙන් ලක්ෂ 1,150ක්

## CIDයට අලුතින් විමර්ශන කොට්ඨාස 05ක්

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් කරන්න

කෝපා කමිටුවෙන් නිර්දේශ

## මඩොල්සිම භූකම්පනයක් බය වෙන්න එපා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න





## රු. කෝටියක කල් ඉකුත් වූ වෛද්‍ය උපකරණ බොරැල්ලෙන් සොයා ගනී

සුභාෂිණී සේනානායක

රුපියල් කෝටියකට ආසන්න වටිනාකමකින් යුත් කල් ඉකුත් වූ වෛද්‍ය උපකරණ තොගයක් බොරැල්ල ගෝතමී පාරේ ගබඩාවක තිබී ඖෂධ නියාමන අධිකාරියේ වැටලීම් ඒකකය හා පොලිසිය එක්ව කරන ලද වැටලීමකදී ඊයේ (12) අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 06

## BBC ලෝක සේවයට චීනයෙන් තහනමක්

පිට 6

රට වටා

# කොවිඩ් ආසාදිතයෝ 942ක් අලුතින් 11දා හඳුනා ගැනෙති

## සමස්ත මරණ 379ක්

## ආසාදිතයෝ 73,116 ක්

## 66,211කට පූර්ණ සුවය

කොවිඩ් -19 ආසාදිතයන් 942ක් පෙරේදා (11) අලුතින් හඳුනාගෙන තිබේ. ඒ අනුව පෑලියගොඩ පොකුරෙන් ආසාදිතයන් 939 දෙනෙකු සහ විදෙස්ගතව සිට පැමිණි පුද්ගලයන් 03 දෙනෙකු ඊයේ දිනයේ ආසාදිතයන් ලෙස හඳුනාගත් බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහන් කළේය.

මේ අනුව අඛණ්ඩව දින තුනක් ආසාදිතයන් 900 සීමාව ඉක්මවා තිබීම විශේෂත්වයකි.

හඳුනාගත් ආසාදිතයන් අතරින් වැඩිම සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, ඒ ආසාදිතයන් 273ක් ලෙසය.

ඊට අමතරව, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 181ක් සහ මහනුවර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 102ක් ලෙස වාර්තා වී ඇති අතර අනෙක් ආසාදිතයන් 383 දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත.

මේ ආසාදිතයන් සමඟ මේ දක්වා මෙරටින් වාර්තා වී ඇති සමස්ත කොවිඩ් -19 ආසාදිතයන් ගණන 73,116 ක් දක්වා ඉහළ ගොස් තිබේ. ආසාදිතයන් 6,526 දෙනෙකු තවදුරටත් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින අතර සමස්ත ආසාදිතයන්ගෙන් 66,211 දෙනෙකු පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහන් කරයි. මෙරටින් වාර්තා වන කොවිඩ් ආසාදිත සමස්ත මරණ සංඛ්‍යාව 379ක් දක්වා ඉහළ ගොස් තිබේ.



ලොව වටා

# ආසාදිතයන් ලක්ෂ අටට ආසන්න පෘතුගාලය ලොව 23 වැනි තැනට

**බුද්ධි කරුණාරත්න**

ලෝකයේ කොරෝනා ආසාදිතයන් ගණන අනුව 23 වැනි ස්ථානයේ පසුවන්නේ මෙතෙක් රෝගීන් හත් ලක්ෂ හැත්තෑපන් දහසක් වාර්තා වී ඇති පෘතුගාලයයි. එරටින් මරණ 14,718ක් ද වාර්තා වී තිබේ. කොරෝනා වැලඳුණු රෝගීන් 636,859ක් පෘතුගාලයෙන් හමු වී තිබේ. එරට සිටින ක්‍රියාකාරී කොරෝනා රෝගීන් ගණන 123,312ක් ලෙස වාර්තා වී ඇති අතර බරපතළ තත්ත්වයේ පසුවන රෝගීන් 853ක් සිටිති. එක් කෝටියකට මදක් වැඩි ජනගහණයක් සිටින පෘතුගාලයේ කොරෝනා හඳුනා ගැනීමේ පරීක්ෂණ හැත්තෑ හත් ලක්ෂයක් සිදු කර තිබේ.මේ අනුව ජනගහනයේ මිලියනයකට පරීක්ෂණ 756,227ක් ද, මරණ 1,446ක් ද, රෝගීන් 76,131ක් ද වාර්තා වී තිබේ.

මාර්තු අග භාගය වනතුරු පෘතුගාලයේ සමස්ත කොරෝනා ආසාදිතයන් ගණන වේගයෙන් ඉහළ ගියේ නැත. අප්‍රේල් මුල් භාගයෙන් පසු තරමක වර්ධනයක් පෙන්නුවත් පෘතුගාලයේ කොරෝනා රෝගීන් වර්ධනය වේගවත් වීමේ වක්‍ර දෙක හමුවන්නේ ඔක්තෝබර් මැද භාගයේ සිට දෙසැම්බර් අග භාගය දක්වාත්, ජනවාරි මුල් භාගයේ සිට වර්තමානය දක්වාත්ය. පළමු වක්‍රයේ නොවැම්බර් 04 වැනිදා වාර්තා වී ඇති රෝගීන් 7,535ක උපරිමයත්, දෙවැනි වක්‍රයේ වාර්තා වී තිබෙන උපරිමය වන 16,432 ජනවාරි 28 වැනිදාත් දක්නට ලැබේ. ජනවාරි 10 වැනිදා කොරෝනා රෝගීන් 4,387ක් වාර්තා වී ඇත.

දෛනික කොරෝනා මරණ දැක්වෙන වක්‍ර 3ක් පෘතුගාලය ආශ්‍රිතව දැකිය හැකිය. පළමුව මාර්තු අග භාගයේ සිට ජූනි මැද භාගය දක්වා සුළු මට්ටමේ වක්‍රයක් ලෙස දැක්වෙන අතර එහි උපරිම ලක්ෂය පෙන්නුම් කරන්නේ අප්‍රේල් 11 වැනිදා දැක්වෙන මරණ 35යි. දෙවැනි වක්‍රය පෙන්නුම් කරන්නේ සැප්තැම්බර් අග භාගයේ සිට දෙසැම්බර් අග භාගය දක්වාය. එහි උපරිම අගය දෙසැම්බර් 13 වැනිදා වාර්තා වූ මරණ 98කි. තෙවැනි කොරෝනා මරණ වක්‍රය දෙසැම්බර් අගභාගයේ සිට වර්තමානය දක්වා දිවෙන අතර එහි උපරිම අගය ජනවාරි 28 සහ 31 දෙදිනේම 303 බැගින් පෙන්නුම් කරයි. පෙබරවාරි 10 වැනිදා පෘතුගාලයේ කොවිඩ් මරණ ගණන පෙන්නුම් කරන්නේ 161ක් වශයෙනි.





# නිදහස් උත්සවයට සහභාගි වූ කන්දකුලිය සිවිල් ආරක්ෂක පුහුණු කඳවුරේ 30කට කොවිඩ්

කන්දකුලිය සිවිල් ආරක්ෂක පුහුණු කඳවුරේ සිවිල් ආරක්ෂක භටයන් 30කට කොරෝනා ආසාදනය වී ඇති බව සෞඛ්‍ය අංශ පවසයි. මේ ආරක්ෂක භටයන් 30දෙනා පසුගියදා පැවැති 73 වැනි නිදහස් උත්සවය වෙනුවෙන් සහභාගි වු අය වෙති.

මේ තත්ත්වය නිසා කල්පිටිය පුහුණු කඳවුරේ භට පිරිස් 62 දෙදෙනකු ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂාවකට ලක්කර තිබු අතර එම පිරිසෙන් 30ක් කොරෝනා ආසාදිතයන් බවට පෙරේදා (11) සවස සෞඛ්‍ය අංශ සනාථ කර ඇත.

එම ආසාදිත සිවිල් ආරක්ෂක භටයන් දංකොටුව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කරමින් ඇති බව කල්පිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි.

මෙවර නිදහස් උත්සවයට සහභාගි වූ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භට කණ්ඩායමෙන් 50 දෙනෙකුට ද කොවිඩ් ආසාදනය වී ඇති බවට හඳුනාගෙන තිබෙන අතර එමෙන්ම තෝරා ගත් නිලධාරිනියකට කෙරෝනා ආසාදිත බවට තහවුරුවීමත් සමඟ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාන්තා නියෝජනයක් මෙවර සිදු කර නොමැත.

නිදහස් උත්සවයට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 450කට ආසන්න පිරිසක් නිදහස් උත්සවයට සහභාගි වී ඇති අතර ඒ අතරින් මේ 50 දෙනා ආසාදිත බවට හඳුනාගෙන තිබේ.

# බන්ධනාගාර ආශ්‍රිත කොවිඩ් පොකුරෙන් 4,494කට පූර්ණ සුවය

## නිලධාරීන් 21කුත් ඒ අතර

**බුද්ධිකා ඉමුලාන**

බන්ධනාගාර ආශ්‍රිත කොවිඩ් ආසාදිතයන්ගෙන් පූර්ණ සුවය ලැබූ සංඛ්‍යාව 4494 දක්වා ඉහළ ගොස් ඇත.මෙයින් 4362ක් රැඳවූවන් වේ.දැනට ප්‍රතිකාර ලබන රැඳවූවන්ගේ සංඛ්‍යාව171කි.නිලධාරින් සංඛ්‍යාව 21කි. ඊයේ (12) දහවල් වාර්තා වූ ආසාදිතයන් 11 දෙනා සමඟ බන්ධනාගාර ආශ්‍රිත සමස්ත කොවිඩ් ආසාදිතයන්ගේ සංඛ්‍යාව 4677ක් ලෙස වාර්තා වී තිබේ.මෙයින් 4524ක් රැඳවූවන් වන අතර සිදුවූ මරණ සංඛ්‍යාව 10කි. වැලිකඩ බන්ධනාගාරයෙන් ආසාදිතයන් 902 ක්ද ,මැගසින් බන්ධනාගාරයෙන් 878ක්ද,මහර බන්ධනාගාරයෙන් 819ක්ද ,කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයෙන් 441 ක්ද මීගමුව බන්ධනාගාරයෙන් 368 ක්ද වශයෙන් ආසාදිතයන් වාර්තා වී තිබේ.

# මුහුණු ආවරණ නොපැළඳි දුරස්ථභාවය නොරැකි 10ක් අත්අඩංගුවට

## පොලිස් මාධ්‍ය ප්‍රකාශක

**රක්ෂණ ශ්‍රියන්ත**

මුහුණු ආවරණ නොපැළඳීම සහ දුරස්ථභාවය තබා නොගත් පුද්ගලයන් 10ක් පෙරේදා (11) උදෑසන 6.00න් අවසන් වූ ගතවූ පැය 24තුළ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මුහුණු ආවරණ නොපැළඳීම සහ දුරස්ථභාවය තබා නොගත් පුද්ගලයන් 3095 මේ වන විට අත්අඩංගුවට ගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

නිවෙසින් බැහැරව පොදු ස්ථානවලට පිටත්ව යන සෑම අවස්ථාවකම මුහුණු ආවරණ පැළඳීමටත් නිරෝධායන රීතීන්ට අනුගතව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී.

## ලේක්හවුස් පුවත්පත්වලින් කාටවත් අකටයුත්තක් සිදු වන්නේ නෑ:

# වඩාත් නිවැරැදිව හසුරුවන මාධ්‍යවලින් සමාජයට වන්නේ විශාල සේවයක්



## ‘වනදිවිය’ පස්වැනි සංවත්සර උත්සවයට එක් වෙමින් වනජීවී ඇමැති කියයි

**අමෝදා ජයමහ**

ලේක්හවුස් පුවත්පත්වලින් කිසිම පුද්ගලයකුට අකටයුතුකම් සිදු නොවන අතර සාවද්‍ය හෝ අසත්‍ය පුවත් ප්‍රචාරය නොවන බව වනජීවී හා වන සංරක්ෂණ ඇමැති සී.බී.රත්නායක මහතා ඊයේ (12) පැවසීය.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශයේ නිල පුවත්පත වන "වනදිවිය" පස්වැනි සංවත්සර උත්සවයට සහභාගි වෙමින් ඇමැතිවරයා මේ බව කීය. ලේක්හවුස් ආයතනයේ දී ඊයේ (12) පැවැති මේ උත්සවයේ දී ඒ මහතා පැවසුවේ භාෂාව නිවැරැදිව හසුරවමින් මාධ්‍යකරණයේ නියැළෙන ලේක්හවුස් ආයතනයෙන් සමාජයට විශාල සේවයක් සිදු වන බවයි.

එහිදී වැඩිදුරටත් ඇමැතිවරයා මෙසේ ද කීය.

වත්මන් ආණ්ඩුව බලයට පැමිණීමත් සමඟ රට සංවර්ධන ඉලක්ක කරා ගෙන යෑමට අපට මේ වනවිට පැහැදිලි දැක්මක් තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතා හැට නව ලක්ෂයක මහජන ඡන්දයකින් අපේ රටේ ජනාධිපතිවරයා බවට පත්වුණා. මගේ දේශපාලන ජීවිතයේ නිවැරැදි නායකයා තෝරාගෙන ඔහුත් සමඟ ඉදිරියට යෑම මගේ අරමුණ වුණා. අපේ රටේ එකම දේශපාලනයේ සන්නාමය වනුයේ වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතායි. මේ සන්නාමය සමඟ ජනතාව විශ්වාසයෙන් පෙළ ගැසුණා. ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා විය යුතුය යන විශ්වාසයේ සිටි එකම පුද්ගලයා මහින්ද රාජපක්ෂ මහතායි. සියලු වියතුන්, උගතුන්, බුද්ධිමතුන්, මහින්ද රාජපක්ෂ මහතා පිළිබඳ විශ්වාසය තබමින් ගෝඨාභය රාජපක්ෂ මහතා වත්මන් ජනාධිපතිවරයා ලෙස පත් කළා. යුද්ධය අවසන් කරන්න බෑ කියා පැවසූ පිරිස්වලට රාජපක්ෂවරු යුද්ධය අවසන් කර පෙන්නුවා. ඡන්දය දිනන්න බෑ. බලයට නැවත පැමිණෙන්න බෑ කියා පැවසූ පිරිස්වලට රාජපක්ෂවරු සුළු ජාතීන්ගේ ඡන්ද නැතිව විශිෂ්ට මැතිවරණ ජයග්‍රහණයක් ලබාගෙන පෙන්නුවා. මේ තමා ඇතැම් පිරිස් කතා කිරීමට, ඇසීමට අකමැති තිත්ත ඇත්ත. වත්මන් ආණ්ඩුවට බලාපොරොත්තු රාශියක් තිබෙනවා. විනය, දේශපාලන සමාජය, සමාජ ආසාධාරණය, අකටයුතුකම්, හොර මැරකම්, නීතිය ක්‍රියාත්මක කිරීමේ යම් යම් ගැටලු යනාදී කරුණු ඔස්සේ නිවැරැදි වියයුතු දේ නිවැරැදි කරමින් ද රාජ්‍ය යන්ත්‍රණය නිසි මඟකට යොමු කිරීම අපගේ මූලික අරමුණයි. නමුත් රාජ්‍ය යාන්ත්‍රණය නිසි මඟකට යොමු කර රට ඉදිරියට යාමට සූදානම් වනවාත් සමඟම ගෝලීය වසංගතයක් පැමිණ සියල්ල අඩපණ වුණා. ලෝකයේ අමෙරිකාව වැනි ප්‍රබල රාජ්‍යයන් පවා සෘණ ආර්ථික මට්ටමක ඇඳ වැටෙද්දී අපේ රටේ ආර්ථික පසුබෑම විපක්ෂයේ කතා කිරීමට සුදුසු වන්නේ නෑ. මුළු ලෝකයේම අර්බුදකාරී තත්ත්වයක් යටතේ තිබිය දී ඉලක්කම් දෙකේ පොළියට තිබූ ණය මුදල තනි ඉලක්කමකට ගෙනාවේ වත්මන් ආණ්ඩුවයි. වැට් බදු අඩු කිරීම්, උපාධිධාරීන් හැට හත්දහසකට වත්මන් ආණ්ඩුව යටතේ මේ වනවිට රැකියා ලබාදී තිබෙනවා. ඒ වගේම සාමාන්‍ය පෙළ අසමත් සමෘද්ධිලාභීන්ට රැකියා දීමේ වැඩපිළිවෙළ යටතේ හතළිස් හත්දහසක් වූ පිරිසකට මේ වනවිට අප රැකියා ලබාදුන්නා. රටේ ඒක පුද්ගල ආදායම වැදගත් කරුණක්.

ලෝකයේ දියුණු වීමත් සමඟම සන්නිවේදන ක්‍රමද දියුණු වුණා. පියවරෙන් පියවර දියුණු වූ මේ සන්නිවේදන ක්‍රම අතර මේ වනවිට මිනිසා සමඟ සමීපතම සම්බන්ධකමක් පවත්වන දියුණුම සන්නිවේදන ක්‍රමය වනුයේ මාධ්‍ය සන්නිවේදනයයි. සත්‍ය එලෙසින් ප්‍රචාරය කරන මාධ්‍යයන් ඇතැම් පිරිස් දේශපාලන රාමුවකට කොටු කරමින්, දේශපාලනයට කඩේ යන මාධ්‍ය ලෙස හංවඩු ගහනවා. ඒ නිසාම එම මාධ්‍ය ආයතන කඩා වැටීමට ලක් වෙනවා. ඒ නිසා පුවත්පත් අලෙවිය අඩු වෙනවා. විශේෂයෙන් මේ ලේක්හවුස් ආයතනයේ පුවත්පත් ගන්නා විට රැකියා පුරප්පාඩු, දැන්වීම් පළ වී තිබෙනවා ද? වෙන්දේසි තිබෙනවා ද? චක්‍රලේඛ තිබේ නම් පමණක් දිනමිණ, සිළුමිණ පුවත්පත් මිලදී ගන්නට ජනතාව හුරු වී තිබෙනවා. මේ නිසාම පෞද්ගලික නාලිකා බිහිවුණා. එම ආයතනයන්හි මූල පාඨයන්වල සඳහන් වනුයේ සත්‍යම ද ? යන්න ප්‍රශ්නාර්ථයක් ගොඩ නැගෙනවා. මේ නිසා යම් යම් අකටයුතුකම්, අසාධාරණකම් අපට සිදු වී තිබෙනවා. ලේක්හවුස් මාධ්‍ය ආයතනයේ පුවත්පත් හරහා කිසිම පුද්ගලයකුට අකටයුත්තක් සිදු වන්නේ නෑ. සාවද්‍ය අසත්‍ය පුවත් ප්‍රචාරය වන්නේ නෑ. මාධ්‍ය නිවැරැදිව සිය රාජකාරිය හසුරුවන්නේ නම් සමාජයට විශාල සේවයක් කිරීමේ හැකියාව ඔවුනට තිබෙනවා.

මේ අවස්ථාවේ දී විශේෂයෙන් "වනදිවිය" පුවත්පත මඟින් සිදු කරන සේවය මම අගය කරනවා. එහි කාර්ය මණ්ඩලය ඇතුළු ලේක්හවුස් මාධ්‍ය ආයතනය වසර පහක් පුරා අපට දැක්වූ සහායට මම ස්තූතිවන්ත වෙනවා. අපේ අමාත්‍යංශයන්හි වන සංරක්ෂණ,වනජීවී, සත්ත්ව උද්‍යාන, දැව සංස්ථාව ලෙස ආයතන හතරක් තිබෙනවා. නමුත් මේ ආයතන හරහා සිදුවන දේ පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමට වෙබ් සයිඩ් එකක්,යූටියුබ් නාලිකාවක් නෑ. ඒ නිසා මෙහි ප්‍රචාරණයක් සිදු වන්නේ නෑ. වනජීවී පුවත්පත් සමඟ අවුරුදු පහක් සමරන මේ මොහොතේ අපි දැක්මක් ඇති කරගත යුතුව තිබෙනවා. මේ පුවත්පත හරහා අප සිදුකළ හැකි පාරිසරික සත්කාර්යයන් මොනවාද? යන්න පිළිබඳ අවබෝධයකින් යුතුව අප ඉදිරියට යා යුතුයි. මම මගේ දේශපාලන ජීවිතයේ පැළ රෝපණ වැඩසටහන් විශාල ප්‍රමාණයකට සහභාගි වී තිබෙනවා. නමුත් එම පැළ නඩත්තුවක් සිදුවෙනවා. මම දැක නෑ. ඒ පැළ සියල්ල මේ වනවිට නිසි ආකාරයෙන් නඩත්තු කළා නම්, මේ වනවිට විශාල ශාක ප්‍රමාණයක් පරිසරයේ වැඩී තිබෙනවා. මේ දේවල්වලට වියදම් වනුයේ මුදල් පමණයි. ඒ මුදල් වෙනත් ප්‍රායෝගික සමාජ සත්කාරයට යෙදවීමට හැකියි. පැළයක් සිටුවන විට එයට අරුතක් ලබාදිය යුතුයි. එය රැක ගත යුතුයි. වනජීවී වනසංරක්ෂණ වෙබ් සයිඩ් එකක් ආරම්භ කර එය සක්‍රිය කිරීමට වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයි. සංචාරක ව්‍යාපාරය නගා සිටුවීමට සහ පාරිසරික වැදගත්කම පිළිබඳ දැනුම බෙදාදීමට, සත්‍ය තොරතුරු ජනතාව අතරට ගෙන යාමට අප අනිවාර්යයෙන් ක්‍රමවේදයක් සකසා ගත යුතුයි. බොරුව සමාජ ගතකර වැරැදි මතයක් ජනතාව අතර ගොඩනැගීමට අප ඉඩ නොතැබිය යුතුයි. එමෙන්ම දැව සංස්ථාව හරහා සිදු කරන නිෂ්පාදන මිල අධික බව පවසනවා. නමුත් අප නිසි ප්‍රමිතීන්ට අනුකූලව, කල්පැවැත්ත සහතික කරමින් අපගේ නිෂ්පාදන ජනතාවට ලබාදීමට කටයුතු කර තිබෙනවා. අද දින මේ උත්සවට සමගාමීව මේ ස්ථානයේ ප්‍රචාරය කළ වීඩියෝ දර්ශනය සමාජ මාධ්‍යයන්ට ඇතුළත් කරන ලෙසත්, සීඩී තැටි කීපයක් නිර්මාණය කර පළාත් නවයේ කලාප අධ්‍යාපන කාර්යාල හරහා පාසල් දරුවන්ට මෙය නැරඹීමට කටයුතු සැලසීම ඉතාමත් වටිනවා. පරිසරයට ආදරය කරන දරුවන් පිරිසක් නිර්මාණය කිරීමට අපට මෙවැනි දේවලින් පුළුවන්. මමත් මේ රටේ පුරවැසියෙක්. මැතිඇමැතිකම් මට හිමි වූ දෙයක් පමණයි. මමත්, මගේ දරුවනුත් රටේ සියලු දෙනාත් මේ පොළොවේ පය තබා ජීවත් විය යුතුයි. අපි අපේ පරිසරය රැක ගැනීමට බැඳී සිටිනවා.



ලේක්හවුස් ආයතනයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා



ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම් මහතා

**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශ ලේකම් එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර මහතා-**

පත්තර කලාවේ පෙරළියක් ඇති කරමින් ඩී.ආර්. විජයවර්ධන මහතා ආරම්භ කළ පුවත්පත් මහගෙදර මුළු ලෝකයටම දැනුම බෙදා දුන් දැනුම් කෝෂ්ඨාගාරයක්. වනදිවි පුවත්වලින් වෙනසක් කරමින්, මට අවශ්‍යය වූයේ මේ පත්තරය කිය වීමෙන් පසු බත් ඔතන කඩදාසියක් බවට පත්වීම නොව, පසු දැනුමට එක්රැස් කර තබා ගන්නා පුවත්පතක් කිරීමටයි. අප මේ වනවිට කතා බහට ලක් වී තිබෙන විශේෂ ශාකයක් පිළිබඳ මේ වනවිට විශාල කතාබහකට ලක්ව තිබෙනවා.ගම්පහ දාරළුව ස්ථානයේ පමණක් බව පවසනවා. ලෝකයේ ඉතිරිව ඇති එකම ශාකය මෙය නොවේ. එය පැහැදිලිවම කිව යුතුයි. මම මේ වනවිට මගේ ඇසින් මේ ශාක හතක් දැක තිබෙනවා. මේ ශාක විශේෂය මේ වන විට ලංකාවේ පමණක් දාරළුව ස්ටේෂන් එක ඉදිරිපිට විශාල ශාකයක් සහ ඒ අසලම තවත් ගැටවර වියේ මේ ශාකයේම ශාක දෙකක් තිබෙනවා. එමෙන්ම මගලෙගොඩ ප්‍රදේශයේ, මිනුවන්ගොඩ ප්‍රදේශයේ ඉතාම විශාල සරු ගසක්, කඩුවෙල ප්‍රදේශයේ ද මේ ශාකය තිබෙනවා. එමෙන්ම ජාතික රාජකීය උද්භිද උද්‍යානයේ (පේරාදෙණිය) මේ ශාකය විශේෂයේ පැළ විස්සක් පමණ තිබෙන බව ද පැවසිය යුතුයි. මේ ශාකය අපේ රටේ කොපමණ තිබෙනවා ද? කියා නිවැරැදිව අධීක්ෂණය කර දත්තගත කිරීමට අප අපේක්ෂා කරනවා. කෘඩියා සෙලනිකා ශාකය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන අතර ගම්පහ දාරළුව ප්‍රදේශයේ ඉදිවෙමින් තිබෙන මධ්‍යම අධිවේගය ආසන්නයේ ඇති මේ ශාකය ආරක්ෂා කර ගනිමින් ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යනවා.

**ලේක්හවුස් ආයතනයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා.-**

"වනදිවිය" පුවත්පත මහින්ද චින්තනය ප්‍රතිපත්තිය යටතේ වසර හතකට පෙර මේ පුවත්පත "ගොවි උදානය" ලෙස ආරම්භ වුණා. ආණ්ඩු පෙරළිත් සමඟ ඇති වූ විවිධ අර්බුද නිසා මේ පුවත්පතේ අඩපණවීම් සිදුවූවත් මේ වනවිට වසර පහක් පුරාවට ලේක්හවුස් ආයතනය හා එක්ව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශය විසින් මේ පුවත්පත දිනමිණ පුවත්පත සමඟ එළි දක්වනවා. මේ රටේ ප්‍රගතිය උදෙසා කැපවෙන මාධ්‍ය ආයතනයක් ලෙස අප කැප වී සේවයට බැඳී සිටිනවා. අපේ රටේ වන සම්පත ආරක්ෂා කර ගැනීමට මේ පුවත්පත හරහා ඉදිරියටත් කටයුතු කිරීමට අපි අපේක්ෂා කරනවා.

**ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම් මහතා-**

ලේක්හවුස් ආයතනය සෑමවිටම ජාතික මාධ්‍ය ආයතනයක් ලෙස වගකීම් සහගතව කටයුතු කරනවා. රටේ උන්නතිය උදෙසා රටේ සමස්ත ජාතිය වෙනුවෙන් පෙනී සිටිමින් අප අපගේ පුවත්පත් මෙහෙයවනවා. පවතින ආණ්ඩුවේ ආකල්ප, ප්‍රතිපත්ති, මත වෙනුවෙන් පෙනී සිටින මාධ්‍යය ආයතනයක් ලෙස අප ඉතිහාසය පුරාම ප්‍රචලිත වෙනවා. ආණ්ඩුවේ හොරණෑ මාධ්‍යයක් ලෙස ලේක්හවුස් මාධ්‍ය ආයතනය ද ජනතාව අතර ප්‍රසිද්ධ වී තිබෙනවා. බලයේ සිටි ඒ ඒ ආණ්ඩුවලින් විවිධ බලපැම් ලේක්හවුස් ආයතනයට එල්ල වී තිබුණත් වත්මන් අණ්ඩුව හරහා කිසිදු බලපෑමක් අපගේ ආයතනයට එල්ල නො කරන බව ඉතාමත් සතුටින් කිව යුතුයි. ලේක්හවුස් පුවත්පත් පසුගිය කාලය පුරාවට පවතින ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටිමින් විරුද්ධ පක්ෂයන්හි නායකයන් හෙළා දැකීම සිදු කළා. ඉතිහාසයේ පළමු වරට මේ වනවිට එසේ නොවන පත්තර කලාවක් ලේක්හවුස් ආයතනයේ ක්‍රියාත්මක වෙනවා. ඒ අභිමානය හිතේ දරාගෙන මේ වන විට අප අපගේ කටයුතු ඉදිරියට කරගෙන යනවා.

**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශය වෙනුවෙන් පුවත්පත් පිළිබඳ අතිරේක ලේකම් (තාක්ෂණ) එච්.ඩී. රත්නායක මහතා-**

වසර පහක් පුරාවට මෙවැනි ආකාරයෙන් වන සම්පත පිළිබඳ ප්‍රචාරයක්"වනදිවිය"පුවත්පත හරහා ලබා දීම පිළිබඳ මම ලේක්හවුස් ආයතනයට ස්තූතිවන්ත වෙනවා. කොවිඩ් වසංගතය මධ්‍යයේ වුව ද ඊ පේපර් එකක් ලෙස මේ පුවත්පත ජනතාවට ලබාදීම ගැන එම කාර්යය මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුද කරනවා. වනජීවී ගැටලු ජනතාව අතරට ගෙන යෑමට වනජීවී ලෝලින්ට අධ්‍යාපනික පුවත්පතක් වෙමින් ජනතාව අතරට යාම සතුටට කරුණක් .

"වනදිවිය" පස්වන සංවත්සර උත්සවයට සමගාමීව ලේක්හවුස් ආයතනයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ජනාධිපති නීතිඥ ඩබ්ලිව්.දයාරත්න මහතා විසින් 2020 වර්ෂය පුරාවට "වනදිවිය" පළ වූ සමරු කලාප සියල්ල වනජීවී හා වන සංරක්ෂණ ඇමැති සී.බී. රත්නායක මහතාට පිළිගන්ව ලැබීය. එමෙන්ම "වනදිවිය" පුවත්පත වෙනුවෙන් කැප වූවන්ට සමරු තිළිණ ප්‍රදානයක් ද සිදු කෙරිණි.

ලේක්හවුස් ආයතනයේ රාජ්‍ය සබඳතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී කළමනාකරණ කර්තෘ සමන්ත කරුණාසේකර මහතා සහ එම අංශයේ නිලධාරීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.



ඡායාරූප-චින්තක කුමාරසිංහ

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

**2021 පෙබරවාරි 13 සෙනසුරාදා**

# ජිනීවා සටනට සඟරුවන පෙරමුණේ

ජිනීවා මානවහිමිකම් චෝදනා යනු රට හමුවේ ඇති ප්‍රධාන අභියෝගයකි. එය නොසලකා හැරීම මෙන්ම සැහැල්ලුවෙන් ගැනීම ද සුදුසු නැත. අභියෝගය ජය ගැනීම සඳහා සාධක දෙකක් පවතී. පළමු සාධකය වන්නේ සාමූහික ප්‍රයත්නයක් ඔස්සේ ඊට මුහුණදීමය. දෙවන සාධකය වන්නේ උපාය මාර්ගික ක්‍රමවේදයක් ඔස්සේ මානව හිමිකම් කවුන්සිලය සමඟ ක්‍රියා කිරීමය. සාමූහික ප්‍රයත්නය යන්නට දේශීය වශයෙන් ඇති කරගනු ලබන එකඟතා සේම විදේශීය වශයෙන් ලබාගත යුතු සහයෝගයන් ඇතුළත්ය. උපාය මාර්ගික ක්‍රමවේදයක් යනු මානව හිමිකම් කවුන්සිලයේ චෝදනා පිළිගැනීම හා එම නිර්දේශ ගෙඩිය පිටින් ක්‍රියාත්මක කිරීම නොවේ. යහපාලන ආණ්ඩුව එබඳු ප්‍රතිපත්තියක සිට ක්‍රියා කළ අතර, එයින් රටේ පාර්ශ්ව ගණනාවක් අපහසුවට පත් වූහ.

අගමැතිවරයා මානව හිමිකම් කවුන්සිලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පූර්ණ වැටහීමකින් කටයුතු කරන බව පෙනෙයි. එය සනාථ කරන එක් සාධකයක් වන්නේ මානව හිමිකම් ගැටලුව සම්බන්ධයෙන් මහා සංඝරත්නයේ මතය හා උපදේශනය ලබා ගැනීමට සාකච්ඡාවක් පැවැත්වීමය. මහින්ද මහතා රටේ ගෞරවයට පාත්‍ර වූ භික්ෂූන් වහන්සේ සමඟ මීට අදාළ සාකච්ඡාවක් පැවැත්වූහ. මෙය අතිශය වැදගත් කාලෝචිත පියවරකි. මානව හිමිකම් කවුන්සිලයේ වාර්තා හැමවිටම පාහේ රටේ ජාතික ආරක්ෂාවට, රාජ්‍ය පාලනයට, දේශපාලන ක්‍රියාවලියට මෙන්ම අපේ අනාගතයටත් අවහිර ඇති කරන තැනෙක පවතී. එය 2010 පටන්ම කවුන්සිලය අඛණ්ඩව ගෙන යන ක්‍රියාවලියකි. මේ ක්‍රියාවලිය පරාජයට පත් කරන්නේ නැතිව රටේ ඉදිරි ගමන තහවුරු කළ නොහැකිය.

ඈත අතීතයේ පටන්ම අපේ රාජ්‍ය පාලනයේ උපදේශකත්වය බාර ගත්තෝ භික්ෂූන් වහන්සේ වෙති. නායකයන් වැරැදි පාරේ යන විට එය නිවැරැදි කිරීමට මහා සංඝයා ඉදිරිපත් වූහ. හිතුවක්කාර පාලකයන් සිහසුනෙන් නෙරපා හැරීමටත් සංඝරත්නය පියවර ගත්හ. ඉතිහාසයට අනුව සෑම සාර්ථක රජ කෙනකු පසුපසම භික්ෂූන් වහන්සේ වැඩ උන්හ. රටට හා ජාතියට අයහපතක් වන සෑම අවස්ථාවකම උන්වහන්සේ පෙරමුණ ගෙන රට හා ජාතිය එක්සේසත් කළහ. ශාසනයේ අභිවෘද්ධිය තහවුරු කළහ. සංඝ රත්නය නොසලකා හරින පාලකයාට දිගුකාලීන පැවැත්මක් නැත. වත්මන් ආණ්ඩුවට හා ජනාධිපතිවරයාට ශාසනය සමඟ සුවිශේෂ සම්බන්ධයක් පවතී. රජය හා ජනාධිපතිවරයා පත් කිරීමට සංඝරත්නය සිදු කර ඇති කැපවීම අතිමහත්ය.

2009දී මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට ත්‍රස්තවාදය පරාජය කොට රටේ ඒකීයභාවය තහවුරු කළ හැකි වූයේ භික්ෂු සමාජයේ උපදේශනය ද සැලැකිල්ලට ගනිමින් නොබියව ක්‍රියා කිරීම නිසාය. රටේ පොදු ජනතාව පෙළගැස්වීමේ බලයක් සංඝ සමාජයට තිබේ. යහපාලන ආණ්ඩුව මානව හිමිකම් කවුන්සිලය සමඟ ක්‍රියා කළ ආකාරය පිළිබඳ බරපතළ විවේචනයක් එදා සංඝ සමාජය වෙතින් ඉදිරිපත් විය. එහෙත් එම විවේචනය යහපාලන නායකයන්ගේ සැලැකිල්ලට ලක්වූයේ නැත. මානව හිමිකම් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම යහපාලන ආණ්ඩුවේ කිහිපදෙනකු අත පැවැතිණි. ඔවුන් දෙමළ ඩයස්පෝරාවට හා රාජ්‍ය නොවන සංවිධානවලට හිස නමන හා මානව හිමිකම් කවුන්සිලයට පක්ෂපාතී ලෙස කටයුතු කරන කණ්ඩායමක් ලෙස ප්‍රකටය. කවුන්සිලය අලුත් ආණ්ඩුවෙන් ද එබඳු හැසිරීමක් අපේක්ෂා කරන බව පැහැදිලිය.

කිසිදු ජගත් සංවිධානයකට රටක අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමේ අයිතියක් නැත. එය ලෝකය පිළිගත් සම්මතයකි. එහෙත් මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාව වැනි රටවල් සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ ඉහත සම්මතයට පටහැනි ලෙසය. ආණ්ඩුවේ උසස් තනතුරු සඳහා හිටපු හමුදා නිලධාරීන් කිහිපදෙනකු පත් කිරීමට කවුන්සිලය එරෙහි වී ඇත. කොවිඩ් ආසාධිතයන්ගේ මරණ ආදාහනය කිරීමටත් කවුන්සිලය විරුද්ධ වී ඇත. ඉස්ලාම් භක්තිකයන්ගේ කොවිඩ් මරණ භූමදාන කළ යුතු යැයි බලපෑමක් කොමිසම සිදු කර තිබේ. ජිනීවා කවුන්සිලය තම සිතැඟි පරිදි දුප්පත් රටවල් පාලනය කිරීමට උත්සුක වෙයි. මෙය පරාජය කළ හැක්කේ අන්තර්ජාතික සහයෝගය ද අප වෙත ලබා ගනිමින්ය. ඒ සඳහා රජයට වැඩපිළිවෙළක් ඇති බව නොයෙක් සාධකවලින් පෙනී යයි.

රටේ පවතින්නේ පොදු ජනයාගේ ආණ්ඩුවකි. මියන්මාරයේ මෙන් හමුදා ආණ්ඩුවක් ශ්‍රී ලංකාවේ නැත. රටේ රාජ්‍ය නායකයා වන ජනාධිපතිවරයා පත් වී ඇත්තේ වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින්ය. ආණ්ඩුව බලයට පත් වී ඇත්තේ ද තුනෙන් දෙකක පාර්ලිමේන්තු බලයක් හිමිකර ගනිමින්ය. මෑත කාලයේ ශ්‍රී ලංකාව තුළ තහවුරු වූ ශක්තිමත්ම රජය ලෙස ද මේ ආණ්ඩුව හැඳින්විය හැකිය. මේ තත්ත්වය නිරීක්ෂණය කරන්නේ නම් මානව හිමිකම් කොමිසම ශ්‍රී ලංකා ආණ්ඩුවට චෝදනා ඉදිරිපත් කරන්නේ නැත. මානව හිමිකම් මහ කොමසාරිස්වරිය වන බැචලේ මහත්මියට අවශ්‍ය නම් ශ්‍රී ලංකාවේ සංචාරයක් කරමින් රටේ ඇත්ත තත්ත්වය වටහාගත හැකිය. ආණ්ඩුව ඇයට ආරාධනයක් ඉදිරිපත් කොට සංචාරයට අවශ්‍ය කටයුතු සූදානම් කරන්නේ නම් එය ද වැදගත්ය.

බෞද්ධ රාජ්‍යයක් ලෙස ප්‍රකට ශ්‍රී ලංකාවට මානව හිමිකම් ගැන අමුතු උපදේශන අවශ්‍ය නැත. බෞද්ධ දර්ශනයට අනුව සමානාත්මතාව යන්න මූලික ඉගැන්වීමකි. නිදහස යන්න තවත් ඉගැන්වීමකි. නිදහස් ජීවිතයකට අවශ්‍ය පසුබිම ශ්‍රී ලංකාව තුළ පවතී. එය තවදුරටත් තහවුරු කරනු පිණිස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා රජය ක්‍රියා කරයි. ජනාධිපතිවරයාගේ නියමය පරිදි විශේෂ මානව හිමිකම් කමිටුවක් ද පත් කර ඇත. එහි අරමුණ වන්නේ සෑම ක්ෂේත්‍රයක්ම නිරීක්ෂණය කරමින් මානව හිමිකම් තහවුරු කිරීමය. ජනාධිපතිවරයා නිදහස් දින උළෙළ අමතමින් කියා සිටියේ පාස්කු ප්‍රහාරයට හා මහ බැංකු මංකොල්ලයට සම්බන්ධ සෑම වරදකරුවකුටම තරාතිරම නොබලා නීති ක්‍රියාමාර්ග ගන්නා බවය. එයින් ද සනාථ වන්නේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුව දක්වන උනන්දුව යැයි කිව හැකිය.

ජිනීවා කවුන්සිලයේ තවත් රැස්වීමක් ඉදිරි සති දෙක තුළදී පැවැත්වීමට නියමිතය. එය වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන බව ද වාර්තා වී ඇත. මේ රැස්වීමේදී ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයාට පිළිතුරු සැපයීමේ අවස්ථාවක් උදා වෙයි. විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ඊට හොඳ සූදානමකින් සිටින බව කියා ඇත. එහි ඊළඟ පියවර වන්නේ මාර්තුවේදී පැවැත්වෙන ප්‍රධාන සැසිවාරයයි. එම සැසියේදී ශ්‍රී ලංකාවට සහයෝගය දක්වන රටවල නියෝජිතයන් ද අප වෙනුවෙන් පෙනී සිටිනු ඇත. මහ කොමසාරිස්වරිය චෝදනා ඉදිරිපත් කළ පමණින් ශ්‍රී ලංකාවට සම්බාධක පැනවීමේ හැකියාවක් නැත. වඩාත් සුදුසු ක්‍රමය වන්නේ සාමූහිකව අභියෝගයට මුහුණදීමය. ගෞරවනීය සංඝරත්නය සහයෝගය දෙන සටනක් කිසිදිනෙක පරාජය වී නැත.

**දිල්රුගෙ සීවිද**

| | |
|---|---|
| පෙම්වන්තයන්ගේ දවසත් ළඟට | ඇවිත් |
| යනවා කොරෝනා තවමත් ලෝකෙ | මැදින් |
| ළං වී තුරුලු වෙන්නට බෑ වගේ | කලින් |
| පෙම් කෙරුවට කමක් නෑ මීටරේ | දුරින් |

# ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා මියන්මාර් සටන

ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක ප්‍රතිඵලය ආපසු හරවමින් හමුදා පාලනයක් ඇති කිරීමට එරෙහිව වීදි බැස සිටින මියන්මාර ජනතාවට හමුදා පාලකයන් අනතුරු අඟවා තිබේ. ඒ එම විරෝධතා මඟින් ප්‍රජාතන්ත්‍රවාදයට හානි සිදුවන බව පවසමිනි. එය විනය විරෝධී බවද රටේ ස්ථාවරත්වයට මහජන ආරක්ෂාවට හා නීතියේ පාලනයට අහිතකර බවද සඳහන් කරමින් එලෙස හැසිරෙන අයට එරෙහිව නීතිමය පියවර ගන්නා බවද ඉන් දැනුම් දී ඇත.

අගනුවරදී පැවැති විරෝධතා අතරතුර සිදු වූ පොලිස් වෙඩි තැබීමකින් කාන්තාවක ඇතුළු පුද්ගලයන් දෙදෙනකුට බරපතළ තුවාල සිදුවී ඇතැයි මාධ්‍ය වාර්තා කිරීමෙන් පසු මේ අවධානාත්මක නිවේදනය ප්‍රකාශයට පත් විය. විරෝධතාකරුවන්ට ජල හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල වූ අතර රබර් උණ්ඩ යොදා වෙඩි තැබීම ද සිදු විය. එම උණ්ඩ කාන්තාවගේ හිසට තුවාල සිදු කර ඇත්තේ ඇය පැළඳ සිටි හෙල්මටය ද සිදුරු කරමින් බව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික ලීගයේ (NLD) ප්‍රකාශක කීටෝ පවසා තිබිණි. ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ එම තුවාල සිදුවී ඇත්තේ සැබෑ උණ්ඩවලින් මිස රබර් උණ්ඩවලින් නොවන බව වෛද්‍ය අංශ පැවසූ බවය. මෙම විරෝධතා ගැන පොලිසිය හෝ හමුදා තන්ත්‍රය කිසිදු ප්‍රකාශයක් කර නොතිබිණි.

මේ සතිය තුළදී මහජන ඒකරාශී වීම් වළක්වමින් නව තහංචි පැනවීම සිදුවූ අතර නෙපිඩෝ අගනුවර ඇතුළු නගර කිහිපයකට බලපාන පරිදි ඇඳිරිනීතිය පැනවීම ද සිදු විය. නව රෙගුලාසි යටතේ 5 දෙනකුට වැඩි පිරිසක් ඒකරාශී වීම තහනම් වේ. පා ගමනින් හෝ මෝටර් රථවලින් විරෝධතාවලට එක්වීම ද තහනම්ය. පොදු ස්ථානවල දේශපාලන කතා පැවැත්වීමට ද අවසර නොලැබේ.

මියන්මාරයේ මෙතරම් විශාල විරෝධතා ව්‍යාපාරයක් දියත් වූයේ 2007න් පසු පළමු වතාවටය. මෙම විරෝධතාවන්ට දසදහස් සංඛ්‍යාත පිරිස් එක්ව සිටි බව මාධ්‍ය වාර්තා කර තිබේ. ඇඟිලි 3කින් ආචාර කරමින් ඔවුහු හමුදා රජයට සිය විරෝධය පළ කළහ. Hanger Games චිත්‍රපටයේ ඇතුළත් එම ආචාරය 2014 වසරේදී යාබද තායිලන්තයේ ඇතිවූ විරෝධතාවලදී ද ජනප්‍රිය සංකේතයක් බවට පත් විය. අගනුවර ප්‍රධාන මාවත් අවුරා සිටි පොලිස් ආරක්ෂක වළලු ඉක්මවා යෑමට විරෝධතාකරුවන් කටයුතු කළ හොත් වෙඩි තැබීමට සිදුවන බවට පොලිසිය අනතුරු අඟවා තිබිණි. සුචීගේ සේයාරූ සහිත පුවරු අත දරමින් විරෝධතාකරුවන් හඬ නැගුවේ ඇය ඇතුළු දේශපාලන නායකයන් නිදහස් කරන ලෙස ඉල්ලමින් හා හමුදා පාලනයට විරෝධය පළ කරමිනි. මෙම විරෝධතාවලදී භික්ෂූන් වහන්සේද ගුරුවරු හා ශිෂ්‍යයන්ද වෘත්තිකයන්ද ඊට එක්ව සිටින බව වාර්තා වේ. පොලිසියට ද තමන් සමඟ එක්වන ලෙසට විරෝධතාකරුවෝ හඬ නැඟූහ.



## ජෙනරාල් මින්ගෙන් ප්‍රකාශයක්

සාමකාමීව විරෝධය පළ කිරීමට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරී පත්වූ පාලනයකට සහාය පළ කිරීමට ජනතාවට අයිතියක් ඇති බව අමෙරිකා රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශක නෙඩ් ප්‍රයිස් ද පවසා තිබිණි. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශක ස්ටෙපාන් ඩුජෙරික් කියා ඇත්තේ අන්තර්ජාලයට පිවිසීම අවහිර කිරීම ඇතුළු නව රෙගුලාසි ගැන අවධානයෙන් පසුවන බවය. මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ සැසියක්ද ඊයේ පැවැත්විණි.

බලය අල්ලා ගැනීමෙන් පසු පළමුවරට රූපවාහිනියේ පෙනී සිටිමින් ජනතාව ඇමතූ ජෙනරාල් මින් අවුන්ග් හ්ලේන්ග් රටවැසියන්ගෙන් ඉල්ලා සිටියේ හැඟීම්වලට නොව සත්‍ය තොරතුරුවලට ප්‍රමුඛත්වය දෙන ලෙසය. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කරන බවද ඉන් ජය ගන්නා පාර්ශ්වයට බලය පවරන බවද මෙහිදී ඔහු පවසා සිටියේය. යළිත් මැතිවරණයක් පැවැත්විය යුතු යැයි කියා සිටියද මැතිවරණය පවත්වා තවමත් ගත වී ඇත්තේ තෙමසකි. මැතිවරණ කොමිසම වාර්තා කළ පරිදි එය නිදහස් හා සාධාරණ මැතිවරණයක් විය.

2008 වසරේදී හමුදා පාලනය මඟින් සම්පාදනය කළ ව්‍යවස්ථාව මඟින් පොලිසිය පිළිබඳ බලතල පවරා ඇත්තේ සන්නද්ධ හමුදාවන්ටය. කෙසේ වුව ද විරෝධතාකරුවන් සම්බන්ධයෙන් පොලිසිය හමුදාව මෙන් නොව සානුකම්පිත අයුරින් සලකා ක්‍රියා කරන බවක් ද පළ වේ.

මේ බව ඇතැම් දේශපාලන විශ්ලේෂකයන් ද පෙන්වා දී තිබේ. පොලිසිය විරෝධතාකරුවන් සමඟ සිටගන්නා සෙයක් පෙනෙන්න ඇති බව ඔවුහු කියා සිටිති. ඇතැම් අවස්ථාවලදී සාමකාමීව විරෝධය දක්වන්නේ නම් පොලිසිය ඊට බාධා නොකළ බව පෙනෙන්නට තිබිණි.

නගර ශාලාවට රැස් වූ විරෝධතාකරුවන් සුචීගේ පියාණන් මෙන්ම මියන්මාර නිදහස් අරගලයේ වීරයා ද එරට සන්නද්ධ හමුදාවන්හි නිර්මාතෘවරයාද වන ජෙනරාල් අවුන්සාන් කියා දුන් පාඩමක් සිහිපත් කර සිටියේ ඔහු තමන්ට උගන්වා ඇත්තේ ජීවිත ආරක්ෂා කිරීමට මිස මිනී මැරීමට නොවන බව පවසමිනි.

මියන්මාර නායිකා අවුන්සාන් සුචී 75 හැවිරිදි වියේ පසුවේ. හමුදා පාලනයක් ස්ථාපිත කිරීමෙන් පසු ඇය රඳවා සිටින බව ප්‍රකාශ වූ නමුත් මෙතෙක් ඇයව දැකගැනීමට හැකිවූයේ නැත. ඇයගේ නීතිඥයාට ද ඇය හමුවීමට ඉඩ නොදුන් බව ඔහු පවසා තිබිණි. ඇය රඳවා තබන්නේ මෙම 15 වැනිදා තෙක් බව ප්‍රකාශ වී ඇතත් ඉන් පසු ඇය නිදහස් කරනු ඇතිද යන්න තවමත් පැහැදිලි නැත.

මේ වන විට මෙම විරෝධතා ව්‍යාපාරයට සතියක් ගතව තිබේ. එය කොපමණ දුරට ඇදේවිද යන්න කිව නොහැකිය. විරෝධතාකරුවන්ට පවසා ඇත්තේ මෙය සතියක් හෝ මාසයක් තිස්සේ පැවැත්වෙනු ඇතැයි ආදී වශයෙන් අනුමාන කළ නොහැකි බවය. සිය නායිකාව ජනාධිපති හා සෙසු දේශපාලන නායකයන්ද නිදහස් කරන තුරුම එය පැවැත්වෙනු ඇතැයි ඔවුහු පවසති. රැවීන් සහ කවීන් සුළුතර කොටස්ද මෙම විරෝධතාකරුවන් සමඟ එක්ව සිටී.

මියන්මාරයේ සුළු ජනවාර්ගික කණ්ඩායම් 130ක් පමණ වේ. හමුදා පාලකයන්ට සම්බාධක පනවන බව නව විධායක නියෝගයක් පනවමින් අමෙරිකා ජනාධිපති ජෝ බයිඩන් ඉකුත් බදාදා නිවේදනය කළේය. එරටට ලබාදෙන අරමුදල්වලින් ඇ. ඩොලර් බිලියනයක් කපා හරින බව කියා සිටි ඔහු දේශපාලන නායකයන් නිදහස් නොකළහොත් තවත් සම්බාධක පනවන බව කියා සිටියේය. 'හමුදාව බලය අත්හැරිය යුතුයි' යනුවෙන් ඔහු පවසා තිබේ. යුරෝපා සංගමයේ විදේශ ප්‍රතිපත්ති ප්‍රධානී ජෝෂප් බොරෙල් ද නව සම්බාධක පිළිබඳ මියන්මාරයට අනතුරු අඟවා ඇත.

> “ හමුදා පාලකයන්ට සම්බාධක පනවන බව නව විධායක නියෝගයක් පනවමින් අමෙරිකා ජනාධිපති ජෝ බයිඩන් ඉකුත් බදාදා නිවේදනය කළේය. එරටට දෙන අරමුදල්වලින් ඇ. ඩොලර් බිලියනයක් කපා හරින බව කියා සිටි ඔහු දේශපාලන නායකයන් නිදහස් නොකළහොත් තවත් සම්බාධක පනවන බව කියා සිටියේය. 'හමුදාව බලය අතහළ යුතුයි' යනුවෙන් ඔහු පවසා තිබේ. යුරෝපා සංගමයේ විදේශ ප්‍රතිපත්ති ප්‍රධානී ජෝෂප් බොරෙල් ද නව සම්බාධක පිළිබඳ මියන්මාරයට අනතුරු අඟවා ඇත.

මියන්මාර හමුදාව තම ක්‍රියාමාර්ගය සාධාරණීකරණය කරන්නේ ඉකුත් මැතිවරණයේදී මහා පරිමාණ වශයෙන් අක්‍රමිකතා සිදුවූ බැවින් ඉන් ජයගත් සුචීගේ පක්ෂයට ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩදිය නොහැකි බව පවසමිනි. එසේ වුවද මෙම හමුදා කුමන්ත්‍රණයෙන් පහ කෙරුණේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් ආණ්ඩුවකි.

## අමෙරිකා සම්බාධක

අමෙරිකාව පැනවූ සම්බාධක හමුදා පාලනයේ ප්‍රධානීන් 8 දෙනකුට අදාළය. ඒ අතර වැඩබලන ජනාධිපති මින්ට් ස්වේ, ස්වදේශ කටයුතු ඇමැති සෝ ටුට් සහ ආරක්ෂක ඇමැති සෙයින් වින්ද වෙති. ජේඩ් සහ මැණික් කර්මාන්තයේ නිරත සමාගම් 3කටද මෙම සම්බාධක අදාළ වේ. ජනාධිපති බයිඩන් බලයට පත්වීමෙන් පසු පැනවූ පළමු සම්බාධක ද මෙයය.

කෙසේ වුවද තවදුරටත් හමුදා සෝදිසි මෙහෙයුම් මෙන්ම අත්අඩංගුවට ගැනීම් ද ක්‍රියාත්මකය. එලෙස අලුතෙන් අත්අඩංගුවට ගත් අය අතර සුචීගේ ජ්‍යෙෂ්ඨතම උපදේශකයන්ද වෙති.

මියන්මාරයේ මීට පෙර සිදුවූ දැවැන්ත විරෝධතා ව්‍යාපාර 2ක් වන 1988 සහ 2007 විරෝධතා ව්‍යාපාරවලදී පිළිවෙළින් විරෝධතාකරුවන් 3000ක් සහ 30ක් මරණයට පත් විය. දහස් සංඛ්‍යාත පිරිසක් අත්අඩංගුවට ගැනිණි. පසුගියදා වෙඩි වැදීමෙන් තුවාල ලැබූ 20 හැවිරිදි යුවතියගේ ජීවිතය අවදානමේ බව එරටින් ලැබෙන වාර්තාවල සඳහන්ය.

රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම උදෙසා ගෙන ගිය අප්‍රතිහත අරගලය හේතුවෙන් 1990 ගණන්වල පටන් අවුන්සාන් සුචී ලොව පුරා අවධානය දිනා ගත්තාය. මේ අරගලය හේතුවෙන් 1989 - 2010 සමයේ එනම් දශක 2ක් ඇයට නිවාස අඩස්සියේ ගෙවා දැමීමට සිදු විය. 1991දී ඇය වෙත නොබෙල් සාම ත්‍යාගය පිරිනැමුණේ ද එලෙස ගත කරන අතරමය. ඉන් නිදහස ලැබීමෙන් පසු එරට 25 වසරක ඉතිහාසයේ පළමුවරට 2015දී පැවැති මහ මැතිවරණයේදී සිය පක්ෂයට (NLD) නායකත්වය දෙමින් විශිෂ්ට ජයග්‍රහණයක් අත්කරදීමට ඇය සමත් වූවාය.

**ධම්මික සෙනෙවිරත්න**






# දකුණු අප්‍රිකාවට පහර දෙන කොරෝනා නව ප්‍රභේද

කවුරුත් මේ දවස්වල වැඩිපුර කතා කරන්නේ කොරෝනා වසංගතය ගැන ය. කොරෝනා ගැන කතා කරන විට ප්‍රස්තුත කරගන්නට අනුමාතෘකා රාශියකි. කොරෝනා මරණ ගණන, කොරෝනා ආසාදිතයන් ගණන, නව ප්‍රභේද, කොරෝනා එන්නත් ඒ අතර ප්‍රධාන ය. කොරෝනා එන්නත් නිපදවීමට පර්යේෂකයන් සහ ඖෂධ සමාගම් සමත්වීම, වසරකට අධික කාලයක් මුළුල්ලේ කොරෝනා වයිරසයෙන් බැට කෑ ලෝකවාසීන්ට මඳ අස්වැසිල්ලක් විණ. කොරෝනා එන්නත් කිහිපයක්ම මේ වනවිට නිෂ්පාදනය කර තිබේ. නිතර නිතර නම කියැවුණු එන්නත් කිහිපයම වාගේ ජනතාවට එන්නත් කිරීමේ කටයුතු ලෝ පුරා දැන් සිදු කෙරේ. එසේ එන්නත් කෙරෙන ඖෂධ අතර ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රසෙනෙකා එන්නතට හිමි වන්නේ සුවිශේෂ තැනකි. එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සහ ඇස්ට්‍ර සෙනෙකා සමාගම එක්ව නිෂ්පාදනය කළ මේ එන්නත ආර්ජන්ටිනාව, සැල්වදෝරය, ඉන්දියාව, මෙක්සිකෝව, බංගලිදේශය, ඩොමිනිකන් ජනරජය, පාකිස්තානය, පිලිපීනය. නේපාලය, බ්‍රසීලය සහ ශ්‍රී ලංකාව ආදී රටවල් රාශියක් භාවිතයට ගැනීම අනුමත කර තිබේ. එසේ වුවත් ඇස්ට්‍රෝසෙනෙකා එන්නත භාවිතය සම්බන්ධයෙන් දකුණු අප්‍රිකා රාජ්‍යයේ ඇත්තේ එයට ඉඳුරාම වෙනස් තත්ත්වයකි.






## සායනික අත්හදා බැලීම්

ඇස්ට්‍රෝසෙනෙකා එන්නත සම්බන්ධයෙන් දකුණු අප්‍රිකාවේ සිදු කළ සායනික අත්හදා බැලීම්වලින් අනාවරණය වී තිබෙන්නේ එම එන්නත එරට ව්‍යාප්ත වන ඇතැම් කොරෝනා වයිරස ප්‍රභේද සම්බන්ධයෙන් එතරම් කාර්යක්ෂම නැති බවකි. 501.V2 හෝ B.1.351 යනු එවැනි කොරෝනා වයිරස ප්‍රභේදයකි. පළමුව කී සායනික අත්හදා බැලීම් සිදු කර තිබෙන්නේ දකුණු අප්‍රිකාවේ විට්වෝටර්ස්රැන්ඩ් සහ එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලවල පර්යේෂකයන් පිරිසකි. මඳ සහ මධ්‍යස්ථ කොරෝනා රෝග ලක්ෂණ මතු කරන ප්‍රභේද සඳහා එම එන්නතේ කාර්යක්ෂමතාව අඩු බව එම පර්යේෂකයෝ පවසති. ඇස්ට්‍රසෙනෙකා එන්නත් භාවිතය සම්බන්ධයෙන් සිදු කෙරුණු සායනික අත්හදා බැලීම් මෙහෙය වූ මහාචාර්ය ශබීර් මාධි පවසන්නේ මෙවැන්නකි.

"අවාසනාවකට වගේ ඇස්ට්‍රසෙනෙකා එන්නත මෘදු සහ සාමාන්‍ය ලක්ෂණ පෙන්නුම් කරන, දකුණු අප්‍රිකාවේ ව්‍යාප්ත වන ප්‍රභේදවලට එරෙහිව වැඩ කරන්නේ නැහැ"

එසේ වුවත් දකුණු අප්‍රිකාවේ ව්‍යාප්ත වන ඉතා බරපතළ රෝග ලක්ෂණ ඇති කරන කොරෝනා වයිරස ප්‍රභේද සම්බන්ධයෙන් ඇස්ට්‍රෝසෙනෙකා එන්නත ක්‍රියාත්මක වන්නට ඉඩ ඇතැයි කියා එරට සෞඛ්‍ය බලධාරීහු විශ්වාසය පළ කරති. තද රෝග ලක්ෂණ මතු කරන කොරෝනා වයිරස් ප්‍රභේද ආසාදනයෙන් රෝහල් ගත කරන්නට සිදු වන රෝගීන් සංඛ්‍යාව සහ ජීවිතක්ෂයට පත් වන සංඛ්‍යාව පහළ දමා ගැනීම සඳහා එම එන්නත භාවිතයට ගත හැකි වේ යැයි ද දකුණු අප්‍රිකා ඇතැම් සෞඛ්‍ය බලධාරීහු විශ්වාසය පළ කරති. වඩාත් බරපතළ රෝග ලක්ෂණ පෙන්නුම් කරන කොරෝනා වයිරස ප්‍රභේද සම්බන්ධයෙන් ඇස්ට්‍රෝසෙනෙකා එන්නතේ බලපෑම කෙසේ ද යන්න පිළිබඳව විධිමත් සොයා බැලීම් සිදු කර නොමැති බව මහාචාර්ය මාධි පවසයි. දකුණු අප්‍රිකාවේ නව කොරෝනා ආසාදනවලින් 90%ක් ම නව ප්‍රභේදයක් නිසා සිදු වන බව පර්යේෂණවලින් සනාථව තිබේ. නව ප්‍රභේදය දකුණු අප්‍රිකාවට බලපාන්නට පටන්ගෙන තිබෙන්නේ එරට කොරෝනා එන්නත් වැඩපිළිවෙළ ආරම්භ කෙරෙන මුල් අවස්ථාවේදීම ය. කෙසේ වුවත් ඇස්ට්‍රසෙනෙකා එන්නත ලබාදීමේ වැඩපිළිවෙළ සෞඛ්‍ය සේවකයන් සඳහා තවදුරටත් ක්‍රියාත්මක ය.

> දකුණු අප්‍රිකාවේ නව කොරෝනා ආසාදනවලින් 90%ක්ම නව ප්‍රභේදයක් නිසා සිදු වන බව පර්යේෂණවලින් සනාතව තිබේ. නව ප්‍රභේදය දකුණු අප්‍රිකාවට බලපාන්න පටන් ගෙන තිබෙන්නේ එරට කොරෝනා එන්නත් වැඩපිළිවෙළ ආරම්භ කෙරෙන මුල් අවස්ථාවේදීමය. කෙසේ වුවත් ඇස්ට්‍රසෙනෙකා එන්නත ලබාදීමේ වැඩපිළිවෙළ සෞඛ්‍ය සේවකයන් සඳහා තවදුරටත් ක්‍රියාත්මක ය.

තදබල රෝග ලක්ෂණ පෙන්වන කොරෝනා රෝගීන් රෝහල් ගත කර ප්‍රතිකාර ලබාදීම වෙනුවෙන් දකුණු අප්‍රිකා රජයට විශාල වියදමක් දරන්නට සිදුව ඇති බව සඳහන් වේ. එයට හේතුව රටේ ජනගහනයෙන් 80%කට අධික සංඛ්‍යාවකට පෞද්ගලික සෞඛ්‍ය පහසුකම් ලබන්නට හැකියාවක් නොමැති වීමයි. එරට රජයේ රෝහල්වලට ඇතුළත්ව ප්‍රතිකාර ලබන කොරෝනා රෝගීන් සංඛ්‍යාව මේ වනවිටත් ඉහළ මට්ටමක පවතී.

ඇස්ට්‍රසෙනෙකා එන්නත භාවිතය සම්බන්ධයෙන් දකුණු අප්‍රිකාවේ මේ වනවිට මතු වී තිබෙන ගැටලුකාරී තත්ත්වය සම්පත් අපතේ යැවීමක්දැයි බොහෝ දෙනෙකු විමසන පැනයකි. එයට පිළිතුරු සපයන දකුණු අප්‍රිකා සෞඛ්‍ය බලධාරීන් පවසන්නේ තමන් නියම කාලයේදී එයට අදාළ විද්‍යාව අත්විඳිමින් සිටින නිසා ඇස්ට්‍රසෙනෙකා එන්නත ලබාදීම සඳහා දරන කිසිදු උත්සාහයක් අපතේ හැරීමක් නොවන බවයි. ඇස්ට්‍රසෙනෙකා එන්නතෙන් ඖෂධ මාත්‍රා මිලියනයක් පමණ දකුණු අප්‍රිකාවට මේ වනවිට ගෙන්වා ගෙන තිබේ. දකුණු අප්‍රිකා බලධාරීන් එම එන්නත් ප්‍රමාණය ලබාදීම සම්බන්ධයෙන් ඉදිරියේදී ස්ථිර නිගමනයකට එළඹෙන්නට නියමිතව ඇත. කොරෝනා එන්නත්වල කාර්යක්ෂමභාවය සම්බන්ධයෙන් නිගමනවලට නොඑළඹෙන මෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය සෑම රටකට ම අනතුරු අඟවා තිබේ.

## අමතර එන්නත්

දකුණු අප්‍රිකා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනත් කොරෝනා එන්නත් තොගයක් නුදුරු අනාගතයේදී සිය රටට ගෙන්වා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් සිටින බව වාර්තා වේ. දකුණු අප්‍රිකා බලධාරීන් සැලසුම් කර තිබෙන්නේ ජොන්සන් ඇන්ඩ් ජොන්සන් සමාගම නිපදවන ලද එන්නත සහ ෆයිසර්/ බයෝඑන්ටෙක් සමාගම නිපදවන ලද එන්නත ගෙන්වා ගැනීම සඳහායි. ජොන්සන් සහ ජොන්සන් සමාගම නිපදවන ලද කොරෝනා එන්නත එක මාත්‍රාවක් පමණක් ලබාදිය යුතු එකකි. එම එන්නතෙන් මාත්‍රා මිලියන නවයක් සහ ෆයිසර්/ බයෝඑන්ටෙක් සමාගම නිපදවන ලද එන්නතෙන් මාත්‍රා මිලියන විස්සක් සිය රටට ගෙන්වා ගැනීමට දකුණු අප්‍රිකා බලධාරීහු ක්‍රියාකරමින් සිටිති.

දකුණු අප්‍රිකාවේ ව්‍යාප්ත වන කොරෝනා වයිසර ප්‍රභේදය සඳහා ඇස්ට්‍රසෙනෙකා එන්නත සාර්ථක නොවීම, දකුණු අප්‍රිකාවේ පවත්නා වත්මන් තත්ත්වය කෙරෙහි අයහපත් බලපෑමක් ඇතිකරන්නක් බව සෞඛ්‍ය බලධාරීහු සඳහන් කරති. දකුණු අප්‍රිකාවේ මේ වනවිට ව්‍යාප්ත වෙමින් පවතින්නේ කොරෝනා දෙවන රැල්ලයි. එරට ජනගහනයෙන් මිලියන 1.5කට අධික පිරිසක් කොරෝනා වයිරසයෙන් ආසාදිත තත්ත්වයට පත්ව සිටිති. කොරෝනා මරණ 46,000ක් පමණ එහි සිදුව ඇත.

බී.බී.සී. ඇසුරෙනි

**මංජුලා විජයරත්න**






# නොදන්නා සේ සිටින දැනුම්වත් ව්‍යසන

ඉකුත් වසරේ මැද කාර්තුවේ පැවැති පුවත්පත් සාකච්ඡාවකදී කැලිෆෝනියාවේ ආණ්ඩුකාරවරයා වූ ගැවින් නිව්සෝම් විසින් අතිශය වැදගත් කාරණාවක් හෙළි කරන ලදී. ඒ ලැව්ගිනි සම්බන්ධයෙනි. ඒ, කැලිෆෝනියා ප්‍රාන්තයේ පමණක් 'දැනුවත්' ලැව්ගිනි 367ක් ඇතිව තිබෙන බවයි. මේ දැනුවත් සහ නොදැනුවත් වචන ද්විත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කළහොත් දැනුවත්ව ඇතිවන ලැව්ගිනි දිගේ තොරතුරු සොයා ගිය විට ඒ තත්ත්වය වර්ධනය වෙමින් පවතින බවත් සොයාගන්නට ලැබී ඇත. එනම් 367ක අගය 560 දක්වා ඉහළ ගොස් තිබෙන බවයි. අතොරක් ලැව්ගිනි තවමත් ඇවිලෙමින් පවතී. සැන්ට රෝසාට උතුරින් පිහිටි ස්ථානයක ඇවිළුණු ලැව්ගින්න ඒ අතරින් විශාලම ගින්න ලෙස ද සැලකේ. අක්කර 491,000කට වඩා වැඩි භූමි ප්‍රමාණයක් අළු කර දමමින් ඇවිළුණු මේ ලැවගින්නේ බලපෑම උතුරු කැලිෆෝනියාවට ආසන්නයේ පිහිටි රටවලට පවා බලපා ඇත. ගින්නෙන් නැගුණු දුම නව එංගලන්තයේ අහස වසා පැතිර ඇත. පසුගිය නොවැම්බරයේ සිට කැලිෆෝනියාවේ පැතිර ගිය ලැව්ගිනිවලින් පුද්ගලයන් 31 දෙනකු මරණයට පත්ව ඇති අතර, උන් හිටි තැන් අහිමි වූ ප්‍රමාණය දහසකට අධිකය.

ගිනි නිවන භටයන් 15,000ට ආසන්න පිරිසක් ගිනි නිවීමේ ක්‍රියාවලියේ නිරතව සිටින අතර, ලෝරා සුළි කුණාටුව ද ලුසියානා ප්‍රදේශය ආක්‍රමණය කළේය. එය මෙක්සිකෝ බොක්ක පසු කරන විටත් වාර්තාගත වේගයක් සලකුණු කර තිබුණි. පැය 24ක් ඇතුළත ලුසියානා කුණාටුව පළමු කාණ්ඩයේ සිට හතර වැනි කාණ්ඩය තෙක් ස්වයං උසස්වීමක් පවා ලබා තිබුණි. මේ කුණාටුව කැමරින් පැරිෂ් වෙත ළඟා වන විට ඇමරිකානු ඉතිහාසයේ දරුණුම නාය යාම් සිදු කළ පස්වැන්නා බවට පත්ව තිබුණි. කුණාටු හේතුවෙන් අවමයෙන් මරණ 16ක් සහ ඩොලර් බිලියන 12ක හානියක් සිදු වී තිබුණි.

මින් වසර විස්සකට පමණ පෙර එනම් මෙවන් ලැව්ගිනි හෝ සුළි කුණාටු වර්ගයේ අර්බුදකාරී තත්ත්ව සඳහා 'ස්වභාවික විපත්' යන යෙදුම භාවිත වුණි. එහෙත් මේ වන විට තත්ත්වය සහමුලින්ම වෙනස් වී ඇත. දේශගුණික විපර්යාස ආදිය හේතුවෙන් මෙවැනි ව්‍යසන සඳහා තව දුරටත් ස්වභාවික විපත් යන්න යෙදිය නොහැක. මේ සියල්ලට මිනිසුන්ගේ ක්‍රියාකාරී මැදිහත් වීම ද බලපා ඇත. මිනිසා විසින් දැනුවත්ව හෝ නොදැනුවත්ව පරිසරයට කළ හානියේ ප්‍රතිවිපාක බූමරංගයක් සේ යළිත් කැරකී තමන් වෙතම පැමිණෙමින් තිබේ.

නිව්සෝම් පුවත්පත් සාකච්ඡාව පැවතෙන අතරතුර මරණයේ නිම්නයේ රසදිය මට්ටම ෆැරන්හයිට් 10 දක්වා ඉහළ ගියේය. උණුසුම් මෙන්ම අතිශය වියළි කැලිෆෝනියාවේ ගිනි දැල් පුපුරා යාමට ඇති ඉඩකඩ බොහෝ වැඩිය. මේ භයානක තත්ත්වය සමඟ ගල්ෆ් කලාපය ද උණුසුම් වෙමින් පවතී. එමගින් ඇති විය හැකි අතුරු ඵල ද බොහෝය. සුළි කුණාටු තමන්ගේ ශක්තිය උරා ගන්නේ පෘෂ්ඨීය ජලයේ උණුසුමෙනි. උණුසුම වැඩි වන තරමට කුණාටුවට අමතර ශක්තියක් ද උපයාගත හැකිය. මෙකී සියලු ව්‍යසනවලට අලුත් නාමයක් එකතු කිරීම යුක්ති යුක්තය. මිනිසා විසින් සාදන ලද ස්වභාවික විපත් යන්න ඊට හොඳින්ම ගැළපේ. මන්දයත් මිනිසා කළ හානිය සොබාදහමට පවරා අත් පිසදා ගැනීම කිසිසේත්ම සාධාරණ නොවන හෙයිනි.

මිනිසා විසින් මේ වන විට පෘථිවිය අත්පත්කරගෙන සිදු කරන බොහෝ ක්‍රියාකාරකම් මේ සියල්ලේම මූලය බවට නම් කළ හැකිය. වඩාත් සරලව කිවහොත් දැන් අප ජීවත් වන්නේ නව භූ විද්‍යාත්මක යුගයක යැයි කිව හැකිය. වනාන්තර කපා දැමීම, පතල් කැණීම, නගර තැනීම ආදී ක්‍රියාකාරකම්වලින් අයිස් රහිත භූමියෙන් අඩක් අපට ඕනෑ හැටියට පරිවර්තනය කරගෙන ඇත්තෙමු. නියතව කිවහොත් පෘථිවියෙන් අඩක් අපට ඕනෑ හැටියට යළි නිර්මාණය කරගෙන දැන් අවසන්ය.

වන සත්ව ගහනයට වඩා 8 සිට 1 දක්වා අනුපාතයෙන් මිනිස් ගහනය වැඩිකරගෙන ඇත්තේ ද මිනිසාමය. මේ ස්වභාවික වරණය ඉක්මවා යාමකි. මිනිසා සහ සොබාදහම අතර තිබූ සමබර බව බිඳ දැමීමට මිනිසා ඉදිරියට පැමිණීම අතිශය කනගාටුදායකය. බොහෝ භූ කම්පන ආදියේ ශක්තිය පවා දැන් දැන් වැඩිව පවතින්නේ මේ අසමබරතාව ගැන මිනිසාට අවසන් ඉඟි සපයන්න විය හැකිය. වනාන්තර ගහනය අඩු වීම පිළිබඳ විටින් විට රතු එළි නිකුත් වූවත් ඒ කිසිවක් ගැන අතිශය බුද්ධිමත් යැයි උදම් අනන මිනිසාට වගේ වගක් නැති බවක් පෙනෙන්නට තිබේ. මිනිසා සුපිරි මිනිසකු බවට පත් වන්නට යන මේ ගමනේදී එකී සුපිරි මිනිස් කාණ්ඩය මිස, සොබාදහම ඉතිරිව නොපවතින බවට අනුමාන මතුවෙමින් පවතින්නේ මෙබැවින් විය හැකිය.

මේ සියල්ල අතරතුර කොරෝනා වසංගතය ලෝකය ආක්‍රමණය කිරීම මෙහිම දිගුවක් ලෙස සැලකිය හැකි බව කිව යුතුය. වවුලන්ගෙන් ප්‍රභවය වූවා යැයි පැවසෙන මේ වසංගතය චීනයේ වූහාන් ප්‍රදේශයෙන් සෙසු ප්‍රදේශවලට පිම්මක් පැන අතිශය ශීඝ්‍රයෙන් පැතිරුණි. අතීතයේ මීට සමාන සිදුවීම් වාර්තා වී ඇතත් මෙවන් පැතිරීමක් සහ භයානක බවක් වාර්තා වී නොමැත. සතුන් සහ මිනිසුන් අතර සම්බන්ධය සේම එකිනෙකාට රෝග පැතිරීම සම්බන්ධයෙන් ගැඹුරු කතිකාවතක් ඇති කළ මුත් පවතින තත්ත්වය යටතේ ලෝකය වසංගතයකින් නෂ්ඨව යාම වළක්වා ගැනීමට දැන් සිදු වී ඇත. එනම් තත්ත්වය අතිශය භයානකය. ශීඝ්‍ර දියුණුවත්, නව තාක්ෂණ ක්‍රමවේදත් මිනිසාට ගෙනා යහපත අභිභවා අයහපත රැගෙන විත් ඇත් දැයි නතරව සිතා බැලීමට කාලය පැමිණ ඇතැයි හැඟේ. එහෙත් අසීමිත දිවීමක නිරත වෙමින් සිටින මිනිසාට මොහොතක් නතරව සිතීමට කාලයක් ඉතිරිව තිබේ දැයි දැන් සැකසහිතය. තමන් විසින් පරිසරයට සේම තම වර්ගයාටම කළ අනර්ථ පිළිසකර කිරීමට වෙහෙසෙන මිනිසාට තමන් කළ අනර්ථ පිළිබඳ තැවීමේ කාල පරිච්ඡේදය ඉක්මවා ගොස් ඇත් සැටියකි.

අතීතයේ නම් මෙවන් වසංගතයක් රටකින් රටකට සංක්‍රමණය වීමට වසර ගණන් ගත වේ. එහෙත් මේ වන විට උද්‍යසන ප්‍රභවය ලැබූ වසංගතයක් සවස ප්‍රවෘත්ති විකාශය අතරතුර වෙනත් රටකට සංක්‍රමණයව මහත් හානියක් සිදු කළ හැකිය. කොවිඩ්-19 සම්බන්ධයෙන් සිදු වූයේ ද එවැන්නකි. අති දියුණු ලෝකයට වසංගතය ද අති දියුණු ආකාරයෙන් වෙනත් තැන්වලට නොදැනුවත්වම ගෙනගොස් කර ඇත. චීනයෙන් වසංගතය වාර්තා වී මාසයක් සපිරෙන විට සෙසු රටවල් 26ක් වෙත වසංගතය විතැන්ව තිබුණි.

මිනිසා විසින් සාදන ලද ස්වභාවික ව්‍යසන කුමන මොහොතක, කොතැනකින් පැන නඟී දැයි අනාවැකි කිව නොහැක. එහෙත් එහි ප්‍රභවය සිදු වන්නේ කෙලෙසක දැයි නිශ්චිතවම කිව හැකිය. මිනිසා විසින් සතුන්ගේ වාසස්ථාන විනාශ කරමින්, ඒවා ආක්‍රමණය කරමින් ලෝකය පුරා තමන්ගේ බලය තහවුරු කර ගනිමින් ඇවිදින විට මෙවන් වසංගත පැතිරීම අමුත්තක් නොවනු ඇත.

ඩේවිඩ් ක්වාමන් පවසන ආකාරයට "අප පරිසර පද්ධති කඩාකප්පල් කරන අතර, ඔවුන්ගේ ස්වභාවික ධාරකයන්ගෙන් වයිරස ලිහිල් කරන්නෙමු. එය සිදු වූ විට ඔවුන්ට නව සත්කාරක සමාගමක් අවශ්‍ය වේ. බොහෝවිට එම නව සත්කාරක සමාගම බවට පත් වන්නට සිදු වන්නේ අපටය."

ඒ අතරම දේශගුණය දිගින් දිගටම උණුසුම් වන විට ගැටුම ඊට වඩා දරුණු වේ. කැලිෆෝනියාවේ පමණක් දිගින් දිගටම ඇති වන ලැව්ගිනි කාලගුණ සංඛ්‍යාතය පසුගිය දශක හතර තුළ දෙගුණයකට වඩා වැඩිව ඇත. එය ශතවර්ශය අවසානය වන විට නැවතත් දෙගුණයක් විය හැකි බවට විශ්ලේෂකයන් විසින් අනතුරු අඟවා ඇත. මෙතැන් සිට ඉදිරියට ඇති වසර දහය හෝ විස්ස පුරා පසුගිය වසරේ වාර්තාගත ගිනි ගැනීම් සහ ගංවතුර ආදිය නව වාර්තා තබනු ඇත. ටෙක්සාස් හි ඒ ඇන්ඩ් එම් විශ්වවිද්‍යාලයේ වායුගෝලීය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයකු වන ඇන්ඩෘ ඩෙස්ලර්ට අනුව "2020දී සිදු වූ සියලු දේශගුණික විපත්වලට ඔබ අකමැති නම්, ඔබේ ජීවිතයේ ඉතිරි කාලය ගැන කීමට මට නරක ආරංචියක් තිබේ."

මේ නරක ආරංචිය අපට කොතෙක් කාලයක් මුළුල්ලේ නොසලකා සිටීමට හැකි දැයි කිව නොහැක. තත්ත්වය එසේ වී නම් අප කළ යුත්තේ කුමක්ද? ස්වභාවික ලෝකයේ මානව මැදිහත්වීම සමඟ කටයුතු කිරීමට ඇති හොඳම ක්‍රමයත් මැදිහත් වීමයි. පැරණි තාක්ෂණය සමඟ කටයුතු කරමින් සිටි මිනිසාව නව තාක්ෂණය පැමිණ දැන් මේ සිටින තත්ත්වයට ඇද දමා ඇතැයි යන්න එක් තර්කයකි. පරිගණක තාක්ෂණයේ සිට ජාන විද්‍යාව, භෞතික විද්‍යාව තෙක් ඇති සියලුම ක්ෂේත්‍රවල ඇති වූ අසාමාන්‍ය වූත්, වේගවත් වූත් දියුණුව මීට මූලික හේතුව බව එම තර්කයේම දිගුවකි.

ජාන සංස්කරණ කටයුතු, නව උපකරණ ආදිය මීට හොඳම උදාහරණය. කොටින්ම කාබන්ඩයොක්සයිඩ් වාතයෙන් උරා ගැනීමට ඉංජිනේරුවන් විසින් යන්ත්‍රයක් පවා නිපදවා ඇත. තවත් ඉදිරියට මෙවන් යන්ත්‍ර ඇන්ඩ්‍රොයිඩ් ඇප්, ඇපල් දුරකතන තරම් සුලබ වනු ඇත. අසීමිත අවස්ථා මඟින් සියල්ල සුලබ කළ යුගයක අප සොබාදහම ගැන නොතැකීම ද එක්තරා අතකින් අරුමයක් නොවේ. ස්වභාවික වරණය නොසලකා අපට ගමන් කළ හැකි දුර කොතරම් දැයි දැන් සිතා බැලිය යුතුය. කෘත්‍රිම ලෝකයක උවමනාව විද්‍යා ප්‍රබන්ධයක් තරම් මායාමය ලෝකයකට අපව රැගෙන යනු ඇති ද? ඒ මායා ලෝකයෙන් අවදිව පොළොව මත ඇවිදයාමට නුවමනා ද?

විකල්ප යෝජනාව ලෙස ඇති හිරු කිරණ සමහරක් අවහිර කිරීමෙන් දේශගුණික විපර්යාසවලට ප්‍රතිවිරෝධය දැක්විය හැකි වීම තවමත් විවාදාපන්නය. පර්යේෂකයන් විසින් වලාකුළු දීප්තිමත් කිරීමට නව තාක්ෂණය සමඟ කටයුතු කරමින් හිඳියි. එමඟින් වැඩි හිරු එළියක් අභ්‍යවකාශයට විහිදිය හැකිය. මෙය 'සූර්ය භූ ඉංජිනේරු විද්‍යාව' ලෙස හඳුන්වා දී ඇත. මේ තර්කවලට ප්‍රතිවිරුද්ධ අදහස් ද රාශියක් ඉදිරිපත් වී ඇත. මෙකී 'සූර්ය භූ ඉංජිනේරු විද්‍යාව' උන්මන්තක අදහස් ගොන්නක් ක්‍රියාවේ යෙදවීමක් බව ප්‍රතිවිරුද්ධව අදහස් දක්වන්නෝ පවසා සිටිති.

දැන් අපට මුහුණ දෙන්නට සිදුව ඇත්තේ සොබාදහමට එරෙහිව අත්තනෝමතිකව ක්‍රියා කරන මිනිසාට මිස සොබාදහමේ හැසිරීමට නොවේ. වඩාත් විහිළු සහගත වන්නේ මේ සොබාදහමට එරෙහිව ක්‍රියා කරන මිනිසාට එරෙහි වන්නේ ද මිනිසුන්ම වීමයි. නව යුගයක, නව මෙවලම් සමඟ කෙරෙන මේ සටනින් කුමන පාර්ශ්වය ජය ගනු ඇති දැයි දැන් අපට බලා සිටිය හැකිය. එසේත් නැත්නම් තනි තනිව සොබාදහමට හානි කිරීම නවතා දැමීමට නිශ්ශබ්ද එකඟතාවකට අපට පැමිණිය හැකිය.

නැෂනල් ජියොග්‍රැෆික් ඇසුරෙනි

**කාංචනා අම්ලානි**

# දේශපාලන පොරපිටිය උණුසුම් කරන චරිත දෙකක් BMICHහිදී එක් වී ප්‍රදර්ශනයක් විවෘත කරති

**මහින්ද අලුත්ගෙදර**




Be Sri Lanka Buy Sri Lanka සහ Lanka pack ප්‍රදර්ශන විවෘත කිරීම ඇමැතිවරුන් වන විමල් වීරවංශ සහ ප්‍රසන්න රණතුංග මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ, සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී ඊයේ (12) සිදුකෙරිණි.

ඒ අනුව Be Sri Lanka Buy Sri Lanka ප්‍රදර්ශනය විවෘත කිරීමට ප්‍රධාන ආරාධිතයා ලෙස සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සහභාගි වූ අතර Lanka pack සමුළුව හා ප්‍රදර්ශනයේ කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණි.

කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පසුගිය සතිඅන්ත පුවත්පතකට කළ ප්‍රකාශයක් පිළිබඳ මේ වනවිට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආණ්ඩුවේ උණුසුම් කතාබහක් නිර්මාණය වී තිබෙන අතර පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේ දී සංචාරක ඇමැතිවරයා විසින් විමල් වීරවංශ මහතාගේ ප්‍රකාශය දැඩි ලෙස විවේචනය කළ පසුබිමක ඇමැතිවරුන් දෙදෙනා මුණ ගැසීම විශේෂත්වයකි.

මේ ඇමැතිවරුන් දෙපළ කොළඹ, සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැති ප්‍රදර්ශන දෙකක සමාරම්භක අවස්ථාවක දී මුණ ගැසුණු අතර ප්‍රථමයෙන් පැමිණි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා විනාඩි කීපයක් ඇමැති විමල් වීරවංශ මහතා පැමිණෙන තුරු රැඳී සිටිනු ද දක්නට ලැබිණි.

විමල් වීරවංශ මහතා පැමිණීමෙන් පසු දෙදෙනාම එක්ව ප්‍රදර්ශන විවෘත කිරීමේ අවස්ථාවට එක්වූ අතර එය සුවිශේෂී අවස්ථාවක් බවට පත්වූයේ දේශපාලන පොරපිටියේ මේ වනවිට මතුව ඇති උණුසුම් කතාබහ හේතුවෙන් බවද විචාරකයෝ පෙන්වා දෙති.

**දුෂ්මන්ත මායාදුන්න**

# මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මානයක් ඉරණතිව්හි පිහිටුවීම හෙට

**බුද්ධිකා ඉඹුලාන**

මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මානයක් ඉරණතිව්හි පිහිටුවීම හෙට (14) ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ඉරණතිව් දූපත ආශ්‍රිතව ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරන මේ ව්‍යාපෘතිය දේශීය ආයෝජකයන් දිරි ගන්වමින් උතුරු ප්‍රදේශයේ පවතින ධීවර සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කරගෙන සිදු කෙරෙයි. මෙරටට විනිමය ගෙන එමින් ආර්ථිකය නංවාලීමට සවියක් වීමටද මෙයින් අපේක්ෂිතය .

මෙමගින් උතුරු ප්‍රදේශයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංවර්ධනයත් එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීමත්, සිදු වන අතර ධීවර පවුල් 83ක පුද්ගලයන් 500කට වැඩි පිරිසකට සෘජු හා වක්‍ර රැකියා මෙයින් උදාවෙයි. මෙරට වාර්ෂික අපනයන ආදායමට රුපියල් මිලියන 200ක ආදායම් ජනිත කිරීමටද මේ ව්‍යාපෘතියෙන් හැකිවනු ඇතැයි ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා විශ්වාසය පළ කරයි.

# ගම්පහ සමුප රෝහලේ මහා සභා රැස්වීම කල් යයි

**ගම්පහ දිස්ත්‍රික් විශේෂ - සිසිල ගුණතිලක සහ ගම්පහ මධ්‍යම සමූහ - ඔලිවර් පෙරේරා**

ගම්පහ සමුපකාර රෝහලේ මහා සභා රැස්වීම හෙට (14) ගම්පහ සුමේධ විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර, එය කොවිඩ් වසංගතය හා සෞඛ්‍ය හේතූන් මත දින නියමයක් නැතිව කල් දමා ඇති බව ගම්පහ සමුපකාර රෝහලේ සභාපති ලසන්ත නදීර කපුරුබණ්ඩාර මහතා සියලුම සාමාජික සාමාජිකාවන්ට දැනුම් දෙන බව පැවසීය.

# කොටස් වෙළෙඳපොළේ වත්මන් තත්ත්වය ගැන සාකච්ඡාවක්

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC) සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) පෙරේදා (11) පස්වරුවේ කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් හමු වී කොටස් වෙළෙඳපොළේ වර්තමාන තත්ත්වය පිළිබඳ සාකච්ඡාවක් පවත්වා තිබේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මගින් ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් රැස්වීමට සහභාගි වූ ප්‍රධාන පාර්ශ්වයන් සහ කොටස් තැරැව්කරුවෝ සිය අදහස් ප්‍රකාශ කළහ.

# කොරියානු භාෂා පාඨමාලා ශිෂ්‍යත්ව ප්‍රදානය අද

**ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ**

කොරියානු රජයේ රැකියා බලාපොරොත්තුවෙන් සිටින තරුණයන්ට කොරියානු භාෂාව ඉගෙන ගැනීමට ශිෂ්‍යත්වයක් පිරිනැමීමට මොනරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය ගයාෂාන් නවනන්ද මහතා පියවර ගෙන ඇත. ඒ අනුව එම වැඩපිළිවෙළ යටතේ එක් තරුණයකු වෙනුවෙන් රුපියල් 12,000ක ශිෂ්‍යත්වයක් පිරිනැමීමට නියමිතය. ශිෂ්‍යත්ව පිරිනැමීම අද (13) පෙ.ව 9:00ට මොනරාගල දිස්ත්‍රික් පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. මේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ පදිංචි තරුණයන් පන්දහසකට අදියර කීපයක් යටතේ ශිෂ්‍යත්ව පිරිනැමේ.


## ධන නිධානය නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනය - 2021/02/11
දිනුම් වාරය - 432

G 32 53 63 82

ඉංග්‍රීසි අක්ෂරය | ජයග්‍රාහී අංක

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 04 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 83 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 220 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 5554 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 3598 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 94344 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 17579 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු 3,878,740.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 121,382

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
රු. 81,303,976.00

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324


# සාලියවැව ජයටම බොරලු ජාවාරමක්

## ප්‍රාදේශීය දේශපාලනඥයකුත් හවුල්

## නීතිය රකින ආයතනත් සහාය දීලා

**මිහිර විජේසේකර - මාරවිල සමූහ**

සාලියවැව පොලිස් වසමට අයත් රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ පෞද්ගලික ඉඩම්වල නීති විරෝධීව සිදුකරන බොරලු කැපීමේ ජාවාරමක් ප්‍රාදේශීය දේශපාලනඥයකුගේ මැදිහත්වීමෙන් සිදුවන බව හා ඊට නීතිය ක්‍රියාත්මක නොවීම ගැටලු සහගත බවත් ප්‍රදේශවාසීහු චෝදනා කරති.

කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සාලියවැව අංක 638 රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පෞද්ගලික ඉඩම්වල සති ගණනක සිට මෙසේ නීති විරෝධී ලෙස කිසිදු බලපත්‍රයක් නැතිව බොරලු කපා ප්‍රවාහනය කරමින් සිටින බවද ගම්මු පෙන්වා දෙති.

ඔවුන් චෝදනා කරන්නේ අදාළ නීති විරෝධී බොරලු කැපීමේ ජාවාරම ප්‍රදේශයේ පෞද්ගලික හිමිකරුවන් සතු පදිංචි වී නැති ඉඩම්වල ප්‍රාදේශීය දේශපාලනඥයකු විසින් සිදු කරන බවයි.

මේ අනුව රණවරාපිටිය ග්‍රාම නිලධාරි වසමේ පමණක් ස්ථාන දෙකක ඉඩම්වල මෙසේ කිසිදු අවසරයකින් තොරව බොරළු කැපීම සිදු කෙරේ.

මේ නීති විරෝධී බොරලු කැපීම පිළිබඳ අදාළ ග්‍රාම නිලධාරි වසම භාර ග්‍රාම නිලධාරිනිය වන ඩී.එම්.එන්. නිල්මිණී මහත්මිය පැවසුවේ බොරලු කැපීම කිසිදු අවසරයකින් තොරව නීති විරෝධීව පෞද්ගලික ඉඩම් වල සිදුව ඇති බවයි.

මේ සඳහා අපේ ආයතනයෙන් කිසිම අවසරයක් දී නැහැ. එය නීති විරෝධී කටයුත්තක්. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් ජනක තුෂාර බාලසූරිය මහතාගෙන් කළ විමසීමේදී ඔහු එසේ පැවසීය.

කෙසේ නමුත් සාලියවැව පොලිස්ථානාධිපතිවරයා පවසා සිටියේ කරුවලගස්වැව 17 කණුව දුටුගැමුණු විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සකස් කිරීමට බොරලු අවශ්‍ය හේතුවෙන් ඒ සඳහා අවස්ථාව ලබාදුන් බවයි.

මේ පිළිබඳව දුටුගැමුණු විද්‍යාලයේ විදුහල්පති ගොටුවැව සීලෝභාස හිමියන්ගෙන් කළ විමසීමේදී උන්වහන්සේ පැවසුවේ සතියකට වැඩි කාලයකදී තම පාසලට බොරලු කියුබ් කීපයක් ලබාදුන් බවයි.

එහෙත් ගම්මු චෝදනා කරන්නේ අදාළ ආයතනවල අනුග්‍රහයෙන් සතිදෙකක කාලයක් පුරා මේ ජාවාරම සිදු වූ බවයි.



බොරලු කපා ඇති අයුරු.


## 2021-02-11 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 720,121

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 32,093,590.00

රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 02 රු. 100,000.00 ත්‍යාග 33

www.nlb.lk

NLB NATIONAL LOTTERIES

## මෙගා පවර් - දිනුම් වාරය 762 නිල ප්‍රතිඵල

ට්‍රිපල් ජෝකර් Mega POWER මෙගා පවර් மெகா பவர்

දිනය: 2021.02.11

ඔබ දිනවන ඔබේ විශ්වාසය

ඉංග්‍රීසි අකුර: D | සුපිරි අංකය: 12 | ජයග්‍රාහී අංක: 32 50 54 73

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | 01 |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 03 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 97 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 213 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 4998 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 3294 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 81002 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 14868 |

ලංකාවේ විශාලතම සුපිරි ත්‍යාගය පිරිනැමූ ලොතරැයියයි...

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 65,727,420.80

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 20,527,409.20

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 32,458,982.00

දිනා ඇති මුළු මුදල රු. 4,052,460.00

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

## වාසනා සම්පත

வாசனா சம்பத Vasana Sampatha

එදත් අදත් සූරයා

නිල ප්‍රතිඵල
දිනුම් වාරය 1665
දිනය 2021.02.11

C 04 41 55 60

| ත්‍යාගය | ත්‍යාග රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 ත්‍යාගය | අංක 4 පමණක් ගැළපේ නම් | 1,000,000/- | - |
| 02 ත්‍යාගය | අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000/- | 07 |
| 03 ත්‍යාගය | අංක 3ක් පමණක් ගැළපේ නම් | 2,000/- | 80 |
| 04 ත්‍යාගය | අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500/- | 162 |
| 05 ත්‍යාගය | අංක 2ක් පමණක් ගැළපේ නම් | 100/- | 3,733 |
| 06 ත්‍යාගය | අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 60/- | 2,285 |
| 07 ත්‍යාගය | අංක 1ක් පමණක් ගැළපේ නම් | 20/- | 57,182 |
| 08 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20/- | 9,609 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,787,220.00

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය රු. 26,775,837.90

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.

රුපියල් ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි.

## ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2690 | දිනුම් අදින ලද දිනය 2021 / 02 / 11

ඉංග්‍රීසි අක්ෂරය: V | ජයග්‍රාහී අංක: 54 59 64 78

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | 01 |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 06 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 177 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 428 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 10228 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 6734 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 167973 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 30617 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 216,164

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,645,960.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 62,339,389.20

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6කෙ කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

## මහජන සම්පත - දිනුම් වාරය - 4395 නිල ප්‍රතිඵල

දිනය: 2021-02-11

ජයග්‍රාහී අක්ෂරය: R | ජයග්‍රාහී අංක: 2 3 9 5 7 1

ත්‍යාග රටාව - අග සිට මුලට

| | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | | 2 | 3 | 9 | 5 | 7 | 1 | රු. 2,000,000/- | 02 |
| 2 වැනි ත්‍යාගය | | | 3 | 9 | 5 | 7 | 1 | රු. 100,000/- | 13 |
| 3 වැනි ත්‍යාගය | | | | 9 | 5 | 7 | 1 | රු. 10,000/- | 128 |
| 4 වැනි ත්‍යාගය | | | | | 5 | 7 | 1 | රු. 1,000/- | 1290 |
| 5 වැනි ත්‍යාගය | | | | | | 7 | 1 | රු. 100/- | 12774 |
| 6 වැනි ත්‍යාගය | | | | | | | 1 | රු. 20/- | 126338 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | | | | | | | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | | 2 | 3 | 9 | 5 | 7 | | රු. 10,000/- | 15 |
| 8 වැනි ත්‍යාගය | | 2 | 3 | 9 | 5 | | | රු. 1,000/- | 137 |
| 9 වැනි ත්‍යාගය | | 2 | 3 | 9 | | | | රු. 100/- | 1284 |
| 10 වැනි ත්‍යාගය | | 2 | 3 | | | | | රු. 50/- | 12615 |
| 11 වැනි ත්‍යාගය | R | | | | | | | රු. 20/- | 50445 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 13,729,210.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 13,153,427.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

## රන්කිරණ තරාදි (ඩෙන්සිමීටර්/ ඝනකමානය) සඳහා මිල ගණන් කැඳවීම

සීමා සහිත ගිනිගත්හේන විවිධ සේවා සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු සඳහා රන් කිරන තරාදි (ඩෙන්සිමීටර්) මිලදී ගැනීමට මිල ගණන් කැඳවනු ලැබේ..

* **මිළ**
* **වගකීම් කාලය**
* **පෙන්නුම් කරන අවම හා උපරිම කැරට් ප්‍රමාණය**
* **නඩත්තු කටයුතු සිදුකිරීම**

යනාදි සියලු තොරතුරු ඇතුළත් කරමින් ලිපි කවරයේ ඉහළ කෙළවරේ **"ඩෙන්සිමීටර් සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන්කර, 2021-02-25 දිනට පෙර පහත ලිපිනයට මිල ගණන් යොමු කළ යුතුය.

**ගරු සභාපති,**
**සී/ස ගිනිගත්හේන වි.සේ.ස. සමිතිය,**
**ගිනිගත්හේන.**
**දු.අංකය : 051-2242119**

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## බිංගිරිය අපනයන සැකසුම් කලාපය
## මිල ගණන් කැඳවීම

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් බිංගිරිය අපනයන සැකසුම් කලාපය පිහිටා ඇති ජර්මන්වත්ත නැමැති ඉඩමෙහි කපා ගොඩ ගසා ඇති ගස් ඉවත් කර ගැනීම**

01. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් බිංගිරිය අපනයන සැකසුම් කලාපය පිහිටා ඇති ජර්මන්වත්ත නැමැති ඉඩමේ ඇති විවිධ වර්ගයේ දැවමය වටිනාකමක් සහිත මුලින් කපා ගොඩගසා ඇති ගස් ඉවත් කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. කපා ගොඩගසන ලද ගස් භූමියෙන් රැගෙන යා යුතු කාල සීමාව දින 30 කි.

02. ඉහත ප්‍රසම්පාදනය සඳහා ජාතික තරගකාරී ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබේ.

03. මේ පිළිබඳව විස්තර පත්‍රිකා කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ, බටහිර කුළුණේ, 5 වන මහලේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්මික සේවා දෙපාර්තමේන්තුවෙන් සහ බිංගිරිය ජර්මන්වත්තෙහි පිහිටා ඇති ආයෝජන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන්, 2021.02.15 වෙනි දින සිට 2021.03.01 දින දක්වා සතියේ සාමාන්‍ය වැඩකරන දිනයන්හිදී පෙ.ව. 09.00 සහ ප.ව. 04.00 අතර කාලයේදී ආපසු නොගෙවන රු. 500.00 ක මුදලක් සහ අදාළ වැට් මුදල 8 වන මහලේ, මුදල් දෙපාර්තමේන්තුවේ මුදල් අයකැමි වෙත හෝ ඕනෑම ලංකා බැංකු ශාඛාවක ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නමින් ගිණුම් අංක 1431688 හි තැන්පත් කර කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැක. මේ සඳහා වැඩි විස්තර කාර්මික නිලධාරී (බිංගිරිය අපනයන සැකසුම් කලාපය) දුරකථන අංක 032-2241376 / 0719929605 හෝ සහකාර අධ්‍යක්ෂ (කාර්මික සේවා) 011-2427278 මගින් ලබාගත හැක.

04. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නමින් ලංකා බැංකු ශාඛාවක තැන්පත් කරන මුදල් සඳහා කුවිතාන්සියේ පිටපතක් එදිනම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුදල් දෙපාර්තමේන්තුවට, යොමුව අධ්‍යක්ෂ (මුදල්) ලෙස සඳහන් කර ෆැක්ස් අංක : 011-2544358 හෝ enokag@boi.lk නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) වෙත දන්වා යැවීමෙන් ගෙවීම් යාවත්කාලීන කළ යුතුය.

05. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ (කාර්මික සේවා), භාරේ, කාර්මික නිලධාරී, බිංගිරිය අපනයන සැකසුම් කලාපය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, වතුවත්ත, දුම්මලසූරිය යන ලිපිනයට 2021.03.02 දින ප.ව. 2.30 ට පෙර භාර දීමට කටයුතු කළ යුතුය. ලංසු කාලය 2021.03.02 **දින ප.ව. 2.30 ට** අවසන් වන අතර, ප.ව. 2.30 පසු ලැබෙන ලංසු භාරගනු නොලැබේ. නියමිත කාලයට හෝ එයට පෙර ලැබී ඇති ලංසු කාලය අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසු ඉදිරිපත් කළ පාර්ශවයන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය.

06. ඉදිරිපත් කරනු ලබන ලංසු 2021.03.02 දින සිට දින 60 ක් වලංගු විය යුතුය.

07. ඉදිරිපත් කරනු ලබන සෑම ලංසුවක් සමගම ලංසු සුරක්ෂිතතාව ලෙස රු. 10,000.00 ක ඇප තැන්පතුවක් ඉහත අංක (3) හි සඳහන් පරිදි ගෙවීම් කර කුවිතාන්සියේ මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතු අතර, එය දින 90 කට වලංගුව පැවතිය යුතුය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සාර්ථක ලංසුකරු තෝරාගත් පසුව මෙම ඇප මුදල නිදහස් කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

## ලුහුඬු දැන්වීම්


විවිධ


406
ගෘහ භාණ්ඩ
විකිණීම

ගෘහ භාණ්ඩ විකිණීමට තිබේ. (අඩුම මිලට) තවත් ගෙවලට අවශ්‍ය කරන බඩු. අමතන්න. 0729193467 010980


නිවාස හා ඉඩම්

616
ගේ දෙර ඉඩකඩම්
කොළඹ
දිස්ත්‍රික්කය
විකිණීමට

කැස්බෑව පර්චස් 20 නිවස විකිණීමට. නිදන කාමර 4 වාස්තු විද්‍යාත්මක සැළසුම අධිවේගී මාර්ගයට කි.මී. 5 ප්‍රධාන පාරේ සිට 2 වන නිවස. 0701684627 010940

### වාසගම වෙනස් කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කය, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 83/8 අධිරාණිගම, ඉහළහල්මිල්ලෑව, එප්පාවල ලිපිනයේ පදිංචි **හේවාපතිරණලාගේ ප්‍රියාජ් සිසිර කුමාර** වන මාගේ දරුවන් දෙදෙනා වන **හොරගල් පේඩිගේ සඳුනි හංසිකා කුමාරි, හොරතල් පේඩිගේ සත්සර කවිෂාන් කුමාර** වන අය **පිළිවෙළින් හේවාපතිරණලාගේ සඳුනි හංසිකා කුමාරි, හේවාපතිරණලාගේ සත්සර කිවිෂාන් කුමාර** යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පියා, H.P. ප්‍රියාජ් සිසිර කුමාර


# මත්පැන් සහ දුම්වැටි භාවිත කරන්නන්ට කොවිඩ් එන්නත්කරණය මුදල් අපතේ යෑමක්

## දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති

**සුභාෂිණී සේනානායක**

මත්පැන් සහ දුම්වැටි භාවිතා කරන්නන්ට කොවිඩ්-19 වැළැක්වීමේ එන්නත ලබාදීමට මුදල් සහ සම්පත් වැය කිරීම අපතේ යැවීමක් බව දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති වෛද්‍ය ආචාර්ය සමාධි රාජපක්ෂ මහතා පෙන්වා දෙයි.

දුම්පානයට ඇබ්බැහිවීමෙන් පෙණහලු අක්‍රිය වීම සිදුවන බවත් ඒ නිසා ඔවුන්ගේ ශ්වසන පද්ධතියට බලපෑම් එල්ල වන බවත් පෙන්වා දෙන ඒ මහතා කොවිඩ් -19 ආසාධනය වීමද ශ්වසන පද්ධතියට බලපෑම් එල්ල කරන බව පෙන්වා දෙයි.

එමෙන්ම දුම්පානයට ඇබ්බැහිවූවන් කොවිඩ්-19 ගොදුරු වීමේ ප්‍රවණතාව වැඩියි.

ඔවුන් දැඩි සත්කාර ඒකක වෙත යොමු කිරීමට මෙන්ම මරණයට ගොදුරුවීමේ අවස්ථාද ඉහළ මට්ටමක පවතිනවා.

මත්පැන් මෙන්ම දුම්වැටි භාවිතයෙන් සිරුරේ ප්‍රතිශක්තිකරණය අඩු කරනවා. ඒ වගේම මේ අයට එන්නත ලබාදීමෙන් වංසගත උවදුර මැඩ පැවැත්වීමේ අරමුණ ඉටු කරගත හැකි වන්නේ නැහැ.

එන්නත ලබාදිය යුත්තේ මත්පැන් හා දුම්වැටි භාවිතා නොකරන කොටසටයි.

ඉන් වඩා ඵලදායි ප්‍රතිඵලයක් ලබා ගත හැකි වෙනවා. එසේම එන්නත ලබාගැනීමෙන් පසුව මාස හයක්වත් යනතුරු මත්පැන් දුම්වැටි භාවිතයෙන් වැළකී සිටීම තමයි වඩාත් සුදුසු යනුවෙන් ඒ මහතා වැඩිදුරටත් කීය.

ඒ මහතා මේ බව කියා සිටියේ අධිකාරියේ පැවැති මාධ්‍ය හමුවකදීය.

# විදේශ රටවල රැඳී සිටි ශ්‍රී ලාංකිකයෝ 850ක් යළි මෙරටට

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව විදේශ රටවල රැඳී සිටි ශ්‍රී ලාංකිකයන් 850ක් යළි මෙරටට ගෙන්වා ගෙන තිබේ. එම ශ්‍රී ලාංකිකයන් පිරිස කටුනායක, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබෙන අතර ඊයේ (12) පෙරවරු 8.30 න් අවසන් වූ පැය 24 තුළ ගුවන් ගමන් 10ක් මගින් මේ පිරිස ශ්‍රී ලංකාවට පැමිණි බව ගුවන් තොටුපොළ පවසයි.

එම පිරිස අතරට, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට පැමිණි ශ්‍රී ලාංකිකයෝ 108 දෙනෙක් සහ සවුදි අරාබියේ සිට පැමිණි ශ්‍රී ලාංකිකයින් 102 දෙනෙක් ඇතුළත් වෙති.

ඊට අමතරව ගුවන් ගමන් 10ක් මගින් ශ්‍රී ලාංකිකයන් 843 දෙනෙකු රැකියා සඳහා විදේශ රටවල් වෙත පිටත්ව ගොස් තිබේ.


## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල තැපැල්, උඩකැලේවත්ත, අංක 214/2 හි පදිංචි **සිවලිංගම් ප්‍රවීන් රාජා** (ජා.හැ.අ. 823494432V) වන මා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 109 කාණ්ඩයේ 8815 පත්‍රිරුවේ දිනපොත් අංක 2594 යටතේ 2017.06.21 දින ලියාපදිංචි කරන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් R.M. **ගංගා කුමාරි කරුණාරත්න** 2017.06.09 දින ලියා සහතික කරන ලද අංක 2297 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස **වැඩ තැපැල්, ඉලුකේවෙල පදිංචි වේලූ ජෙබමනි** (ජා.හැ.අ. 522453005V) යන අය පත්කළ අතර, එකී ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද බවත් ඔහු විසින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වගකීම නොදරන බවත් ප්‍රකාශ කර සිටිමි.

**සිවලිංගම් ප්‍රවීන් රාජා**
**2021.01.27**

## ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

දෙහිවල, අත්තිඩිය, පස්වෙනි පටුමග, අංක 73/ඒ/17 දරන ස්ථානයෙහි පදිංචි **ගලප්පත්තිගේ වජිර චන්දන ද සිල්වා** වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ, කඳාන පදිංචි නිලන්ති පී. සිරිවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 19 වන දින ලියා සහතික කරන ලද අංක 711 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අළුත්ගම, වැලිපැන්න පාර, 'සාගල' හී පදිංචි **ගලප්පත්තිගේ විල්සන් ද සිල්වා** යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලපත්‍රය 2021.01.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

**ගලප්පත්තිගේ වජිරි චන්දන ද සිල්වා**

## ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

**(රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය)**

**ජා. ගො. ප. සංවිධානය සහ ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා මානව සම්පත් කළමනාකරුවෙකු තෝරාගැනීම සඳහා අභිලාශය ප්‍රකාශ කිරීමේ ඇරයුම (EOI)**

ජා. ගො. ප. සංවිධානය සහ ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා මානව සම්පත් කළමනාකරණ සැලැස්ම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් ඇති සුදුසුකම් ලත් මානව සම්පත් කළමනාකරුවන්ගෙන් ඒ සඳහා අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කරයි. මේ පිළිබඳ විස්තර www.nbro.gov.lk වෙතින්) ලබා ගත හැකිය. උනන්දුවක් දක්වන පුද්ගලයින් ජීව දත්ත සමඟ සියලු විස්තර ඉදිරිපත් කළ යුතුය. අභිලාශය ප්‍රකාශ කිරීම අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, 99/1, ජාවත්ත පාර, කොළඹ 5 ලිපිනයට

හෝ info@ nbro.gov.lk වෙත විද්‍යුත් තැපෑලෙන් 2021 පෙබරවාරි මස 19 වන දිනට ප්‍රථම එවිය යුතුය.

## සමාගම් කොටස් සහතිකපත්‍ර අස්ථානගතවීමේ නිවේදනය

**සී.ස. සී.ඊ.ජී. එඩියුකේෂන් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම**

සී.ස. යූබී ෆිනෑන්ස් සමාගම වෙත (සී.ස. ද ෆිනෑන්ස් සහ ගැරන්ටි සමාගම ලෙසින් පෙර හැඳින්වූ) නිකුත් කරන ලද අනුක්‍රමික අංක 2672503 සිට 2682502 සහ 4237487 සිට 4249986 දරන, කොටස් 22500ක් සඳහා වූ අංක 15 සහ 29 දරන සමාගම් කොටස් සහතික පත්‍ර අස්ථානගත වී ඇති බව දැනුම් දී ඇත. මෙම දැන්වීම් පලකල දින සිට දින 21 ඇතුලත විරෝධතා ඉදිරිපත් නොවන්නේ නම් ඉහත සඳහන් සමාගම් කොටස් සහතික පත්‍ර සඳහා අනුපිටපත් නිකුත් කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් ලේකම්වරු
නො.69, ජනාධිපති මාවත, කොළඹ 01.

## සියල්ලෝම මෙයින් දැනගනිත්වා

වැලිමඩ, නුගතලාව, අංක 93/01, හි පදිංචි **බන්දුල ගුණරත්න** (ජ.හැ.අ. 571113660V) වන මා විසින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් නලීන් වීරසිංහ මහතා විසින් 2021-05-14 වන දින අංක 390 දරන සාමාන්‍ය ඇටර්නි බලපත්‍රය මගින් වැලිමඩ, නුගතලාව, අංක 93/01, හි පදිංචි **සකලකලා වල්ලභ ආදිපාදයන්ගේ චන්ද්‍රාවතී** (ජ.හැ.අ. 566572257 V) යන අයට ලබා දී ඇති **ඇටර්නි බලපත්‍රය අද මෙතැන් පටන් අවලංගුකර පත්‍යාදිශ්ඨ කරමි.**

## ප්‍රසම්පාදන දැන්වීමයි

**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප)**

**(පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත)**

### හෝමාගම කර්මාන්තපුරයේ ඇතුළත මාර්ග සංවර්ධනය කිරීම සඳහා ඉමල්ෂන් සැපයීම.

මෙම අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාල සඳහා අවශ්‍ය CSS 1/CRS 1 ඉමල්ෂන් මිලදී ගැනීමට සැපයුම්කරුවන්ගෙන් විවෘත මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසු අංකය | සැපයුම් ප්‍රමාණය | | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු | ලංසු ඇපකරයේ වටිනාකම රු. (බැංකු ඇපකරය) | ලංසු ඇපකරයේ වටිනාකම රු. (මුදලින්) |
|---|---|---|---|---|---|
| | CSS 1 | CRS 1 | | | |
| PRDA/WP/PRO/2021/07 | 20,000 | 10,000 | 2,160.00 | 20,750.00 | 10,375.00 |

02. මේ සඳහා වන ලංසු ලියවිලි කට්ටලය 2021-02-15 දින සිට 2021-03-01 දින දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 2.45 දක්වා ඉහත සඳහන් ටෙන්ඩර් පෝරම ගාස්තු වලට යටත්ව මෙම අධිකාරියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. මේ සඳහා වන ලංසු ඇපකරය මුදලින් හෝ බැංකු /රක්ෂණ ඇපකරයක් මගින් ප්‍රසම්පාදන ලියවිලිවල සඳහන් කොන්දේසි වලට අනුකූලව ඉහත සඳහන් වටිනාකමට ඉදිරිපත් කළ යුතුය.

03. ලංසු ප්‍රදානයන්ට සුදුසුකම් ලැබීම සඳහා ලංසු මුදල රුපියල් මිලියන 5.0 ඉක්මවන අවස්ථාවන්හිදී ලංසුකරු විසින් 1987 **අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය** ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු භාරගන්නා අවසන් දිනය 2021/03/02 දින පෙ.ව. 10.30 වන අතර, ලංසු විවෘත කිරීම එම අවස්ථාවේදීම මෙම කාර්යාලයේදී සිදු කරනු ලැබේ.

05. එම අවස්ථාවට සැපයුම්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප),**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දු.අ. 011-5676903.**

## (262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත 66 උ වගන්තිය

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධිත) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥපනතේ 66උ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව

**මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ ලිඳුල නගර සභාවේ සභාපතිවරයා තෝරාපත්කර ගැනීම සඳහා වූ පළමු රැස්වීම**
**2021-03-05 දින පෙ.ව. 10.00 ට**

**තලවාකැලේ ලිඳුල නගර සභා රැස්වීම් ශාලාවේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරමි.**

**2021 පෙබරවාරි 11 දින,**
**පළාත් සභා සංකීර්ණය,**
**පල්ලේකැලේ, කුණ්ඩසාලේ.**

**එච්.එම්.එම්.යූ.බී. හේරත්,**
**පළාත් පාලන කොමසාරිස්,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත.**

### අද පාසලක හොඳ නරක තක්සේරු කරන්නේ ප්‍රතිඵල අනුවයි

## දරුවන්ට පොතේම එල්ලී ඉන්න බැහැ

# පීඩනය මඟහැර ගන්න ක්‍රීඩා කළ යුතුයි

### අගමැති මහින්ද රාජපක්ෂ ආණමඩුවේදී කියයි

පාසල් කාලයේ සිටම ක්‍රීඩාවලට සම්බන්ධ වී කටයුතු කිරීමට දරුවන් පෙලඹිය යුතුයැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය. අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ බව පැවසුවේ ආණමඩුව කන්නන්ගර ආදර්ශ විද්‍යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල පෙරේදා (11) විවෘත කිරීමෙන් අනතුරුව පැවති උත්සවයේදීය.

අධ්‍යාපන අමාත්‍යාංශය රුපියල් ලක්ෂ 360ක් වැය කරමින් මේ තෙමහල් ගොඩනැගිල්ල ඉදි කර තිබේ. සිසු දරුවන් 2861ක් හා ආචාර්ය මණ්ඩලයේ 92කින් සමන්විත කන්නන්ගර ආදර්ශ විද්‍යාලයට මූලිකව පැවැති අඩුපාඩු රැසක් නව ගොඩනැගිල්ල විවෘත වීමත් සමඟ මඟහැරී ඇත.

විදුහල්පති විමල් විජේරත්න මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය ද, සිසු දරුවෝ ද අගමැතිවරයා පිළිගැනීමට එක්ව සිටියහ.

නව තෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීමෙන් අනතුරුව අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙසේ කීය.

අද මේ පාසලට ඇවිත් ඔබ සැම හමුවීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අපේ ආණ්ඩුවේ බලාපොරොත්තුව අපේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමයි.

අපි මොනතරම් මහන්සි වුණත් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න පුළුවන් සීමාසහිත සංඛ්‍යාවකටයි. ඒ නිසාම තමයි කාර්මික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන අවශ්‍ය වන්නේ. විශේෂයෙන් වෘත්තීය පුහුණු අධිකාරිය හදලා අපේ දරුවන්ගේ දැනට සවියක් දෙන්න අප කටයුතු කළා. ඒ වගේම ඒ දැනට සවියක් ඇති වුණාම ඔවුන්ට රැකියාවක් ලබා ගැනීමට අසීරු නැහැ. අපේ යුගයේ අපි, තරුණ තරුණියන්ට පුහුණුවක් ලබාදීලා කොරියාවට ජපානයට යවන්න පටන් ගත්තා.

මට මතකයි මුල් අවස්ථාවේ අපේ ආසනේ තරුණයන්ට කොරියාවේ යන්න කිව්වාම අපි ඔබතුමාට වැඩ කළේ කොරියාවේ යන්න නෙමෙයි කියා මට දෝෂාරෝපණය කළා. ඒ පාර මම ඒ ගමේම සහෝදරියක් යැව්වා. පළමුවැනි පඩිය ලැබී ගෙදරට සල්ලි එව්වාම අර කොල්ලො ටික ආපහු දුවගෙන ඇවිත් 'අනේ සර් අපිවත් යවන්න' කිව්වා. එතෙක් කොරියාව පිළිබඳ දැක්වූයේ අමුතු ආකල්පයක්. හැබැයි අද ඒක නැහැ. අද අපේ තරුණයෝ පිටරට යන්න ගිහින් රැකියා කරන්න උනන්දුවක් දක්වනවා. අපි ඔබෙන් බලාපොරොත්තු වෙන්නේ කුමක්ද ? පුළුවන් තරම් මහන්සිවෙලා ඉගෙනගෙන විශ්ව විද්‍යාලයට ගිහින් හොඳ අධ්‍යාපනයක් ලැබූ දරුවන් බවට පත්වීමයි.



පාසලක ප්‍රතිඵල අනුව තමයි ඒ පාසලේ හොඳ නරක, අධ්‍යාපනය තක්සේරු කරන්නේ. අපි දන්නවා හුගක් පාසල්වලට ක්‍රීඩා පිටි නැහැ. පාසල් කාලයේ ඉඳන්ම ක්‍රීඩාවලට සම්බන්ධ වෙලා කටයුතු කරන්න දරුවන් පෙලඹෙන්න ඕනෑ කියලයි මම විශ්වාස කරන්නේ. දරුවන්ට පොතේම එල්ලී ඉන්න බැහැ. එහෙම ඉන්නකොටත් එය විශාල පීඩනයක්.

ඒ නිසා ඔබ මේ කාලයේ ලබන්නා වූ දැනුම, අධ්‍යාපනය විතරක් නෙවෙයි ක්‍රීඩාවලින්, වෘත්තිය පුහුණුවලින් ලබන්නා වූ දැනුම ද ප්‍රයෝජනවත් වෙනවා කියා අප විශ්වාස කරනවා.

මේ දරුවන්ගෙන් මව්පියන් වන ඔබ සියලුදෙනා සහ අපිත් බලාපොරොත්තු වෙන්නේ දරුවන් හොඳට ඉගෙන ගන්න ඕනෑ කියලයි. හොඳින් ඉගෙන ගෙන හොඳ පුරවැසියන් වීමට කටයුතු කරන්නැයි දරුවන් වන ඔබගෙන් ඉල්ලා සිටිනවා. ඔබ සියලු දෙනාට සුබ අනාගතයක් වේවා!

රාජ්‍ය අමාත්‍යවරුන් වන පියංකර ජයරත්න, සනත් නිශාන්ත, ලොහාන් රත්වත්තේ, වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අශෝක ප්‍රියන්ත, චින්තක මායාදුන්නේ, අලි සබ්රි රහීම් මහත්වරු ද, ප්‍රදේශයේ මහජන නියෝජිතයෝ ද, විදුහල්පති විමල් විජේරත්න මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලය ද සිසු දරුවන්, මව්පියෝ සහ ප්‍රදේශවාසීහු රැසක් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

## දේශීය මිනිරන්වලින් නවීන බැටරි නිපදවන සමාගමක් ඇරඹීමට පියවර

### ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ

ලෝකයේ ඉහළම ගුණාත්මකභාවයෙන් යුත් දේශීය මිනිරන් භාවිත කර නවීන බැටරි වර්ග නිෂ්පාදනය කරන රජයේ සමාගමක් ඇතිකිරීමට කඩිනමින් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පවසයි.

අරලියගහ මන්දිරයේ පසුගියදා (9) පැවති සාකච්ඡාවකදී ඒ මහතා මේ බව සඳහන් කළේය.

නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යංශයේ මූලිකත්වයෙන් සිදු කළ පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස ජාතික මූලික අධ්‍යයන ආයතනය නවීන බැටරි වැනි නිෂ්පාදන සඳහා දේශිය මිනිරන් භාවිතා කිරීමේ හැකියාව අනාවරණය කරගෙන ඇත. දේශිය මිනිරන් (ග්‍රැෆයිට්) සඳහා අගය එකතු කිරීමෙන් ඉහළ පාරිශුද්ධතාවකින් සහ ඉහළ විදුලි ධාරිතාවක් ගබඩා කර තබා ගැනීමේ හැකියාව ඇති 'ග්‍රැෆීන්' නිෂ්පාදනය දැනටමත් SINTEC ආයතනය විසින් සිදුකරනු ලබයි.

ලෝකයේ වෙනත් රටවල නිෂ්පාදනය කරන ලිතියම් අයන් බැටරිවලට (Lithium-ion Battery) වඩා ඉහළ විදුලි ධාරිතාවක් සහිත බැටරි නිෂ්පාදනයෙන් ලෝක වෙළෙඳපොළේ වැඩි ආකර්ශනයක් ලබාගැනීමේ හැකියාව ඇත. මේ සඳහා වූ වෙනම රාජ්‍ය සමාගමක් පිහිටුවීමට මේ සාකච්ඡාවේදී තීරණය කළ අතර, සමාගම පිහිටුවීමට අවශ්‍ය ප්‍රාග්ධනය රාජ්‍ය ආයතන හා රජයේ අරමුදල්වලින් ආයෝජනය කිරීමට යෝජනා විය. මෙසේ බිහි කරන සමාගම් ලාභ ලබන තත්ත්වයට පත්කර ඉතා ඉහළ මිලකට අවශ්‍ය නම් දේශීය ආයෝජකයන්ට පවරා දී එමගින් ඉහළ ආදායමක් රජයට ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳවත්, මෙහිදී සාකච්ඡා විය.

තවද, ලෝකයේ බැටරි නිෂ්පාදනය කරන කීර්තිනාමය දිනාගෙන ඇති සමාගමකට කොටස් අලෙවි කර ඔවුන්ගේ වෙළෙඳනාමය භාවිතා කර ලෝකයේ බැටරි වෙළෙඳපොළ ආකර්ශනය කරගැනීමේ හැකියාව පිළිබඳව ද අවධානය යොමු විය.

නව උත්පාදන හඳුන්වා දෙමින් නිෂ්පාදන අවශ්‍යතාව සැලසුම් කිරීමේ දී මූලික අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය, විශ්ව විද්‍යාල, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී ආයතනයන්හි පවතින තාක්ෂණය හා මානව හා භෞතික සම්පත් යොදා ගනිමින් ඒකබද්ධව ක්‍රියා කරන ලෙසද බැසිල් රාජපක්ෂ මහතා මෙහිදී වැඩිදුරටත් සඳහන් කළේය.

රාජ්‍ය අමාත්‍යවරුන් වන විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ මහත්මිය ද, තාරක බාලසූරිය මහතා ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ නිලධාරීහු රැසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

## බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තාව අගමැතිට භාර දෙයි



**මහින්ද අලුත්ගෙදර**

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් සම්පාදනය කළ බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තාව අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත භාර දී තිබේ.

ඒ අනුව බෞද්ධ හිමිකම් කොමිෂන් සභා වාර්තාව අගමැතිවරයාට විජේරාම පෙදෙසේ පිහිටි නිල නිවෙසේ දී ඊයේ (12) භාර දෙනු ලැබිණි. 2018 වර්ෂයේ දී පොසොන් පොහෝ දින මිහින්තලා පුදබිමේ දී ස්ථාපිත කළ මේ කොමිෂන් සභාව දිවයින පුරා වසර දෙකකට අධික කාලයක් සාක්ෂි විමසීමට ලක්කර මේ වාර්තාව සකස් කර තිබේ.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති ජගත් සුමතිපාල මහතා විසින් එම වාර්තාව අගමැතිවරයාට භාර දුන් අතර එම අවස්ථාවට බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ සභාපති පාලිත ප්‍රනාන්දු මහතා ඇතුළු කොමිෂන් සභා සාමාජිකයෝ ද සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ උරුමය මෙරට සියලු ජාතීන්ට අයත් බව පෙන්වා දුන් නව සිහළ රාවය ජාතික සංවිධානයේ මහ ලේකම් මාගල්කන්දේ සුදන්ත හිමියෝ, මෙරට පුරාවිද්‍යාත්මක වටිනාකම් දෙමළ මාධ්‍ය අධ්‍යාපනයට ඇතුළත් කිරීම පිළිබඳව සොයා බලන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතාගෙන් මෙහිදී ඉල්ලා සිටියහ.

ඒ මොහොතේම ඊට ප්‍රතිචාර දැක්වූ අගමැතිවරයා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතාට ජාතික උරුමයන් පිළිබඳ පරිච්ඡේදයන් දමිළ අධ්‍යාපනයට යොමු කිරීම සම්බන්ධයෙන් සොයා බලා දන්වන්නැයි කියා සිටියේය.

බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයන් වන චන්ද්‍ර නිමල් වාකිශ්ට (විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති) මහාචාර්ය නිමල් සිල්වා, විශේෂඥ වෛද්‍ය නරේන්ද්‍ර පිංතු, මහාචාර්ය මාලනී මැදගම මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය ඇරේ



ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආණමඩුව කලාපීය මධ්‍යස්ථානය අගමැති මහින්ද රාජපක්ෂ මහතා අතින් පෙරේදා (11) විවෘත විය. එම මධ්‍යස්ථානය විවෘත කිරීමෙන් අනතුරුව අගමැති මහින්ද රාජපක්ෂ මහතා, එහි පැමිණ සිටි ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සිසුන් හා ඔවුන්ගේ මවුපියන් සමඟ සුහද පිළිසඳරක ද නිරත වූයේය.

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්තිය යථාර්ථයක් කිරීමේ අරමුණ ඇතිව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ මේ මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබේ. රාජ්‍ය ඇමැතිවරුන් වන පියංකර ජයරත්න, සීතා අරඹේපොළ, සනත් නිශාන්ත, ලොහාන් රත්වත්තේ, වයඹ පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලුරේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අශෝක ප්‍රියන්ත, චින්තක මායාදුන්නේ, අලි සබ්රි රහීම්, නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සී.ඩබ්ලිව්. රත්නායක මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

## පුත්තලම ආරච්චිකට්ටුව ලංකා සී ෆුඩ්ස් නිෂ්පාදනාගාරය අගමැති අතින් විවෘත වෙයි



පුත්තලම ආරච්චිකට්ටුව ප්‍රදේශයේ ස්ථාපිත කළ ලංකා සී ෆුඩ්ස් නිෂ්පාදනාගාරය අගමැති මහින්ද රාජපක්ෂ මහතා අතින් පෙරේදා (11) විවෘත විය.

විදේශ වෙළෙඳ පොළ ඉලක්ක කර ගනිමින් මත්ස්‍ය අපනයනයේ යෙදෙන ලංකා සී ෆුඩ්ස් සමාගම රැකියා 600ක් පමණ උත්පාදනය කර තිබේ. විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් නව නිෂ්පාදනාගාරයේ ඉහළ ප්‍රමිතියෙන් යුතු මත්ස්‍ය සැකසුම් සිදුවන ආකාරය මෙහිදී අගමැතිවරයාගේ නිරීක්ෂණයට ලක් විය.

අපනයන ප්‍රමිතියෙන් යුත් ලංකා සී ෆුඩ්ස් නිෂ්පාදන රට පුරා පිහිටුවන වෙළෙඳසල් ජාලයකින් මිලදී ගැනීමට දේශීය පාරිභෝගිකයන්ට ඉදිරියේදී අවස්ථාව උදා වේ. ලංකා සී ෆුඩ්ස් ආයතනයේ සභාපති සරත් කිත්සිරි මහතා එම ආයතනයේ ඉදිරි දැක්ම පිළිබඳ අගමැති මහින්ද රාජපක්ෂ මහතාට කරුණු පැහැදිලි කළේය.

රාජ්‍ය අමාත්‍යවරුන් වන සනත් නිශාන්ත, ලොහාන් රත්වත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන චින්තක මායාදුන්නේ, අශෝක ප්‍රියන්ත මහත්වරු ද, ලංකා සී ෆුඩ්ස් නිෂ්පාදනාගාරයේ කාර්ය මණ්ඩලය ද මේ අවස්ථාවට එක් වූහ.



# සියලු රටවැසියන්ට එන්නත් ලබාදී ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ කොවිඩ් තුරන් කළ පළමු රට බවට පත් කරනවා

### ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ

**ක්‍රිසන්ති විතාරණ**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ අනුව සියලුම රටවැසියන්ට එන්නත් ලබාදී ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ කොවිඩ්- 19 රෝගයෙන් තොර පළමු රට බවට පත් කිරීමට කටයුතු කරන බව ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම විසින් රුපියල් මිලියන 20කට අධික වටිනාකමින් යුත් පී. සී. ආර් යන්ත්‍රයක් හා පරීක්ෂණ කට්ටල 5000ක් ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කිරීමේ අවස්ථාවට සහභාගි වෙමිනි.

සී.එච්.ඊ.සී පෝර්ට් සිටි කොළඹ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ Jiang Houliang මහතා වෙනුවෙන් එම සමාගමේ සහකාර කළමනාකාර අධ්‍යක්ෂ Yue Yeqing මහතා විසින් අදාළ උපකරණ හා පරීක්ෂණ කට්ටල තොගය, බැසිල් රාජපක්ෂ මහතා වෙත බාරදෙනු ලැබීය.

මේ පරිත්‍යාගය අගය කළ බැසිල් රාජපක්ෂ මහතා, අදාළ පී. සී. ආර් යන්ත්‍රය සහ පරීක්ෂණ කට්ටල වහාම භාවිතයට ගැනීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත බාරදුන්නේය. පී. සී.ආර් යන්ත්‍රය මුලින් ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන බවත්, එමගින් දිස්ත්‍රික්කයේ දෛනිකව සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කළ හැකිවනු ඇති බවත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැති සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පැවසුවාය.

මෙහිදී පෝර්ට් සිටි නියෝජිතයෝ එම ව්‍යාපෘතියේ නවතම තත්ත්වය සම්බන්ධයෙන් බැසිල් රාජපක්ෂ මහතා දැනුවත් කළහ. එහිදී රාජපක්ෂ මහතා කියා සිටියේ, ඉදිරියේදී විශේෂ ආර්ථික කලාප පනත හඳුන්වා දීමත් සමග මෙය දකුණු ආසියානු කලාපයේ නවීන සේවා හා මූල්‍ය කේන්ද්‍රයක් බවට පත්වනු ඇති බවයි. එමෙන්ම මේ වසරේදී කොළඹ වරාය නගරය සංවර්ධන කටයුතු ඔස්සේ රටට සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවනු ඇති බවටද ඒ මහතා විශ්වාසය පළකළේය.

පසුගිය මාස කීපයේ අවස්ථා කීපයකදී මෙරට බලධාරීන් වෙත ආරක්ෂක උපාංග පරිත්‍යාග කිරීමට පෝර්ට් සිටි කටයුතු කළේය. මේ අතරට ශ්‍රී ජයවර්ධනපුර රෝහලට මුඛ ආවරණ 10,000 ක් පරිත්‍යාග කිරීම, ශ්‍රී ලංකා රේගුවට මුඛ ආවරණ 2,000 ක් පරිත්‍යාග කිරීම සහ කොළඹ මැනිං තොග වෙළෙඳපොළ, ශ්‍රී ලංකා පොලීසිය, කළුතර නාගොඩ රෝහල, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත රු. මිලියන 6කට අධික වටිනාකමකින් යුත් පරිත්‍යාග සිදුකිරීම ඇතුළත් වේ.

එමෙන්ම 2020 නොවැම්බර් මාසයේදී, ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 රෝග මර්දන උත්සාහයන්ට ලබාදෙන තවත් සහයෝගයක් වශයෙන්, ශල්‍ය මුඛ ආවරණ 20,000 ක් සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය වෙත භාරදීමටද කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම පියවර ගත්තේය. මේ පරිත්‍යාග අගය කළ සෞඛ්‍ය ඇමැතිනිය, රටට දැඩි ලෙස අවශ්‍ය වී ඇති පී.සී. ආර් උපකරණ හා පරීක්ෂණ කට්ටලද ලබාදෙන ලෙස ඉල්ලීමක් කළා. මේ ඉල්ලීම ඉටුකරන බවට ප්‍රතිඥා දුන් පෝර්ට් සිටි කළමනාකාර අධ්‍යක්ෂවරයා, මාස කීපයක් තුළ එම ප්‍රතිඥාව ඉටු කරමින්, මෙසේ පී. සී. ආර් උපකරණ හා පරීක්ෂණ කට්ටල එකතුවක් පරිත්‍යාග කිරීමට කටයුතු කර තිබේ.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනී සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන, දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු අමාත්‍යංශයේ ලේකම් වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා, කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යපෘතියේ විධායක ව්‍යපෘති කළමනාකරණ අධ්‍යක්ෂ රාජා එදිරිසූරිය, එහි අධ්‍යක්ෂිකා (විකුණුම් හා අලෙවි) යමුනා ජයරත්න සහ මහජන සම්බන්ධතා ප්‍රධානී කස්සප සෙනරත් මහත්වරුන් ඇතුළු පිරිසක් මෙහිදී රැස්ව සිටියහ.

sports.dinamina@lakehouse.lk

## සංගම් 4ක ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවයි

# හෑන්ඩ්බෝල් - කැරම් - හොකී - ගොල්ෆ්
# ක්‍රීඩා පාලනයට නිසි බලධාරියෙක්

**ප්‍රින්ස් ගුණසේකර**

පරිපාලනමය ගැටලුවලින් සමන්විත ජාතික ක්‍රීඩා සංගම් 4ක ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීමට ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අත්සනින් යුත් අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් වෙයි.

එම අති විශේෂ ගැසට් නිවේදනය මඟින් හෑන්ඩ්බෝල්, කැරම්, හොකී හා ගොල්ෆ් යන ජාතික ක්‍රීඩා සංගම්වල ක්‍රියාකාරීත්වය අත්හිටුවා තාවකාලික පියවරක් ලෙස ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතා නිසි බලධාරියා ලෙස පත් කර ඇත.

ඒ අනුව මේ ජාතික ක්‍රීඩා සම්මේලනවල පරිපාලනය හා අවශ්‍ය අවස්ථාවකදී නිලවරණ කැඳවීමේ බලය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී ඇත.

නිසි පරිදි නිලවරණ පැවැත්වීමට හා ගිණුම් කටයුතු කළට වේලාවට විගණනය කිරීමට අපොහොසත්ව තිබූ මේ ක්‍රීඩා සංගම්වල නීත්‍යානුකූලභාවය අහෝසි වී ඇති බවට ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා වෙත ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මෙයට මාස කිහිපයකට පෙර දැනුම්දී තිබූ අතර, ක්‍රීඩා ඇමැතිවරයා මේ වෙනුවෙන් අවශ්‍ය නිර්දේශ හා උපදෙස් ගැනීමට අදාළ ලිපිගොනු ජාතික ක්‍රීඩා සභාව වෙත යොමු කර තිබිණි.




මේ ක්‍රීඩා සංගම් හතරේ නිලවරණ කඩිනමින් පැවැත්වීමට ක්‍රීඩා අමාත්‍යාංශය අපේක්ෂා කරන බවත් ඉක්මණින් නිලවරණ කමිටු පත් කිරීම සිදු වනු ඇති බවත් ක්‍රීඩා අමාත්‍යාංශ ප්‍රකාශකයකු 'දිනමිණ'ට පැවසීය. නිසි බලධාරියාගේ භූමිකාව ඉතාම කෙටි කාලයකට සීමාවන බවත් ඔහුගේ ප්‍රධාන කාර්යය ස්වාධීන හා සාධාරණ නිලවරණයක් පවත්වා නව නිලධාරී මණ්ඩලයකට පරිපාලනය භාරදීම බවත් එම ප්‍රකාශකයා පැවසීය.

කොරෝනා අර්බුදය ආරම්භ වූ වහාම ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු ක්‍රීඩා ඇමැතිවරයා විසින් සාදන ලද නියෝග කිහිපයක් මාස 6ක කාලයකට බලපැවැත්වෙන පරිදි ගැසට් මගින් සංශෝධනය කිරීමට ක්‍රීඩා අමාත්‍යාංශය පසුගිය වසරේ පියවර ගත් අතර, එම සියලු සංශෝධන මේ වසරේ ජනවාරි 1දා සිට යළිත් පෙර තිබූ පරිදිම ක්‍රියාත්මක බව එම ගැසට් නිවේදනයේම සඳහන්ව තිබිණි.

ක්‍රීඩා සංගම්වල නිලවරණ කමිටුව පත්කළ දින සිට දින 30ක් ඇතුළත එම කමිටුව විසින් ඡන්දදායක නාම ලේඛනය සකස් කළ යුතු වුවද, නව සංශෝධනය යටතේ එම කාල සීමාව දින 75ක් කිරීමත් ක්‍රීඩා සංගමයක ඡන්ද විමසීම භාරව කටයුතු කරන නිලවරණ කමිටුව පත්කිරීමෙන් අනතුරුව එහි පත්වීම් දින සිට මාස දෙකකට නොඅඩු කාලයක් තුළ නිලවරණ කමිටුව නාමයෝජනා කැඳවිය යුතු වුවත්, නව සංශෝධනය අනුව ඒ සඳහා දින 75ක කාලයක් දී ඇත.

## කොදෙව් යන සංචිතයේ 35ම නෙගටිව්

ඉදිරියේදී පැවැත්වීමට නියමිත බටහිර ඉන්දීය කොදෙව් සංචාරය අරමුණු කර ගනිමින් පවත්වාගෙන යන ශ්‍රී ලංකා ක්‍රිකට් සංචිතයේ ක්‍රීඩකයන් 35 දෙනාටම කොරොනා වයිරසය ආසාදනය වී නැතැයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පවසයි. එමෙන්ම පුහුණු කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ද වයිරසය ආසාදනය වී නැති බවට හඳුනා ගෙන තිබේ.

ප්‍රධාන පුහුණුකරු මිකී ආතර් සහ ළහිරු තිරිමාන්නට වයිසරය වැළඳීමෙන් පසු පුහුණුවීම් තාවකාලිකව අත්හිටුවූ අතර, යළිත් පසුගිය 10 වැනිදා සංචාරයට නම් කළ ක්‍රීඩකයන් 35 දෙනා පීසීආර් පරීක්ෂාවට ලක් කෙරිණි. එහිදී සියලු ක්‍රීඩකයන් සෘණ ප්‍රතිඵල පෙන්වීම හේතුවෙන් ඔවුන් සියලු දෙනා ඊයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට ලක් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කටයුතු කර තිබිණි.

ඒ අනුව යෝග්‍යතා පරීක්ෂණය සමත්වන ක්‍රීඩකයන්ගේ පුහුණුවීම් කටයුතු ලබන 16 වැනිදා සිට ආරම්භ කරන බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිකුත් කළ නිවේදනයේ දැක්වේ.

මේ අතර, වයිරසය ආසාදනය වූ පුහුණුකරු මිකී ආතර් සහ ළහිරු තිරිමාන්න තව දුරටත් ප්‍රතිකාර ලබමින් සිටින බවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කියයි.

## පාකිස්තාන පිල අප්‍රේල් මස දකුණු අප්‍රිකාවට

සීමිත ඕවර තරගාවලි 2ක් සඳහා එළැඹෙන අප්‍රේල් මස පාකිස්තාන ක්‍රිකට් කණ්ඩායම දකුණු අප්‍රිකාවේ සංචාරයක නිරත වන බව පාකිස්තාන ක්‍රිකට් ආයතනය නිවේදනය කළේය.

එම සංචාරයට එක්දින තරග 3ක් සහ විස්සයි20 තරග 4ක් අතුළත් වෙයි.

අයිසීසී ලෝක කුසලානය සුපර් ලීග් තරගාවලියේ එක්දින තරගවලින් මේ තරගාවලිය ආරම්භ වෙයි. මෙය දකුණු අප්‍රිකාව සුපර් ලීග් තරගාවලිය යටතේ එක්වන පළමු තරගාවලියයි.

පාකිස්තාන පිල මාර්තු මස 26 වැනිදා ජොහැන්නස්බර්ග් බලා පිටත්ව යන අතර, එක්දින තරග 3 අප්‍රේල් 2, 4 සහ 7 වැනි දිනවල පැවැත්වේ.

තරග 4කින් සමන්විත විස්සයි20 තරගාවලිය අප්‍රේල් 10, 12, 14 සහ 16 දිනවල පැවැත්වීමට නියමිතය.

## ශකිබ්ට නිවාඩුවක්

බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ එළැඹෙන නවසීලන්ත තරග සංචාරය සඳහා තුන් ඉරියව් ක්‍රීඩක ශකීබ් අල් හසන් එක් නොවන බව බංග්ලාදේශ ක්‍රිකට් ආයතනය පවසයි.

මේ සංචාරය සඳහා වන සංචිතයේ තේරීම් සඳහා තමා එක් කර නොගන්නා ලෙස ශකීබ් බංග්ලාදේශ ක්‍රිකට් ආයතනයෙන් කළ ඉල්ලීමක් හේතුවෙන් මෙලෙස ඔහු සංචිතයෙන් ඉවත් කර තිබේ. ඔහුගේ බිරිය තෙවැනි දරු උපත වෙනුවෙන් සූදානමින් සිටින බැවින් මෙලෙස පීතෘ නිවාඩු ඉල්ලීමට ශකීබ් කටයුතු කර තිබිණි.

මේ සංචාරය ආරම්භ කරමින් බංග්ලාදේශ කණ්ඩායම ලබන 24 වැනිදා එරටින් පිටත්ව යෑමට නියමිතය. එම සංචාරයට එක්දින තරග 3ක් සහ විස්සයි20 තරග 3ක් ඇතුළත් ය. එම තරගාවලිය මාර්තු මස 20 වැනිදා එක්දින තරගාවලියේ ආරම්භ වීමට නියමිතය.

මේ අතර, ආබාධයක් හේතුවෙන් මේ දිනවල බටහිර ඉන්දීය කොදෙව් පිල සමග පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගයට ශකීබ් ක්‍රීඩා කරන්නේ නැත.

# අයිපීඑල් වෙන්දේසියට ශ්‍රී ලංකාවෙන් 9යි

## හය දෙනකුට කෝටියට වැඩි ලංසු




විජයකාන්ත් වියස්කාන්ත්

**නිරෝෂාන් ප්‍රියංකර**

ඉන්දීය ක්‍රිකට් ආයතනයේ සංවිධායකත්වයෙන් මේ වසරේ පැවැත්වීමට නියමිත 14 වැනි ඉන්දීය ප්‍රිමියර් ලීග් (අයිපීඑල්) ක්‍රිකට් තරගාවලියේ ක්‍රීඩක වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන අවසන් ක්‍රීඩක ලැයිස්තුව පසුගියදා ප්‍රකාශයට පත් කෙරිණි.

මුලින් මේ වෙන්දේසිය සඳහා ඉන්දීය ක්‍රීඩකයෝ 814ක් සහ විදෙස් ක්‍රීඩකයෝ 283ක් ඇතුළත්ව සිටි අතර, ඒ අතරින් අවසන් ලැයිස්තුව සඳහා තෝරා ගෙන ඇත්තේ ක්‍රීඩකයන් 292ක් පමණි. ඊට ඉන්දීය ක්‍රීඩකයන් 164 දෙනෙක් සහ විදෙස් ක්‍රීඩකයන් 128 දෙනෙක් ඇතුළත් අතර, විදෙස් ක්‍රීඩකයගේ ලැයිස්තුවට ටෙස්ට් වරම් නොලැබූ රටවලින් ක්‍රීඩකයන් තිදෙනෙක් ඇතුළත්ව සිටිති.

මේ වෙන්දේසියේ මූලික ලැයිස්තුව සඳහා ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් 31 දෙනෙක් ලියාපදිංචි වී සිටි අතර, ඉන් අවසන් ලැයිස්තුවට ඇතුළත්ව ඇති ක්‍රීඩකයන් සංඛ්‍යාව 9කි.

ඒ අනුව තුන් ඉරියව් ක්‍රීඩකයන් වන තිසර පෙරේරා, ඉසුරු උදාන, දසුන් ශානක, වනිඳු හසරංග සමග කුසල් ජනිත් පෙරේරා, කෙවින් කොත්තිගොඩ, මහේෂ් තීක්ෂණ සහ විජයකාන්ත් වියස්කාන්ත් මෙවර තරගාවලියේ ක්‍රීඩක වෙන්දේසියට ශ්‍රී ලාංකික ක්‍රීඩකයන් ලෙස එක්ව සිටිති.

පසුගිය වසරේ අයිපීඑල් තරගාවලිය නියෝජන කළ එකම ශ්‍රී ලාංකික ක්‍රීඩකයා වන ඉසුරු උදාන සමගින් තිසර පෙරේරා, දසුන් ශානක, වනිඳු හසරංග, කුසල් ජනිත් පෙරේරා සහ දුෂ්මන්ත චමීරට හිමිව ඇති මූලික ලංසුව ඉන්දීය රුපියල් ලක්ෂ 50කි. එය ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් කෝටි 1.3ක් පමණ වේ.

උදාන පසුගිය තරගාවලියේ තරග 10කට එක් වූ අතර, පසුගිය වසරේ තරගාවලියට එක් නොවුවද තිසර පෙරේරා අයිපීඑල් තරග 37ක් ක්‍රීඩා කර තිබේ. ඔහු එහිදී කණ්ඩායම් 6ක් නියෝජනය කර ඇත. කුසල් ජනිත් රාජස්ථාන් රෝයල්ස් පිල වෙනුවෙන් තරග 2ක් ක්‍රීඩා කර ඇති අතර, දුෂ්මන්ත චමීර රාජස්ථාන් රෝයල්ස් පිල වෙනුවෙන් එක්වරක් පමණක් තරගාවලියකට එක්ව තිබුණ ද ඔහුට එහිදී ක්‍රීඩා කිරීමට අවස්ථාවක් හිමිව නැත. දසුන් ශානක සහ වනිඳු හසරංග මින් පෙර අයිපීඑල් තරගාවලියට එක්ව නැත.



කෙවින්



තීක්ෂණ

තවමත් අන්තර්ජාතික තරග වරම් හෝ අයිපීඑල් තරග වරම් හිමිකර ගෙන නැති කෙවින් කොත්තිගොඩ, මහේෂ් තීක්ෂණ සහ විජයකාන්ත් වියස්කාන්ත් එක්ව ඇත්තේ ඉන්දීය රුපියල් ලක්ෂ 20ක වටිනාකමකින් යුත් කාණ්ඩයටය.

22 හැවිරිදි කෙවින් කොත්තිගොඩ සහ 20 හැවිරිදි මහේෂ් තීක්ෂණ පසුගියදා අබුඩාබියේදී නිමාවූ ටී ටෙන් තරගාවලියට ද එක්ව සිටි අතර, පළමු වරට පැවැති එල්පීඑල් තරගාවලියට එක් වූහ. එහෙත් එල්පීඑල් තරගාවලියේදී කැන්ඩි පිල නියෝජනය කළ කෙවින්ට එක් තරගයක් හෝ ක්‍රීඩා කිරීමට අවස්ථාව හිමි නොවූ අතර, මහේෂ් (ජැෆ්නා) එක් තරගයක් පමණක් ක්‍රීඩා කළේය.

එල්පීඑල් තරගාවලියේදී ජැෆ්නා පිල වෙනුවෙන් ක්‍රීඩා කරමින් වැඩි අවධානයක් දිනාගත් විජයකාන්ත් තවමත් 19 හැවිරිදි වියේ පසු වෙයි. යාපනයේ ක්‍රීඩකයකු වන ඔහු තවමත් ක්‍රීඩා කර ඇත්තේ විස්සයි20 තරග 3ක් පමණි.

මේ අතර, වෙන්දේසියේ ඉහළම වටිනාකම වන ඉන්දීය රුපියල් කෝටි දෙකක මූලික වටිනාකමකින් යුත් කාණ්ඩයට ක්‍රීඩකයන් 10 දෙනකු ඇතුළත්ව සිටිති. ඊට එංගලන්ත ක්‍රීඩකයන් 5 දෙනකු එක්ව සිටීම විශේෂත්වයකි. මොයින් අලි, සෑම් බිලින්ග්ස්, ලියම් ප්ලන්කට්, ජේසන් රෝයි සහ මාක් වුඩ් එංගලන්තයෙන් එක්ව ඇති අතර, ඉන්දියාවෙන් හර්බජාන් සිං සහ කෙදාර් ජාදෙව්, ඔස්ට්‍රේලියාවේ ග්ලේන් මැක්ස්වෙල්, ස්ටීවන් ස්මිත් සමග බංග්ලාදේශයේ ශකිබ් අල් හසන් එම ලැයිස්තුවේ සිටිති.

ඉන්දීය රුපියල් කෝටි 1.5ක මූලික වටිනාකම සහිත කාණ්ඩයට ක්‍රීඩකයන් 12ක් ඇතුළත්ව ඇති අතර, ඉන්දීය රුපියල් කෝටියක මූලික වටිනාකමක් ඉදිරිපත්ව ඇති ක්‍රීඩකයන් සංඛ්‍යාව 11කි.

මේ ක්‍රීඩක වෙන්දේසිය 18 වැනිදා චෙන්නායිහිදී පැවැත්වීමට නියමිතය.



ජොෂුවා ද සිල්වා සහ අල්සාරි ජෝශප්

## කොදෙව් පළමු ඉනිම 409යි

ජොෂුවා ද සිල්වා සහ අල්සාරි ජෝශප් ගොඩනැගූ ශතක සබඳතාව හේතුවෙන් බංග්ලාදේශ පිල සමග ඩකාහිදී පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගයේ පළමු ඉනිම සඳහා ලකුණු 409ක් රැස් කිරීමට සංචාරක බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම සමත් විය.

ඊයේ දෙවැනි දිනයට ක්‍රීඩාව නතර කරන විට පිළිතුරු ඉනිම ක්‍රීඩා කරන බංග්ලාදේශය කඩුලු 4ක් දැවී ලකුණු 105ක් රැස් කරගෙන සිටියේය. ඒ අනුව කඩුලු 6ක් අතැතිව සිටින ඔවුන් කොදෙව් පළමු ඉනිමට වඩා තවත් ලකුණු 304ක් පසුපසින් සිටී.

මුෂ්ෆිකුර් රහීම් ලකුණු 27ක් සහ මොහොමඩ් මිතුන් ලකුණු 6ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටිති.

බංග්ලාදේශ පිළිතුරු ඉනිම අසීරු තත්ත්වයකට පත් කරමින් ලකුණු 71ක් තුළ කඩුලු 4ක් බිඳ දැමීමට කොදෙව් පන්දු යවන්නෝ සමත් වූහ.

ඉනිමේ මුල් කඩුලු 2 ලකුණු 11ක් තුළ බිඳ දැමීමට ෂැනොන් ග්‍රේබියල් සමත් වූ අතර, නායක මොමිනුල් හක් ලකුණු 21කටත්, ටමීම් ඉක්බාල් ලකුණු 44කටත් දැවී ගියේය.

පළමු දිනය නිමා වන විට කඩුලු 5ක් දැවී ලකුණු 233ක් රැස්කර සිටි කොදෙව් ක්‍රීඩකයෝ ඊයේ දිනයේදී අවසන් කඩුලු 5 සඳහා තවත් ලකුණු 186ක් රැස් කර ගත්හ.

ඉනිමේ වැඩිම ලකුණු ලාභියා වෙමින් සිය ටෙස්ට් තරග දිවියේ හොඳම ඉනිම ක්‍රීඩා කළ ජොෂුව ද සිල්වා මුළු ලකුණු 384දී අවාසනාවන්ත ලෙස දැවී යන විට ලකුණු 92ක් රැස් කර තිබිණි. 6 වැනි කඩුල්ලට අල්සාරි ජෝශප් සමග එක්ව ලකුණු 118ක් එක්කළ ජොෂුවා ඉන් පෙර නක්රුමා බොනීර් සමගින් 5 වැනි කඩුල්ලට ලකුණු 88ක් එක්කර තිබිණි.

ජෝශප් ලකුණු 82කට දැවී ගිය අතර, පළමු දිනයේ ලකුණු 74කින් නොදැවී සිටි බොනීර් තවත් ලකුණු 16ක් එක් කර ගැනීමෙන් අනතුරුව දිනයේ පළමු කඩුල්ල ලෙස දැවී ගියේය. සිය දෙවැනි ටෙස්ට් තරගයට එක්වූ බොනීර් රැස් කළ ලකුණු 90 ඔහුගේ ඉහළම ටෙස්ට් ඉනිම ලෙස ද වාර්තා විය.

පන්දු යැවීමේදී අබු ජයඩ් සහ ටයිජුල් ඉස්ලාම් කඩුලු 4 බැගින් දවා ගත්හ.

අද තරගයේ තෙවැනි දිනයයි.

# ගුවන් හමුදාපති කුසලාන රග්බි තරගාවලිය සැලසුම් කළ පරිදි පැවැත්වෙනවා

## රග්බි සභාපති රිස්ලි ඉල්යාස් කියයි

**ෆවුස් මොහොමඩ්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ශ්‍රී ලංකා රග්බි ආයතනය එක්ව මෙහෙයවනු ලබන 'ගුවන් හමුදාපති කුසලාන' අන්තර් සමාජ සත් සාමාජික රග්බි තරගාවලියෙන් මහනුවර, සී.ආර් ඇන්ඩ් එෆ්.සී. සහ සී.එච්. ඇන්ඩ් එෆ්.සී. ක්‍රීඩා සමාජ ත්‍රිත්වය ඉවත්වීමට තීරණය කළ ද, නියමිත පරිදි තරගාවලිය පැවැත්වෙන බව ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපති රිස්ලි ඉල්යාස් මහතා ප්‍රකාශ කළේය.

පවතින කොරෝනා වසංගතයේ තත්ත්වය හමුවේ බරපතළ ආර්ථික ගැටලු රැසකට මුහුණ දී සිටින බැවින් ඉහත කී ක්‍රීඩා සමාජ මේ තරගාවලියෙන් ඉවත්වීමට තීරණය කර ඇති අතර, සී.එච්. ඇන්ඩ් එෆ්.සී. ක්‍රීඩා සමාජයේ ක්‍රීඩකයන් දෙදෙනකුට කොරෝනා ආසාදනය වී ඇති බව ද වාර්තා වේ. ඒ අනුව ඔවුන් සමඟ පුහුණුවීම් කටයුතුවල නිරත වූ තවත් ක්‍රීඩකයන් රැසකට ස්වයං නිරෝධායනය වීමට සිදු වී ඇති බව ද ආරංචි මාර්ග සඳහන් කරයි.

කොරෝනා වසංගතයේ ව්‍යාප්තියෙන් පසු මෙරට පැවැත්වෙන පළමු රග්බි තරගාවලිය වන ගුවන් හමුදාපති කුසලාන සත් සාමාජික රග්බි තරගාවලියේ පළමු අදියර ලබන මාර්තු මස 20 සහ 21 දෙදිනත්, දෙවැනි අදියර මාර්තු මස 26 සහ 27 දෙවැනි අදියරත් පැවත්වීමට කටයුතු යොදා තිබේ.

"කොරෝනා වසංගත තත්ත්වය තුළ අපට මෙවැනි අර්බුදවලට මුහුණ දීමට සිදු වන බව දැන සිටියා. ඒත් අපි මෙරට රග්බි ක්‍රීඩාව ආරම්භ කර ඉදිරියට රැගෙන යා යුතුයි. ඒ නිසා මම සිතනවා දැනට ඉතිරිව ඇති කණ්ඩායම් 5ට අමතරව තවත් කණ්ඩායමක් ඇතුළත් කරමින් කණ්ඩායම් 6ක තරගාවලියක් ලෙස පැවැත්වීමේ හැකියාව තිබෙනවා. ඒ හැරත් ඉදිරියේදී මෙවැනි ගැටලු



හේතුවෙන් හැව්ලොක්ස් ක්‍රීඩා සමාජයත් තරගාවලියෙන් ඉවත් වන්නේ නම් ත්‍රිවිධ හමුදා කණ්ඩායම් සහ පොලිස් ක්‍රීඩා සමාජය සමග කණ්ඩායම් 4ක තරගාවලියක් ලෙස හෝ තවත් දෙවැනි පෙළ කණ්ඩායම් කිහිපයක් සහභාගි කරවමින් කණ්ඩායම් 8ක තරගාවලියක් ලෙස හෝ පැවැත්වීමට හැකියාව තිබෙනවා. අපිට විකල්ප කිහිපයක්ම තිබෙනවා." ඉල්යාස් මහතා කියා සිටියේය.

ඉදිරියේදී ගුවන් හමුදාපති කුසලානය නිරාවරණය කරමින් තරගාවලිය ආරම්භ කිරීම සම්බන්ධව නිල මාධ්‍ය හමුවක් පැවත්වීමට කටයුතු යොදා ඇති බවත්, තරගාවලියේ නව මුහුණුවර පිළිබඳ එදිනට අනාවරණය කරන බවත් ඔහු වැඩි දුරටත් කීවේය.

"කොරෝනා තත්ත්වය තුළ මෙවැනි තරගාවලියක් පැවැත්වීමට ඇති හැකියාව සහ එම තරගාවලිය පැවත්වීමට සැලසුම් කර ඇති ආකාරය පිළිබඳ අප ඉදිරිපත් කළ වාර්තාවට ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ අනුමැතිය ලැබීමත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමත් ලොකු ජයග්‍රහණයක්. ඒ නිසා කෙසේ හෝ තරගාවලිය සාර්ථකව පවත්වමින් මෙරට රග්බි ක්‍රීඩාව ඉදිරියට රැගෙන යාම රග්බි ආයතනයේ මෙන්ම ගුවන් හමුදාවේ සහ අනුග්‍රාහක ඩයලොග් ආයතනයේ එකම බලාපොරොත්තුවයි." රග්බි සභාපතිවරයා කියා සිටියේය.



## සෙනුරිට අන්තර්ජාතික ජයක්

අන්තර්ජාතික විවෘත ටයිකොන්ඩෝ තරගාවලියේදී ශ්‍රී ලංකාවට රිදී පදක්කමක් දිනා දීමට බී.ඒ.ඩී. සෙනුරි දේවින්දි සේනානායක සමත් වූවාය.

වීඩියෝ තාක්ෂණය ඔස්සේ නේපාලයේ පැවැති තරගාලියේදී අවුරුදු 6-9ත් අතර, වයස් කාණ්ඩයේ පුම්සේ ඉසව්වෙන් තරග කරමින් සෙනුරි මේ දස්කම් දැක්වූවාය.

දෙහිඕවිට මානයම්ගම කනිෂ්ඨ විද්‍යාලයේ 2 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඇය විද්‍යාලයීය ස්කෝර්පියන් ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් මේ තරගයට එක් වූ අතර, ඇයගේ පුහුණුකරු ලෙස පුහුණුකරු ලෙස කැප්ටන් පී.පී. සම්පත් මහතා කටයුතු කරයි. අන්තර්ජාතික ටයිකොන්ඩෝ පුහුණුකරුවකු සහ විනිසුරුවකු වන ඒ මහතා ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සංගමයේ ලේකම් සහ කෑගල්ල දිස්ත්‍රික් සංගමයේ ලේකම් ලෙස ද කටයුතු කරයි.

**සටහන සහ ඡායාරූපය**
**දැරණියගල සමූහ**
**ඩබ්.එම්. තිලකරත්න**

## අද තරගයට ආචර් නෑ

එංගලන්ත වේග පන්දු යවන ක්‍රීඩක ජොෆ්රා ආචර්ට ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම සමඟ අද (13) ආරම්භ වන දෙවැනි ටෙස්ට් තරගය අහිමි වෙයි.

පළමු ටෙස්ට් තරගයේදී ඔහු දකුණු වැලමිට ප්‍රදේශයේ ආබාධයකට ගොදුරු වූ අතර, ඒ හේතුවෙන් එන්නත් කිරීමක් අනතුරුව ඔහුට දෙවැනි තරගයෙන් ඉවත් වී තිබේ.

කෙසේ වෙතත් ලබන 24 වැනිදා අහමදාබාද්හිදී පැවැත්වෙන තෙවැනි ටෙස්ට් තරගයට ක්‍රීඩා කිරීමට ආචාර් සුවය ලබනු ඇතැයි එංගලන්ත ක්‍රිකට් ආයතනයේ විශ්වාසය වී තිබේ.

ආචර්ගේ ආබාධය හේතුවෙන් ඔහුගේ ස්ථානයට ඔලී ස්ටෝන් කැඳවීමට ඉඩ ඇතැයි වාර්තා වේ. ජේම්ස් ඇන්ඩර්සන් විවේක ගැන්වීමට කටයුතු කර ඇති බැවින් ස්ටුවර්ට් බ්‍රෝඩ් මේ තරගයට එක්කර ඇත.

මේ අතර, තරග 4කින් සමන්විත ටෙස්ට් තරගාවලියේ චෙන්නායිහිදී අද ආරම්භ වන දෙවැනි තරගය ප්‍රේක්ෂකයන්ට විවෘත කිරීමට ඉන්දීය ක්‍රිකට් බලධාරීන් පියවර ගෙන තිබේ.

ඒ අනුව කොරෝනා වසංගතයෙන් පසු ප්‍රේක්ෂකයන් පිටියේදී තරගයක් නරඹන පළමු අවස්ථාව මෙය වන අතර, පහළොස් දහසකට මේ සඳහා අවස්ථාව හිමි වෙයි.

## පාකිස්තානයට තියුණු ජයක්



මොහොමඩ් රිස්වාන්

මොහොමඩ් රිස්වාන් වාර්තා කළ ශතකය හේතුවෙන් සංචාරක දකුණු අප්‍රිකා ක්‍රිකට් කණ්ඩායම සමග පැවැති පළමු විස්සයි20 තරගයෙන් ලකුණු 3ක තියුණු ජයක් අත් කර ගැනීමට පාකිස්තානය සමත් විය.

මේ සමඟින් තරග 3කින් සමන්විත විස්සයි20 තරගාවලිය 1-0ක් ලෙස පෙරමුණ ගැනීමට පාකිස්තානයට හැකි විය.

ලාහෝර්හිදී පැවැති තරගයේ කාසියේ වාසිය දිනූ දකුණු අප්‍රිකානු පිලේ ආරාධනයෙන් පළමුව පන්දුවට පහර දුන් පාකිස්තානය කඩුලු 6ක් දැවී ලකුණු 169ක් රැස් කළේය. එම ඉලක්කය හඹා ගිය සංචාරකයන්ට ඕවර 20 අවසානයේ රැස් කළ හැකි වූයේ ලකුණු 166ක් පමණි.

රීසා හෙන්ඩ්‍රික්ස් පන්දු 42කින් ලකුණු 54ක් සහ ජනේමන් මාලන් ලකුණු 44ක් රැස් කරමින් දකුණු අප්‍රිකාවට සාර්ථක ආරම්භයක් දුන්න ද අවසන් ඕවරයේදී හිමිවූ ලකුණු 18 හමුවේ දකුණු අප්‍රිකානු ක්‍රීඩකයන්ට රැස්කළ හැකි වූයේ ලකුණු 15ක් පමණි.

ඩ්වේන් ප්‍රිටෝරියස් පන්දු 6කින් ලකුණු 15ක් සහ බජෝර්න් ෆෝටුයින් පන්දු 9කින් ලකුණු 17ක් රැස් කරමින් කණ්ඩායම ජයග්‍රහණ කරා ගෙන යෑමට උත්සාහ කළද එය අසාර්ථක විණි.

පන්දු යැවීමේ දී හැරිස් රවුෆ් හා උස්මාන් කාදීර් කඩුලු 2 බැගින් බිඳ දැමූහ.

ආරම්භක පිතිකරු මොහොමඩ් රිස්වාන් මංගල විස්සයි20 ශතකය රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් පාකිස්තාන පිල ලකුණු 169 සීමාවට රැගෙන ගියේය. තරගයේ වීරයා වූ ඔහු පන්දු 64කදී හතරේ පහර 6කින් සහ හයේ පහර 7කින් ඉනිම වර්ණවත් කර ගත්තේය. හයිදර් අලි ලකුණු 21ක් ඉනිමට එක් කළ අතර, ඇන්ඩිල් පෙලුක්වායෝ කඩුලු 2ක් දවා ගත්තේය.

දෙපිල අතර, දෙවැනි විස්සයි20 තරගය අද (13) ලාහෝර්හිදීම පැවැත්වේ.

# ආනයන-අපනයන සමතුලිත කර ස්ථිරසාර ආර්ථිකයක් ගොඩනඟනවා

## මුදල් රාජ්‍ය ඇමැති අජිත් නිවාඞ්



**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

ටයිල් සහ සෙරමික් භාණ්ඩ ආනයනයට සීමා පනවමින් මුදල් ඇමැතිවරයා මෙම මස 02දා පැන වූ ගැසට් නිවේදනය අත්හිටුවා ආණ්ඩුව නැවත නියෝගයක් නිකුත් කළේ දේශීය නිෂ්පාදකයන් ඉදිරිපත් කළ ඉල්ලීම් සමාලෝචනය කිරීමෙන් පසුව බව මුදල් රාජ්‍ය ඇමැති අජිත් නිවාඞ් කබ්රාල් මහතා පාර්ලිමේන්තුවේදි ඊයේ (12දා) ප්‍රකාශ කළේය.

ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ ගැසට් පත්‍රයේ, රෙගුලාසි 3 සහ 4 පමණක් අත්හිටුවන ලෙස නියෝග දී ඇති බවද රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

රාජ්‍ය ඇමැති අජිත් නිවාඞ් කබ්රාල් මහතා මේ බව සඳහන් කළේ ජාතික ජනබලවේගය පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා ස්ථාවර නියෝග 27/2 යටතේ මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

ආනයන අපනයන පාලන පනත පිළිබඳ ගැසට් නිවේදනය අවලංගු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියකුට හැකියාව තිබේද යන්න පක්ෂනායකවරයා විමසූ අතර ඒ පිළිබඳ රාජ්‍ය ඇමැතිවරයා කියා සිටියේ මුදල් ඇමැතිවරයා විසින් කරන ලද නියෝගය අවලංගු කර නොමැති බවයි.

ගැසට් නිවේදනය නිකුත් කිරීමේ සිට අත්හිටුවීම දක්වා වන කාලය අතරතුර නැවත ටයිල් හා සෙරමික් භාණ්ඩ ආනයනයට ආනයනකරුවන් ණයවර ලිපි විවෘත කර නොතිබුණු බවද සඳහන් කළ රාජ්‍ය ඇමැතිවරයා ඒ අතරතුර සීමාසහිත කාලයක් මෙන්ම බොහෝවිට බැංකු කටයුතු සිදු නොවන කාල පරිච්ඡේදයක් නිසා එසේ වී නොමැති බව සඳහන් කළේය.

අනුර කුමාර දිසානායක මහතා රජයේ බඳු පරස්පර විරෝධයන් සිදුවන්නේ ඇයි ද යනුවෙන් ඉදිරිපත් කළ ගැටලුවට පිළිතුරු දෙමින් රාජ්‍ය ඇමැතිවරයා කියා සිටියේ එසේ නොවනබවත්, තවත් ගැසට් පත්‍රයක් නිකුත් කරමින් ආනයන සහ අපනයන අතර කිසියම් සමතුලිතතාවක් ඇති කරමින් ස්ථිරසාර ආර්ථික රටාවක් වෙත ගමන් කිරීමට රජය උත්සාහ දරමින් සිටින බව ප්‍රකාශ කළේය.

# ‘පොහොට්ටුව’ වෙනස්කම් පිළිගන්නා දේශපාලන පෙරමුණක්

## නවක මන්ත්‍රී එකමුතුවේදී පා.ම. මහාචාර්ය රංජිත් බණ්ඩාර කියයි



ජනතා අභිලාෂ ඉටු කිරීම වෙනුවෙන් ආණ්ඩුව ආරක්ෂා කර ගැනීමට නවක මන්ත්‍රීවරුන්ගේ එකමුතුවේ අරමුණ බව කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න මහතා පෙරේදා (11දා) බත්තරමුල්ල අපේගම පරිශ්‍රයේදී පැවැති මාධ්‍ය හමුවකදී පැවැසීය. එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා මෙසේ ද කීවේය.

පාර්ලිමේන්තුව රැස්වුණ මුල් අවස්ථාවේ ඉඳලම අපට අභ්‍යන්තර සංවාදයක් තිබුණා. සමස්තයක් විදියට රට ගොඩනැඟීමේ කාර්යභාරය තුළ අපේ දායකත්වය වෙනුවෙන් අප මේ එකමුතුව හදාගත්තා. ඒ වගේම පසුගිය ජනාධිපතිවරණයට මුහුණ දෙන අවස්ථාවේදී රට තුළ හෝඩුවාවක්වත් නොතිබුණ අනපේක්ෂිත අභියෝගයකට ජාතියක් විදියට මුහුණ දෙමින් ඉන්නවා. ඒ කොවිඩ් මතු කළ අලුත් ආර්ථික සමාජ අර්බුදයයි. අප ඒ තත්ත්වයන් කළමනාකරණය කරමින් රට යළි ගොඩනැඟීමට අලුත් ක්‍රමවේදයන් පාවිච්චි කළ යුතුයි.

**කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ලලිත් එල්ලාවල** - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නිර්මාතෘ බැසිල් රාජපක්ෂ මහතා හිරේ විලංගුවේ දානකොට තමයි මේ පක්ෂය නිර්මාණය කළේ. එදා ඉඳන්ම විශේෂයෙන්ම මේ පසුපෙළ මන්ත්‍රීවරු එදා පළාත් සභා මන්ත්‍රීවරු වෙලා ඉඳගෙන ප්‍රාදේශීය සභාවල සභාපතිවරු වෙලා ඉඳගෙන ලොකු කැපවීමක් කළා මේ පක්ෂය ගොඩගන්න. එසේ ගොඩනැගූ ආණ්ඩුවේ අගමැතිවරයා, ජනාධිපතිවරයා ආරක්ෂා කර ගැනීම නවක මන්ත්‍රී කණ්ඩායමේ අරමුණයි.

**පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා** - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැම කෙනෙකුටම අදහසක් තියෙනවයි කියල පිළිගන්න පක්ෂයක්. අපි විවිධත්වයට කැමැති පක්ෂයක්. අපි නියෝජනය කරන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව.

මේ රටේ මහජනතාව අපව බලයට පත් කරද්දී ජනාධිපතිවරයා, අගමැතිවරයා කෙරෙහි විශාල විශ්වාසයක් තිබුණ. ඒ නිසාම අපට පුළුවන්කම ලැබුණා පිට පිට මේ රටේ දේශපාලන ඉතිහාසයේ කිසිදු පක්ෂයක් ජයග්‍රහණය නොකළ ආකාරයට ප්‍රාදේශීය සභා මැතිවරණය ජනාධිපතිවරණය පාර්ලිමේන්තු මැතිවරණය ජයග්‍රහණය කරන්න විශිෂ්ට ලෙස. අප මේ ජයග්‍රහණයක් ඉලක්ක කළේ සෞභාග්‍යයේ දැක්ම තුළ අඩංගු සියලු අපේක්ෂාවන් යථාර්ථයක් බවට පත් කිරීමේ පරමාර්ථයෙන්. ඒ නිසා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පසුපෙළ මන්ත්‍රීන් පෙනී සිටින්නේ මෙන්න මේ උදාර කර්තව්‍ය වෙනුවෙන්. ඒ නිසා අප මේ රටේ මහජනතාවට නැවත වතාවක් කියා සිටිනවා අප අතර වෙනස්කම් තියෙනව හැබැයි අපි ඒ වෙනස දරාගන්නට තරම් දේශපාලන පක්ෂයක්. ඒ වෙනස දරාගැනීම තමයි අපේ තියෙන ලොකුම ශක්තිය. ඒ නිසා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පෙරමුණක්. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වචනයේ පරමාර්ථත් සියල්ල සමග වැඩකිරීමට සූදානම් පක්ෂයක්. ඒ නිසා අපි කිසිවෙක් කිසිවෙකුගේ වැරදි හෝ අඩුපාඩු හොයන්නේ නෑ. අපි මේ රටේ මහජනතාවට වගකියන දේශපාලන පක්ෂයක්.

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප්, අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රී කේ.පී. එස්. කුමාරසිරියන මහත්වරුද කතා කළහ.

# යහපාලනය ඇත්තටම මිල අඩු කළා මේ ආණ්ඩුව නමට මිල අඩු කරනවා

## රට යළි කළු කඩ යුගයකට ගෙන යනවා

### සජබ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර



**පහන් විජේසේකර**

ආනයන සීමා කර පැරැණි කළු කඩ යුගයකට ආණ්ඩුව රට ගෙන යමින් තිබෙන බව විපක්ෂනායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක දී සමගි ජනබලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා ඊයේ (12දා) ප්‍රකාශ කළේය. එහිදී අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීවේය.

වෙළෙඳ ඇමැති අත්‍යවශ්‍ය භාණ්ඩ 27ක මිල පහත හෙලන බව ප්‍රකාශ කරා ඒ වෙනුවෙන් පුවත්පත්වල පිටු භාගයක් ම වෙන් කර දැන්වීම් දැම්මා. ආණ්ඩුව නැවත ආනයන අපනයන සම්බන්ධ නීති රීති දමලා ආනයන සීමා කර තිබෙනවා. නමුත් තවම අපනයනවල අඩුවක් සිදුව නැහැ. නමුත් 2015ට වැඩිය අපනයන ආදායම වැඩි වී ඇති බව පැහැදිලි. රටේම අපනයනය ආදායම ඩොලර් මිලියන 10547යි. 2019 වසරේ ඩොලර් මිලියන 11972යි. දැනටත් ඩොලර් මිලියන නමදාස් ගණනක් වෙලා. නමුත් රටේ අපනයනය අඩු වීමක් සිදුව නැහැ.

එයට හේතුව වන්නේ රුපියල අව ප්‍රමාණය වන අතර ආණ්ඩුව ගජ මිතුරුන්ට බදු සහනය දීමයි. මුදල් අච්චු ගැසීමයි. ආණ්ඩුව ආනයන බදු අඩු කළ විට ගජ මිතුරුන්ගේ බදු අඩු කර නැහැ. සීනි බදු සහනය ජනතාවට ලැබුණේ නැහැ. බදු අඩු කිරීමෙන් පසු සීනි ටොන් 2,50,000ක් මෙරටට ගෙන්වා තිබෙනවා. අනෙකුත් භාණ්ඩ ආනයන සීමා කරද්දි සීනි ගෙන්වා තිබෙනවා. ආණ්ඩුවේ මිත්‍රයන් පිනවන්න එසේ කර තිබෙනවා. නමුත් සීනි මිල වෙළෙඳ පොළේ තවම රුපියල් 120යි. එයින් රටට බිලියන 12 හමාරක් අහිමි වුණා. කොවිඩ් එන්නත ගේන්න වැය වෙන්නේ බිලියන 10යි.

ටයිල් උපාංග ආනයන සීමා කිරීමෙන් පාරිභෝගිකයන් අසරණ වෙලා. අද භාණ්ඩ 27ක මිල අඩු කරන බව බන්දුල ගුණවර්ධන වෙළෙඳ ඇමැති කිව්වවත් එසේ වෙලා නැහැ. ගජමිතුරුන් මුදල් හම්බු කරනවා. කොහොමත් වී නිෂ්පාදනය වැඩි කාලයට සහල් මිල අඩු වෙනවා. බන්දුල ඇමැතිට අඩු කරන්න දෙයක් නැහැ. යහපාලන රජය තරම් බඩු මිල සහනයක් මේ ආණ්ඩුව ජනතාවට දී නැහැ. අද පරිප්පු, අර්තාපල්, හාල් මැස්සන්, රතු ළූණු මිල සියල්ල වැඩි වෙලා. නිෂ්පාදනය වැඩි කාලයට මිල අඩු වීමක් එදා සිට වෙනවා.

ආණ්ඩුව ගජ මිතුරුන්ට සහන දෙන්න විතරක් ගැසට් කීයක් ගැහුවද දැන් සෙරමික් උපකරණවලටත් ගැසට් ගහනවා. ඉස්සර මිනිස්සු අතර ගැසට් කිව්වම කොච්චර පිළිගැනීමක් තිබුණ ද අද ජනාධිපතිවරයාගේ ගැසට් මිනිස්සු ගණන් ගන්නේ නැහැ.

අද ගම්මිරිස් ගොවියා අසරණ වෙලා. එදා සිටි විපක්ෂය ගම්මිරිස් කරල් වේදිකාවේ පෙන්නලා දැන් සැපද අහුවා. අද රට අරාජික තත්ත්වයට පත්වෙලා අගමැති පාර්ලිමේන්තුවේ පවසන දේ ඇමතිවරු එළියට ඇවිත් නැහැ කියනවා. අද අගමැතිවරයා බාල්දු කරලා. එක පැත්තකින් ආණ්ඩුව අද විහිළුවක් වෙලා. මේ ආණ්ඩුව වැඩි කල් බලයේ ඉන්න බැහැ ජනතාව මුල දී කිව්වේ සර් ෆේල් කියලා. දැන් සර් විතරක් නොවෙයි ආණ්ඩුවත් ෆේල් බව මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

# වගා කරන තරුණයන්ට ණය දෙන්න ආණ්ඩුව සූදානම්

## ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ



**ස්වර්ණා විජේකෝන්, සන්ධ්‍යා කරුණාරත්න**

පුරන් කුඹුරු අස්වැද්දීමට කටයුතු කරන පිරිස් සඳහා මෙන්ම අනෙකුත් වගා කටයුතුවල යෙදෙන තරුණයන් වෙනුවෙන් ණය පහසුකම් ලබාදීමට කටයුතු කරන බව කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පවසයි.

එමෙන්ම පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනක් ජාතික උත්සවයක් ලෙස සංවිධානය කිරීමටද කටයුතු කරන බව අමාත්‍යවරයා සඳහන් කළේය.

එක් දිනයක් තුළදී රටේම විශාල පුරන් කුඹුරු ප්‍රමාණයක් අස්වැද්දීමට කටයුතු කරන අතර සියලු ඉඩම් වගාකිරිමට ජනතාව උනන්දු කරවිය යුතු බවද ඇමතිවරයා පැවසීය.

එමෙන්ම මෙතෙක් වගා අක්කර පහක් හිමි ගොවීන්ට පමණක් ලබාදුන් ගිනි අවි බලපත්‍රය එක් වගා අක්කරයක් හිමි ගොවීන්ටද දීමට හැකිවන ආකාරයෙන් අදාළ චක්‍රලේඛනය සංශෝධනය කරන බව ද අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

ඇමතිවරයා මේ බව සඳහන්කළේ පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැති කෘෂිකර්ම අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදීය.

එමෙන්ම මෙතෙක් වගා අක්කර පහක් හිමි ගොවින්ට පමණක් දුන් ගිනි අවි බලපත්‍රය එක් වගා අක්කරයක් හිමි ගොවීන්ටද දීමට හැකිවන ආකාරයෙන් අදාළ චක්‍රලේඛනය සංශෝධනය කරන බව ද අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

විශේෂයෙන් කුඩා පරිමාණ ඉඩම් හිමි ගොවියන්ට ඌරන් රිලවුන් වැනි සතුන්ගෙන් වගා සඳහා දැඩි අලාභ හානි සිදුවන නිසා එවැනි ගොවියන් තම වගා කටයුතුවලින් ඉවත්වීම සිදුවන බැවින් මේ සඳහා කටයුතු කරන බව පැවසීය. මෙම කාරක සභාවට පැමිණ සිටි මන්ත්‍රීවරුන්ගේ අදහස වූවේද අදාල චක්‍රලේඛනය ඉක්මනින් සකස් කළ යුතු බවයි. එසේම වනජීවී අමාත්‍යාංශය හා සම්බන්ධ වී මෙසේ වගා සඳහා හානි පමුණුවන සතුන් අල්ලා කූඩු කිරීමට කටයුතු කරීමට අවධානය යොමුවී ඇතිබවද පැවසීය. මේ වෙනුවෙන් අවශ්‍ය කූඩු සැකසීමට වනජීවී අමාත්‍යාංශය හා සම්බන්ධ වී කටයුතු කරන බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

ලංකාවේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා අවශ සියලු උපකරණ දීමට කටයුතු කරන අතර අවශ්‍ය තාක්ෂණයෙන් ශක්තිමත් කරන බවද මෙහිදී පැවසීය. බඩඉරිඟු සඳහා නිවැරදි මිලක් ලබාදීමේ අවශ්‍යතාව වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත්වී කටයුතු කරන බවද කාරක සභාවේදී සඳහන් විය.

එසේම රටේ පවතිව මුඩු ඉඩම් කෘෂිකර්ම අවශ්‍යතා වෙනුවෙන් යොදාගැනීමේ හැකියාව පිළිබඳ පැමිණ සිටි මන්ත්‍රීවරු සහ අමාත්‍යවරයා සාකච්ඡා කළේය.

# හිටපු ඇමැති රවීට එරෙහිව සාක්කිකරුවෝ 32ක්

## අල්ලස් කොමිසම අධිකරණයට දන්වයි

**කුමුදු හෙට්ටිආරච්චි**

කොල්ලුපිටිය ‘මොනැක්’ නිවාස සංකීර්ණයේ රුපියල් මිලියන 11.68ක් වටිනා නිවෙසක් තුටු පඬුරක් ලෙස ලබා ගැනීම හා ලබාදීම සම්බන්ධයෙන් හිටපු මුදල් ඇමැති රවී කරුණානායක හා පර්පචුවෙල් ට්‍රෙෂරිස් සමාගමේ අධ්‍යක්ෂවරයකු වන අර්ජුන් ඇලෝසියස් යන අයට එරෙහි නඩුව ලබන අප්‍රියෙල් 01 වැනිදා යළි කැඳවීමට කොළඹ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ මහතා ඊයේ (12දා) නියෝග කළේය.

පසුගිය 05 වැනිදා විත්තිකරුවන් හට අධිචෝදනා පත්‍ර භාර දීමෙන් අනතුරුව විත්තිකරුවන්ට ඇප නියම කළ විනිසුරුවරයා එම ඇප කොන්දේසි සපුරා ඇද්දැයි පරීක්ෂා කිරීම සඳහා නඩුව ඊයේ (12දා) දිනට කැඳවීමට නියෝග කර තිබුණි.

ඒ අනුව ඇප කොන්දේසිවලට අදාළ ලේඛන කාර්යාලයට භාර දෙන ලෙස ඊයේ (12දා) අධිකරණය හමුවේ පෙනී සිටි වික්තිකරුවන්ට නියෝග කළ විනිසුරුවරයා නඩුව යළි අප්‍රියෙල් 01 වැනිදා කැඳවීමට එසේ නියෝග කළේය.

# අභියාචනාධිකරණය මුතුරාජවෙල පෙත්සම ඇසීමට තීරණය කරයි

**නෙල්කා මැදගෙදර**

මුතුරාජවෙල අභය භූමිය ආශ්‍රිත වගුරු බිම් පිරවීම සඳහා එම ප්‍රදේශයට කැළි කසළ සහ අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් වගකිවයුත්තන් වළක්වන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා ගොනු කර ඇති රිට් පෙත්සම මාර්තු මස 03වැනිදා කැඳවීමට අභියාචනාධිකරණය ඊයේ (12දා) තීරණය කළේය.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ අභියාචනාධිකරණ විනිසුරු මායාදුන්න කොරයා යන මහත්වරුන් හමුවේ මෙම පෙත්සම් කැඳවනු ලැබිණි.

එහිදී පෙත්සම වෙනත් දිනයක කැඳවීමට තීරණය විය. පාරිසරික යුක්ති කේන්ද්‍රය සහ එහි අධ්‍යක්ෂ හේමන්ත රංජිත් සිසිර කුමාර මහතා විසින් මෙම පෙත්සම ගොනු කර ඇත.

මෙම පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර ඇමැති මහින්ද අමරවීර, වනජීවී සහ වන සංරක්ෂණ ඇමැති සී.බී.රත්නායක, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර, වන ජීවී අධ්‍යක්ෂ ඩබ්ලිව්.ඒ.සී. වේරගොඩ, ගොවිජන සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ රෝහණ රාජපක්ෂ, පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න, ප්‍රාදේශීය ලේකම්වරුන්, නීතිපති ඇතුළු 12 දෙනකු නම් කරනු ලැබ සිටිති. නීතිඥ රවීන්ද්‍රනාත් දාබරේ මහතා පෙත්සම වෙනුවෙන් පෙනී සිටියේය.

# මහ බැංකු හොරු දූෂණය ගැන කියන විට ජනතාවට හතර හිනා

## පා.ම. මධුර විතානගේ

**නුවන් කොඩිකාර**

යහපාලන ආණ්ඩුව කාලයේ මහ බැංකුවෙන්, කරුංකවලින්, තඹවලින් හොරකම් කළ හිටපු මැති ඇමැතිවරුන් අද ජනතාව ඉදිරියට පැමිණි දූෂණය, භීෂණය ගැන කතා කිරීම හාස්‍යජනක යැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මහතා පවසයි.

දේශපාලන වශයෙන් බංකොළොත් වී ඇති විපක්ෂය කුමන මතවාද ගෙන ගියද ඊට ඇහුම්කන් දීමට ජනතාව සූදානම් නැති බව හෙතෙම කීවේය.

කොරෝනා වසංගත තත්ත්වය තිබියදීත් රට යළිත් වැඩ බිමක් බවට පත් කිරීමට වත්මන් රජයට හැකිව ඇති බවත් එය දරා ගැනීමට නොහැකි වූ පිරිසක් රට ගිනි තියා හෝ බලය ගැනීමේ කුමන්ත්‍රණයක නියැළී සිටින බවත් රාජගිරියේ පැවැති උත්සවයකින් අනතුරුව මාධ්‍ය අමතමින් මන්ත්‍රීවරයා කියා සිටියේය.

කොරෝනා වයිරසයට නොබියව මුහුණ දෙමින් ඉන් රට ගලවා ගැනීමට ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු ආණ්ඩුව ගෙන යන වැඩපිළිවෙළට ලෝකයේම පැසසුම් හිමි වෙද්දි අපේ රටේ කුහක පිරිස් එක්වී එය හෑල්ලුවට ලක් කිරීමට උත්සහ ගනිමින් සිටින බවද ඒ මහතා සඳහන් කළේය.

තවත් කෙටි කාලයකින් කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය සහමුලින්ම අවසන් කර ගැනීමට හැකි වනු ඇති බව පෙන්වා දුන් විතානගේ මහතා ඉන් පසු ජනතාවට කිසිඳු බියක් සැකක් නොමැතිව දෛනික කාර්යයන් හි නිරත වීමට හැකි වනු ඇති බව කීවේය. මන්ත්‍රීවරයා වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.



පසුගිය යහපාලනය කාලයේ මේ රටේ ආණ්ඩුවක් තිබුණද කියලා ලොකු ප්‍රශ්නයක් ජනතාවට තිබුණා. රටේ නායකයා කවුද කියන්නේ කියලා ප්‍රශ්නයක් තිබුණා. රට තනිකරම අයාලේ යමින් තමයි තිබුණේ. සෑම අංශයකින්ම රට කඩාගෙන වැටෙන්න ගත්තා. අවුරුදු ගණනක් දුක් විඳ ඇති කරගත්ත ආරක්ෂාව සහමුලින්ම නැති කළා. දවසින් දවස රට අගාධයට යමින් තිබුණා. ඒ තත්ත්වය තවදුටත් බලා ගෙන ඉන්න බැරි වුණ ජනතාව පාරට බැහැලා යහපාලන ආණ්ඩුව වෙනස් කරන්න කටයුතු කළා. හැටනව ලක්ෂයකට අධික පිරිසක් ඡන්දය දෙමින් රටේ නායකත්වය පත් කර ගත්තා. අන්න ඒ ජනතාව තැබූ විශ්වාසය රැකගන්න ඔවුන් පත් කළ නායකයට හැකි වී තිබෙනවා. එතුමන් යම් තීන්දු තීරණ ගනිද්දි කාමරවලට වෙලා එම තීන්දු ගත්තේ නැහැ. ජනතාව අතරට ගිහින්, ඒ ජනතාවත් එක්ක කතා කරලයි තීන්දු තීරණ ගන්නේ.

මේ දේ දරාගන්න බැරි ඇතැම් පිරිසක් විවිධ අසාර්ථක ක්‍රමවේද යොදා ගනිමින් ජනාධිපතිවරයාට, ආණ්ඩුවට මඩ ගහන්න කටයුතු කරමින් ඉන්නවා. මඩ ගහන එක නතර කරලා ඔවුන්ගේ අවුරුදු පහක කාලයේදී සහ අපේ අවුරුද්දක කාලයේදී කළ වැඩ කොටස ගැන කතා කරන්න එන්න කියලා අප විපක්ෂයට අභියෝග කරනවා.



# යුද ජයග්‍රහණයෙන් පසුව උතුරට මානව හිමිකම් ලැබුණා

## යාපනය සිවිල් සංවිධාන කේන්ද්‍රයේ කැඳවුම්කාර අරූන් සිද්ධාර්ත්

**උපාලි කරුණාරත්න**

යාපනයේ ජනතාවට 2009 වසරට පෙර මානව හිමිකම් නොතිබූ බවත්, දමිළ දේශපාලනඥයන්ගේ මෙහෙයවීමෙන් යාපනයේ පළ වන පුවත්පත්වලින් වැරදි තොරතුරු දන්වමින් ප්‍රදේශයේ ජනතාව නොමග යවමින් රටට විශාල හානියක් සිදු කරන බව යාපනය සිවිල් සංවිධාන කේන්ද්‍රයේ කැඳවුම්කාර අරූන් සිද්ධාර්ත් මහතා පවසයි.

සිද්ධාර්ත් මහතා මේ අදහස් පළ කළේ ඊයේ (12දා) ජාතික උරුම, ප්‍රසංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ලේ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති සාකච්ඡාවකට සහභාගි වෙමිනි.

යාපනය ජනතාවගේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගෙන විහාරස්ථාන ගොඩනගන බවට එල්ල වන චෝදනා අසත්‍ය බව පෙන්වා දුන් අරූන් සිද්ධාර්ත් මහතා බෞද්ධ ජනතාව හා රජය දෙමළ ජනතාවගේ සතුරන් ලෙස ව්‍යාජ ලෙස පෙන්වීමට උත්සාහ කරන බව පැවසීය. දෙමළ ජාතික සන්ධානයට ගැටලු පවතිනවා නම් ආණ්ඩුව සමඟ ඒවා සාකච්ඡා කර විසඳාගත යුතු යැයි හෙතෙම කීය.

රුපියල් 1500ට භූමිතෙල් විකුණා පාර්ලිමේන්තු ගිය දෙමළ දේශපාලනඥයන්ද සිටින බව පැවසූ සිද්ධාර්ත් මහතා ජනතාවගේ බලවත් මානව හිමිකමක් වන ජල අයිතියට බාධා කරමින් මාවිල් ආරු සිදුවීමට සම්බන්ධව කටයුතු කළ එල්.ටී.ටී.ඊ නායකයකු වන එළිලන් වෙනුවෙන් මානව හිමිකම් කටයුතු සිදු කරන බවද පැවසීය.

# සියලු දේශීය නිෂ්පාදන හා සේවා එක තැනකදී මිලට ගැනීමට පාරිභෝගිකයාට ඉඩ සැලැස්වීම 'රජවාස' ව්‍යාපෘතියේ ඉලක්කයයි

## ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

**අනුර ප්‍රේමලාල්**

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රකාර රාජ්‍ය ව්‍යවසායකයන්ගේ හා දේශීය නිෂ්පාදකයන්ගේ ගුණාත්මක භාණ්ඩ හා සේවා එක වහලක් යටදී සපයා ගැනීමට පාරිභෝගිකයාට අවස්ථාව උදා කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ බව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළ පෙරේදා (11) ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ප්‍රදර්ශනාගාරය පුළුල් කර "රජවාස" වෙළෙඳ සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට එක්වෙමින්ය.

නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථාන භූමියේ ස්ථාපිත "State Trust Centre" (රජවාස) වෙළෙඳ සංකීර්ණය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණි.

එය රාජ්‍ය සහ පෞද්ගලික වෙළෙඳ ආයතන 78කින් සමන්විතය. දේශීය නිෂ්පාදකයන් දිරි ගැන්වීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන භාණ්ඩ වෙළෙඳසල්වලට සැපයීමේ අවස්ථාව සැලසීම ද නව වැඩපිළිවෙළට අයත්ය.

සමරු ඵලකය නිරාවරණය කරමින් වෙළෙඳ සංකීර්ණය විවෘත කළ ජනාධිපතිතුමා වෙළෙඳසල් වෙත යමින් නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් සමග අදහස් හුවමාරු කර ගත්තේය.

එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ මෙම ව්‍යාපෘතියේ නිර්මාතෘ වෙළෙඳ අමාත්‍යවරයා මෙසේද කීය:

ලාංකීය ඉතිහාසයේ ප්‍රථම වතාවට ගුණත්වයෙන් ඉහළ භාණ්ඩ වඩා සාධාරණ මිල ගණන් යටතේ එකම වහලක් යටින් ලබා ගැනීමට මේ ඔස්සේ පාරිභෝගික ජනතාවට අවස්ථාව උදා වන අතර නිෂ්පාදකයන්ටද සිය නිෂ්පාදන සෘජුවම අලෙවි කිරීමට මේ ඔස්සේ අවස්ථාව උදා වේ.

තමා භාරගන්නා විට පාඩු ලබන ආයතනයක් බවට පත් වී තිබූ රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව තව මාස තුනක් යෑමට මත්තෙන් ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විටත් සිදු කර අවසන් බව කියා සිටි අමාත්‍යවරයා දිවයින පුරා දිස්ත්‍රික්ක විසිපහේම මෙම රජවාස වෙළෙඳ මධ්‍යස්ථාන ඇති කිරීම සිය බලාපොරොත්තුව බවද සඳහන් කළේය.

රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවට වසර පනහක් සපිරීම නිමිත්තෙන් තැපැල් දෙපාර්තමේන්තුව මගින් සමරු මුද්දරයක් නිකුත් කිරීමද මේ අවස්ථාවට සමගාමීව සිදු කෙරුණි. මෙම අවස්ථාවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ, කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ, රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, මහාචාර්ය චන්න ජයසුමන, ශෂීන්ද්‍ර රාජපක්ෂ, ජානක වක්කුඹුර, රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවේ සභාපති සහ වෙළෙඳ අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.





# සමස්ත අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ඇරඹේ



**රෝෂන් තුෂාර**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව සමස්ත අධිකරණ පද්ධතිය ඩිජිටල් කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීම අධිකරණ ඇමැති එම් යූ එම් අලි සබ්රි මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (11) සිදුවිය.

අධිකරණ සේවා කොමිෂන් සභාව, තාක්ෂණ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා එක්ව මෙම ගිවිසුම අත්සන් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ මෙරට සමස්ථ අධිකරණ පද්ධතියම ඩිජිටල්කරණය කිරීම ආරම්භ කෙරේ. අධිකරණ පද්ධතියේ ලිපි ගොනු කිරීම, මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ දඩ මුදල් ගෙවීම ඇතුළු සමස්ත අධිකරණ ක්‍රියාවලියම ඩිජිටල්කරණය කිරීමට සැලැසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය පිළිබඳව වන අවබෝධතා ගිවිසුමට අත්සන් කිරීම ඊයේ දින (2021.02.11) අධිකරණ අමාත්‍යාංශයේදී සිදු විය. මීට පෙර යම් යම් අංශ පරිගණක ගත කිරීම් සිදු වුණත් ශ්‍රී ලංකාවේ සමස්ථ අධිකරණ පද්ධතියම ඩිජිටල් කරණය කිරීම පිළිබදව ඒකාබද්ධ වන පුළුල් නව වැඩපිළිවෙළක් මෙමගින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙහි පළමු අදියර 2021 වසරේදී අවසන් කිරීමට අපේක්ෂිතය.

ඩිජිටල්කරණ ක්‍රියාවලිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් ඇතුළු තාක්ෂණික මෙහෙයුම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මඟින් සිදුකෙරෙනු ඇත. සමස්ථ අධිකරණ පද්ධතියට අදාළ තොරතුරු හා වාර්තා, නඩු ලිපිගොනු ශ්‍රී ලංකා තොරතුරු මේසයේ (Lanka Government Cloud) ඇතුළත් කිරීමෙන් එහි ආරක්ෂාව තහවුරු කෙරේ. (Data Security)

මෙම ව්‍යාපෘතිය මඟින් අධිකරණ කටයුතු විධිමත් වීම කඩිනම් කිරීම, විනිවිද භාවය, වියදම් අවම කර ගැනීම ඇතුළු වාසි රැසක් හිමිවේ.

කෙටි පණිවඩ සේවා මඟින් අදාළ පාර්ශවයන්ට අධිකරණ කටයුතු දැනුම් දීමද සිදු කෙරෙනු ඇත. නීතිඥවරුන්, නීතිඥ සමාගම් රජය හා අදාළ අනෙකුත් පාර්ශ

තත්ත්වයන් නිසා අධිකරණ පද්ධතියේ ගුණාත්මක භාවයද වර්ධනය වනු ඇත.

එමඟින් ව්‍යාපාර පවත්වාගෙන යෑමේ සත්‍ය තා දර්ශකයේ (Doing Business Index) අන්තර්ජාතිකව ඉදිරියට යෑමට හැකි වන අතර එය ආයෝජන ආකර්ෂණය වැඩිවීමටද හේතුවනු ඇත. මෙම ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යන හා ප්‍රසම්පාදන කටයුතු ලබන මාර්තු මාසයේදී ක්‍රියාවට නැගීමට අපේක්ෂිතයි. එහිදී මෙරට සැපයුම්කරුවන්ට ප්‍රමුඛත්වය හිමි වන අතර මූලික අරමුදල් සැපයීම මහා භාණ්ඩාගාරය මගින් සිදුකෙරේ.

මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාවට අධිකරණ ඇමති එම්. යූ. එම්. අලි සබ්රි මහතා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් එම්.එම්.පී.කේ. මායාදුන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් එස්.එස්. සෝමරත්න, තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සභාපති මහාචාර්ය ලලිත් ගමගේ යන මහත්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු පිරිසක් එක් වූහ.

# අලි වැට ඉදි කිරීමට අවශ්‍ය උපකරණ මෙරටදීම හදයි

## රු.මිලියන 1000ක විදේශ විනිමය ඉතිරියක්



**අනුර ප්‍රේමලාල්**

අලිමිනිස් ගැටුම හේතුවෙන් ඉදි කරන විදුලි වැට සඳහා උපයෝගි කරගන්නා පරිවාරක (Insulator) මේ රටේම නිෂ්පාදනය කිරීමට හැකිවීමෙන් වසරකට විදේශයට ඇදී යන අපේ රුපියල් මිලියන 1000ට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකි බව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඊයේ (11) විදුලි අලි වැට ඉදිකිරීමේදී යොදා ගැනෙන පරිවාරක (Insulator), වනජීවී රැකවරණ සහ වන සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදීම සඳහා වූ අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම බත්තරමුල්ල, සොබාදම් පියසේදී පැවැති අවස්ථාවට එක් වෙමින්ය.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේද කීය:

මේ පරිවාරක අපි මෙතෙක් කල් නවසීලන්තය ඇතුළු විදෙස් රට වලින් ආනයනය කළේ. මේ භාණ්ඩ අපේ රටේ කර්මාන්තකරුවන් විසින් නිෂ්පාදනය කර, ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනයට ඉදිරිපත් කළා, එම ආයතනයෙන් ප්‍රමිති සහතිකය අපි ලබා ගත්තා. පිටරටින් ආනයනය කරන පරිවාරකයට වඩා ශක්තිමත් පරිවාරකයක් බව ඔවුන් තහවුරු කර තියෙනවා.

මම අනෙකුත් ආයතනවලටත් කියන්නේ පිටරටින් ආනයනය කරන දේවල් අපේ රටේ නිෂ්පාදනය කරලා දේශීය ආර්ථිකය නගාසිටුවීමට වැඩකටයුතු කරන්න කියලා. අපිත් එක්ක එකතු වෙන්න කියලයි. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ආකාරයට ජනතා කේන්ද්‍රීය ආර්ථිකය ශක්තිමත් කෙරෙන වැඩ පිළිවෙළට මේ තුළින් විශාල දායකත්වයක් සැපයෙනවා.

මෙහිදි අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක අමාත්‍යවරයා:

සමහර අය චෝදනා කරනවා අපි ඉදිකටු ගේන්නෙත් පිටරටින් කියලා. ඒ නිසා ඒක අපි නතර කරගන්න ඕනි. අපිට අපේ රටේ මහා පොළොව, මිනිස්සු ගැන විශ්වාසයකින් කටයුතු කරලා නිෂ්පාදන ආර්ථිකයකට මේ රට ගෙනියන්න අවශ්‍යයි.

අවුරුද්දකට ජාතික ආහාර නිෂ්පාදනයෙන් 30% කට ආසන්න ප්‍රමාණයක් වන ජීවීන් විසින් විනාශ කරනවා. බොහෝ ගොවින් බැංකුවලින් ණය අරං ගෙදර දොර කනකර උකස් තියලා වගා කරන්නේ, එය එක රැයකින් වන අලින්, විවිධ වන සතුන් විනාශ කරනවා. අවුරුදු 25 ක් හදන ගේ එක පැය කාලක් ඇතුළත බිමට සමතලා කරනවා. වනජීවීන් සහ මිනිසුන් අතර ගැටුම දුප්පත් කමටද බලපා තිබෙනවා. වන ජීවීන් විනාශ වෙනවා සේම, මිනිසුන්ගේ ජීවිතත් විනාශ වෙනවා. මේ අවුරුද්දේ අපි කිලෝමීටර් 1200ක් පමණ අලුතින් අලි වැටවල් ඉදිකිරීමට කටයුතු ආරම්භ කර තිබෙනවා.

එය සාම්ප්‍රදායික මෙතෙක් පවත්වාගෙන ආපු අලි වැටම නොවෙයි. අපි විවිධ අත්හදා බැලීම් කරලා නව අලි වැටවල් කීපයක් නිර්මාණය කරලා තියෙනවා. ඒ සඳහා අද අපි අත්සන් තැබූ ගිවිසුමට අනුව, දේශීය කර්මාන්ත කරුවන්ගෙන් මෙම පරිවාරක මිලදී ගැනීමට කටයුතු කරනවා.

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ වෙනුවෙන් එහි ලේකම් එම්. ඒ. බී. විජිත බණ්ඩාරනායක සහ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළ හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) ඩබ්ලිව්. පී. පී. ප්‍රනාන්දු යන මහත්වරුන් අතර මෙම ගිවිසුම අත්සන් කිරීම සිදු විය.

ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය විසින් මෙම පරිවාරකවල (Insulator) ප්‍රමිතිය පිළිබදව නිර්දේශ ලබාදී ඇත. විදේශයෙන් ආනයන කරන ලද පරිවාරකවලට වඩා ඉහළ ප්‍රමිතියකින් යුතුව දේශීය කර්මාන්ත කරුවන් මෙම පරිවාර (Insulator) නිෂ්පාදනය කර තිබේ.

විදුලි අලි වැට ඉදිකිරීම සඳහා පරිවාරක(Insulator) නවසිලන්තය, චීනය ඇතුළු විදෙස් රට වලින් මේ දක්වා ආනයනය කර තිබේ. ඒ වෙනුවෙන් වසරකට රුපියල් මිලියන 1000ට වඩා වැඩි ප්‍රමාණයක් විදේශයන් වෙත ගෙවා තිබෙන බව ගණනය කර ඇත.

අලි-මිනිස් ගැටුම සම්පූර්ණයෙන් විසඳීම සඳහා වත්මන් රජය විසින් විදුලි වැට කි.මී 1400 දක්වා දීර්ඝ කිරීමට යෝජිතය. ඒ සඳහා වන පරිවාක (Insulator) විදේශයන්ගෙන් ආනයනය කිරීමෙන් විශාල විනිමයක් විදේශයන් වෙත ගලා යනු ඇත. මෙම ව්‍යාපෘතිය තුලින් දේශීය ආර්ථිකය ශක්තිමත් වන අතරම ජාතික ආර්ථිකයටද විශාල පිටුවහලක් සපයයි.

මෙම අවස්ථාවට රාජ්‍ය අමත්‍යාංශයන්හි අධ්‍යක්ෂවරු සහ නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

# දැරියගේ ආදර්ශවත් ක්‍රියාවෙන් අසරණ පවුලට නිවෙසක්



**උපාලි කරුණාරත්න**

ඉබ්බාගමුව, වඩුපොල ග්‍රාම සේවා වසමේ පදිංචි ඉබ්බාගමුව ආදර්ශ මහා විද්‍යාලයේ 07 වසරේ ඉගෙනුම ලබන දීප්ති සුභාෂිණී දැරිය විසින් ඇයට හිමි පෙළ පොතක ඇතුළත තිබී හමු වූ රුපියල් 20,000 ක මුදල නැවත පන්ති භාර ගුරුතුමියට ලබා දී, පසුව ගුරුතුමිය මගින් පාසලේ විදුහල්පතිතුමිය වෙත එම මුදල ලබා දී සිදු කළ ආදර්ශවත් ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ ප්‍රවෘත්තිය සමග ඒ පිළිබඳව සොයා බැලීම සඳහා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් මත ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පසුගියදා (10) එහි ගියේය.

මෙම දැරිය දැනට ජීවත් වන නිවෙස, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඔබට ගෙයක් - රටට හෙටක් නිවාස වැඩසටහන යටතේ තෝරා ගත් ප්‍රතිලාභී නිවෙසක් වේ. මේ වන විටත් එහි ඉදිකිරීම් වැඩ කටයුතු ආරම්භ කර ඇති අතර දැරියගේ පියා ආබාධිත පුද්ගලයකු බැවින් හා ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා මෙම නිවෙස කඩිනමින් ඉදිකර දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස රාජ්‍ය ඇමැතිවරයා මෙහිදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කළමනාකරු වෙත උපදෙස් දුන්නේය. දැරිය කළ ආදර්ශවත් ක්‍රියාව ඇගයීම පිණිස මෙම ග්‍රාම සේවා වසමට 'ඔබට ගෙයක් - රටට හෙටක්' නිවාස වැඩ සටහන යටතේ නිවාස අවශ්‍යතාවය ඇති තව කෙනෙකු සඳහා නව නිවෙසක් ලබා දීමට තීරණය කළ බවද ඇමැතිවරයා මෙහිදී පැවැසීය.

මෙම අවස්ථාවට කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී යූ. කේ. සුමිත්, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුත්තරා දේවි විද්‍යාලංකාර, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් වසන්තා වර්ණකුලසූරිය, ඉබ්බාගමුව කලාප අධ්‍යක්ෂ සිරිනිමල් පොඩිනිලමේ, ඉබ්බාගමුව ආදර්ශ මහා විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් වන සරත් රූපසිංහ හා ප්‍රභාත් ගුණවර්ධන යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# අකුරල තෙත් බිම් කැළිකසළ පුරවමින් වනසයි

**පහන් විජේසේකර**

ගාල්ල දිස්ත්‍රික්කයට අයත් හික්කඩුව ප්රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අකුරල තෙත් බිම මේ වනවිට කැලි කසළ හා ගලි බවුසර මගින් අපද්‍රව්‍ය ගෙනැවිත් දමන ස්ථානයක් බවට පත්ව ඇතැයි තෙත් බිම් උරුමය සංවිධානය පෙන්වා දෙයි.

මෙම තෙත් බිම අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යහපාලන රජය සමයේ දී කැබිනට් අනුමැතිය පවා හිමිව තිබූ නමුත් එලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා මේ වනතුරු කටයුතු සලසා නැති බව එම සංවිධානයේ සම ලේකම් සුමිත් කුමාර මහතා සඳහන් කර සිටී.

වර්තමානය වනවිට රත්ගම ප්‍රාදේශීය සභාවේ පූර්ණ අනුග්‍රහය මත මෙම තෙත් බිමට කසළ පුරවමින් සිටින අතර තාප්ප ගසා බිම් කොටස් වෙන් කර ගැනීමක් ද සිදු වන බව ඔහු කියා සිටියි.

තවද බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් එහි කඩොලාන යායවල් එළි කොට ඉඩම් වෙන් කර ගැනීමක් සිදු කෙරෙන අතර මෙකී භූමිය සංවේදී පරිසර පද්ධතියක් බව අමතක කොට කැළි කසළ ගොඩ බෑමට රත්ගම ප්‍රාදේශීය සභාව අනුමැතිය ලබා දී ඇතැයි ද හෙතෙම චෝදනා කරයි.

# කඹුරුපිටිය ඇතුළු දකුණේ නගර රැසක් අංග සම්පූර්ණ නගර බවට පත් කිරීමට සැලසුම්

**තිහගොඩ සමූහ වාර්තාකරු
පී.පී.පී.සුගතදාස.**

දිවයිනේ නගර සංවර්ධන ව්‍යාපෘති යටතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය, දෙවිනුවර, කොටවිල, අකුරැස්ස හා යටියන නගර අංග සම්පූර්ණ නගර වශයෙන් සංවර්ධනය කරන බව විදුලි බල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා පැවැසීය.

තිහගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේ පැවති සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ මුලසුන හොබවමින් අමාත්‍යවරයා මෙසේ ද සඳහන් කළේ ය.

ශ්‍රී ලංකාවේ සමෘද්ධි ප්‍රතිලාභී දරු පවුල් ලක්ෂයක් (100000) සඳහා සූර්ය කෝෂ ලබාදීමේ නව වැඩපිළිවෙළක් විදුලි බල අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කළ අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා එම ව්‍යාපෘතිය හරහා එක් ප්‍රතිලාභී පවුලකට විදුලිය අලෙවියෙන් මසකට රුපියල් 10000.00 පමණ ආදායමක් උපයාගත හැකිවන බවද සඳහන් කළේ ය.

දැනට ශ්‍රී ලංකාවේ විදුලිය පහසුකම් නැති පවුල් සංඛ්‍යාව 118000 පමණ බවත්, එම සංඛ්‍යාවෙන් පවුල් 33 සිටින්නේ තිහගොඩ ප්‍රාදේශීය කොට්ඨාසයේ බවත් සඳහන් කළේ ය. එම සියලුම පවුල් වලට මෙම වසර අවසන්වීමට ප්‍රථම විදුලිය පහසුකම් ලබාදෙන බවද හෙතෙම පැවැසීය. දක්ෂිණ අධිවේගී මාර්ගයේ කපුදුව නව අන්තර් හුවමාරුව ලබන සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට ප්‍රථම ජනතා අයිතියට පත් කිරීමට නියමිතව ඇති බව ප්‍රකාශ කළ අමාත්‍යවරයා එහි ඉදිකිරිම් කටයුතුවල දැනට පවතින මන්දගාමී තත්ත්වය පිළිබදව බලවත් කනස්සල්ල පළකර සිටිය අතර, එම ව්‍යාපෘතියේ සියලු ඉදිකිරීම් කඩිනමින් අවසන් කරන ලෙස අදාල නිලධාරීන්ට අමාත්‍යවරයා විසින් උපදෙස් දෙන ලදී.

රජය මගින් ආරම්භ කළ ගම සමග පිළිසඳරක් ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් සංවර්ධනයට වඩා අඩු ආදායම් ලාබී පවුල්වල ජීවනෝපාය සංවර්ධනයට ප්‍රමුඛත්වය ලබාදිමේ අවශ්‍යතාවය හෙතෙම අවධාරණය කළේ ය. තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති නිර්මාල් සමරසිංහ මහතා රැස්වීම අමතමින් යටියන රජයේ උළු හා ගඩොල් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ධාරිතාවය හා එකී නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පහත වැටීම හේතුවෙන් එම කර්මාන්ත ශාලාව දැනට පාඩු ලබන තත්ත්වයට පත්ව ඇති බව කීය. එම තත්ත්වය මගහරවා ගෙන නිෂ්පාදන ඉහළ නංවා ලාබ ලබන තත්වයට පත් කරිමේ අවශ්‍යතාවය හෙතෙම අ ශ්‍රී ලංකා පිගන් සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කළේ ය.

වත්මන් රජය ආරම්භ කළ නිවාස නැති දරු පවුල්වලට නව නිවාස ඉදිකර දීමේ ව්‍යාපෘතිය යටතේ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නව නිවාස 40ක් ඉදිකරන බවත්, එම සංඛ්‍යාවෙන් නිවෙස් 27 ඉදිකිරීම් නිමවෙමින් තිබෙන අතර ඉතිරි නිවාසවල වැඩ ළඟදීම ආරම්භ කරන බවත් පැවැසීය.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හා සම්බන්ධ රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීහු හා කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීහු මෙම රැස්වීමට සහභාගී වූහ.

# පැන්සල් තුරට දාන කැටයම් සමන්ත










කවී විජේසූරිය

නිර්මාණකරුවෙකුගේ සිතුම් පැතුම් රටාව, කලා රසඥතාව හා විද්‍යාත්මක තාක්ෂණික දැනුම මනාව නිරූපණය වන කලා මාධ්‍යක් ලෙස කැටයම් කලාව හැඳින්වීමට පිළිවන . ඒ අතරින් පැන්සල් තුඩක සියුම් වූ කැටයම් නිර්මාණය යනු මනා ඉවසීමකින් යුතුව කළ යුත්තකි .ඉතිං යොවුන් ජනතා මෙවර කතාබහ තමන්ගේ හැකියාව විනෝදාංශයක් කරගත් අපූරු තරුණයකු පිළිබඳවයි

ඔහු නමින් සමන්ත දසනායක. තම මව පියා සහ සොහොයුරා සමඟ සමන්තගේ පදිංචිය ඹිපනායකයි. ඹිපනායක ගල්හිර විද්‍යාලයෙන් සහ බලංගොඩ ආනන්ද මෛත්‍රී විද්‍යාලයෙන් අකුරු කළ සමන්ත මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළත් වන්නට සුදුසුකම් ලබා තිබේ

සමන්ත පවසන ආකාරයට පැන්සල් තුඩක කැටයම් පිළිබඳව ඔහු මුලින්ම දැනගෙන ඇත්තේ රූපවාහිනියෙනි. ඉන් වසර ගණනාවක් යනතෙක් එම පුදුමසහගත අත්දැකීම හිතේ තබාගෙන හුන් සමන්ත මුල්මවරට පැන්සල් තුඩෙන් නිර්මාණයක් කරනු ලැබුවේ තම මිතුරකුගේ උපන්දිනයක් වෙනුවෙන් ත්‍යාගයක් ලබාදීම වෙනුවෙනි.

එහිදී ලැබුණු අගය කිරීම් මත අන්තර්ජාලයේ විවිධ වෙබ් අඩවි වෙත නිතර නිතර ඔහුගේ තව තවත් නිර්මාණ ඉදිරිපත් කළ ද ඒවා ප්‍රතික්ෂේපවීමෙන් අනතුරුව ෆේස්බුක් හරහා නිර්මාණ ඉදිරිපත් කරන්නට යොමු විය. ඒ අනුව ෆේස්බුක් හරහා ලැබුණු ඇනවුම් මත මේ වන විටත් නිර්මාණ කටයුතුවල නියැළේ.

මේ වන විට ඉහළ ප්‍රතිචාර හිමිවන සමන්තගේ මෙම කැටයම් වෙළෙඳපොළට යොමු කිරීම සම්බන්ධයෙන් පැවසුවේ මෙවැන්නකි .

"පැන්සල් තුඩේ කරන කැටයමක් නිසා ඉතා සුළු ගැටීමකින් උනත් මේව කැඩෙන්න පුළුවන්. ඒ නිසා විනිවිද පෙනෙන වීදුරු ආවරණයක් සහිතව තමයි මේ නිර්මාණ වෙළඳපොළට යවන්නෙ. දැනට දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ සඳහා නිර්මාණ සිදු කරනවා. දේශීයව නම් මේ නිර්මාණවලට නියම වටිනාකම කොහොමටවත් ලැබෙන්නෙ නෑ. සාමාන්‍යයෙන් නිර්මාණයක මිල








රුපියල් වලින් 10 000ක් වත් වෙනව. ඒත් මම දේශීය ගැනුම්කරුවන්ට රුපියල් 700 සිට ඉහළට විවිධ මිල ගණන් යටතේ නිර්මාණ සිදු කරනවා. නිර්මාණයේ සංකීර්ණ බව අනුව මිල ගණන් වෙනස් වෙනවා. දේශීයව නම් අපේ නිර්මාණයක් අපේ කෙනෙක්ට දෙනවා කියන ආත්ම තෘප්තිය විතරයි ලැබෙන්නෙ. අඩු මිලට නිර්මාණ කරන්න ගියාම මේ නිර්මාණවල වටිනාකමට හානි වෙන බව මමත් පිළිගන්නවා. ඒත් අපි ගනුදෙනු කරන්නෙ මිනිස්සුන්ගෙ සිතුවිලි හා ආශාවන් එක්ක. මගේ ළඟට එන අය බොහොම දෙනෙක් මේ නිර්මාණ කරගන්නෙ තමන් ආදරේ කරන කෙනාට දෙන්න. එහෙම කෙනෙක්ට දහස් ගණනකින් මිලක් කියල එයාගේ ආදරය සහ වත්කම අතර ගැටුමක් ඇති කරන්නෙ කොහොම ද ඉතිං ඒ ගැටුමට හේතුවක් වෙන්න මට බෑ."

මේ දක්වා වූ කෙටි වූ ගමන තුළ මුහුණ දුන් ගැටලු හා බාධාවන් ඇති බව පවසන සමන්ත එහිදී විදේශීය වෙළෙඳපොළ සඳහා සම්බන්ධවීමේ ගැටලුව හා විදේශීය නිර්මාණ යැවීම වෙනුවෙන් වැයවෙන අධික මිල ප්‍රධාන ගැටලුවක්ව පත්ව ඇති බවත් එමෙන්ම අවශ්‍ය පැන්සල් හා කැපුම් උපකරණ ඔහු වෙසෙන ප්‍රදේශය තුළ නොමැතිවීමත් තවත් ගැටලුවක් බවත් ඔහු පවසයි..

මේ දක්වා පැමිණි ගමන තුළ උදවු උපකාර කළ විශාල පිරිසක් සිටින බවත් ඒ අතරින් පවුලේ සියලු දෙනාටමත්, සියලු ගුරුවරුන්ටත්, වචනයකින් හෝ උදවු උපකාර කළ සියලු දෙනාත් මතක් කිරීමට ඔහු අමතක කළේ නෑ. සමන්තගේ අනාගත බලාපොරොත්තුව ලෙසින් ඔහු පවසන්නේ තම හිතවතුන්ට උදවු උපකාර කරමින් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමයි.

අවසාන වශයෙන් අනාගතයේදී කලා නිර්මාණ වෙත යොමුවීමට අදහස් කරමින් සිටිනා තරුණ තරුණියන්ට ඔහු පැවසුවේ මෙවැන්නකි.

"කාල්මාක්ස් කියලා තියෙනවා, ලේඛකයා ජීවත් වීම සඳහාත්, ලිවීමේ හැකියාව වැඩි දියුණු කරගැනීම සඳහාත් අනිවාර්යෙන්ම වැටුපක් ලබාගත යුතුයි.. නමුත් ඔහු ජීවත් වීම සඳහාවත් අන් කිසිදු අරමුණක් උදෙසාවත් ලිවීම නොකළ යුතුයි." කියලා. ලේඛකයා ගැන කිවුවට හැම කලාකරුවෙක්ටම ඒ දේ පොදුයි. ඉතිං යහපත් චේතනාවෙන් අපි හැමෝම කටයුතු කරනවා නම් එයයි සාර්ථකත්වය."

## ජීවිතේ ජයගන්න ඉලක්කයටම යමු

ජීවිතය ජයගැනීමට නම් කළයුතු වන්නේ යහ සංකල්පයන් වපුරා ඒවා ඉටු කරගැනීමේ බලාපොරොත්තු අස්වනු ලෙස නෙළා ගැනීම තුරුණු වියේදිම ආරම්භ කිරීමය. ඒ බණ්ඩි වැදෙන කිරි ගොයම සේ සාර්ථකත්වයේ අස්වනු තුරුණු වියේදි ඇට මස් ලේ නහර තුළට කිරි වදින්නට සුදුසුම වයස තරුණ කාලය නිසාය. මේ අයුරින් සංවර්ධනය වන පුද්ගල චරිත වෙනස් වන සමාජ ක්‍රියාවලිය තුළ සිය සිතිවිලි මතින් ගොඩ නැගෙන ක්‍රියාදාමයන් මනාව හා බුද්ධිමත් ලෙස හසුරුවා ගැනීමට එය මහත් සේ උපකාරී කර ගනී. සමාජය වෙනස් වීමේ ක්‍රියාවලිය වටහා ගැනීම සමාජ ක්‍රමය භෞතික ක්‍රියාවලියක් තුළ විසඳා ගැනීමට උනන්දු වීමේ කුසලතාව ලැබීම මේ නිසා ඇතිවේ.

තරුණ ජීවිත උඩු යටි කරනු ලබන සමාජ ප්‍රශ්නවල ස්වභාවය කෙසේද?

මානව සම්බන්ධතා කෙරෙහි අහිතකර ලෙස බලපාන සමාජයේ භෞතික හෝ අභෞතික ක්‍රියාවලිය මත පැන නැගී ඇති සිද්ධි වාචකයක් සමාජ ගැටලුවක මූලාරම්භය ලෙස හැඳින්විය හැකිය. සමාජ පර්යාය බිඳවැටීම සමාජ ප්‍රශ්නවලට හේතුවකි. එසේම සමාජ පර්යායේ බිඳවැටීම සිදුවන්නේ සමාජ හැසිරීමේ බිඳවැටීම නිසාය.

මේ අනුව පෙනී යන්නේ සමාජය තුළට පිවිසෙන පිරිස් ක්‍රියා කරන ආකාරය අනුව සමාජය දෝලනය වන බවය. සමාජය තුළට පිවිසෙන්නා තුල ඇති අභ්‍යන්තර විනය හා බැඳී ආකල්ප කෙනෙකුගේ සාර්ථකත්වය හා දියුණුව සදහා හේතුවන බව රිචර්ඩ් බ්‍රැන්සන් ප්‍රකාශ කර ඇත්තේ ඒ නිසාය.

අධ්‍යාපනයේ පිබිදීම අවධාරණය කරනු ලබන්නේ දැනුම කුසලතා මුල් කොට ගැනීමෙනි. වර්තමානයේදී දක්නට ඇත්තේ ආකල්ප පෙරට පැමිණ ඇති බවකි.

දැනුම කුසලතා වේගයෙන් ලබා ගත හැකි වුවද ආකල්ප ලබා ගැනීමට කිසියම් කාලයක් අවශ්‍යය. ඒ සමඟම ඉහත කී අභ්‍යන්තර විනයද අත්‍යවශ්‍යය. මේ සදහා හොඳම මග වන්නේ තරුණ තරුණියන් තම තමනට අභියෝග කරගැනීමයි. එසේම තරුණ ජීවිතයක වැදගත්ම සංකල්පය විය යුත්තේ ඉලක්කයයි. කිසියම් යහ අරමුණක් වෙත යාමේ ඉලක්කය නොහොත් එල්ලය තරුණ ජීවිතයක සමාජමය ප්‍රගතිය යහපත් කරවන ප්‍රධාන සාධකයකි. එබැවින් ඉලක්ක වෙත ගමන් කිරීමේදී හමුවන අභියෝග හමුවේ නොසැලී ඒවා ජයගැනීම ඉහත කී කරුණ කෙරෙහි සෘජුව බලපානු ලබයි.

බොහෝ සමාජ ප්‍රශ්න කෙරෙහි නූගත්කම විරැකියාව හා දිළිඳු බව බලපාන බැවින් ඒවා අභියෝග ලෙස ගෙන ජය ගැනීම කෙරෙහි හුරු වීම යහපත් සමාජ ධූරාවලියක ආරම්භයයි.

කපිල කුලසිංහ
කළුතර බෝම්බුවල මහ විද්‍යාලය

2021 පෙබරවාරි 13 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සදතතික පත්තර තාරුණ්‍යය
යොවුන් ජනතා
2021 පෙබරවාරි 13 සෙනසුරාදා





PAGE 05
අපිට අමතක අපි



PAGE 07
අලුතින්ම හිතමු



PAGE 03
ඒ ලෙවල් නෙවෙයි

# අපි ඔබ ඉලක්ක කරන්නෙමු

යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි.තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි.අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.

එන්න, අපි හරි පාරක් හදමු

සංස්කරණය - රජිත බස්නායක
younjanatha@lakehouse.lk
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35
ලේක් හවුස්
ඩී. ආර්. විජයවර්ධන මාවත
කොළඹ 10

යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත් younjanatha@lakehouse.lk ලිපිනයට යොමු කරන්න

# කටින් බතල හිටෙවුවාට වැඩේ ගොඩ යන්නේ නෑ

ජීවිතේ කොහෙමෙන් කොහොම හරි ගැට ගහගන්න උත්සහ කරන අපේ ජීවිත , ක්‍රියාදාම පිරි ටෙලි කථාන්ගයකට සමානය. එහි පරිච්ඡේද අඩු ගණනක් රඟ දක්වා රංගනයෙන් බැස යන්නන් මෙන්ම , වාර්තා තබා වැඩි ආයුෂත් අතැතිව දීර්ඝ ටෙලිනාට්‍යකට නෑකම් කියන්නවුන් ද ඇත්තේය. මේ කුමන කතාමාලාවන් වුව ද රචකයා මෙන්ම කථා නායකයා / නායිකාව ද වන්නේ එකම පුද්ගලයකුය .

මෙම අපූර්ව ජවනිකා පිරි ජීවිත කතාවේ මතක, සිදුවෙන්නා වූ හා මතු සම්බන්ධ කොටස් ගණනාවක් පවතී . ඊයේ , අද , හෙට ලෙස ගලා යන්නා වූ අපගේ ජීවිතයන් හී , සුන්දර තැන් පාහේම අසුන්දර වූ නමුත් සුන්දරත්වයට ආවඩන සිද්ධි දාමයක් පවතී. මේකී එක් එක් දිනයේදී එක් එක් පුද්ගලයා ක්‍රියා කරන ආකාරය අතිසය වෙනස් වූ බව නියතය . යථාර්ථය වූ කලී ඊයේ ගෙවී ගියද අද හුස්ම ගන්නාවූ ද හෙට පැමිණෙන්නට ඇත්තාවූ ද තත්වයන්ය . ඉතිං මේ කුමක් හෝ වේවා අපි හුස්ම ගන්නේ අදය. නැතිව ඊයේ මතකවල

> යථාර්ථය වූ කලී ඊයේ ගෙවී ගියද අද හුස්ම ගන්නාවුද හෙට පැමිණෙන්නට ඇත්තාවුද තත්වයන්ය. ඉතිං මේ කුමක් හෝ වේවා අපි හුස්ම ගන්නේ අදය. නැතිව ඊයේ මතකවල එල්ලී අද නිකරුනේ නාස්ති කිරීම යුතු නොවේ.

එල්ලී අද නිකරුනේ කාලය නාස්ති කිරීම යුතු නොවේ. අතීතය හැඳන්වීමේදී ගෙවෙන්නා වූ තත්පරයක් තත්පරයක් පාහේ අතීතයට එක් වෙයි. ඒ හා සමඟ ම අපත් තත්පරයකින් වියපත් වෙයි. ඒ ගෙවී ගිය තත්පර ගණනාව වැය වෙන්නේ උදා වන්නට තිබෙන්නාවු තත්පර උදෙසාය. අප ජීවත් විය යුත්තේ කුමන කාලයේ දැයි තීරණය කල යුත්තන් ද අපිමය.

අතීතයේ නීරස මිහිරි මතකවලින් ලබාගන්නා වු පන්නරය තුළින් අද ජීවත් වීම ද , එයින් එහා ගිය තවත් සුන්දර හෙටක් උදාකර ගැනීමට ද යන්න පිළිබඳ කල්පනා කල යුතුමය. එය කටින් බතල හිටවන්නා සේ වුවද , මහත් ආයාසයකින් යුතුව එම කාර්යයෙහි නියැළීමට කාට කාටත් හැකිය. බහුතරයක් අතර සුළුතරය අතීතයෙන් උගත් පාඩම් ආශ්‍රයෙන් හෙට දිනයට , නව ගෙත්තමක් වියමන් කරගත්ත ද , තාමත් බොහෝ දෙනා අතීතයේ ශෝකී මෙන්ම වෛරී හැඟීම් අතර වහල් වී සිටියි. එයින් මිදීමට කියන්නා වගේ ලෙහෙසි පහසු නොවේ. එය වනාහි අසීරුම පල්ලම් ගැටිති තැනිතලා වලින් ගහනය වූවක්මය .

මේ ව්‍යායාමය සිදු කිරීමට අපේ සෘණාත්මක සිතුවිලි ධනාත්මක කරගත යුතුය. එහිදී තනිව උත්සහ කළ නොහැකිය . බොහෝදෙනා පිළිතුරු සොයන්නේ හුදකලාව තුළින්ය. එයින් මතුවන අවසානය වන්නේ ජීවිතය අවසන් කරගැනීමය. නැතිනම් සිය හුස්ම හෙටටත් පණ ගැහෙන්නට නොදී අදින් අවසන් කර ගැනීමයි . මෙලෙස තනිකමේ ගිලී සිට අතීත මතක අතර විඳවන්නන් දෙස අප වැඩි අවධානයක් යොමු කරමු. අපගේම සුන්දර හෙටක් වර්ණ කරගන්නා අතරම, ඔවුන්ව අතීතයේ සිරකරුවන් බවට පත්වන්නට නොදී අපගේ හෙටට ඔවුන්වත් එක් කරගනිමු.

ප්‍රේමයෙන් පරාජය වූවන් ද, මතින් මත් වූවන් ද, සෙනෙහෙවන්තයින් අහිමි වූවන් ද , ජීවිත ධාවනයෙන් පරාජය වූවන්ට ද ආදරයෙන් දෑත දිගු කරමු. එය ඔවුන්ට මහගු පිටිවහලක් වනු ඇත. ගිය දේ ගියා මිස යළි නොයෙන්නා සේ , වැරදුණු පොට නිවැරදි කරගනිමු . පැටළුණු තැන් සීරුවට ලිහා ගනිමු . හෙටට බලාපොරොත්තු එක්කලම පා තබමු . තනිව ගමනක් නොව ඇද වැටුණු අයවත් එක් කරගන්නට අමතක නොකරමු . අතීතය කණවැල කරගනිමින් හෙටට පියනගන්නට අද අත්වාරුව කරගනිමු. උදා නොවූ හෙට ගැන සැලකිලිමත් වීමේදි අතපසු වී යන යුතුකම් පිළිබඳවත් අවධානය දී ජීවිත තුලාව සමබර කරගනිමු .

එම තිර පිටපත රචනා කළ යුතු අපම පනින්නට පෙර හොඳ හැටි සිතා බලමු. කුඩා දරුවෙකු, තරුණ තරුණියන් ලෙසද වැඩිහිටියන් ලෙස ද තමන්ට සුදුසු ම දේ පිලිබඳ පමණක් කැපවෙමු. නැතිනම් අවසානයේ හෙටට ශේෂ වන්නේ හිමිකරුවෙකු නැති මලක් පමණි. ඉතිං ආදරයෙන් ම කෙරෙන ඇරයුමයි... " කලලය ස්ථාපිත කරගන්නට පෙර ගර්භාෂය නිසි පරිදි සූදානම් කරගන්න. " එවිට, අතීතය වැහි වලාවක් වුවත්, හෙට පායන්නේ අද ඇදහැලුණු වර්ෂාවෙන් උපන් වසන්තයේ දේදුන්නයි.

සෝදුපත් නොබලන
ව්‍යාකරණ අනුකූල නොවන්නාවු
කෙටිකථා නවකථා අතර
ඔහේ දිවෙන ජීවිත......

ඊයේ ගුල්ලෝ ගැසූ
අද කාවෝ කෑ
හෙටක් නැති හෙටක්
වියමන් නොකරම
පනිමු පිම්මක්
තුලිත කරන්නට
ජීවිත සමීකරණය .....



දෙව්නි දිව්‍යාංජලී පෙරේරා
වැද්දුව



# වැඩේ ගොඩදාගන්න නම් අලුතින්ම හිතමු

**වෙනස්වීම කියන්නේ ලොව බලගතුම වචනයක් . මේ ලෝකය වෙනස් කරේ වෙනස් විදියට හිතපු මිනිස්සු බව අප කවුරුත් දන්නා කරුණක්. ඔබ භාවිත කරන දුරකථනය ඔබ භාවිත කරන ලද ඔරලෝසුව, ඔබ අඳින ඇඳුම පවා කිසියම් පුද්ගලයකුගේ වෙනස් ලෙස සිතීමේ ප්‍රතිඵලයක්. ගුරුවරයෙක්, ඉංජිනේරුවෙක්, මාධ්‍යවේදියෙක්, ටියුබර් කෙනෙක් ආදී විවිධාකාර අරමුණු අපේ ජීවිතවල තියෙනවා. අපි තෝරාගන්නෙ කිනම් ක්ෂේත්‍රයක් වුවද එම ක්ෂේත්‍රය තුළ ඉදිරියට යාමට නම් අප තුළ වෙනස් ලෙස සිතීමේ හැකියාව තිබිය යුතුය.**

ඔබ ගුරුවරයෙක් වෙන්නට සිතනවා යැයි සරලව සිතන්න. ඔබට අනෙක් ගුරුවරුන්ට වඩා සුවිශේෂ වෙන්නට නම් අනෙක් ගුරුවරුන්ට වඩා සාර්ථක ඉගැන්වීම් රටා හඳුන්වා දෙන්නට නම් ඔබට වෙනස් ලෙස සිතීමේ හැකියාව වැදගත් වෙනු ඇත.



වෙනස් ලෙස සිතීම මගින් ඔබේ ජීවිතය වෙනස් කර ගැනීමට හැකි බවට ඔබ දැනුවත් ඇත. ඔබට ගුරුවරු දේශකවරු වෙනස් ලෙස සිතන පුද්ගලයකු වන්නට යැයි දහස් වාරයක් මන්ත්‍රයක් සේ පවසා ඇති බවට විශ්වාසය. නමුත් ඔබට එවැනි පුද්ගලයකු වීමට හැකි වූවා ද? එය ඔබ ඔබෙන්ම ප්‍රශ්න කරගත යුතුය. වෙනස් ලෙස සිතන කෙනෙක් වෙන්නට යැයි කියූ පමණින් අපට වෙනස් ලෙස සිතිය නොහැකිය . එයට දිගුකාලීන පුහුණුවීමක් අභ්‍යාසයක් අවශ්‍යය.

වෙනස් ලෙස සිතීමට නම් වෙනස් අදහස් ඔබ තුළ තිබිය යුතුය. වෙනස් අදහස්වලින් යුක්ත පුද්ගලයෙකු වීමට නම් ඔබ කියවීම ප්‍රගුණ කළ යුතු ය. ඔබට කිය වූ පමණින් වෙනස් ලෙස සිතීමට හැකිවෙන්නේ නැත. අන් අයට එතරම් කියවීමට ග්‍රහණය නොවන කෘති ඔබ කියවිය යුතු ය. ලංකාවේ පාඨකයන් බහුලව නොකියවන විවිධ ලේඛකයන්ගේ දාර්ශනිකයන්ගේ කෘති කියවීම තුළින් ඔබේ අදහස්වල ඔබේ සිතුවිලිවල නැවුම් බවක්, වෙනස් බවක් ඇතිකර ගත හැකිය. අන් අයගේ ද බහුල අවධානයට පත්වන කෘති කියවීම තුළින් පමණක් ඔබේ වෙනස්වීමේ අභිමතාර්ථය සාක්ෂාත් වීමේ සම්භාවිතාව අඩු මට්ටමක පවතී.

අප විසින් අපේ මට්ටමෙන් සිතනා විට සමාන මට්ටම්වල මිතුරන් පමණක් ඇසුරු කිරීමට වඩා අප අරමුණු කරගන්නා ක්ෂේත්‍රයේ අපට වඩා සාර්ථකත්වය කරා ළඟා වූ පුද්ගලයන් ඇසුරු කිරීම තුළින් ඔවුන් සමඟ කතා කිරීම තුළින් අපි සිතන සිතුවිලි සට්ටනයන්ට පත්වෙමින් වර්ධනය වෙමින් ඉදිරියට යනු ඇත.

අන්තර්ජාලය හරහා ඔබ අරමුණු කරගන්නා ක්ෂේත්‍රයේ නව යාවත්කාලීනවීම් සොයා බලන්න. නිරන්තරයෙන් අන්තර්ජාලයේ දී පවා නව අදහස් සමඟ ගැවසෙන්න. ඔබ සරලව මෙලෙස සිතන්න. ඔබ කැමරාකරණයේ නිරතවන පුද්ගලයෙක් නම් විවිධාකාරයේ වෙනස් ඡායාරූප, වෙනස් කැමරාකෝණ භාවිතා කළ ඡායාරූප බැලීම තුළින් එම ක්ෂේත්‍රය පිළිබද වෙනස් ලෙස සිතීමට ඔබට ඔබේ මනස අවදිකර ගත හැකි ය.

> ඔබට පුද්ගලිකව පැන නැගෙන ප්‍රශ්නවලට සහ සමාජය තුළ පැන නැගෙන ප්‍රශ්නවලට වෙනස් නිර්මාණශීලී පිළිතුරු සැපයීම තුළින් ඔබට වෙනස් ලෙස සිතන පුද්ගලයකු බවට පත්විය හැකි ය.

වෙනස් ලෙස සිතන්නට ප්‍රගුණ කිරීමේ දී අප අප තුළ පරිකල්පන හැකියාව වර්ධනය කරගත යුතු ය. එනම් අප නව නිෂ්පාදනයක් කරන්නට පෙලඹෙනවා නම් එම නිෂ්පාදනය පිළිබද යම්කිසි චිත්‍රයක් අප සිත තුළ තිබිය යුතුය.අප එම හැකියාව වර්ධනය කර ගැනීමට නම් අප චිත්තරූප මැවීමේ හැකියාව වර්ධනය කරගත යුතු ය. මෙහි දී චිත්තරූප මැවීමේ හැකියාව ලෙස සඳහන් කරන්නේ යමක් නිශ්පාදනය කරන්නට පෙර ඒ පිළිබද කිසියම් චිත්‍රණයක් සිත තුළ මවාගැනීමේ හැකියාවයි.

ඔබට පුද්ගලිකව පැන නැගෙන ප්‍රශ්නවලට සහ සමාජය තුළ පැන නැගෙන ප්‍රශ්නවලට වෙනස් නිර්මාණශීලී පිළිතුරු සැපයීම තුළින් ඔබට වෙනස් ලෙස සිතන පුද්ගලයකු බවට පත්විය හැකි ය.

ලෝකයේ තම අරමුණුවලින් ඉහළම ස්ථානවලට ළඟා වූ කලාකරුවන්, මාධ්‍යවේදීන්, ඉංජිනේරුවරුන්, චින්තකයන්, ආදී නොයෙක් පුද්ගලයන්ගේ සාර්ථක වීමේ රහස වෙනස් ලෙස සිතීම බව අප අවබෝධ කරගත යුතු ය.

වෙනස් ලෙස සිතීම යනු සමාජය දෙස හෝ ඔබේ ක්ෂේත්‍රය දෙස වෙනස් වර්ණයකින් වෙනස් දෘෂ්ටියකින් බැලීමයි. එවිට අලුත් ආකාරයකට වෙනස් ආකාරයකට පෙනෙන්නට පටන්ගනු ඇත. අද සිටම වෙනස් ලෙස සිතීමට ආරම්භය සකසා ගන්න. මන් ද වෙනස් ලෙස සිතීම එකවර කිරීමට නොහැකි බැවිනි.

අශාන් ප්‍රමුදිත ජයසිංහ

# ඉතින් මොකටද වැලන්ටයින්



අවුරුදු 15 /16 කියන්නේ ජීවිතේ හරි අමාරු කාලයක්. ඒ දවස්වල මට මතකයි සර්ලා, මිස්ලා කියන්නේ ඔය තමයි උඹලගේ කුණාටු සමය කියලා. ඔය කාලෙට ඉතිං පංතියේ ඉන්න කෙල්ලො කොල්ලො ගැන පොඩි මෙවුවා එකක් හිතට වදිනවා. ඒ කාලෙට love එකක් කියන්නේ ඉතිං මුළු රටක් රාජ්‍යයක් ලැබුණා වගේ කවුරු මොනවා කිවුවත් හිත මුරණ්ඩුයි. බහුතරයක් කතන්දර ඉතිං අවසානෙට අහෝ දුකකි. ඉරකි. තිතකි. ඕකට කියන්නේ ආකර්ෂණය කියලා. අවුරුදු විස්ස විසිපහ වෙනකොට අපි හොයනවා ජීවිතේට හයියක්, අපේ

> ගහට කොළට සතා සිවුපාවට මේ හැමෝටම මනුෂ්‍යයෙක් වගේ ආදරේ බෙදන්න පුළුවන් නම් ඔයා හොඳ ආදරවන්තයෙක්. කාටත් කලියෙන් තමන්ට ආදරේ කරන්න ඕන. මොකද තමන්ට ආදරේ නොකරන තාක් අනිත් අයට ආදරේ කරන්න ඔය කිසි කෙනෙකුට බෑ.

හැඟිම් බෙදාගන්න කෙනෙක්. "ලස්සන කන්නද බං හිත තමයි හොඳ වෙන්න ඕන". ඔය කාලෙට අපි හැමෝගෙම තියරිය ඕක තමයි. ලස්සන කියන දේ එක මොහොතකින් නැතිවෙලා යන්න පුළුවන්. එක පාරක් දෙපාරක් ආදරේ මගහැරෙන්න පුළුවන්. ඒ වෙලාවට අපි ඔක්කොම කරන්නේ මුළු ජීවිතයම එපා කරගන්න එක. ඒ වෙලාවට හිතුනොත් මේ ලෝකේ ආදරේ කියලා දෙයක් නෑ කියලා , ඉක්මනට ගිහින් තාත්තාගේ අත්දෙක අල්ලා බලන්න. අම්මගේ යට ගියපු ඇස් දිහා බලන්න. ඒ ඇස් යට ගියේ , ඒ අත් රළු වුණේ අපිව ජීවත් කරන්න මහන්සි වෙලා. ඉතින් මේ හැමදේම ආදරේ හින්දා නේද...? එක පාරක් වැරදුනාම මේ ලෝකේම ප්‍රශ්න තියෙන්නේ මට විතරයි කියලා හිතලා අපි හැමෝම ජීවිතේ අත්හරින්න හිතුවොත් මේ මුළු ලෝකේම අමුම අමු සොහොනක්.

face book post දාගෙන ඔයා මගේ මං ඔයාගේ කියලා රඟන උන් අතරින් ඒක Practically දෙන්න පුළුවන්, මොන බාධක ආවත් ලඟින් රැඳෙන ආදරයක් හොයාගන්න. ගහට කොළට සතා සිවුපාවට මේ හැමෝටම මනුෂ්‍යයෙක් වගේ ආදරේ බෙදන්න පුළුවන් නම් ඔයා හොඳ ආදරවන්තයෙක්. කාටත් කලියෙන් තමන්ට ආදරේ කරන්න ඕන. මොකද තමන්ට ආදරේ නොකරන තාක් අනිත් අයට ආදරේ කරන්න ඔය කිසි කෙනෙකුට බෑ. ඉතිං හැමෝටම කලින් මං දෙයක් කියනවා. මේ ලෝකේ තාමත් ආදරේ කියලා දෙයක් තියනවා. මේ මොහොතෙත් මං මේ අකුරු ලියන්නේ ඇත්තටම ආදරයක් තියෙන නිසයි. වැලන්ටයින් දවසට විතරක් නෙවෙයි හැම මෙහොතකම තමන් ආදරේ කරන අයට, තමන්ට ආදරේ කරන අයට මුල් තැන දෙන්න. එතකොට ආයේ අමුතුවෙන් වැලන්ටයින් කියලා දවසක් ඕනිම නෑ.

හර්ෂමාලී වීරරත්න

# හිමිදිරි පෙදෙස

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk



## ලොකු සර්....

හැමදාම නුඹ ගියා ඉර දිහා බලාගෙන
දොර ඇරලා මම දුන්නෙ බත් මුලත් ඔතාගෙන
පොඩි පැටව් අන්දලා කවාගෙන පොවාගෙන
ලඟි ලඟියෙ පිටවුණේ මහ දොරත් වසාගෙන

පොඩි එවුන් ඉස්කෝලෙ දොර ළඟින් දමාගෙන
මම ගියේ මීටරේ කටු අතේ තියාගෙන
හදිසියට මහ මගේ සුදු ඉරත් කපාගෙන
මම යද්දි මුල් පොතේ රතු ඉරත් වැදීගෙන

හතේ පන්තියෙ ළමයි අත් මුදුනෙ තබාගෙන
දැනුම් සවි සිහි සවිය යදියි ඇස් පියාගෙන
දෙකන්සෙන් බේරෙනා මුගුරු පිස දමාගෙන
අලුත් පාඩමක් මම හොයනවා පෙරළගෙන

ඉන්ස්පෙක්ෂන් වලට පළාතෙන් ඇවිල්ලලු
වාර සටහන් එහෙම අකුරටම බලනවලු
සාපෙළ ට ඔන්ලයින් කරපු හැටි අහනවලු
පන්ති කවයට අදත් දෙමව්පියො ඇවිල්ලලු

ගුත්තිලයෙ වෙණ වැයුම අද ඉවර කරන්නලු
ටීචර් ට ලොකු සර් ප්‍රමිති ටික ගේන්නලු
එලසපිරි දර්ශකේ ලකුණු කොල බලනවලු
පන්තියේ දරුවෙකුට කලන්තය හැදිලාලු

පන්තියෙන් පන්තියට සීනුවෙන් සීනුවට
ගිහින් පොඩිඋන් එක්ක ටයිම් ටේබල් එකට
කවි සින්දු කිය කියා උන් සිනා ගන්වන්ට
නැති දාට ලොකු සර් මට නිවාඩුව දෙන්ට

**අසන්ති කරුණානායක**

## ජීවිත පොත

කුසේ ගිනි ඉවසාන බැරි වී
ළතැවෙනා ගිනියම් පැයේ..
ගතේ ගිනි ගෙඩි පුපුරු වී
දැවෙනවා සරදම් ලෙස පැයේ..
අතේ හුන් රුපියලේ කාසිය
ගුලිවෙනා සිතදුක් ලෙසේ....
වතේ හුය පමණක් තියේවි ද
හඬවෙනා නිදි නැති

දවසින් දවස ගෙවෙනා හැම ක්ෂණයකම
අඟ මුල මැද නුඹේ නම හා රූපයම
වැතිරුණු නමුදු සයනය වෙත නිදි නොඑන
ඇර නෙත් යුගල දකිනෙ ද සිහිනය කෙලෙස

රුදුරුය නුඹේ මා කුල්මත් කළ වදනන්
වියරුය නුඹේ සිත තුළ උන් නෙක පැතුමන්
දරුණුය නුඹේ නෙතඟින් බැලු හැම බැල්මන්
අඳුරුය මගේ දිවි මඟ අද නුඹ ආයෙන්...

සුදු මල් ගිලිහි සොහොනක් මෙනි මා දිවිය
පෙළින් පෙළ ලියපු මගෙ පොත නිශ්ඵලය
ගෙත්තම් කළ වචන හැම කළු ඉරි වැනිය
ස්තුතිය කෙලෙස ලියම් ද පිටු නැතිව.....

**සඳුනි අරවින්දිනී**

## දෑවැද්ද අගෙයි මද

නුඹ කලේ පෙමක්මද
සිතනවා තවද මම
දෑවැද්ද නොමැති කළ
මටත් අගයක් නැතිද

අද රජෙක් වගේ ඔබ
ලෝකයට පෙනෙන්නට
කද බැදන් පොදි ගසන්
පෙන්වන්නෙ ලොකු කමද

මේ සියලු දෙය නොවෙයි
අවැසි මට ආදරෙයි
එය නොමැති නම් ඉතින්
කිසි පලක් මට නැතයි

හොඳින් තේරුම් ගන්න
ආදරේ පුද දෙන්න
හැකියි සැම දේ ගන්න
එකට හැකි නම් යන්න !

**ගයාන් මලින්ත**

## තේරු කරත්තෙන් බහින්න පත්තිනි දේවී

පුවක්, කෙසෙල් ගස් ගොක්කොල සමඟ මිතුරු වී
මහ වීදිය හැඩ කරනවා නුඹටම පේවී
අතුරු පාර දෙස බලන්න මඳක් සැපත් වී
තේරු කරත්තෙන් බහින්න පත්තිනි දේවී

හරෝ හරා හඬ ටිකකට නැවතී යද්දෙන්
සිහල දමිල කැල පොඩ්ඩක් විවේක ගද්දෙන්
හඳුන් කපුරු මල් පලතුරු ඔහේ තිබුණදෙන්
වඩින්න දෙවියනි තේ වත්තේ ලැයිම මැදින්

පසු කරගෙන ආව ගෙදර රාසයියාගේ
උන්දැගෙ දුව පාර්වතී වැඩ පැක්ටරියේ
අප්පා නැති කොළුවට ඇගෙ මන්දපෝෂණේ
නුඹ පුදන්න පලතුරු ගෙන ඇයත් පෝලිමේ

පිච්ච මල් දෙවැටෙ අයිතිය මුන්ට නෑ තවත්
ඒක බදු අරන් ජුවලරි මුදලාලි කෙනෙක්
කැකුළු හුණ්ඩුවක් කැඩුවම දෙනවා සොච්චමක්
යාරෙ දෙසීයයි කොහොමද ගන්නෙ මල් වැලක්

බෙලෙක් තහඩු හිල් අස්සෙන් වතුර වැටෙනවා
තෙත බිරි පොලවේ ඉඳගෙන නුඹට යදිනවා
තේරු කරත්තෙන් වඩිද්දි මුන් පෑගෙනවා
රෝද දෙකට උඩින් කපුවො සල්ලි ගනිනවා

කටු ගහලා පුවක් ගහේ එල්ලන්නෙත් මුං
අඟුරු ගොඩේ දුව දුව ගිනි පාගන්නෙත් මුං
එලකිරි ටික ගෙනත් නුඹව නාවන්නෙත් මුං
තේරුව උඩ යද්දි නුඹට නොපෙනෙන්නෙත් මුං

අනේ මෑණියනි දැන්වත් කරුණා කරලා
පිහිට වෙන්න ගැත්තන්ගේ මේ දුක දැකලා
ප්‍රාඩෝවල යන උන් බොරු පොරොන්දු දීලා
දැන්වත් අතුගා දමන්න බලය පෙන්නලා

**රවීන්ද්‍ර දයාවංශ**



## පිච්ච මල්

බුදු පුදට යන ගමන්
මල් වට්ටියේ මැද ඉඳන්
බැලුවාලු ඔරවන්
වන පස මලක් දෙස හොරැහින්

**සංජය ප්‍රියදර්ශන**
**උඩුගම්පොල**

## කස්තූරි විවරය

*(නිමිත්ත - මා අසලටම විත් ක්ෂනයක සිතුවිල්ලකට මුලා වී සරාගික චිත්තක්ෂණයක පැටලී හිතාමතා නාභිය පෙනෙන පරිදි හිඳි විවාහක මිතුරිය වෙතටයි)*

හදිසියේම හැමූ
ඒ මුදු නලමත
සලිතව
මා අසලටම විත්
දුහුල් විවර කර
මා ඇසගත්
නාසගත් කස්තුරි සුවඳ
තැවරූ මුවැත්තිය......

ඇයි අමතක කලේ
චිත්තක්ෂනයකින්
කුලුදුලේ පැටවාත්
නුඹට හිමි වූ
නුඹටම හිතැති
ඒ පිනිමුවාත්.....

කිමද ඉගි කලේ
නෙලන්නට තහනම් මලක්
අමතකද නුඹ සස්වාමික මලක්
සොයන්නේ මා තවමත්
මට කියා පිබිදෙන මලක්

ඉසිණු නුඹගේ
ඒ කස්තුරි විලවුන්
හිමිව ඇති පිනිමුවා
නෙත් දෑලේම පමණක් ..

ගොදුරු ලුහුබඳිමින්
සරයි වගවලසුන්
ඉතින් ඉනු සතියෙන්
නික්ම යන් මා අසලින්
වසාගෙන
කස්තුරි විවරය
සොඳින්

**වජිර කුමාරසිංහ**





# ඒ ලෙවල් නොවෙයි මේ ලෙවල්

## කවිශ්ක මාධව

**පිටරටින් ගෙන්වන වාහන වැඩි මුදලක් ගෙවා භාවිත කිරීමට අපට සිදුව ඇත්තේ අප රට තුළ වාහනයක් හෝ වාහනයක කොටසක් හෝ නිෂ්පාදනය නොකරනා නිසාවෙනි. ඇතැම් අවස්ථාවලදී අප ගන්නා වාහනයට වැඩි මුදලක් බදු වශයෙන් ද ගෙවීමට සිදු වේ. මේ සෑම දෙයක්ම අප රටේ වාහන නිෂ්පාදනයක් සිදු නොවීම හේතුවෙනි. අතීතයේ අප රටේ වාහන නිෂ්පාදනය කළ බවට අදට ද දැක බලාගත හැකි ඇන්ටික් වාහන හොඳ සාක්ෂියකි. කොවිඩ් - 19 ගෝලීය වසංගතය හේතුවෙන් පිටරටින් ආනයනය කරන්නා වූ සෑම දෙයකටම අද වන විට තවත් සීමා පැන වී ඇත.**


අතීතයේ රජ දවස පටන් පැවත එන සිංහලයන් එදා දැක්වූ දක්ෂතා ආදර්ශයට ගෙන හැකි අයුරින් හෝ වාහන නිෂ්පාදනයකට ද යොමු විය හැකිනම් එය අප රටේ හැරවුම් ලක්ෂ්‍යයක් වනු නො අනුමානය. ඇත්තෙන්ම එවන් දෙයක් තවදුරටත් හීන නොවනා තරමට තරුණයන්ගේ නව නිෂ්පාදන කරළියට පැමිණීම අප කාහටත් සතුටට කරුණකි.

අප මේ කියන්නට යන්නේ අඩු වයසකින් එවැනි වාහන නිෂ්පාදනය කිරීමට උපන්හපන්කම් පානා තරුණයෙක් ගැනය.

කවිශ්ක මාධව රත්නවීර නම් මේ සිසුවා බණ්ඩාරනායක විද්‍යාලයේ ඉගෙනුම ලබා උසස් පෙළ විභාගයට මුහුණදී ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින්නේය. කුඩා කල සිටම බණ්ඩාරනායක විද්‍යාලයේ නව නිපැයුම් සංගමය හා සම්බන්ධව නව නිෂ්පාදන සිදු කර ඇති මාධව සිසුවා දැනට වාහන අටක් නිෂ්පාදනය කිරීමට සමත් වී තිබේ.

පහ වසරේ සිටම මෙලෙස වාහන නිෂ්පාදනය කිරීමට සමත්ව ඇති මාධව කාර් 6ක්, ආබාධ සහිත කෙනකුට අතින් ක්‍රියා කරවිය හැකි වාහනයක් සහ ඕනෑම දුෂ්කර මාර්ගයක ගමන් කළ හැකි වාහනයක් ඇතුළුව වාහන 8ක් තනිවම මේ වන විටත් සාදා අවසන්ය. විශේෂත්වය වනුයේ මේ වාහන ඔහු විසින්ම නිෂ්පාදනය කිරීමය. මෝටර්සයිකල් එන්ජින් එකක් උපයෝගි කරගෙන එය වාහනයකට සරිලන අයුරින් සකසා අලංකාර නිමාවකින් යුතු මෝටර් රථයක් බවට පත් කිරීමට මොහු උපන් හපනෙකි.

මොහු සාදා ඇති වාහනවල තවත් විශේෂත්වයක් තිබේ. ඒ පස්දෙනකුගෙන් යුතුව ලීටරයකට කිලෝමීටර් 35ක් පමණ ගමන් කරවීමේ ඇති හැකියාවය. අනාගතයේ මුහුණදීමට සිදුවන තෙල් අර්බුදයට ද මාධව සිසුවා දැනටමත් විසඳුම් සොයාගෙන අවසානය. පිටරටින් ගෙන්වන ඇතැම් වාහනවල පවා මෙලෙස වැඩි දුරක් ගමන් කළ නොහැකිය.



එලෙසම මනා නිමාවකින් අවසානය දක්වා ඉවසීමකින් යුතුව මේ වාහන සාදනා මෙවන් තරුණයන්ගෙන් අප දැන්වත් වැඩක් ගත යුතුව ඇත. ඔවුන්ගේ දැනුමට අවස්ථාවක් දී තවත් ඔවුන්ට වෘත්තීයමය වශයෙන් වාහන පිළිබඳ අධ්‍යාපනයක් ලබා දුනහොත් අද නැතත් මතු යම් දිනෙක හෝ වාහන පිටරටින් ගෙන්වනතුරුත් වැඩි මිලට ගැනීමටවත් අපට අවශ්‍ය නැත. මෙවැනි දක්ෂ තරුණයන් දෙස බැලීමේදී ඒ දවස වැඩි ඈතක නොවනු ඇතැයි අපිට පෙනී යන්නෙමු.

කවිශ්ක මාධව තරුණයාට තවමත් මෙවැනි නිෂ්පාදන සිදු කිරීමට කුමන හෝ ආයතනයකින් අනුග්‍රහයක් ලැබී නැත. ඇත්තෙන්ම මෙවැනි දක්ෂ මොළකරුවන්ගෙන් අප දැන්වත් රටට එල ප්‍රයෝජනයක් ගත යුතු නොවන්නේ ද...?

ඔවුන්ගේ හැකියාවන් මනා ලෙස අධ්‍යයනය කර ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ සැපයීමට මඟ පෙන්වීමට හැකි නම් අප රට තුළ වාහන නිෂ්පාදනය කළ හැකිය. කවිශ්ක සිසුවා දක්ෂකම් දක්වන්නේ වාහන සෑදීමට පමණක්ම නොවනා බවට විශේෂයෙන්ම කිව යුතුය. ඔහු අ.පො.ස. උ.පෙළ ප්‍රතිඵල ලැබෙන තුරු සී.සී.ටී.වී. කැමරා සවි කිරීම, වෑල්ඩින් වැඩ මෙන්ම වාහනවල අලුත්වැඩියාවන් ද සිදු කරන්නේ මනා දක්ෂයකු ලෙසිනි.

අවසානයට පෙර යමක් කිය යුතුව ඇති බවට මාධව සිසුවාම අප හා පැවසීය. ඒ මාධව සිසුවාට පාසල් අවධියේදී දක්ෂතා ඔප්නංවා ගැනීමට හෙවණැල්ලක් මෙන් සිටි ගුරුවරයකු ගැනය. ඒ එවකට බණ්ඩාරනායක විද්‍යාලයේ තාක්ෂණික අංශය භාර සහකාර විදුහල්පති ලෙස කටයුතු කළ තරංග දුනුආරච්චි ගුරු පියාණන්ය. මේ සිසුවාගේ සැඟවුණු දක්ෂතා ඉතා හොඳින් හඳුනාගත් ඒ ගුරු පියාණන් නොසිටින්නට අද මෙවන් දක්ෂයෙක් බිහි නොවනු ඇත.

අ.පො.ස. සා.පෙළ, උ.පෙළ කළ තරුණයන් ස්මාර්ට් දුරකථන, පරිගණකවල එල්ලී සිටීමට පුරුදුව ඇති සමාජයක කවිශ්ක මාධව යනු හාත්පසින්ම වෙනස් වූ තරුණයකු බවට ඔබටම දැන් පැහැදිලිය. ඔහුට ඉලක්කයක් ඇත. ඒ විශ්වවිද්‍යාලයට ගොස් විභාග සමත්ව උපාධිය ලබා ගැනීමට වඩා වෙනස්ම වූ අවශ්‍යතාවකි. කෙදිනක හෝ තමන්ගේ කියාම නව නිපැයුම් කරනා ව්‍යාපාරික ස්ථානයක් වගේම ඉන් නව නිපැයුම් ලොවටම දායාද කිරීම ඔහුගේ එකම අභිප්‍රායය. එසේ නම් යොවුන් ජනතා අප ඔහුගේ අභිලාෂයන් එසේම ඉෂ්ට වේවායි ප්‍රාර්ථනා කරනා අතර, මෙවැනි දක්ෂයන් හට අතහිත දීමට හැකි කෙනකු සිටීනම් ඔවුනට එය ද මහඟු ශක්තියක් බැව් මතක් කර සිටීමට කැමැත්තෙමි.

**රුචිනා බොතේජු**





# 2021 යෞවනයේ ඩයරිය

### පෙබරවාරි 06

කොරෝනා නිසා නිදහස බොහෝදුරට සීමා වුණ අපිට නිදහස ගැන මේ පාර අර්ථවත්ව කතා කරන්න පුළුවන්. අපිට වගේම සත්තුන්ටත් ජීවත් වීමේ නිදහස තියෙනවා. සත්ව උද්‍යානයේ කූඩු කරලා ඉන්න සත්තුන්ටත්, ගෙවල්වල කූඩු කරලා හදන සත්තුන්ටත් අපිට වගේම නිදහසේ ජීවත් වෙන්න අයිතියක් තියෙනවා. කොරෝනා නිසා ගෙවල්වලටම හිරවෙලා, අපි හිටියෙ කොයි තරම් අමාරුවෙන් ද? සතෙක්ට තමන්ගෙ මුළු ජීවිත කාලෙම කූඩුවක් ඇතුළෙ හිර වෙලා, තමන්ට උරුම වුණ ජීවිතේ විඳගන්න නොලැබී, ජීවත් වෙන්න සිද්ධ වෙන එක මොනතරම් කනගාටුදායක දෙයක් ද?

### පෙබරවාරි 07

මේ දවස්වල කවියක්වත් ලියවෙන්නෙ නෑ. හිතට දැනෙන දේවල් අකුරුවලටවත් හරවන්න බැරුව හිත ඇතුළෙම ගල් වෙලා තියෙන එක හරිම අමාරුයි. සේනක බටගොඩ මහත්මයාගෙ සින්දුවක එන පද පේළියක් මට මතක් වෙනවා... "ඇහෙන දකින දේවල් කොතරම් තිබුණ ද, හිතට දැනෙන දේවල් ඇයි මෙතරම් බර.."

### පෙබරවාරි 08

හැම මනුස්සයෙක්ගෙම ජීවිත කතාව ඇතුළෙ බිඳ වැටීම් තියෙනවා. වැරදිකාර මනුස්සයෙක්ට උනත් එහෙම වෙන්න හේතුවක් තියෙන්න පුළුවන්. ඉපදෙනකොටම කිසිම කෙනෙක් හොරෙක්වත් මිනීමරුවෙක්වත් වෙන්නේ නෑ. ඔවුන් නිර්මාණය කරන්නේ සමාජය විසින්. Money Heist ටෙලි කතා මාලාව බලනකොට අපි හොරු දිහා අනුකම්පාවෙන් බලන්නේ ඔවුන්ගෙ ජීවිත කතාව අපි දන්න නිසාම වෙන්න ඕන.

### පෙබරවාරි 09

"මොකද ඔය කොණ්ඩෙට වෙලා තියෙන්නෙ, කැලි කැලි කපාගෙන කපුටු කූඩුවක් වගේ." ජීවිතේ ඒකාකාරී නීරස විදියට ගලාගෙන යනකොට වෙනසක් ඕන වෙනවා. ඉතිං ඒවගේ වෙලාවක කොණ්ඩෙ කපලා අලුත් හෙයා ස්ටයිල් එකක් ට්‍රයි කරන එක වැරැද්දක් නෑනෙ. කොහෙද ඉතිං අම්මලට මේවා තේරෙනවැයි.

### පෙබරවාරි 10

අපේ රටේ මිනිස්සු හැමතිස්සෙම අනෙකාව විවේචනය කරන්න පෙලඹෙන්නේ ඇයි කියලා මට නම් තේරෙන්නේ නෑ. කාගේ හරි මොකක්ම හරි පොඩි දෙයක් අල්ලගෙන ඒක විවේචනය කරන එක දරුණු විදියටම වෙනවා. වැරැද්දක් පෙන්නලා දීලා ඒක නිවැරදි කරනවා වෙනුවට ඒ මනුස්සයව පීඩාවට පත් කරන එක හරිම පහත් දෙයක්.

### පෙබරවාරි 11

කොරෝනා නිසා කාලෙකින් මුහුද වෙරළට ගියේ නෑ. ඉර බහින වෙලාවක මුහුදු වෙරළකට වෙලා ඈත සිතිජය දිහා බලාගෙන ඉන්න, කිසිම කතාවක් නැතුව මුහුදෙ හඬට කන් දීගෙන ඉන්න, මුහුදු රළ කකුල් වටේ එතෙන සනීපය විඳගන්න තියෙනවා නම්. මේ සති අන්තයේවත් මුහුද බලන්න යන්න ඕන.

### පෙබරවාරි 12

ආදරවන්තයින්ගේ දිනය ළඟ නිසා ෆේස් බුක් යන්න බෑ වෙළඳ දැන්වීම් පිරිලා. ඩිස්කවුන්ට් හැමතැනම. වැලන්ටයින් විකුණනවා. ලෝකයේ පැවත්ම තියෙන්නේ ආදරය එක්ක. අනිත් හැම දේකටම වගේ දිනයක් තියෙන නිසා ආදරයටත් දිනයක් වෙන් කරන එක විය යුතු දෙයක්. හැබැයි ආදරය කියන එක මීට වඩා පුළුල් විදියට අර්ථයකින් යුතුව සමරන්න ඕන දෙයක්.

**කුශාන්ති අනුරාධා බණ්ඩාර**

'යොවුන් ජනතා' දිනමිණ
ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

## සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය (ආනන්ද සමිතිය)

**43 වන සංවත්සර මහ සභාව 2021 පෙබරවාරි මස 27 වන සෙනසුරාදා දින පෙ.ව. 10.30ට කඩවත පිහිටි කේ.සී.පී. ශාලාවේදී ගරු සභාපති වාසනා ලියනගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.**

සාමාජික ඔබ සැමගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂක්ෂා කරමි.

**සැ.යු. -**

01. රැස්වීම් ශාලාවට ඇතුළු වීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ දෙපාර්තමේන්තු හැඳුනුම්පත අනිවාර්යයෙන් ඉදිරිපත් කළයුතුය.
02. සංචරණ සීමා පනවා ඇති ප්‍රදේශවල වාසය කරන කිසිදු සාමාජිකයෙකු හෝ නිරෝධානය වන පවුලක සාමාජිකයෙකු හෝ coviD 19 රෝග ලක්ෂණ සහිත (උණ / කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව /උගුරේ වේදනාව වැනි) කිසිදු පුද්ගලයෙකු මෙම රැස්වීමට සහභාගි නොවිය යුතුය.
03. පෙ.ව 10.30 සිට ප.ව 12.30 දක්වා කාලය තුළ මෙම මහ සභාව පැවැත්වීමට නියමිතය.

**මෙයට,**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,**
**සාමාන්‍යාධිකාරී/ලේකම්,**
**ඩබ්ලිව්.ඒ.අයි.එල්. වීරසිංහ**
**දු.ක. :- 011-2687476 / 011-2699295**
**ෆැක්ස් :- 011-2687477**
**2021.02.12**

## සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය අංක 912/1, මරදාන පාර, කොළඹ 08.

ඉහත සමුපකාර සමිතියේ 2018.04.01 සිට 2019.03.31 දක්වා මූල්‍ය ප්‍රකාශන මත විගණනවරයාගේ වාර්තාව, 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය මේ සමඟ ඉදිරිපත් කර ඇත.

**ඩබ්ලිව්.කේ.එල්. කේ. ලියනගේ**
**සභාපති**

**ඩබ්ලිව්.ඒ.අයි.එල්. වීරසිංහ**
**සාමාන්‍යාධිකාරී/ලේකම්**

## සීමාසහිත සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2018.04.01 සිට 2019.03.31 දින දක්වා මූල්‍ය ප්‍රකාශන මත විගණකවරයාගේ වාර්තාව

**1. යොමුකිරීම**

සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් / සහකාර කොමසාරිස් (විගණන) මඟින් සීමාසහිත සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ සමාජිකයන් වෙත.

**2. අධිකාරිය**

සහකාර කොමසාරිස් (ඈවර / විගණන), ඩී.එම්.එම්. බන්දුල මහතා විසින් ඔහුගේ අංක DCD/3/2/1-2019 හා 2019.09.26 දිනැති ලිපියෙන්, 1992 අංක 11 සහ 1983 අංක 32 දරන සංශෝධන සමඟ කියවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 44 (1) වගන්තිය යටතේ අප වෙත බලය පවරා කරන ලද විධිවිධානයට අනුව, අප විසින් වාර්තාවේ පිටු අංක 01 සිට පිටු අංක 31 දක්වා ඇති සීමාසහිත සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එම දිනෙන් අවසන් වසර සඳහා වූ ඊට සම්බන්ධිත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට කරන ලද සටහන් හා ගිණුම් ප්‍රතිපත්ති සමඟ විගණනය කරන ලදී.

**3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා සමුපකාර නීතියේ සඳහන් නියමයන්ට යටත්ව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. ඒ යටතේ,

- යෝග්‍ය වූත් ප්‍රමාණවත් වූත් ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා නඩත්තු කිරීම.
- වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- සත්‍ය වූත් සාධාරණ වූත් ආකාරයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදා ගැනීම.
- අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම.
- සමුපකාර සමිතිය අඛණ්ඩ පැවැත්මකින් යුතුව පවත්වාගෙන යාම.
- මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සියලු වත්කම් සමිතිය සතුව තිබිය යුතු අතර, ඒවා පාවිච්චි කළ හැකි, අයකර ගත හැකි ගුණාත්මකභාවයකින් යුතු වත්කම් වීම.

යන සමස්ත ක්‍රියාවලියේ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුවේ.

**4. විගණකගේ වගකීම -**

විගණකවරුන් ලෙස අප වෙත පැවරී ඇති වගකීම වනුයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවත්, සමුපකාර නීතියේ සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇති බවට වාර්තා කිරීමත්, සමිතියේ කටයුතු හා පරිපාලනය සමුපකාර නීතියට අනුව සිදුකර ඇති බව වාර්තා කිරීමත්, මූල්‍ය ප්‍රකාශන මඟින් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ප්‍රකාශ වේදැයි යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමත් වේ.

**5. විෂයපථය -**

මෙම විගණනය සිදුකරනු ලැබුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලව හා සමුපකාර නීතියේ විගණනය සම්බන්ධයෙන් කර ඇති නියමයන්ට අනුකූලව අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටි පිළිබඳ තහවුරුවක් සඳහා අදාළ සාක්ෂි පරීක්ෂාකර බැලීම අපගේ විෂය පථයට ඇතුළත් වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් හා කරුණු සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සෝදිසි කිරීමේ පදනම මත (නියැළි තහවුරු පරීක්ෂා කිරීම මත) ඉතා සාධාරණව සිදුකර ඇත. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් සිදුකරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම ද, සමථ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ද, ඇගයීම ද මෙම විගණනයට ඇතුළත් වේ. අපගේ වෘත්තීය පරිචය හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබා ගන්නා ලදී.

**6. විශේෂ අවධාරණයට යටත් කරුණු**

ගිණුම් ශේෂයන් කිහිපයක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණත්වයන්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නො වීම හා සමුපකාර නීතියේ සඳහන් නියමයන්ට හා සමුපකාර සේවක කොමිෂන් සභා නීති, රෙගුලාසි හා නියමයන්ට අනුකූල නොවීම පිළිබඳව අපගේ කළමනාකරණ ලිපියෙන් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඇත. එමෙන්ම විගණන කටයුතුවලදී අනාවරණය කරගත් ගිණුම් වාර්තා පවත්වා ගැනීම, මූල්‍ය වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව තවදුරටත් කළ යුතු වැදගත් කරුණු ඉහත ලිපිය මඟින් අධ්‍යක්ෂකවරුන්ගේ අවධානයට යොමු කර ඇත.

**7. විගණන මතය -**

විගණන පරීක්ෂණවලට අනුව සීමා සහිත සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය විසින් නියමිත ගිණුම් පොත් පවත්වාගෙන යාමේදී අප වෙත ඉදිරිපත් වූ තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් පොත්පත් අතර එකඟතාවයක් ඇති බවද, 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතින් නියමව ඇති තොරතුරු ප්‍රතිපාදනය වී ඇති බවද, 2019.03.31 දිනට සමිතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳව හා එදිනෙන් අවසන් මෙහෙයුම් වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය පිළිබඳ අපගේ මතය අනුව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් අපගේ මතය වේ.

**විගණක**
**ඒ.අයි.ඒ. අදිකාරි**
**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**
**2020.02.13**

**විගණක**
**ජී.ආර්.ආර්. පතිරගේ**
**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**
**2020.02.13**

## සී/ස. සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබද සමුපකාර සමිතිය

### 2019/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන් | 2019-03-31 | 2018-03-31 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. |
| මුදල් හා මුදල් සමානයන් | 01 | 14,410,751.82 | 16,624,092.54 |
| මූල්‍ය ආයෝජන | 02 | 934,468,695.10 | 70,347,444.29 |
| සාමාජික ණය හා අත්තිකාරම් | 03 | 1,311,475,783.86 | 1,156,814,159.49 |
| වෙනත් ලැබිය යුතු දෑ | 04 | 29,979,257.35 | 19,494,169.24 |
| ඉතිරි තොගය | 05 | 0.00 | 26,500.59 |
| ආයතනික කොටස් | 06 | 10,000,000.00 | 10,001,500.00 |
| දේපළ පිරියත හා උපකරණ | 07 | 127,907,124.84 | 108,312,697.53 |
| **මුළු වත්කම්** | | **1,587,241,612.97** | **1,381,620,563.68** |
| **වගකීම්** | | | |
| තැන්පත් | 08 | 654,433,244.15 | 559,404,404.73 |
| සමුපකාර අරමුදල | 09 | 14,919,163.78 | 11,686,396.16 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 10 | 27,667,319.64 | 24,982,137.26 |
| වෙත් වගකීම් | 11 | 18,966,482.09 | 11,230,662.06 |
| **මුළු වගකීම්** | | **715,986,209.66** | **916,307,208.96** |
| **හිමිකම්** | | | |
| **කොටස් ප්‍රාග්ධනය** | 12 | 268,812,268.41 | 234,483,570.58 |
| ව්‍යවස්ථාපිත සංචිතය | 13 | 102,238,943.06 | 86,944,094.67 |
| වෙනත් සංචිත හා අරමුදල් | 14 | 398,466,366.11 | 374,653,624.48 |
| ඉතිරි ලාභ | 15 | 101,737,825.73 | 78,235,673.74 |
| **මුළු හිමිකම්** | | **871,255,403.31** | **465,313,354.72** |
| **මුළු වගකීම් හා හිමිකම්** | | **1,587,241,612.97** | **1,381,620,563.68** |

ගිණුම් සටහන් අංක 1 සිට 15 දක්වා සඳහන් ගිණුම් සටහන් මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේම කොටසක් බවත් ඉහත සඳහන් තොරතුරු සමිතියේ පොත්පත් අනුව නිවැරදි බවත් සහතික කරමු.

එම්.ඩී.එන්.ආර්.පී. කුමාර
ගණකාධිකාරී

| | | |
|---|---|---|
| ඒ.යූ. එදිරිසිංහ | ඩබ්ලිව්.ඒ.අයි. වීරසිංහ | ඩබ්.කේ.එල්.කේ. ලියනගේ |
| භාණ්ඩාගාරික | ලේකම් | සභාපති |

අප සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ ගිණුම් පරීක්ෂා කර බලා ඉහත පිටපත් කර තිබෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගණන් පරීක්ෂා කළෙමි. (මෙම වාර්තාවේ යන පිටුවල හැර) අපට අවශ්‍ය වූ සියලු විස්තර හා තොරතුරු සමිතියේ නිලධාරීන්ගෙන් ලබා ගතිමි. මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සියලු වත්කම් හා බැරකම් තිබෙන බවටත්, ඒවායේ අගය වැඩිපුර දක්වා නොමැති බවටත්, අපට වැටහෙන පරිදි සමිතියේ පොත්පත්වල දක්වන්නාවූ හා අප වෙත ඉදිරිපත් කරන ලද්දාවූ තොරතුරු හා විස්තර අනුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමිතියේ කටයුතු සම්බන්ධයෙන් නියම තත්ත්වය විදහාපාන පරිදි සකස් කර ඇති බව අපගේ අදහස වේ.

විගණනයට භාජනය කළෙමු.

විගණක - ඒ.අයි.ඒ. අධිකාරී

විගණක - ජී.ආර්.ආර්. පතිරගේ

2020-02-13

## සී/ස. සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබද සමුපකාර සමිතිය

### 2019/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | 2019-03-31 | 2018-03-31 |
|---|---|---|---|
| | | රු. | රු. |
| පොලී ආදායම | 16 | 169,107,871.83 | 148,430,185.71 |
| පොලී වියදම | 17 | 44,783,592.00 | 37,990,137.00 |
| ශුද්ධ පොලී ආදායම | | **124,324,279.83** | **110,440,048.71** |
| සුපිරි වෙළඳසැල් අලාභය | 18 | 0.00 | (1,537,096.92) |
| වෙනත් ආදායම් | 19 | 1,368,668.31 | 1,295,078.00 |
| **මුළු ආදායම** | | **125,692,948.14** | **110,198,029.79** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 20 | 22,499,035.99 | 20,629,932.36 |
| පරිශ්‍ර උපකරණ ආයතන වියදම් | 21 | 6,407,519.92 | 7,374,324.80 |
| අධ්‍යක්ෂක මණ්ඩල වියදම් | 22 | 2,328,498.81 | 1,634,145.00 |
| ක්ෂය | 23 | 3,940,957.44 | 4,238,631.31 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 24 | 29,337,542.41 | 21,929,161.50 |
| මුළු වියදම් | | **64,513,554.57** | **55,806,194.97** |
| **ශුද්ධ ලාභය** | | **61,179,393.57** | **54,391,834.82** |

ගිණුම් සටහන් අංක 16 සිට 23 දක්වා සඳහන් ගිණුම් සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයේම කොටසක් බවත්, ඉහත ආදායම් වියදම් සමිතියේ පොත්පත් අනුව නිවැරදි බවත් සහතික කරමු.

එම්.ඩී.එන්.ආර්.පී. කුමාර
ගණකාධිකාරී

| | | |
|---|---|---|
| ඒ.යූ. එදිරිසිංහ | ඩබ්ලිව්.ඒ.අයි. වීරසිංහ | ඩබ්.කේ.එල්.කේ. ලියනගේ |
| භාණ්ඩාගාරික | ලේකම් | සභාපති |

විගනණයට භාජනය කරන ලදී

# කඩුවෙල මහා නගර සභාව

## ටෙන්ඩර් දැන්වීමයි

කඩුවෙල මහා නගර සභාවට අයත් කඩුවෙල බස් නැවතුම්පොළෙහි හා කඩුවෙල සතිපොළෙහි පිහිටා ඇති වැසිකිළි පද්ධතිය අවම වාර්ෂික ටෙන්ඩර් මුදල වන රු.144,000/- කට අවුරුදු එක (01) ක කාල සීමාවක් සඳහා බදුදීමට මුද්‍රා තබන ලද ලංසු 2021/03/05 දින පෙ.ව. 10.00 දක්වා කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **ටෙන්ඩර්පත් නිකුත් කිරීමේ අවසාන දිනය හා වේලාව** | : | **2021/03/04 ප.ව 03.00** |
| **ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව** | : | **2021/03/05 පෙ.ව 10.00** |
| **ටෙන්ඩර් විවෘත කිරීමේ දිනය හා වේලාව** | : | **2021/03/05 පෙ.ව 10.15** |

ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර ආපසු නොගෙවන රු.5,000.00ක ටෙන්ඩර් පෝරම ගාස්තුවක් හා ආපසු ගෙවනු ලබන රු. 25,000.00 ක ටෙන්ඩර් තැන්පතුවක් ද, ගෙවීමෙන් පසු ටෙන්ඩර් අයදුම්පත් කඩුවෙල මහා නගර සභාවේ නාගරික මුදල් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය.

ටෙන්ඩර් අයදුම්පත් භාර ගන්නා අවසාන දින නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලීම කළ යුතුය. තවද ටෙන්ඩර්පත් බහාලන කවරයේ ඉහළ කෙළවරේ **"කඩුවෙල බස් නැවතුම්පොළෙහි හා කඩුවෙල සතිපොළෙහි පිහිටා ඇති වැසිකිළි පද්ධතිය බදු ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් භාර ගැනීමේ සහ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය සභාව සතුය . වැඩි විස්තර කාර්යාල වේලාව තුළදී නාගරික ගණකාධිකාරී මගින් ලබා ගත හැකිය. (දුරකථන අංක: 0112 - 539562)

**2021/02/11**
**කඩුවෙල මහා නගර සභාව.**

**සංජීව බන්දුකීර්ති,**
**නාගරික කොමසාරිස්.**

# රැකියා ඇබෑර්තු



# පුරප්පාඩු

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2021.02.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

අ .පො. ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(II) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. LEVEL 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

හෝ

(ආ) පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ වසරක පළපුරුද්දක් සහිත ඉහත (II) (අ) සුදුසුකම්වලට සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 31625-7X300 10X355 -37275 p.m. [U-MT 1 (III)]

**බඳවා ගැනීම :** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස :** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

- අයදුම්පත්‍රය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන WWW.SJP.AC.LK මගින් බාගත කර ගත හැකි අතර, සෑම අයදුම්පතක්ම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත්ද සමග සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2021.02.25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- විශ්වවිද්‍යාල සේවයේ/රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම්වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුපට ද, 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලටද බැර කරනු ලැබේ. එයට අමතරව තෝරා ගත් අයදුම්කරුවන් වෙනුවෙන් 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැරකරනු ලැබේ.
- අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**
**2021.02.10**

---

1986 අංක 32 දරණ පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ පනතේ 29 ඩී ( 29D ) වගන්තිය යටතේ වන විකුණුම් නිවේදනය.

PEOPLE'S BANK

## මහජන බැංකුව (ආනමඩුව ශාඛාව)

### ගොඩනැගිලි සහිත භූමිය ,එහි ඇති ගස්, පලතුරු වගාවන්, ඇතුළු වටිනා වෙළඳ වටිනාකමකින් යුතු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ අංශයට අයත්, කුමාරවන්නි පළාත කෝරලේ හි පාදිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආනමඩුව ප්‍රාදේශීය සභා මායිමෙහි පිහිටි ,ආනමඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ , හි ආනමඩුව ග්‍රාමයේ "පලුගහ කැලේ" ලෙස හඳුන්වන, බලයලත් මිනින්දෝරු ආර් .බී . ප්‍රේමතිලක බණ්ඩාර විසින් 1992.11.19 දින සමීක්ෂණය කරන ලද අංක 531 පිඹුරුපතෙහි සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන්කරන ලද ,

උතුරු දිශාවෙන් : කේ .බී. වීරකෝන්ට අයත් ඉඩමෙන්ද,
නැගෙනහිර දිශාවෙන් : පී .පී රුබර්ට්ට අයත් ඉඩමෙන්ද,
දකුණු දිශාවෙන් : අංක 531 සැලැස්මේ ලොට් අංක 2 දරණ ඉඩමෙන්ද,
බටහිර දිශාවෙන් : හලාවත සිට ආනමඩුව දක්වා දිවෙන මාර්ගයෙන්ද,

පර්චස් 5යි දශම 9 ක (A.00 - R. 00 - P. 5.9) වපසරියක් පුරා පැතිර ඇති ඉඩම හා එහි අඩංගු ගොඩනැගිලි, ගස්, පලතුරු වගා සහ එහි ඇති සෑම දෙයක් සමගම. ඉහත ඉඩම පහත පරිදි නැවත නැවත සමීක්ෂණය කර ඇත. පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අයත්, ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ ආනමඩුව ප්‍රාදේශීය සභාව මායිමෙහි පිහිටි, ආනමඩුව ග්‍රාම නිලධාරී කොට්ටාශයේ, ආනමඩුව ග්‍රාමයේ "පලුගහ කැලේ" ලෙස හඳුන්වන ඉහත සඳහන් ඉඩම, බලයලත් මිනින්දෝරු ජේ.ඒ.වී. රාජනායගම් විසින් 2006.08.20 දින සමීක්ෂණය කරන ලද අංක 292 පිඹුරුපතෙහි ලොට් අංක 1 ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන්කරන ලද,

උතුරු දිශාවෙන් : පාර සහ ඒ.ඒ. ටියුඩර් යන අයට අයත් ඉඩමෙන්ද,

නැගෙනහිර දිශාවෙන් : රුබර්ට්ට යන අයට අයත් ඉඩම සහ ඒ ඒ ටියුඩර් යන අයට අයත් ඉඩමෙන්ද

දකුණු දිශාවෙන් : රුබර්ට්ට අයත් ඉඩමෙන් සහ එල් .සී.ප්‍රනාන්දුට අයත් ඉඩමෙන්ද,

බටහිර දිශාවෙන් : එල් .සී. ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් සහ මාර්ගයෙන්ද,

පර්චෙස් 6 ක (A. 00 - R. 00 - P.06) හෙවත් හෙක්ටයාර දශම බින්දුවයි එකයි පහයි දෙකක (H.0.0152) ප්‍රමාණයෙන් යුත් වපසරියක් පුරා පැතිර ඇති ඉඩම හා එහි අඩංගු ගොඩනැගිලි, ගස්, පලතුරු වගා සහ එහි ඇති සෑම දෙයක් සමගම වේ .

ඉහත සඳහන් ඉඩමට පිවිසීම සඳහා බටහිර මායිමෙන් පොදු මාර්ගයක් ද වේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් පී .ඩී .එස් රන්සිරිනි ජෝසප් මහත්මිය හමුවේ දිව්රුම් දුන් පරිදි අංක 2749 දරණ බැඳුම්කරය වික්‍රමසිංහ ගම්ලත් ගෙදර ඉනෝකා රසංගිකා වික්‍රමසිංහ යන බන්ධනදායකයා වෙත ලබාදුන් පහසුකම් සඳහා සුරක්ෂිත දේපල වෙනුවෙන් මහජන බැංකුවට පොරොන්දු වූ ගෙවීම් පැහැර හැර ඇත .

**මහජන බැංකුව විසින් මා හට පවරන ලද බලය යටතේ**
ඉහත සඳහන් දේපළ 2021 මාර්තු මස 09 වන අඟහරුවාදා දින පෙරවරු 10.30ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දැනුම් දෙමු .

**දේපළ සඳහා වූ ප්‍රවේශය :-**
ආනමඩුව නගර මධ්‍යයේ ඔරලෝසු කනුව ඉදිරිපිට හලාවත දක්වා දිවෙන මාර්ගයට මුහුණලා අදාළ දේපල පිහිටා ඇත.

**විකිණීමේ නිවේදනය සඳහා :-**
කරුණාකර 2019 අප්‍රේල් 26 වන දින රජයේ ගැසට් පත්‍රය සහ ඩේලි නිව්ස් , දිනමිණ සහ තිනකරන් පුවත්පත් පරිහරණය කරන්න.

**ගෙවීම් කරන පිළිවෙල -**
මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් මිටිය පහත් හෙළීමත් සමගම පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්).
2. ගැනුම් මිලෙන් ජාතිය ගොඩනැගීමේ බද්ද 2% ක්.
3. ගැනුම් මිලෙන් 8% ක් වූ එකතු කල අගය මත බදු මුදල්
4. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එක) දේශීය විකුණුම් බද්ද,
5. ගැනුම් මිලෙන් 2 ½% (සියයට දෙකහමාරක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල
6. විකුණුම් පිරිවැය සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා.
7. විකුණුම් සහතිකයට අදාළ මුද්දර ගාස්තු.
8. ගැනුම් මිලෙන් තවත් සියයට 90% ක් වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය පිහිටි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත එම මුදල ගෙවනු නොලබන්නේ නම්, දැනටමත් ගෙවනු ලැබූ 10% ක මුදල අහෝසි කර දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුව පවතී.

හිමිකම් ඔප්පුව සහ අදාළ ලියකියවිලි පහත ලිපිනයෙන් ලබා ගත හැකිය.

පෙර දැනුම් දීමකින් තොරව වෙන්දේසිය පැවැත්වීමට හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

ප්‍රාදේශීය කළමනාකරු - පුත්තලම,
මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79,
මාරවිල පාර,
නාත්තන්ඩිය.

දු.ක. : 032-22253300, 032-2253301
ෆැක්ස් : 032-2255247

DK's AUCTIONS
To Professionally Serve the Nation

**ඩැලස් කෙලාට්**
විශේෂඥ බලපත්‍රලාභී වෙන්දේසිකරුවන්
අංක:146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථන: 011- 4367467,0 11- 4367111
විද්‍යුත් : aucslk@gmail.com

---

**ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

SD&CC

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

## ඇබෑර්තු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පළමු ශ්‍රේණියේ (CS1 ශ්‍රේණියේ) ආයතනයක් ලෙස ලියාපදිංචි, ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ සහතිකලත් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ආයතනයක ප්‍රවීණ වෘත්තිකයින් කණ්ඩායමක් සමග සේවය කිරීමේ සුවිශේෂීය අවස්ථාවකි.

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සිවිල් ඉංජිනේරු තනතුර (MM 1-2)

**සුදුසුකම් :**
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධියක් හෝ සමාන සුදුසුකම්
පිළිගත් ඉදිකිරීම් ආයතනයක සේවා පළපුරුද්ද සතු අයහට ප්‍රමුඛතාවය හිමි වේ.

**වැටුප :**
සාකච්ඡා කළ හැකි අතර, සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම් වේ.

**වයස :**
අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

### 02. නිර්මාණ අධිකාරි තනතුර (JM 1-1)

**සුදුසුකම් :**
ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT - Civil) හෝ සමාන සුදුසුකම්
පිළිගත් ඉදිකිරීම් ආයතනයක සේවා පළපුරුද්ද සතු අයහට ප්‍රමුඛතාවය හිමි වේ.

**වැටුප :**
සාකච්ඡා කළ හැකි අතර, සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම් වේ.

**වයස :**
අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගත් අයදුම්කරුවන්හට,**

- වාර්ෂික ප්‍රසාද දීමනාව
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්
- වෛද්‍ය රක්ෂණ ආවරණය
- දිරි දීමනා

සුදුසුකම් පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව, ඥාතින් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් හා දුරකථන අංකද ඇතුළත් කළ අයදුම්පත හා අදාළ සහතික වල පිටපත් ද අමුණා මෙම දැන්වීමේ දින සිට දින දාහතරක් (14) ඇතුළත ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අපේක්ෂකයින් විසින්, අයදුම්කරන තනතුර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**සභාපති**
**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව,**
**අංක 07, බොරුපන පාර,**
**රත්මලාන.**

**" යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ පුරෝගාමියෝ "**

---

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදගම තනෝටුව දෙමටළුව ලිපිනයේ පදිංචි

1. වත්ගුවා දූරයලාගේ මෙවිල් සමරසිංහ
2. පෙරුමා දූරයලාගේ පුෂ්පා රෝහිණී
3. වත්ගුවා දූරයලාගේ සසිත දිලංජන් සමරසිංහ
4. වත්ගුවා දූරයලාගේ කලනධනංජන් සමරසිංහ
5. වත්ගුවා දූරයලාගේ රශ්මිණී රසංජනා සමරසිංහ

වන අපි මෙතැන් පටන්

1. වැලිවත්ත දිසානායකගේ මෙවිල් වැලිවත්ත
2. වැලිවත්ත දිසානායකගේ පුෂ්පා රෝහිණී වැලිවත්ත
3. වැලිවත්ත දිසානායකගේ සසික දිලංජන් වැලිවත්ත
4. වැලිවත්ත දිසානායකගේ කලන ධනංජන් වැලිවත්ත
5. වැලිවත්ත දිසානායකගේ රශ්මිණී රසාංජනා වැලිවත්ත

යන නම්වලින් හඳුන්වන බව ශ්‍රී ලංකා ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට,
වැලිවත්ත දිසානායකගේ මෙවිල් වැලිවත්ත

---

කළුතර දිස්ත්‍රික්යේ බේරුවල ප්‍රා.ලේ. කොට්ඨාශයේ 765, සීනවත්ත ග්‍රා.නි. වසමේ සයිමන් ද සිල්වා මාවතේ පදිංචි පත්තිනිගේ ප්‍රසන්න දේශප්‍රිය සිල්වා වන මා මගේ දරුවන් වන **පත්තිනිගේ දෑහැමි සහස්නා ලක්මින්දි, පත්තිනිගේ අසේලි ආරාධ්‍යා මෙත්සරණී,** මෙතැන් සිට **පත්තිනිගේ දෑහැමි සහස්නා ලක්මින්දි සිල්වා, පත්තිනිගේ අසේලි ආරාධ්‍යා මෙත්සරණී සිල්වා** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජන රජයටත්, මහජනතාවටත් දැනුම් දෙමි.

පත්තිනිගේ ප්‍රසන්න දේශප්‍රිය සිල්වා (පියා)

---

**තරුණියන්ගේ**
**කාන්තාවන්ගේ**
**මවුවරුන්ගේ**

හද බැඳි කාන්තා පත්තරය
**සෑම බදාදාවකම**

**තරුණී**

---

## - නිවැරදි කිරීමකි -

## කොළඹ මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීම

2021 පෙබරවාරි මස 12 දින දිනමිණ පුවත්පතේ 18 පිටුවේ පළවූ දැන්වීමේ වගුවේ අංක 02 පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

| | යොමු අංකය | විස්තර |
|---|---|---|
| 02. | CPD16/30/2021 | කොළඹ මහා නගර සභා සීමා පරිශ්‍රයන් වෙත පවිත්‍රතා සේවා සැපයීම 2021-01 (ස්ථාන 10 ක්) |

**රොෂාණි දිසානායක - නීතිඥ**
**නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව.**

---

**සීමාසහිත මීගමුව විවිධ සේවා සමුපකාර සමිතිය**
**පෞද්ගලික ආරක්ෂක සේවා සඳහා**

## මිල ගණන් කැඳවීම.

සමිති මූලස්ථානයට ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලබන අතර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ වාර්ෂික බලපත්‍රයේ පිටපතක් අයදුම්පත්‍රය සමඟ එවිය යුතුය.

මුද්‍රා තබන ලද මිල ගණන් පිටපත් 2 කින් 2021-02-26 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. නොඑසේ නම් සමිති ප්‍රධාන කාර්යාලයට අතින් ගෙනවිත් භාරදිය හැකිය. ටෙන්ඩර්පත් විවෘත කරන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පෞද්ගලික ආරක්ෂක සේවා සඳහා මිල ගණන් කැඳවීම"** යනුවෙන් සටහන් කර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

ටෙන්ඩර් පෝර්ම ගාස්තු රු.1500/- ක සහ ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් රු. 25,000/- ක් ගෙවා ටෙන්ඩර් පෝර්ම සමිති කාර්යාලයෙන් ලබාගත හැකිය.

**ගරු සභාපති තුමිය,**
**සී/ස මීගමුව වි.සේ.ස. සමිතිය,**
**358, කෙලින් වීදිය, මීගමුව.**

**දුරකථන අංක : 031-2222341,**
**ෆැක්ස් අංක : 031-2238846**

---

## තනතුරු ඇබෑර්තු

**සීමාසහිත රත්ගම විවිධ සේවා සමුපකාර සමිතිය**

**තනතුර : සාමාන්‍යාධිකාරී**

**වැටුප් පරිමාණය : 101.7**
(13935-330x12-350x10-370x8-390x8 = 27475)

දායක විශ්‍රාම වැටුප් සහිතයි.

**වයස අවු. 22-45 අතර.**

දැනට සමුපකාර සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

මෙම තනතුර සඳහා අනුමත සුදුසුකම් පිළිබඳව විස්තර අප සමිති කාර්යාලයෙන් හෝ ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඕනෑම සමූපකාර සමිති කාර්යාලයකින් හෝ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැකිය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමග එවියයුතු අතර, අයදුම් පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත් 2021.02.24 දින දහවල් 12 ට පෙර ලියාපදිංචි තැපෑලෙන්.

**ගරු සභාපති, සිමාසහිත රත්ගම විවිධ සේවා සමුපකාර සමිතිය, රත්ගම** යන ලිපිනයට එවිය යුතුය.

**ගරු සභාපති,**
**සී.ස. රත්ගම වි.සේ.ස. සමිතිය.**
**දුරකථන අංකය - 091-2267087**

---

**පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි**

**ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ**

# ලෝක ගුවන්විදුලි දිනයේ දසවැනි සැමරුම අද

(අදට (13) යෙදෙන ලෝක ගුවන්විදුලි දිනය නිමිත්තෙනි)

ලෝක ගුවන්විදුලි දිනයේ දසවැනි සැමරුම අදයි. ලෝක ගුවන්විදුලිය ඇරැඹි වසර එකසිය දහය සපිරෙන්නේ ද මේ වර්ෂයේදීය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ගුවන්විදුලි සේවයක් ආරම්භ කොට අදට (13) වසර 75කි. අද්‍යතන ගුවන්විදුලි මාධ්‍යයේ ස්වභාවය, ගුවන්විදුලි මාධ්‍ය මෙහෙයවිය යුතු දිශානතිය තේරුම් ගැනීමට මේ මාධ්‍යයේ සමාජ දායකත්වය ලෝක ගුවන්විදුලි තේමා සහ අරමුණු පිළිබඳ අවබෝධ කරගැනීම අතිශය වැදගත් වන්නකි.

ලොව ප්‍රථම විද්‍යුත් මාධ්‍ය ගුවන්විදුලියයි. ගුවන්විදුලිය ජනාදරයට පත්වන්නේ මුල්වරට ප්‍රවෘත්ති ගෙන එන්නා වශයෙනි. ග්‍රාහක මනස ග්‍රහණය කළේ රසාස්වාදනීය විනෝදාත්මක මාධ්‍යයක් ලෙසිනි. ගුවන්විදුලි ගීත, සංගීතය මෙන්ම ගුවන්විදුලි භාෂාව මානව සමාජයට අලුත් අත්දැකීම් එකතු කළේය. ගුවන්විදුලි භාෂාවේ සංයුතිය වන්නේ මිනිස් හඬ, සංගීතය හා බාහිර ශබ්දයයි. මේ ශබ්ද ත්‍රිත්වයේ සංකලනයෙන් අර්ථ පූර්ණ ගුවන්විදුලි භාෂාව ගොඩනැගේ. ගුවන්විදුලි භාවිතයේ වැදගත්ම සාධකය වන්නේ මේ භාෂාව මැනවින් භාවිත කිරීමය. ගුවන්විදුලි පණිවිඩ අර්ථපූර්ණ වන්නේ ගුවන්විදුලි භාෂාවේ ගුණාත්මක බව අනුව ය.

ගුවන්විදුලිය පරිකල්පනය අවදි කරන මාධ්‍යයකි. පසුගිය සියවසේ මානව සමාජ නිර්මාණ පසුපස ගුවන්විදුලිය අවදි කළ පරිකල්පනයේ යෝධ සෙවණැල්ල සටහන්ව පවතී. වින්දනාත්මක ජන පරපුරක් ගොඩනැගීමේ ගුවන්විදුලි පරිකල්පනය මගින් අවදි කළ ප්‍රභාව පුළුල් මෙහෙවරක් ඉටු කර තිබේ. 1960 දශකය වන විට සංවර්ධන පණිවිඩ ජනගත කිරීමේ පෙර ගමන්කරු වූයේ ගුවන්විදුලියයි. පුළුල්ව විසිරියාම, ක්ෂණික බව, අඩු පිරිවැය සහිත මාධ්‍යයක් වීම, එක් පුද්ගලයකුට ආමන්ත්‍රණය කිරීම මෙන්ම, ජංගම ශීලී වීම මේ සඳහා බලපෑ කරුණු අතර වැදගත්ය. චීනය, ටැන්සානියාව සංවර්ධන ක්‍රියාදාමයේ මූලික උපකරණයක් ලෙස ගුවන්විදුලි මාධ්‍ය භාවිතයේ ආදර්ශ සපයා තිබේ. ශ්‍රී ලංකා මහවැලි ප්‍රජා ගුවන්විදුලියේ ප්‍රජා සංවර්ධන මෙහෙවර යුනෙස්කෝ සංවිධානයේ සම්භාවනාවට පාත්‍ර වූවකි. ගුවන්විදුලිය වාණිජ දේශපාලන අරමුණු සඳහා ප්‍රබලව භාවිත වේ. ජර්මනියේ හිට්ලර් දෙවන ලෝක සංග්‍රාමයේදී ස්වකීය අණසක පැතිරවීමට ඉවහල් කරගත්තේ ද ගුවන්විදුලියයි.

ගුවන්විදුලිය 19 වන සියවසේ විද්‍යාඥයන්ගේ සාමූහික උත්සාහයේ ප්‍රතිඵලයක් බව ශාස්ත්‍රීය පිළිගැනීමයි. එහෙත් ගුවන්විදුලිය ප්‍රචලිත වන්නේ මාර්කෝනිගේ සොයාගැනීමක් වශයෙනි. මහා බ්‍රිතාන්‍ය කේන්ද්‍ර කරගනිමින් ව්‍යාප්ත වූ ගුවන්විදුලිය පදනම් කර ගත්තේ පොදු සේවා ගුවන්විදුලි සංකල්පයයි. අමෙරිකාවේ ගුවන්විදුලිය ජනගත වූයේ වාණිජ පදනමකිනි.

ලෝක ගුවන්විදුලි දිනය ප්‍රකාශයට පත්වීම විමසිය යුත්තේ මේ පුළුල් පසුතලය පිළිබඳ අවබෝධයකිනි. පෙබරවාරි 13 ලෝක ගුවන්විදුලි දිනය ගුවන්විදුලිය පිළිබඳ කතා කරන එක් දිනයක් පමණක් නොවේ. එය වර්ෂයක් පුරා ගුවන්විදුලියේ මෙහෙයවීම පිළිබඳ දිශානතිය පැහැදිලි කරන දිනයකි. වසර පුරා වැඩසටහන් සැලසුම් කළයුතු, ක්‍රියාත්මක කළයුතු ආකාරය පිළිබඳ නිර්ණායක හඳුන්වාදීමේ සමාරම්භක ලක්ෂයක් ලෙස මේ දිනය හැඳින්විය හැකිය. පසුගිය දස වසරේ ලෝක ගුවන්විදුලි තේමා ගුවන්විදුලි ආයතනයක් මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.

ලෝක ගුවන්විදුලි දිනය ප්‍රකාශයට පත් කිරීමේ යෝජනාව යුනෙස්කෝ සංවිධානයට ඉදිරිපත් කර ඇත්තේ ස්පාඤ්ඤ ගුවන්විදුලි ඇකඩමිය මගිනි. යුනෙස්කෝ සංවිධානය ලොව පුරා විවිධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, ගුවන්විදුලි සංගම්, ගුවන්විදුලි ආයතනවලින් විමසීම් සිදුකර ඇති අතර ඒ සඳහා 95% කට අධික සාධනීය ප්‍රතිචාර ලැබී තිබේ. ආසියා පැසිපික්, අප්‍රිකා, කැරිබියානු රටවල් හා උතුරු අමෙරිකාවේ ගුවන්විදුලි සංගම් මේ මතය කෙරෙහි ජනතා භාවිතය වර්ධනය කර තිබේ. බී. බී. සී. ආයතනයේ සාධනීය ප්‍රතිචාරය සැබෑ ශක්තියක් විය.

ලෝක ගුවන්විදුලි දිනය විය යුත්තේ කවදාද? යන්න සංවාදයට ලක් වූවකි. 1946 පෙබරවාරි 13 වැනි දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගුවන්විදුලි සේවාවක් ආරම්භ කර තිබූ බැවින්, එම දිනය ලෝක ගුවන්විදුලි දිනය ලෙස යෝජනා කර ඇත්තේ යුනෙස්කෝ සංවිධානය විසිනි. එම යෝජනාව සම්මත වූයේ 2011 වර්ෂයේදීය. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් 2012 වර්ෂයේ දී ප්‍රථම ලෝක ගුවන්විදුලි දිනය සමරා තිබේ. එය ගුවන්විදුලි ඉතිහාසයේ ස්වර්ණමය දිනයක් වන අතර අපි මෙවර දසවෙනි ලෝක ගුවන්විදුලි දිනය සමරන්නෙමු.

ප්‍රථම සැමරුමේ තේමාව වූයේ 'තරඟකාරි ගුවන්විදුලිය හා ලෝක ජනතාව' යන්නයි. වාණිජත්වය හා සබැඳි තරගයකදී පොදු සේවා ගුවන්විදුලි සේවා මෙහෙවර මේ තත්ත්වය යටතේ සාකච්ඡාවට භාජනය විය. 2013 වර්ෂයේ ලෝකයේ සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන මාතෘකා දහය අතරට ගුවන්විදුලිය එක් වී තිබේ. මේ පුළුල් මහජන ආකර්ෂණයට හේතු වූයේ එම වර්ෂයේ තේමාව වූ 'නව මාධ්‍ය හා ප්‍රචාරණය' යන්නයි. 2014 වර්ෂයේ දී 'කාන්තාව බලාත්මක කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය' තේමාව විය. ගුවන්විදුලි මාධ්‍යයේ කාන්තා දායකත්වය හා කුසලතා ප්‍රවර්ධනය මෙන්ම ගුවන්විදුලි මාධ්‍යවේදිනියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම කෙරෙහි ලෝක අවධානය යොමුවිය. 2015 දී 'තරුණයා සහ ගුවන්විදුලිය' යන්න භාවිත කරන ලද තේමාවයි. තරුණයා බලාත්මක කිරීමේදී ගුවන්විදුලි භූමිකාව සාකච්ඡාවට භාජනය විය. 'හදිසි ආපදා සහ ගුවන්විදුලිය' යන්න 2016 වර්ෂයේ තේමාව වූ අතර එමගින් ලොව පුරා ඕනෑම ස්ථානයක පුද්ගලයකු හඬ ඔස්සේ ස්පර්ශ කිරීමට ඇති හැකියාව අවධානයට ලක්විය. 'ගුවන්විදුලියයි ඔබයි' 2017 දී තේමාව වූ අතර එමගින් ගුවන්විදුලිය හා සබැඳි මානව සබඳතාව ප්‍රචලිත කිරීම අරමුණ විය. 'ක්‍රීඩාව හා ගුවන්විදුලිය' 2018 දී තේමාව කරගනිමින් ක්‍රීඩාවේ ප්‍රවර්ධනයට දායකත්වය සපයා තිබේ. 2019 දී තේමාව වූයේ 'සාමය ඉවසිලිවන්ත භාවය හා සංවාදය' යන්නයි. එමගින් ලොව පුරා වර්ධනය වෙමින් පැවති ප්‍රචණ්ඩත්වයට ඉවසිලිවන්ත භාවයෙන් යුක්තව සංවාදශීලිවීම අරමුණ වී තිබේ. පසුගිය වර්ෂයේ තේමාව වී ඇත්තේ 'ගුවන්විදුලිය හා විවිධත්වය' යන්නයි. මානව සහ සමාජ අරමුණු සාධනය සඳහා විවිධත්වය උපයෝගි කරගන්නා ආකාරය පිළිබඳ සංවාද ගොඩනැගීම අභිලාෂය විය.

2021 වර්ෂයේ තේමාව වී ඇත්තේ 'නව ලෝකය නව ගුවන්විදුලිය' යන්නයි. මේ ප්‍රධාන තේමාව උප තේමා තුනක් යටතේ සමරන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය තම සාමාජික රාජ්‍යවලින් ඉල්ලා සිටී. එම තේමාවන් වන්නේ පරිණාමය, නව්‍යකරණය හා සබඳතාව යන්නයි. අප අපේ පරිණාමය දෙස ආපසු හැරී බැලිය යුතුය. නව්‍යකරණය විය යුත්තේ අතීත අත්දැකීම් ආශ්‍රයෙනි. එම අත්දැකීම් ආශ්‍රයෙන් ප්‍රචණ්ඩත්වය හා දේශපාලනය මගින් කර්කශ බවට පත්වෙමින් පවතින අද්‍යතන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී සංවාද බලවත් කිරීමේ අරමුණ සබඳතා මගින් අර්ථ දක්වයි. මානව සබඳතා ප්‍රවර්ධනය එහි අරමුණයි. ලෝක ගුවන්විදුලි තේමා විමසීමෙන් ගුවන්විදුලිය ගමන් කළයුතු දිශානතිය අවබෝධ කරගැනීම අතිශය පහසු කරුණකි. කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ සහයෝගයෙන් යුතුව ප්‍රථම වරට ලෝක ගුවන්විදුලි දිනය ශ්‍රී ලංකාවේ සමරා තිබේ. 2017 වර්ෂයේ සිට සංස්කෘතික දෙපාර්තමේන්තුව ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උලෙළක් පවත්වා, ගුවන්විදුලි වැඩසටහන් සම්පාදනය පිළිබඳ ව්‍යාකරණයක් ස්ථාපිත කිරීමට උත්සාහ දරා ඇති බව ද සටහන් කළ යුතුය. එම වර්ෂයේ සිට 'ගුවන්විදුලි සමීක්ෂා' නමින් ශාස්ත්‍රීය ලිපි සංග්‍රහ තුනක් නිකුත් කරමින් ගුවන්විදුලි දින අරමුණු පෝෂණය කිරීමට ප්‍රශංසනීය පියවරක් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ගෙන තිබීම අගය කළ යුත්තකි.

**-මහාචාර්ය කමල් වලේබොඩ**

# කෝප් කමිටු රැස්වීම අතරමඟ නවතා දමයි
## මාසයකින් සූදානම් වෙලා එන්න

### ක්‍රිකට් ආයතනයේ නිලධාරීන්ට කෝප් කමිටු සභාපති කියයි

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

විගණන විමසුම් සඳහා නිසි සූදානමකින් තොරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) හමුවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් පැමිණීම හේතුවෙන් කෝප් කමිටු රැස්වීම අතරමඟ නවතා දැමීමට සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා තීරණය කළේය.

ඒ අනුව මාසයකින් කරුණු විමසීමට නිසි පරිදි සූදානම්ව පැමිණෙන ලෙස ද කෝප් කමිටුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට දැනුම් දී ඇත.

ක්‍රිකට් ආයතනයේ මූල්‍ය පරිපාලනය අවිධිමත්වීම හේතුවෙන් ගැටලු රැසක් නිර්මාණය වී ඇති බවද සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා මෙහිදී පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2017 සහ 2018 මූල්‍ය වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාව සහ එහි වර්තමාන කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පෙරේදා (11) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත කැඳවා තිබුණි. එහෙත් එම දැනුම්දීමට අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් රැස්වීමට සහභාගි වුවද නිසි පරිදි සූදානම් වී නොමැති හෙයින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම (කෝප් කමිටු රැස්වීම) අතරමඟ අත්හිටුවීමට පියවර ගත් එම කාරක සභාව නැවත මාසයක් ඇතුළත කරුණු විමසීමට සූදානම්ව පැමිණෙන ලෙස එම ආයතනයට දැනුම් දුන්නේය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය පරිපාලනය අවධිමත්වීම හේතුවෙන් ගැටලු රැසක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය වී ඇතැයි කාරක සභාවේ සභාපති මාහාචාර්ය චරිත හේරත් මහතා මෙහිදී පැවසීය. ශ්‍රී ලංකා ක්‍රිකට් සම්බන්ධව ජනතා අප්‍රසාදය ඉහළ ගොස් ඇති බවත් එය එක් පාර්ශ්වයකට පමණක් හිමි දෙයක් නොව රටට අයත් දෙයක් බවත් හෙතෙම අවධාරණය කළේය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය පරිපාලනය අවධිමත්වීම හේතුවෙන් ගැටලු රැසක් නිර්මාණය වී ඇති බව නිරීෂණය වී ඇතැයි කාරක සභාවේ සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා මෙහිදී කීය. මේ ආයතනය සම්බන්ධයෙන් ජනතා සාදය ඉහළ ගොස් ඇති බවත් එය එක් පාර්ශ්වයකට පමණක් හිමි දෙයක් නොව රටට අයත් දෙයක් බවත් හෙතෙම අවධාරණය කළේය. 2017 වසර වන විට



රුපියල් මිලියන 240කට අධික මුදලක නොනිමි වැඩවලට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් ,වැඩභාර ගැනීමේ ලිපි සහ වැඩ ආරම්භ කිරීම හා අවසන් කළ යුතු දිනයන් යනාදී සම්බන්ධිත ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභා සාමාජිකයෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට දෝෂාරෝපණය කළහ. කාරක සභා රැස්වීමේදී හෝ එම ලිපි ගොනු නිවැරදිව ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අපොහොසත් විය.

2020 වසර වන විට එලෙස විගණනයට ඉදිරිපත් නොකර තිබූ නොනිමි වැඩවලට අදාළ ව්‍යාපෘතිවල වටිනාකම රුපියල් මිලියන 511ක් දක්වා ඉහළයාම සම්බන්ධවද කාරක සභාවේ විශේෂ අවධානයක් යොමුවිය.

2018 වසරේදී දකුණු අප්‍රිකා ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරයට අදාළව අනුග්‍රාහක අයිතිය වෙනුවෙන් ලැබිය යුතු ආදායම වූ රුපියල් මිලියන 29ක මුදල මෙතෙක් අයකර නොගැනීම සම්බන්ධව කාරක සභාව ප්‍රශ්න කළ අතර, ඊට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් මේ වන විට ආරම්භ වී ඇති බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ෂම්මි සිල්වා මහතා කාරක සභාවට දැන්වීය.

මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව මසක් ඇතුළත කාරක සභාවට ලබාදෙන ලෙස සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන් මහතාට දැනුම් දුන්නේය.

එම මුදල ඩයමන් චැනල් නම් අමෙරිකානු ජාතිකයකුගේ ගිණුමකට ඇතුළත්ව ඇති බවත්,එය සිදුවූයේ කෙසේද යන්න පිළිබඳව විමර්ශනවලදී අවධානය යොමුව ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.චන්දික හතුරුසිංහ මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රධාන පුහුණුකරු ලෙස බඳවා ගැනීමට අදාළ ගිවිසුම දෝෂ සහිත බව පෙන්වා දුන් කාරක සභාව ඒ හේතුවෙන් හතුරුසිංහ මහතා මේ වන විට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බවද පැවසීය.

හතුරුසිංහ මහතාගේ කොන්ත්‍රාත් කාලය වසර 03 ක් වුවද නියමිත කාලයට පෙර ඔහු ඉවත් කිරීමට සිදු වූයේ බලාපොරොත්තු වූ වෙනස ඔහුගෙන් සිදු නොවීම හේතුවෙන් බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කාරක සභාවට දැනුම් දුන්නේය.

චන්දික හතුරුසිංහ මහතා පවරා ඇති නඩුවට අදාළ නඩු ගාස්තු ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ වන විට රුපියල් මිලියන 20ක් වියදම් කර ඇති බවද කාරක සභාවේදී අනාවරණය විය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික වාර්තා වසර කීපයකම සිට පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන්ද කාරක සභාවේ විශේෂ අවධානයක් යොමුවිය. වහාම එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කරන ලෙස කාරක සභාව අමාත්‍යාංශ ලේකම්වරයාට දැනුම් දුන්නේය.

# නිවී ගිය සබේ විදුලි විලක්කුව

**(දිවි රඟමඩලෙන් සමුගත් ප්‍රවීණ රංගනවේදියකු වූ ජයලාල් රෝහණයන්ගේ අභාවය වෙනුවෙනි)**

මෙයට දශක හතරකට පමණ පෙර 1983 වසරේදී මම, එච්.ඒ. පෙරේරා, පරාක්‍රම නිරිඇල්ල, සහ වසන්ත විට්ටච්චි සමඟ කොළඹ ශ්‍රී ලංකා සෝවියට් මිත්‍රත්ව මන්දිරයේදී නාට්‍යකරණයේ යෙදීමට කැමති සහ නාට්‍යකරණයේ යෙදෙන තරුණ තරුණියන්ට සති දෙකක වැඩමුළුවක් ආරම්භ කර සෑම වසරකම පැවැත්වීමු. එහි ආරම්භක වසරේ වැඩමුළුවට පැමිණි තරුණ පිරිස අතර, තරමක මැර පෙනුමක් තිබුණු දඩබ්බර තරුණයෙක් විය. ඔහුගේ කතා විලාශය වචනවලින් පහරදෙන සේ දරුණුය. හැඩි දැඩි අඟපසඟ සොලවමින් කිසිවකුට දෙවැනි නොවන අයුරින් හැසිරුණු මේ තරුණයා හික්මවා ගත යුතුයැයි මම සිතුවෙමි.

වැඩමුළුවට විශාල බෑග් එකක් රැගෙන වේලාවටම එන, උපදේශකවරුන්ගෙන් හරි හරියට ප්‍රශ්න අහන මේ තරුණයා සියලු දෙනාගේම ළබැඳි මිතුරෙක් විය. එදා තරුණකමෙන් පිරිපුන් උදේනි අල්විස්, මාලි ජයවීර, චන්න පෙරේරා, අජිත් ලොකුගේ, සමරසිරි කඳනගේ, සුදත් මහදිවුල්වැව, නිල්මිණි බුවනෙක, අසෝක හඳගම, මැල්කම් මචාඩෝ, අනෝමා ජිනාදරි, තුසිත ජයවර්ධන සහ සුරේෂ් අබේසේකර ඇතුළු තරුණ තරුණියන් රැසක් අතර ජයලාල් රෝහණ අමුතු තරුණයෙක් විය.

දැඩි මතයක සිටි ජයලාල් නාට්‍ය කලාව සමඟ ක්‍රමයෙන් පෙමෙන් බැඳෙනවිට සුන්දර පෙම්වතෙකු මෙන් මොළොක් සිතක් ඇත්තෙක් විය.මිතුරන්ගේ විපතකදී ඉක්මණින්ම සංවේදී වෙන ජයලාල් ඒ වෙනුවෙන් කළ හැකි කළ යුතු දෙයක් ඉටු කරන්න දෙවරක් සිතුවේ නැත. ඔහුගේ කරේ තිබුණ ලොකු බෑගයේ සරමක්, කොට කලිසමක්, සබන් කැල්ලක්, දත් බුරුසුවක්, ටූත් පේස්ට්, මෙන්ම විවිධ විෂයන්ට අදාළ පොත්පත් ද, කවදා හෝ අවශ්‍යවේයැයි සිතෙන ඉවත දැමූ උපකරණ කොටස් ද, ඒ තුළ විය. ඔහුට ඉතා දයාබර වූ ආදරණීය මෑණියන් ඔහුගේ පරමාදර්ශී චරිතය විය. එසේ වුවත්, ඔහුගේ බෑගයේ තිබූ අඩුම කුඩුම භාවිතා කරමින් දින කීපයක් හිතෙන ඕනෑම තැනක නැවතීමට තිබුණු හැකියාව නිසාම බලි තොවිල්, ශාන්ති කර්ම, දහඅට සන්නි වැනි ගැමි රංගනයක් තිබුණු ඇත එපිට ගමක නැවැති එම ශිල්පීන් සමඟ ගැටෙමින් ඒ පිළිබඳ සොයාබලා තම දැනුම වඩා ගන්නට ඔහුට හැකි විය. ඒ නිසාම ඔහු ඒ පිළිබඳ දැනුමෙන් පෝෂිත අයෙක් විය.

වේදිකා නාට්‍ය කලාවට පිවිසි ඔහු ඒ තුළ ද ගවේෂකයෙක් විය. මා එය හොඳින් අත්වින්දේ වැඩමුළුවෙන් අනතුරුව මම නිර්මාණය කළ හිට්ලර් නාට්‍යයේ වේදිකා කළමනාකරු ලෙස ඔහුව පත් කර ගැනීම නිසාය.

යකඩ බට, බෝල්ට් ඇණ, ටකරන් තහඩු, ඇතුළත් සංකීර්ණ වේදිකා පසුතල සහිත එම නාට්‍යයේ ජර්මන් සොල්දාදුවාගේ කුරිරු චරිතය නිරූපණය කරන අතරම වේදිකා කළමනාකරු වශයෙන් ඔහු කළ කාර්යභාරය අන් නළු නිළියන්ට පවා ආදර්ශවත් විය.

එකල ජයලාල් අසාධාරණය ඉදිරියේ අසාමාන්‍ය ලෙස කිපුණත්, ඔහු තම රංගන දිවිය රංගන ශිල්පියකුට අවශ්‍ය විනය,සංයමය, අධ්‍යයනය, කැපවීම මැනවින් තිබුණු අයෙකි. ඔහු වායු සමනය කළ රංග ශාලාවක වේදිකාවේ ලෑලි පලසට පමණක් නොව දුවිලි පිරුණු වීදියට ද ඇලුම් කළේය.

සෝවියට් මිත්‍රත්ව වැඩමුළු පවත්වන අතරතුර ශ්‍රී ලංකා සෝවියට් මිත්‍ර සංගමය මගින් කොළඹ මහජන පුස්තකාලයේ පවත්වන ලෝක සාමය වෙනුවෙන් සමුළුවට කෙටි නාට්‍යයක් ලබාදෙන ලෙස ලේකම් නීතිඥ පීටර් ජයසේකර මහතා මාගෙන් කළ ඉල්ලීම වෙනුවෙන් 'ටියුෂන් යුද්ධය' නමින් කෙටි නාට්‍යයක් නිර්මාණය කළෙමි. එයින් කියවුණේ ඉංග්‍රිසි ටියුෂන් පන්ති ප්‍රචාරය කර ළමයි ගෙන්වා ගැනීමට ගුරුන් දෙන්නෙකු තම සිසුන් යොදවා ගැනීමට කරන අරගලයයි. ජයලාල් සර්ගේ චරිතයත්, ප්‍රසාද් සූරියආරච්චි ප්‍රසාද් සර්ගේ චරිතයත් ඉතා කෙටි පුහුණුවකින් පසු ප්‍රදර්ශනය කර ආරාධිතයන්ගේ විශේෂ අවධානය දිනා ගැනීමට හැකි විය.

එකල නව හැවිරිදි කුඩා බර්නි (ජගත් බෙනරගම) ඔසවා මේසයක් උඩට විසි කර මරන්නට මැෂින් තුවක්කුව එල්ල කරමින් හිට්ලර් නාට්‍යයේ ජර්මන් සොල්දාදුවා කරන ලද සුවිශේෂී රංගනය නිසාම ඔහු විශේෂ ඇගයීමකටද ලක්වුණි. කුඩා ජගත් බෙනරගම සමඟ ශිලක්බි නාට්‍යයේ රඟපෑම ද සිහිපත් කළ යුතුය.

ජයලාල් රෝහණ දැනුම ලබාගත් ක්‍රමය මේයැයි මට කිව නොහැකිය. ඔහු විසින් 1997 දි ලියන ලද "සබේ විදුලි විලක්කුව" නැමැති පොතේ පෙරවදනේ මෙසේ සඳහන් කර ඇත.

'අවුරුදු දහයක් පමණ කාලයක් ලුම්බිණියේත් විවිධ නාට්‍ය ශාලාවලත් රංගාලෝක ශිල්පීන් සමඟ මම ඇසුරු කළෙමි. විෂයෙහි පැන නඟින ගැටලුවලට ඔවුන් දෙන පිළිතුරු සහ න්‍යාය කොතරම් දුරට සම වේද? නොවේද? යන්න විමසුවෙමි. මේ කාලයේ රංගාලෝක ශිල්පය පිළිබඳව ඉංග්‍රිසියෙන් පළ වී ඇති පොත් පත් කියවිමි.'

එමෙන්ම ඔහු බම්බලපිටියේ පදික වේදිකාවේ පොත් වෙළෙන්දෙකු ළඟ තිබුණු නිල් ප්‍රේසර් නැමැති ලේඛකයා රංගාලෝකය ගැන ලියූ වටිනා ඉංග්‍රිසි පොතක් මිලදී ගැනීමට මුදල් අඩු වූ නිසා ලින්ටන් සේමගේ නැමැති රංගන ශිල්පියා සමඟ තරගයට එකිනෙකා ළඟට ගොස් මුදල් එකතු කරගෙන රු. 350 කට එම පොත මිලදී ගත් ආකාරයද එම පෙරවදනෙන් සඳහන්ව ඇත.

"සබේ විදුලි විලක්කුව" ලියන්න 1990 පමණ පටන්ගෙන තොරතුරු සොයමින් අවසානයේ 1997 ලියා පළ කරන ලද අතර, එම විෂය පිළිබඳ එතෙක් සිංහල භාෂාවේ ලියවුණු එකම පොත එය විය. එමෙන්ම සයිමන් නවගත්තේගම ප්‍රවීණ නාට්‍යවේදියා සමඟ කොළඹ වතුවල ජන සන්නිවේදන ව්‍යාපෘතියේ සේවය කර ලබාගත් අත්දැකීම් ද ඔහුගේ ජීවිතයට බලපෑ බව ඔහු 1999 වසරේ ලියන ලද 'සැබෑ මුහුණේ වෙස් මුහුණු' කෘතියේ පෙරවදනේ සඳහන් කර ඇත. එමෙන්ම ඔහුගේ නාට්‍ය කණ්ඩායම "දිරිය කැදැල්ල" නමින් හඳුන්වා ගත් ජයලාල් රෝහණ, එහි අරමුණ ලෙස දක්වන්නේ "බඩගෝස්තර වාදීන්ගේ කලාව විවේචනය කිරීම සහ එවන් පුද්ගලයන්ගේ දුර්මත ජනතාව අතරට යෑම වැළැක්වීමයි. නැතහොත් තර්ක ඥානයෙන් විභාග කර සදොස් තැන් නිදොස් කිරීමයි" යනුවෙන් දක්වා ඇත.

ඔහු විසින් අංග රචනය සඳහා ලියන ලද අත්පොත සැබවින්ම පරිපූර්ණ කෘතියකි. එමෙන්ම "සවේශයට ප්‍රවේශයක්" කෘතිය වෙස් මෝස්තර රචනය පිළිබඳ අත්පොත මෙහිලා සඳහන් කළ යුතුය.

ජයලාල් රෝහණ රචනා කර නිෂ්පාදනය කර, රංගාභූමි නිර්මාණ කර, අංග රචනා කර, රංගලෝක නිර්මාණය කර, රංගනයෙන් ද දායක වුණ 1997 නිර්මාණය කළ ලෝකා නාට්‍යය යෞවන සම්මාන උලෙළේ වේදිකාගත කරන අවස්ථාවේ සුගතපාලද සිල්වා මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර සමඟ මම ද විනිශ්චය මණ්ඩල සාමාජිකයෙක් වුණෙමි. එම සම්මාන උලෙළේ හොඳම නළුවා ලෙස ජයලාල් සම්මානය දිනාගත් අතර, එම සම්මාන උලෙළේ සෑම අංගයකින්ම සම්මාන දිනා ගැනීමට ඔහු සමත් විය.

වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයේ මඟ සලකුනු තිබූ සුභ සහ යස,පණ්ඩුකාභය, වර්ණ, සෙනෙහෙබර ඩොලි, වැනිසියේ වෙළෙන්දා, හිට්ලර්, විකලි සමයම, යක්ෂාගමනය, උත්තමාවි, ජූරිය, පාදඩයා, උක්දඩු හින්න, සොක්‍රටීස්, හෙණ බැක්බත්, හංකිති දහතුන ඇතුළු නාට්‍ය රැසකට රංගනයෙන් ද, වේදිකා කළමනාකරණයන් ද, අංග රචනාවලින්ද ජයලාල් දායක වන අතර, ඔහු ලැබූ සම්මාන ප්‍රමාණය ද රැසකි.

පසුකලක රූපවාහිනියේ, රඟපෑමටද එක්වුණ ජයලාල් ඉතා ජනප්‍රිය රංගන ශිල්පියෙකු ලෙස නමක් දිනාගැනීමට හේතුවූයේ "ඉසුරු යෝගය" ටෙලි නාට්‍යයේ රංගනයට ප්‍රේක්ෂකයන් වඩ වඩා ආකර්ෂණය වූ බැවිනි.



සිනමා රංගනයෙන් ද තම දක්ෂතා ප්‍රකට කළ ජයලාල් නාට්‍ය හා රංගකලා දේශකයකු ලෙස ඉමහත් ප්‍රසිද්ධියක් දිනාගෙන සිටින අතර, ස්වාධීන රූපවාහිනියේ දොරමඬලාව විද්වත් කතිකාවේ කැපී පෙනෙන විද්වතෙක් ද විය. ජයලාල් රෝහණ 56 වැනි වියේදී සමුගැනීම කනගාටුවකි. ඔහුගේ සමුගැනීම තව වසර කීයකට ප්‍රමාද වූයේ නම් නාට්‍ය හා රංගකලා විෂයෙන් ප්‍රමාණික විද්වතෙකු ලෙස ඔහු රැස්කරගත් දැනුම නිර්ලෝභීව බෙදා දෙන බව මම දනිමි.

ජයලාල් රෝහණ හිතවතාණෙනි, අපි සියලු දෙනාම මැරෙන බව ස්ථිරය. එහෙත් ජනතාවගේ හද බැඳගත් නළුවකු මැරීම අපහසුය. මන්ද ජනතා හදවත්වල ඔහු ජීවත්වන බැවිනි.

ඒ නිසා ඔබට සමුදිය නොහැකි බැවින් මම නිවන් සුව පතමි.

**නීතීඥ ඩග්ලස් සිරිවර්ධන**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ටවර්හෝල් රඟහල පදනම**

## සොයුරු රෝහණ අපෙන් සමුගෙන ගියේ හඬවා සැමදෙනා

පිනෙන් හැට හතරේදි නවසිය ලොව දකින්නට බලය ලැබුණා
දිනෙන් දින මල් ළමා ලොව ඔබ එළිය කරමින් ජවය වැඩුණා
ගලෙන් ගල පැන ලඳු කැලෑ තුළ කෙළිදෙලෙන් කාලයත් ගෙවුණා
හලෙන් සිප් ආනන්දයෙන් ඔබ කෝට්ටෙන් නැණ දියෙන් තෙමුණා

පසුව පේරාදෙණියෙ විදුබිම දැනුම වැඩුමට බලය වී
විසුව ඔබහට මහා වියතුන් සමඟ උරෙනුර ගැටී මුසු වී
ඇසුව විමසුව දෙයින් දින දින දුර දකින්නට පහසු වී
නැසුව මනසින් අඳුරු සෙවණැලි පෙරට පා තැබූ පුබුදු වී

කලක් කැලණියෙ සොඳුරු සරසවි බිමේ රංගන මග වඩා
තුරක් සේ නුග සෙවණ දුන් සිසුවනට මෙහි සිටි ලොකු කුඩා
හුගක් වෙහෙසිව වැඩ කළෙන් ඔබ නොබලමින් ජීවන විඩා
දිනක් එළඹුණි දෝ සිතේ මිය යන්න දිවිතුරු අතු කඩා

රංග නර්තන නිරූපණ වෙස් මග වැඩූ උරුමය තුළින්
අංග රචනය නැවුම් ලෙස කළ ප්‍රහසනය වඩවා මුලින්
බ්‍රිංග නද පරදවන හඬ ඔබෙ ගැඹුරු බව ජනිතවූ පෙළින්
තුංග තරිකිට නාද බෙරයට පා තැබූ වේ ඔබ කෙළින්

ඉසුරුයෝගය තුළින් මතුකළ රංග ප්‍රතිභාවට මනා
පඩුරු පුද ලැබූ හොඳම නළු වී සුමති සම්මානය දිනා
කවුරු මොනවා කෙසේ කීවද බලය හැකියාවෙන් ගෙනා
සොයුරු රෝහණ අපෙන් සමුගෙන ගියේ හඬවා සැමදෙනා

**- කලාභූෂණ කිවිපති කවිධජ**
**ඩබ්ලිව් කේ සරත් විමලසිරි**

# තිරය වැහෙන්නත් පෙර දිවිරැඟුම නිමා කළ ජයලාල්

(දිවි රඟමඩලෙන් සමුගත් ප්‍රවීණ රංගනවේදියකු වූ ජයලාල් රෝහණයන්ගේ අභාවය වෙනුවෙනි)

ජයලාල් රෝහණ ගැන මා මුලින්ම දැන ගන්නේ අප උසස් පෙළ හදාරන අනුව දශකයේ අග භාගයේදීය.එකල ජයලාල් රෝහණ මහතා ගම්පහ නාට්‍ය රංගකලාව පිළිබඳ උපකාරක පන්ති මාලාවක් කළේය.ඒ පන්තිවලදී ඔහු නාට්‍යකරණය විෂය මාලාව පමණක් උගන්වා හවසට ගෙදර ගියේ නැත.පන්තියේ සිසුන්ට මනුස්සකම ගැන කියා දුන්නේය.ප්‍රගතිශීලී දේශපාලන අදහස් රෝපණය කළේය.ඔහු මේ සියල්ල කළේ නාට්‍යානුසාරයෙනි.එ නිසා ගම්පහ සිසුන් අතර ජයලාල් ජනප්‍රිය ගුරුවරයකි.ඔහුගෙන් ඉගෙනගෙන අද නාට්‍ය අංශයෙන් ඉහළටම ගිය අය බොහෝය.ජයලාල් සරල පැවතුම් ඇති නිහතමානි මිනිසෙකි.ඒ නිසා ඔහුගේ මිතුරන් ඉහළ පැලැන්තියේ සිට නගරයේ පදික වේදිකාව ත්‍රිරෝද ගාල දක්වා සිටියේය.කොළඹ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශය ජයලාල්ගේ උපන් ගම විය. එහෙත් ජයලාල් රෝහණ දශක ගණනාවක සිට තම ගම්පියස කර ගත්තේ සියනෑ කෝරලයේ ගණේමුල්ල කොස්සින්න ප්‍රදේශයයි.ඔහුට ගණේමුල්ල ,ගම්පහ ප්‍රදේශ සමඟ තිබුණේ වෙන්කළ නොහැකි තරමේ සබඳතාවකි.ජයලාල් රෝහණ මහතා නිතර තම නාට්‍ය කටයුතු සහ රාජකාරි වැඩ සඳහා කොළඹට ගියේ දුම්රියෙනි.දුම්රිය මැදිරියේ සිටි බොහෝ දෙනා ඔහුගේ හිතවතුන් හා මිතුරන්ය.නාට්‍ය ගැන දේශපාලනය ගැන හරබර රසබර සංවාද ගොඩනැගෙන්නේ එතැනදීය.නිල් කොළ රතු හිතවතුන් මැද ඔහු තමන්ගේ ස්වාධීන මතය ගෙන හැර දැක්වීමට පසුබට වන්නේ නැත. ඔහු සතුව මෝටර් රථයක් තිබියදී ජයලාල් ගමන් බිමන් සඳහා තෝරාගත් ජනප්‍රියම මාදිලිය වූයේ රේල්ලුවයි. ඇයි මෙච්චර කෝච්චියේ යන්න කැමැති. අපි ඔහුගෙන් විමසුවෙමු.මෙතැන තමා නාට්‍යකට ගැළපෙන හොඳම වස්තු බීජ තියෙන්නේ.කාර් එකේ ගියානම් මම තනි වෙනවා. අනෙක් අයගේ අදහස් මොනවද? දුක සැප මොකක්ද කියා තේරෙන්නෙ නෑ. ජයලාල්ට තිබුණේ මේ ආකාරයේ විකල්ප අදහස්‍ය. 1964 වසරේ නොවැම්බරයේ ඉපිද කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් ඉගෙනුම ලබන ඔහු උසස් අධ්‍යාපනය ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙනි.ඒ වන විටත් කලාවට හිත ගොස් තිබූ ඔහුට ගාමිණි හත්තොට්ටුවේගම,ඇෂ්ලි හල්පේ ප්‍රවීණයන්ගේ මඟ පෙන්වීම ලැබෙයි. එහෙත් ඔහුගේ පළමු වේදිකා නාට්‍ය අත්දැකීම "මුහුදු ගියා" වේදිකා නාට්‍යයයි. ඒ නාට්‍ය එවකට සම්මානලාභී නාට්‍යයකි. ජයලාල් රෝහණ ගැන සමාජයේ ප්‍රසිද්ධව ඇත්තේ ජනප්‍රිය වේදිකා සහ ටෙලි නාට්‍ය නළුවකු ලෙසිනි.එහෙත් ඔහු දක්ෂ ග්‍රන්ථ කර්තෘවරයෙකි.1997 දී "සබේ විදුලි විලක්කුව"නාට්‍ය විෂයානුබද්ධ පොත රචනා කළ අතර "වෙස් මුහුණේ සැබෑ මුහුණ" ද ඔහුගේ තවත් පොතකි. ජයලාල් රෝහණ මහතා අතිදක්ෂ වේශ නිරූපණ ශිල්පියකු ලෙසද ප්‍රකටය.ඔහු අධ්‍යක්ෂණය කළ නාට්‍ය රැසකි.ඔහු දායකත්වය දුන් වේදිකා නාට්‍ය රැස අතරෙන් මෑත කාලයේ ජනාදරයට පත් නාට්‍ය අතර "ගොන්ඩෝලා"," හංකිති දහතුන" නාට්‍ය රසික හදවතේ රැඳී පවතී. එයට අමතරව හරවත් රසවත් වේදිකා නාට්‍ය රැසකට ඔහු දායකත්වය ලබා දී තිබේ.ඇත්තෙන්ම ජයලාල් රෝහණ නමැති අතිදක්ෂ රංගවේදියා ගොඩනැගෙන්නේ වේදිකාවෙනි. ඔහුට ටෙලි නාට්‍යයේ සහ සිනමාවේ මේ තරම් ඉහළ දස්කම් පෙන්වීමට පුළුවන්කම ලැබුණේ වේදිකාවෙන් ලැබුණු පන්නරය නිසාය.එමෙන්ම ඔහු දේශපාලන මතයක් ඇති දැනුම්වත් මිනිසකුවීම ඔහුගේ නළු ජීවිතයට ලොකු ගැම්මක් එක් කළේය. ජයලාල් ටෙලි නාට්‍ය අතර ජනප්‍රියත්වයේ මුදුනටම පැමිණියේ "ඉසුරු යෝගය" ටෙලි නාට්‍යයේ "මුතුමිණ"චරිතයෙනි.අද පවා බොහෝ අය ඔහුට ආදරයට කීවේ

"මුතුමිණ" ලෙසය. සඳගලතැන්නේ ග්‍රාමසේවක මහතාගේ චරිතයද රසික සිත් බැඳ ගත්තේය.මෑත යුගයේ "බොරලු පාර"ටෙලියද රසික විචාරක දෙපාර්ශ්වයේම ප්‍රසාදයට පත්වූවකි. නළුවකු අධ්‍යක්ෂවරයකු වේෂ නිරූපණ ශිල්පියකු ලෙස පමණක් නොව විශ්වවිද්‍යාල ආරාධිත කතිකාචාර්යවරකු ලෙස ඔහු කළ මෙහෙයද සුවිශාලය. වාම් ඉවුරේ කලාකරුවකු ලෙස සැමදා කටයුතු කළ ජයලාල් තම නිර්මාණ ,දේශන ,ලේඛන මෙන්ම සමාජයේදීද ඒ වෙනුවෙන් පෙනී සිටි අතර සෙසු මතවාද සහ අදහස්ද සම සිතින් ඉවසා ගරු කළේය. මේ සැම කරුණිම ගෙන බලද්දී ජයලාල් රෝහණ කලාවෙන් නික්ම ගිය කාලය ඉක්මන් වැඩිය.වයස අවුරුදු පනස් හයක් වූ ජයලාල්ට කලාව වෙනුවෙන් තව දශකයක් දෙකක් වැඩ කිරීමට හැකියාව සහ ශක්තිය තිබුණි.එහෙත් දෛවය ඔහුට හරස් වූයේ නොසිතූ ලෙසිනි.ඇත්තෙන්ම ජයලාල් රෝහණ මහතා ජීවිතයෙන් සමුගත්තේ ජයලාල් රෝහණලා දහස් ගණනින් අවැසි කාලයකදීය.

**උදිත ගුණවර්ධන**

සෙනවිරත්න කහටපිටිය - බොරලැස්ගමුව සමූහ

## බොරලැස්ගමුවේ ගණිකා නිවාසයක් වටලයි

ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන මුවාවෙන් වසර ගණනාවක් තිස්සේ බොරලැස්ගමුව නගර සීමාවේ ගොඩනැගිල්ලක රහසිගතව පවත්වාගන යනු ලැබූ ගණිකා නිවාසයක් ඉකුත් 8 වන දින රාත්‍රියේ නුගේගොඩ කොට්ඨාස දූෂණ මර්ධන අංශය මගින් වටලා එහි කළමනාකරු සහ ගණිකා වෘත්තියට පැමිණ සිටි කාන්තාවන් 4 දෙනකු අත්අඩංගුවට ගෙන ඇතැයි පොලීසිය පැවසීය.

මෙහි අන්තර් ජාල මාර්ගයෙන් ඇනවුම් ලබාගන රුපියල් 5000 සිට 15000 වැනි ඉහළ මිල ගණන්වලට කාන්තාවන් අලෙවිකර ඇති අතර , මෙම පහස ලබා ගැනීම සඳහා ප්‍රධාන පෙලේ ව්‍යාපාරිකයන් .ඇතුළු ප්‍රභූ පිරිස් ද පැමිණ ඇති බවටත් පොලිස් උපාය දූතයකු යොදවා සිදුකළ මූලික විමර්ශන වලදි අනාවරණයවී ඇතැයිද පොලීසිය කියයි.

අත් අඩංගුවට පත් කාන්තාවන් කොළඹ ප්‍රදේශයේ ඉහළ පෙලේ රැකියා කරනබව පවසමින් පැමිණ විශාල මුදල් නිවාස වලට යවා ඇති අතර , ජා ඇළ, ඇල්පිටිය , තිස්ස මහාරාමය , බුලත් කොහුපිටිය , යන ප්‍රදේශවල පදිංචි වයස 25 ත් 35 ත් අතර පසුවන අයද වන බවත් පොලීසිය කියයි .

වැඩිදුර පරීක්ෂණ කටයුතු නුගේගොඩ කොට්ඨාසභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නුවන් අසංක මහතාගේ අධීක්ෂණයෙන් කොට්ඨාස දූෂණ මර්ධන ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කහටදෙනිය මහතාගේ උපදෙස්මත පොලිස් සැරයන් 41127 රුවන් , 54478 වසන්ත , පොලිස් කොස්තාපල්වරුන් වන 74980 වෙනුක , 85163 හේරත් , කාන්තා පොලිස් කොස්තාපල් 10200 ගයනී යන නිලධාරීන් විසින් සිදුකරගන යනු ලබයි .

එස්.පී.උබේපාල - කැබිතිගොල්ලෑව සමූහ.

## උතුරුමැද රෝහල් රැසක සේවක පුරප්පාඩු

උතුරු මැද පළාතේ මැදවච්චිය කැබිතිගොල්ලෑව පදවිය ඇතුළු මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සහ රෝහල් රැසක පවතින සේවක පුරප්පාඩු හේතුවෙන් දෛනික රාජකාරි කටයුතු සඳහා බාධා ඇති වී ඇති බව සෞඛ්‍ය කාර්යය මණ්ඩල නිලධාරීහු පවසති.

ඒ අනුව මැදවච්චිය ප්‍රාදේශීය රෝහලේ කණිෂ්ඨ සේවකයන් 27 දෙනෙකු පුරප්පාඩුව පවතින බව රෝහලේ සේවකයකු අප කළ විමසීමේදී පැවසීය.

මැදවච්චිය රෝහලේ කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් දෛනිකව දින 03 පමණ අඛණ්ඩ සේවා මුර වල දිවා රාත්‍රි යෙදිමින් සේවාවක් මේ වන විට සිදු කරමින් සිටින බව සෞඛ්‍ය නිලධාරීහු වැඩි දුරටත් පැවසූහ.

මේ පිළිබඳව සොයා බලා සේවා අවශ්‍යතාවයන් අනුව කාර්යය මණ්ඩල ලබා දීමට කටයුතු කර දෙන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

එන්.පී.රාජදොරේ - රත්නපුර විශේෂ

## මත්කුඩු ග්‍රෑම් 2ක් සමඟ කතක් අල්ලයි

නීති විරෝධි ලෙස කංසා ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් පෙර වැරදි තිබූ කාන්තාවක් මත්කුඩු ග්‍රෑම් 2ක් සමග රත්නපුර අංගම්මන ප්‍රදේශයේදී පසුගියදා අත් අඩංගුවට ගත්බව රත්නපුර මූලස්ථාන පොලීසිය පවසයි.

අත් අඩංගුවට ගත් කාන්තාව තිදරු මවකි. ඇගේ සැමියා පොලීසිය මගින් දින 14කට පෙර මත් කුඩු සමග අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

රත්නපුර මුලස්ථාන පොලිස් පරීක්‍ෂක රොහාන් ඕලුගල මහතාගේ උපදෙස් මත රත්නපුර පොලීසියේ වැටලීම් අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්‍ෂක රංගන රණසිංහ, උප පොලිස් පරීක්‍ෂක තිලකරත්න, සැරයන් වරුන් වන 2270නිශාන්ත, 42681 සුමනසිරි, 87319තරිපවන්, 7861පෙරේරා, කොස්තාපල්වරුන්වන 89843 කරුණාරත්න කාන්තා කොස්ථාපල් 5809 ශිරෝමි මාලා යන නිලධාරීන් සැක කාරිය අත්අඩංගුවට ගැනීමට සහභාගිවී ඇත.

සමේලා රාජපක්ෂ - වතුරගම

## අන්තර්ජාතික පර්යේෂණ සැසියක් ශ්‍රී පාලි මණ්ඩපයේදී

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ දෙවැනි වරටත් සංවිධාන කරනු ලබන අන්තර්ජාතික පර්යේෂණ සැසිය මේ මස 19 වැනි දින උදෑසන 9.00 සිට සවස 6.00 දක්වා පැවැත්වීමට නියමිතය.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් මෙය මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීම ද විශේෂත්වයකි. මේ පර්යේෂණ සැසිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අතර එහි තේමාව " ඩිජිටල් සන්දර්භය තුළ ජාතික සංවර්ධනය සඳහා කලාත්මක හා මාධ්‍ය වටිනාකම්" Artistic and Media Values for National Development in Digital Contexts& යන්නයි. මෙහිදී උපශීර්ෂ 10ක් යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයන් රචනා කරන ලද පර්යේෂණ පත්‍රිකා අතරින්, තෝරාගත් පර්යේෂණ පත්‍රිකා 40ක් එදිනට ඉදිරිපත් කිරීමට නියමිතය.

මේ පර්යේෂණ සැසියේ මුලසුන හොබවන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ, ශ්‍රී පාලි මණ්ඩපයේ, ප්‍රසංග කලා අධ්‍යයන අංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය කුමුදුනි මද්දුමාගේ මහත්මිය විසිනි.

# දසත — දස අත ම එක තැන



## නල්ලූර් කෝවිලට පිවිසෙන මාර්ගයේ ඉදිකළ තොරණ විවෘත කරයි

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ

රුපියල් කෝටි හතරහමාරක වියදමකින් නල්ලූර් කෝවිලට පිවිසෙන චෙම්මනි මාර්ගයේ ඉදි කළ අලංකාර තොරණ 10 දා උත්සව ශ්‍රීයෙන් යුතුව විවෘත කෙරුණි.

මේ පිවිසුම් තොරණ සඳහා වියදම් වූ මුළු මුදලත් විවෘත කිරීම සඳහාත් පූජාවන් සඳහාත් වැය වූ සම්පූර්ණ මුදලම දරා ඇත්තේ නල්ලූර් කෝවිලේ දායක සභාවේ සාමාජික සාමාජිකාවෝය.

අභිනව තොරණ විවෘත කිරීමේ අවස්ථාවට හින්දු පූජකවරු යාපනයේ දේශපාලනඥයෝ හා රාජ්‍ය නිලධාරීහු රැසක් සහභාගී වී සිටියහ.



පුත්තලම සමූහ

## වන්දනාවේ ගිය කතුන් දෙදෙනකු මුලාකර රන් අභරණ පැහැරගත් සැකකරු අත්අඩංගුවට

අනුරාධපුරයේ වන්දනාවේ ගිය කාන්තාවන් දෙදෙනකු රවටා මුලාකර ඔවුන් පැළඳ තිබූ රන්අභරණ සහ අතතිබූ ජංගම දුරකථනයක්ද සොරකම් කරගෙන ගොස් ඇති අයකු පුත්තලම පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

සාලියවැවදී මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇත්තේ කාන්තාවන්ගෙන් සොරකම් කරගෙන ගොස් තිබූ ජංගම දුරකථනයක්ද සමගය.

සාලියවැව පදිංචි කාරියන්වන කාන්තාවන් දෙදෙනෙක් පූජනීය වන්දනා ස්ථාන වැඳ පුදාගැනීම සඳහා අනුරාධපුරයට ගොස් ඇත.

එහිදී මුනගැසුන නාඳුනන පිරිමි අයෙක් මෙම කාන්තාවන් දෙදෙනාගේ වන්දනාමාන කටයුතුවලදී ඔවුන්ට සහාය දෙමින් මිතුරුවී ඇත. තුන්දෙනාම සුහද මිතුරන්මෙන් වන්දනාමාන සිදුකර එකට එක්ව දිවා ආහාර ගැනීමද සිදුකර ඇත.

එම අවස්ථාවේ එක් කාන්තාවක් තමා ගෙන ආ දිවා ආහාර පාර්සලය මෙම මිතුරාට දී ඇති අතර, මිතුරාද තමන් සතුව තිබූ පැටිස් දෙකක් මිතුරු කාන්තාවන් දෙදෙනාට දී ඇත.

මෙසේ ආහාර ගෙන ස්වල්ප වේලාවකට පසුව කාන්තාවන් දෙදෙනාටම රෝගී තත්වයක් මතුවී වමනය යෑම සහ ක්ලාන්ත ගතියක් මතුවී ත්‍රීරෝද රථයක් කතා කරගත් මිතුරා කාන්තාවන් දෙදෙනාද සමග අනුරාධපුර බස් නැවතුම් පොළට පැමිණ, කාන්තාවන් දෙදෙනාද සමගම පුත්තලම හරහා කොළඹට ධාවනයවන බස් රථයකට ගොඩවී ඇත. බස් රථය ධාවනයවන අතර තුර කාන්තාවන් දෙදෙනාටම තදින් නින්ද ගොස් ඇත.

මේ අතර කාන්තාවන් දෙදෙනාට නින්ද ගොස් තිබියදී ඔවුන් සමග සිටි මිතුරාද අතරමගදී බස්රථයෙන් බැස ඇත.

සාලියවැව කිට්ටුවෙද්දි බස් කොන්දොස්තරවරයාගේද ශබ්දයෙන් අවදිවූ කාන්තාවන් දෙදෙනා සාලියවැවදී බස්රථයෙන් බැස ඇති අතර, තමන් පැළඳ තිබූ රන්අභරණ හා අතතිබූ ජංගම දුරකථනද අස්ථානගතවී ඇති බව දැනගෙන ඇත්තේ ඉන්පසුවය. මේ බව සඳහන් කරමින් සාලියවැව පොලිස් ස්ථානයට සහ පුත්තලම පොලිසියේ විශේෂ අපරාධ අංශයට පැමිණිලි කර ඇති අතර, වහා ක්‍රියාත්මක්වූ පොලිසිය පරීක්ෂණ අරඹා සැකකරු අත්අඩංගුවට ගෙන ඔහුගේ නිවෙසේ සඟවා තිබී එක් කාන්තාවකගේ ජංගම දුරකථනයක්ද සොයාගෙන ඇත. ඊට අමතරව නිකවැරටියේ රන්භාණ්ඩ අලෙවි සලකට විකුණා තිබූ රන් මාලයක්ද සොයාගෙන ඇති අතර , එම රන්මාලය එක් කාන්තාවකගෙන් ගලවාගෙන ඇති මාලයක් බවද හෙළිවී ඇත.

වැඩිදුර පරීක්ෂණ හා අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා සැකකරු සිද්ධියට අදාළ රන්මාලය හා ජංගම දුරකථනයද සමග සාලියවැව පොලිසියට භාරදී ඇත.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංවාරක

## යටවත්ත දිවිල්ල උප තැපැල් කාර්යාලය වැසීම නවතී

ග්‍රාමීය ජනතාවගේ විශේෂ අවශ්‍යතාවක් ලෙස පවත්වාගෙන ගිය යටවත්ත දිවිල්ල උප තැපල් කාර්යාලය තාවකාලිකව වසා දමා යටවත්ත කාර්යාලයට අනුයුක්ත කිරීමට පසුගියදා (08) ගෙන තිබූ තීරණය වෙනස් කරමින් ග්‍රාමීය ජනතාවගේ සුවපහසුව තකා ජනතා අවශ්‍යතාවක් ලෙසින් නැවත අවලංගු කර තබූ ස්ථානයේම පවත්වාගෙන යන ලෙස රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ උපදෙසින් දිවිල්ල උප තැපල් කාර්යාලය පවත්වාගෙන යන ලෙසට මාතලේ ප්‍රාදේශීය තැපල් අධිකාරිවරයාට ලිපියකින් දන්වා ඇති බව යටවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති එච්. ඩී. ලාල් අත්තනායක මහතා පැවැසීය.

මේ අනුව දිවිල්ල ග්‍රාමයේ වැඩිහිටි දිමනා, පිළිකා ආධාර ගොවි විශ්‍රාම වැටුප් මහජන ආධාර විදුලි බිල්පත් ඇතුළු විශාල ජනතා සේවයක් මේ කාර්යාලයෙන් සිදුවන බවත් වසා දැමුවහොත් වයෝවෘද්ධ බොහෝ පිරිසක් අපහසුතාවට පත්වන හෙයින් තිබූ තත්ත්වයෙන් ද පවත්වාගෙන යන ලෙස දන්වා ඇත. මේ උප තැපැල් කාර්යාලය වසා දමන බවට ලද තොරතුරු මත ගම්වාසීන් කාර්යාලය ඉදිරිපිට රැස්ව සිටි බවත් ඔවුන්ගේ එකම ඉල්ලීම වූයේ අසරණව ඉන්නා මේ අහිංසක මිනිසුන් කබලෙන් ලිපට ඇද දැමීමක් වගේ සිද්ධ වෙනවා යන්නයි.

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

## උණවටුනේ සංචාරක හෝටල්වල විදුලිය විසන්ධි කිරීමෙන් ව්‍යාපාරිකයෝ කබලෙන් ලිපට

කොවිඩ් නිසා වැලේ වැල් නැතිව ඉන්න උණවටුනේ සංචාරක හෝටල් සහ අවන්හල් වල විදුලිය සම්බන්ධතා විදුලි බල මණ්ඩලය මගින් විසන්ධි කිරීම හේතුවෙන් ව්‍යාපාරිකයන් කබලෙන් ලිපට වැටී ඇතැයි උණවටුන කුඩා සහ මධ්‍ය පරිමාණයේ සංචාරක ව්‍යාපාරික සංගමයේ සභාපති රූපසේන කොස්වත්ත මහතා පැවසීය.

උණවටුනේ පැවති මාධ්‍ය හමුවක් අමතමින් කොස්වත්ත මහතා මේ බව කීය.

රූපසේන මහතා මෙසේ ද කීවේය දැනට උණවටුනට දේශීය හෝ විදේශීය සංචාරකයන් කිසිවෙක් පැමිණෙන්නේ නැහැ ප්‍රදේශය පාළුවට ගිහින් මේ වන විට ජල සම්පත් මණ්ඩලයෙනුත් ජලය විසන්ධි කරන බව දන්වමින් රතු නිවේදන ගෙනත් දීල දැන් අපිට වෙලා තියෙන්නේ ගහෙන් වැටුණ මිනිහට ගොනා ඇන්න වගේ වැඩක්. උණවටුනේ සංචාරක හෝටල් කීපයක් හැරුන විට සෙසු සියලු දෙනාම කුඩා අවන්හල් හිමියො මේ පිරිස සියයට අනූවකටත් වැඩියි මේ අවන්හල් සංචාරක මණ්ඩලයේ ලියා පදිංචිවී නැහැ පවතින නීති ලියා පදිංචියට බාධාවක් වෙලා රජයෙන් බැංකු වලින් සියලුම පහසුකම් ලබා දෙන්නේ සංචාරක මණ්ඩලයේ ලියා පදිංචි ආයතන වලට පමණයි මෙය බලවත් අසාධාරණයක්.

අපි රජයෙන් ඉල්ලා සිටින්නේ මේ අසීරු අවස්ථාවේ විදුලි බිල සහ වතුර බිල විසන්ධි නොකරන ලෙසත් බැංකු ණය ගෙවීමට සහන කාලයක් ලබා දෙන ලෙසයි.යල් පැන ගිය නීති වෙනස් කර සෑම අවන් හලක්ම සංචාරක මණ්ඩලයේ ලියා පදිංචිකර රජයේ ලැබෙන වරප්‍රසාද අපටත් ලබා දෙන ලෙසයි.

වැල්ලවාය විශේෂ - ජී අයි ආර් ගරුසිංහ

## හක්කපටස් කෑ අලියා මියයයි

තණමල්විල පොලිස් බල ප්‍රදේශයට අයත් බෝදාගම මිනිරන්කන්ද රක්ෂිතය ආශ්‍රිත ප්‍රදේශයේදී වට්ටක්කා ගෙඩියකට දැමූ හක්කාපටස් එකක් පුපුරා යෑමෙන් බරපතළ ලෙස තුවාල ලබා සිටි අලියකු මියගොස් ඇතැයි වනජීවී නිලධාරිහු පවසති. මෙම අලියා ඉකුත් (08) මෙසේ තුවාල ලබා සිටියදි උඩවලව වනජීවී නිලධාරීන්ට හමුවී තිබේ. මෙම අලියා සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවීමත් සමඟ උඩවලව වනජීවී නිලධාරීහු එම අලියාට දින දෙකක් පුරා ප්‍රතිකාර කරමින් සුවපත් කිරීම සඳහා දැඩි වෙහෙසක් ගෙන ඇතත් අවසානයේදී එම අලියා මියගොස් තිබේ.

කෑගල්ල දිස්ත්‍රික් සමූහ දයාරත්න බණ්ඩාර

## කෑගල්ල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩල රැස්වීම



නන්ද ස්වාමීන්වහන්සේ විසින් වීරසූරිය මහතාට ග්‍රන්ථ කිහිපයක් පිරිනැමීම

කෑගල්ල දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩල රැස්වීම දිස්ත්‍රික් ලේකම් මහින්ද එස් වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ඒ අනුව කොවිඩ් වසංගතය හමුවේ දහම් පාසල් පැවැත්වීම ප්‍රාදේශීය ශාසනාරක්ෂක නිලවරණය පැවැත්වීම දිස්ත්‍රික් ශාසනාරක්ෂක නිලවරණය පැවැත්වීම දිස්ත්‍රික් බෞද්ධ කටයුතු අරමුදලේ ඉදිරි කටයුතු, තරුණ බෞද්ධ සංගමයේ ඉදිරි කටයුතු දහම් සරසවිය පාඨමාලා පැවැත්වීම ආදී කරුණු සාකච්ඡාව සිදු කෙරිණි.

ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ නිලවරණ පෙබරවාරි 23 දින සහ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බලමණ්ඩලයේ නිලවරණය මාර්තු 23 දින පැවැත් වෙන බව මෙහි දී අනාවරණය කෙරිණි.

දෙහිඕවිට ප්‍රාදේශීය ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ඉහළ තල්දුව ඉසිපතනාරාමයේ විහාරාධිපති පූජ්‍ය නන්ද ස්වාමීන්වහන්සේ විසින් මෙහිදී දිසාපති මහින්ද එස් වීරසූරිය මහතාට ග්‍රන්ථ කිහිපයක් පිරිනැමීම ද සිදු කෙරිණි.

දිස්ත්‍රික්කයේ ශාසනික උන්නතිය සඳහා මෙහිදී කරුණු සාකච්ඡා කෙරිණි.

මේ අවස්ථාව සඳහා දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති පූජ්‍ය හෙම්මාතගම සිද්ධාර්ථ නාහිමි, දිස්ත්‍රික් ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේකම් පූජ්‍ය දුනුකේවත්ත සීලවිමල නාහිමි ඇතුළු ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති සහ ලේඛකාධිකාරි හිමිවරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්, බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් හා සංවර්ධන නිලධාරීහු රැසක් ද සහභාගී වූහ.

සීගිරිය විශේෂ

## ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගාමිණී මීගහකුඹුර සේවයෙන් විශ්‍රාම ලබයි



දඹුල්ල මුලස්ථාන පොලිසිය මගින් විශ්‍රාම යන ගාමිණී මීගහකුඹුර මහතා වෙත සමරු තිළිණයක් ප්‍රදානය කළ අයුරු.

ශ්‍රී ලංකා පොලිස් සේවයේ වසර 36 ක පමණ කාලයක් සේවය කළ දඹුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගාමිණී මීගහකුඹුර මහතා 10 දින සිට සේවයෙන් විශ්‍රාම ගෙන තිබේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගාමිණී මීගහකුඹුර මහතා සේවා දිවියෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් දඹුල්ල පොලිසිය සීගිරිය පොලිසිය ගලේවෙල පොලිසිය නාඋල පොලිසිය සහ දඹුල්ල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික ආයතන ප්‍රධානීහු බොහෝ දෙනෙක් ඒ මහතා ගේ සේවය ඇගයීමට ලක් කළහ.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට උප පොලිස් පරීක්ෂකවරයකු ලෙස සේවයට එක් වූ ගාමිණී මීගහකුඹුර මහතා වසර 36ක කාලයක් උප පොලිස් පරීක්ෂක පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරීක්ෂක සහකාර පොලිස් අධිකාරී පොලිස් අධිකාරි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යන තනතුරු වල සේවය කොට තිබේ.

පොලිස් ජීවිතාරක්ෂක සංගමය පිහිටුවීම සඳහා මෙන්ම දිවයිනේ පළමු ජීවිතාරක්ෂක තූර්ය වාදන ශිෂ්‍ය භට කණ්ඩායම ආරම්භ කිරීම සඳහා නායකත්වය ලබා දීම දිවයිනේ ප්‍රථම වතාවට දිය මත බක් මහ උළෙලක් සංවිධාන කිරීම . දිවයිනේ ප්‍රථම වතාවට කෘතිම වැවක සාදන ලද පිහිනුම් තටාකයක ක්‍රීඩක ක්‍රීඩිකාවන් දෙදහසක් සහභාගීත්වයෙන් සිදුකරන ලද පිහිනුම් තරග සංවිධාන කිරීම ආදී කැපී පෙනෙන සේවා රැසක් ඉටුකර තිබිණි.

ආර්. රාජමන්ත්‍රී - වැලිමඩ සමූහ

## වැලිමඩ උඩුපුස්සල්ලාව මාර්ගයේ කොටසක් නාය යයි



වැලිමඩ උඩුපුස්සල්ලාව මාර්ගයේ කර්කලීස් කොටසේ 10 වන දින පස්වරුවේ නාය යෑමකට ලක්ව පැයකට අධික කාලයක් රථවාහන ධාවනය තාවකාලිකව නතර කළ බව ඌවපරණගම පොලිසිය පවසයි. ප්‍රදේශයට ඇදහැලෙන වර්ෂාව හේතුවෙන් මෙම මාර්ගයේ තැන තැන නාය යෑම හා මාර්ගයට පස් කඳුකඩා වැටීමේ අවධානමක් මතුව ඇති නිසා රථවාහන ධාවනයේදී වඩාත් විමසිලි මත් වන ලෙසට පොලිසිය රථවාහන රියදුරන්ගෙන් ඉල්ලා සිටී.

වැලිමඩ උඩුපුස්සල්ලාව මාර්ගයේ සංවර්ධන කටයුතු සිදුකරන කර්ක්ලීස් කොටසේ මාර්ග නාය යෑම හා මාර්ගයට පස් කඳු කඩා වැටී තිබුණු අයුරු.

සී. මහගම - නුවරඑළිය සමූහ

## නුවරඑළියේ ගොවි සංවිධාන දෙකකට ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳසල්

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන දෙකකට ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳසල් දීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පියවර ගෙන තිබේ. තලවකැලේ - ලිඳුල ගොවි සංවිධානය සඳහා රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයෙන් හා රාගල ගොවි සංවිධානය සඳහා නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයෙන් මෙසේ වෙළෙඳසල් දීමට පියවර ගෙන ඇත.

ගොවියාටත් පාරිභෝගිකයාටත් සාධාරණය ඉටු වන පරිදි එළවළු ආර්ථික මධ්‍යස්ථාන හරහා බෙදා හැරීමේ රජයේ වැඩසටහන විධිමත් කරමින් රාගල හා තලවකැලේ - ලිඳුල ගොවි සංවිධානවලට මෙසේ ආර්ථික මධ්‍යස්ථානවල වෙළෙඳසල් දීමට පියවර ගත් බව කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

2021 පෙබරවාරි 13 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ

සදෘතතික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

2021 පෙබරවාරි 13 සෙනසුරාදා





PAGE 05

## අපිට අමතක අපි



PAGE 07

## අලුතින්ම හිතමු



PAGE 03

## ඒ ලෙවල් නෙවෙයි

# කටින් බතල හිටෙවුවාට වැඩේ ගොඩ යන්නේ නෑ

ජීවිතේ කොහෙමෙන් කොහොම හරි ගැට ගහගන්න උත්සහ කරන අපේ ජීවිත , ක්‍රියාදාම පිරි ටෙලි කථාන්ගයකට සමානය. එහි පරිච්ඡේද අඩු ගණනක් රඟ දක්වා රංගනයෙන් බැස යන්නන් මෙන්ම , වාර්තා තබා වැඩි ආයුෂත් අතැතිව දීර්ඝ ටෙලිනාට්‍යකට නෑකම් කියන්නවුන් ද ඇත්තේය. මේ කුමන කතාමාලාවන් වුව ද රචකයා මෙන්ම කථා නායකයා / නායිකාව ද වන්නේ එකම පුද්ගලයකුය .

මෙම අපූර්ව ජවනිකා පිරි ජීවිත කතාවේ මතක, සිදුවෙන්නා වූ හා මතු සම්බන්ධ කොටස් ගණනාවක් පවතී . ඊයේ , අද , හෙට ලෙස ගලා යන්නා වූ අපගේ ජීවිතයන් හී , සුන්දර තැන් පාහේම අසුන්දර වූ නමුත් සුන්දරත්වයට ආවඩන සිද්ධි දාමයක් පවතී. මේකී එක් එක් දිනයේදී එක් එක් පුද්ගලයා ක්‍රියා කරන ආකාරය අතිසය වෙනස් වූ බව නියතය . යථාර්ථය වූ කලී ඊයේ ගෙවී ගියද අද හුස්ම ගන්නාවූ ද හෙට පැමිණෙන්නට ඇත්තාවූ ද තත්වයන්ය . ඉතිං මේ කුමක් හෝ වේවා අපි හුස්ම ගන්නේ අදය. නැතිව ඊයේ මතකවල

> යථාර්ථය වූ කලී ඊයේ ගෙවී ගියද අද හුස්ම ගන්නාවුද හෙට පැමිණෙන්නට ඇත්තාවුද තත්වයන්ය. ඉතිං මේ කුමක් හෝ වේවා අපි හුස්ම ගන්නේ අදය. නැතිව ඊයේ මතකවල එල්ලී අද නිකරුනේ නාස්ති කිරීම යුතු නොවේ.

එල්ලී අද නිකරුනේ කාලය නාස්ති කිරීම යුතු නොවේ. අතීතය හැඳන්වීමේදී ගෙවෙන්නා වූ තත්පරයක් තත්පරයක් පාහේ අතීතයට එක් වෙයි. ඒ හා සමඟ ම අපත් තත්පරයකින් වියපත් වෙයි. ඒ ගෙවී ගිය තත්පර ගණනාව වැය වෙන්නේ උදා වන්නට තිබෙන්නාවු තත්පර උදෙසාය. අප ජීවත් විය යුත්තේ කුමන කාලයේ දැයි තීරණය කල යුත්තන් ද අපිමය.

අතීතයේ නීරස මිහිරි මතකවලින් ලබාගන්නා වු පන්නරය තුළින් අද ජීවත් වීම ද , එයින් එහා ගිය තවත් සුන්දර හෙටක් උදාකර ගැනීමට ද යන්න පිළිබඳ කල්පනා කල යුතුමය. එය කටින් බතල හිටවන්නා සේ වුවද , මහත් ආයාසයකින් යුතුව එම කාර්යයෙහි නියැළීමට කාට කාටත් හැකිය. බහුතරයක් අතර සුළුතරය අතීතයෙන් උගත් පාඩම් ආශ්‍රයෙන් හෙට දිනයට , නව ගෙත්තමක් වියමන් කරගත්ත ද , තාමත් බොහෝ දෙනා අතීතයේ ශෝකී මෙන්ම වෛරී හැඟීම් අතර වහල් වී සිටියි. එයින් මිදීමට කියන්නා වගේ ලෙහෙසි පහසු නොවේ. එය වනාහි අසීරුම පල්ලම් ගැටිති තැනිතලා වලින් ගහනය වූවක්මය .

මේ ව්‍යායාමය සිදු කිරීමට අපේ සෘණාත්මක සිතුවිලි ධනාත්මක කරගත යුතුය. එහිදී තනිව උත්සහ කළ නොහැකිය . බොහෝදෙනා පිළිතුරු සොයන්නේ හුදකලාව තුළින්ය. එයින් මතුවන අවසානය වන්නේ ජීවිතය අවසන් කරගැනීමය. නැතිනම් සිය හුස්ම හෙටටත් පණ ගැහෙන්නට නොදී අදින් අවසන් කර ගැනීමයි . මෙලෙස තනිකමේ ගිලී සිට අතීත මතක අතර විඳවන්නන් දෙස අප වැඩි අවධානයක් යොමු කරමු. අපගේම සුන්දර හෙටක් වර්ණ කරගන්නා අතරම, ඔවුන්ව අතීතයේ සිරකරවුන් බවට පත්වන්නට නොදී අපගේ හෙටට ඔවුන්වත් එක් කරගනිමු.

ප්‍රේමයෙන් පරාජය වූවන් ද, මතින් මත් වූවන් ද, සෙනෙහෙවන්තයින් අහිමි වූවන් ද , ජීවිත ධාවනයෙන් පරාජය වූවන්ට ද ආදරයෙන් දෑත දිගු කරමු. එය ඔවුන්ට මහගු පිටිවහලක් වනු ඇත. ගිය දේ ගියා මිස යළි නොයෙන්නා සේ , වැරදුණු පොට නිවැරදි කරගනිමු . පැටළුණු තැන් සීරුවට ලිහා ගනිමු . හෙටට බලාපොරොත්තු එක්කලම පා තබමු . තනිව ගමනක් නොව ඇද වැටුණු අයවත් එක් කරගන්නට අමතක නොකරමු . අතීතය කණවැල කරගනිමින් හෙටට පියනගන්නට අද අත්වාරුව කරගනිමු. උදා නොවූ හෙට ගැන සැලකිලිමත් වීමේදි අතපසු වී යන යුතුකම් පිළිබඳවත් අවධානය දී ජීවිත තුලාව සමබර කරගනිමු .

එම තිර පිටපත රචනා කළ යුතු අපම පනින්නට පෙර හොඳ හැටි සිතා බලමු. කුඩා දරුවෙකු, තරුණ තරුණියන් ලෙසද වැඩිහිටියන් ලෙස ද තමන්ට සුදුසු ම දේ පිලිබඳ පමණක් කැපවෙමු. නැතිනම් අවසානයේ හෙටට ශේෂ වන්නේ හිමිකරුවෙකු නැති මලක් පමණි. ඉතිං ආදරයෙන් ම කෙරෙන ඇරයුමයි... " කලලය ස්ථාපිත කරගන්නට පෙර ගර්භාෂය නිසි පරිදි සූදානම් කරගන්න. " එවිට, අතීතය වැහි වලාවක් වුවත්, හෙට පායන්නේ අද ඇදහැලුණු වර්ෂාවෙන් උපන් වසන්තයේ දේදුන්නයි.

සෝදුපත් නොබලන
ව්‍යාකරණ අනුකූල නොවන්නාවු
කෙටිකථා නවකථා අතර
ඔහේ දිවෙන ජීවිත......

ඊයේ ගුල්ලෝ ගැසූ
අද කාවෝ කෑ
හෙටක් නැති හෙටක්
වියමන් නොකරම
පනිමු පිම්මක්
තුලිත කරන්නට
ජීවිත සමීකරණය .....



දෙව්නි දිව්‍යාංජලි පෙරේරා
වාද්දුව

අපි ඔබ ඉලක්ක කරන්නෙමු

යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි.තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි.අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.

එන්න, අපි හරි හාරක් හදමු

සංස්කරණය - රජිත බස්නායක
younjanatha@lakehouse.lk
‘යොවුන් ජනතා’, දිනමිණ
අංක 35
ලේක් හවුස්
ඩී. ආර්. විජයවර්ධන මාවත
කොළඹ 10

යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත් younjanatha@lakehouse.lk ලිපිනයට යොමු කරන්න



# ඒ ලෙවල් නෙවෙයි මේ ලේවල්

## කවිශ්ක මාධව

පිටරටින් ගෙන්වන වාහන වැඩි මුදලක් ගෙවා භාවිත කිරීමට අපට සිදුව ඇත්තේ අප රට තුළ වාහනයක් හෝ වාහනයක කොටසක් හෝ නිෂ්පාදනය නොකරනා නිසාවෙනි. ඇතැම් අවස්ථාවලදී අප ගන්නා වාහනයට වැඩි මුදලක් බදු වශයෙන් ද ගෙවීමට සිදු වේ. මේ සෑම දෙයක්ම අප රටේ වාහන නිෂ්පාදනයක් සිදු නොවීම හේතුවෙනි. අතීතයේ අප රටේ වාහන නිෂ්පාදනය කළ බවට අදට ද දැක බලාගත හැකි ඇන්ටික් වාහන හොඳ සාක්ෂියකි. කොවිඩ් - 19 ගෝලීය වසංගතය හේතුවෙන් පිටරටින් ආනයනය කරන්නා වූ සෑම දෙයකටම අද වන විට තවත් සීමා පැන වී ඇත.

අතීතයේ රජ දවස පටන් පැවත එන සිංහලයන් එදා දැක්වූ දක්ෂතා ආදර්ශයට ගෙන හැකි අයුරින් හෝ වාහන නිෂ්පාදනයකට ද යොමු විය හැකිනම් එය අප රටේ හැරවුම් ලක්ෂ්‍යයක් වනු නො අනුමානය. ඇත්තෙන්ම එවන් දෙයක් තවදුරටත් හීන නොවනා තරමට තරුණයන්ගේ නව නිෂ්පාදන කරළියට පැමිණීම අප කාහටත් සතුටට කරුණකි.

අප මේ කියන්නට යන්නේ අඩු වයසකින් එවැනි වාහන නිෂ්පාදනය කිරීමට උපන්හපන්කම් පානා තරුණයෙක් ගැනය.

කවිශ්ක මාධව රත්නවීර නම් මේ සිසුවා බණ්ඩාරනායක විද්‍යාලයේ ඉගෙනුම ලබා උසස් පෙළ විභාගයට මුහුණදී ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින්නේය. කුඩා කල සිටම බණ්ඩාරනායක විද්‍යාලයේ නව නිපැයුම් සංගමය හා සම්බන්ධව නව නිෂ්පාදන සිදු කර ඇති මාධව සිසුවා දැනට වාහන අටක් නිෂ්පාදනය කිරීමට සමත් වී තිබේ.

පහ වසරේ සිටම මෙලෙස වාහන නිෂ්පාදනය කිරීමට සමත්ව ඇති මාධව කාර් 6ක්, ආබාධ සහිත කෙනකුට අතින් ක්‍රියා කරවිය හැකි වාහනයක් සහ ඕනෑම දුෂ්කර මාර්ගයක ගමන් කළ හැකි වාහනයක් ඇතුළුව වාහන 8ක් තනිවම මේ වන විටත් සාදා අවසන්ය. විශේෂත්වය වනුයේ මේ වාහන ඔහු විසින්ම නිෂ්පාදනය කිරීමය. මෝටර්සයිකල් එන්ජින් එකක් උපයෝගි කරගෙන එය වාහනයකට සරිලන අයුරින් සකසා අලංකාර නිමාවකින් යුතු මෝටර් රථයක් බවට පත් කිරීමට මොහු උපන් හපනෙකි.



මොහු සාදා ඇති වාහනවල තවත් විශේෂත්වයක් තිබේ. ඒ පස්දෙනකුගෙන් යුතුව ලීටරයකට කිලෝමීටර් 35ක් පමණ ගමන් කරවීමේ ඇති හැකියාවය. අනාගතයේ මුහුණදීමට සිදුවන තෙල් අර්බුදයට ද මාධව සිසුවා දැනටමත් විසඳුම් සොයාගෙන අවසානය. පිටරටින් ගෙන්වන ඇතැම් වාහනවල පවා මෙලෙස වැඩි දුරක් ගමන් කළ නොහැකිය.

එලෙසම මනා නිමාවකින් අවසානය දක්වා ඉවසීමකින් යුතුව මේ වාහන සාදනා මෙවන් තරුණයන්ගෙන් අප දැන්වත් වැඩක් ගත යුතුව ඇත. ඔවුන්ගේ දැනුමට අවස්ථාවක් දී තවත් ඔවුන්ට වෘත්තීයමය වශයෙන් වාහන පිළිබඳ අධ්‍යාපනයක් ලබා දුනහොත් අද නැතත් මතු යම් දිනෙක හෝ වාහන පිටරටින් ගෙන්වනතුරුත් වැඩි මිලට ගැනීමටවත් අපට අවශ්‍ය නැත. මෙවැනි දක්ෂ තරුණයන් දෙස බැලීමේදී ඒ දවස වැඩි ඈතක නොවනු ඇතැයි අපිට පෙනී යන්නෙමු.

කවිශ්ක මාධව තරුණයාට තවමත් මෙවැනි නිෂ්පාදන සිදු කිරීමට කුමන හෝ ආයතනයකින් අනුග්‍රහයක් ලැබී නැත. ඇත්තෙන්ම මෙවැනි දක්ෂ මොළකරුවන්ගෙන් අප දැන්වත් රටට ඵල ප්‍රයෝජනයක් ගත යුතු නොවන්නේ ද...?

ඔවුන්ගේ හැකියාවන් මනා ලෙස අධ්‍යයනය කර ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ සැපයීමට මඟ පෙන්වීමට හැකි නම් අප රට තුළ වාහන නිෂ්පාදනය කළ හැකිය. කවිශ්ක සිසුවා දක්ෂකම් දක්වන්නේ වාහන සෑදීමට පමණක්ම නොවනා බවට විශේෂයෙන්ම කිව යුතුය. ඔහු අ.පො.ස. උ.පෙළ ප්‍රතිඵල ලැබෙන තුරු සී.සී.ටී.වී. කැමරා සවි කිරීම, වෑල්ඩින් වැඩ මෙන්ම වාහනවල අලුත්වැඩියාවන් ද සිදු කරන්නේ මනා දක්ෂයකු ලෙසිනි.

අවසානයට පෙර යමක් කිය යුතුව ඇති බවට මාධව සිසුවාම අප හා පැවසීය. ඒ මාධව සිසුවාට පාසල් අවධියේදී දක්ෂතා ඔප්නංවා ගැනීමට හෙවණැල්ලක් මෙන් සිටි ගුරුවරයකු ගැනය. ඒ එවකට බණ්ඩාරනායක විද්‍යාලයේ තාක්ෂණික අංශය භාර සහකාර විදුහල්පති ලෙස කටයුතු කළ තරංග දුනුආරච්චි ගුරු පියාණන්ය. මේ සිසුවාගේ සැඟවුණු දක්ෂතා ඉතා හොඳින් හඳුනාගත් ඒ ගුරු පියාණන් නොසිටින්නට අද මෙවන් දක්ෂයෙක් බිහි නොවනු ඇත.

අ.පො.ස. සා.පෙළ, උ.පෙළ කළ තරුණයන් ස්මාර්ට් දුරකථන, පරිගණකවල එල්ලී සිටීමට පුරුදුව ඇති සමාජයක කවිශ්ක මාධව යනු හාත්පසින්ම වෙනස් වූ තරුණයකු බවට ඔබටම දැන් පැහැදිලිය. ඔහුට ඉලක්කයක් ඇත. ඒ විශ්වවිද්‍යාලයට ගොස් විභාග සමත්ව උපාධිය ලබා ගැනීමට වඩා වෙනස්ම වූ අවශ්‍යතාවකි. කෙදිනක හෝ තමන්ගේ කියාම නව නිපැයුම් කරනා ව්‍යාපාරික ස්ථානයක් වගේම ඉන් නව නිපැයුම් ලොවටම දායාද කිරීම ඔහුගේ එකම අභිප්‍රායය. එසේ නම් යොවුන් ජනතා අප ඔහුගේ අභිලාෂයන් එසේම ඉෂ්ට වේවායි ප්‍රාර්ථනා කරනා අතර, මෙවැනි දක්ෂයන් හට අතහිත දීමට හැකි කෙනකු සිටීනම් ඔවුනට එය ද මහඟු ශක්තියක් බැව් මතක් කර සිටීමට කැමැත්තෙමි.

රුචිනා බොතේජු





# යෞවනයේ ඩයරිය

### පෙබරවාරි 06

කොරෝනා නිසා නිදහස බොහෝදුරට සීමා වුණ අපිට නිදහස ගැන මේ පාර අර්ථවත්ව කතා කරන්න පුළුවන්. අපිට වගේම සත්තුන්ටත් ජීවත් වීමේ නිදහස තියෙනවා. සත්ව උද්‍යානයේ කූඩු කරලා ඉන්න සත්තුන්ටත්, ගෙවල්වල කූඩු කරලා හදන සත්තුන්ටත් අපිට වගේම නිදහසේ ජීවත් වෙන්න අයිතියක් තියෙනවා. කොරෝනා නිසා ගෙවල්වලටම හිරවෙලා, අපි හිටියෙ කොයි තරම් අමාරුවෙන් ද? සතෙක්ට තමන්ගෙ මුළු ජීවිත කාලෙම කූඩුවක් ඇතුළෙ හිර වෙලා, තමන්ට උරුම වුණ ජීවිතේ විඳගන්න නොලැබී, ජීවත් වෙන්න සිද්ධ වෙන එක මොනතරම් කනගාටුදායක දෙයක් ද?

### පෙබරවාරි 07

මේ දවස්වල කවියක්වත් ලියවෙන්නෙ නෑ. හිතට දැනෙන දේවල් අකුරුවලටවත් හරවන්න බැරුව හිත ඇතුළෙම ගල් වෙලා තියෙන එක හරිම අමාරුයි. සේනක බටගොඩ මහත්මයාගෙ සින්දුවක එන පද පේළියක් මට මතක් වෙනවා... "ඇහෙන දකින දේවල් කොතරම් තිබුණ ද, හිතට දැනෙන දේවල් ඇයි මෙතරම් බර.."

### පෙබරවාරි 08

හැම මනුස්සයෙක්ගෙම ජීවිත කතාව ඇතුළෙ බිඳ වැටීම් තියෙනවා. වැරදිකාර මනුස්සයෙක්ට උනත් එහෙම වෙන්න හේතුවක් තියෙන්න පුළුවන්. ඉපදෙනකොටම කිසිම කෙනෙක් හොරෙක්වත් මිනීමරුවෙක්වත් වෙන්නේ නෑ. ඔවුන් නිර්මාණය කරන්නේ සමාජය විසින්. Money Heist ටෙලි කතා මාලාව බලනකොට අපි හොරු දිහා අනුකම්පාවෙන් බලන්නේ ඔවුන්ගෙ ජීවිත කතාව අපි දන්න නිසාම වෙන්න ඕන.

### පෙබරවාරි 09

"මොකද ඔය කොණ්ඩෙට වෙලා තියෙන්නෙ, කැලි කැලි කපාගෙන කපුටු කූඩුවක් වගේ." ජීවිතේ ඒකාකාරී නීරස විදියට ගලාගෙන යනකොට වෙනසක් ඕන වෙනවා. ඉතිං ඒවගේ වෙලාවක කොණ්ඩෙ කපලා අලුත් හෙයා ස්ටයිල් එකක් ට්‍රයි කරන එක වැරැද්දක් නෑනෙ. කොහෙද ඉතිං අම්මලට මේවා තේරෙනවැයි.

### පෙබරවාරි 10

අපේ රටේ මිනිස්සු හැමතිස්සෙම අනෙකාව විවේචනය කරන්න පෙලඹෙන්නේ ඇයි කියලා මට නම් තේරෙන්නේ නෑ. කාගේ හරි මොකක්ම හරි පොඩි දෙයක් අල්ලගෙන ඒක විවේචනය කරන එක දරුණු විදියටම වෙනවා. වැරැද්දක් පෙන්නලා දීලා ඒක නිවැරදි කරනවා වෙනුවට ඒ මනුස්සයව පීඩාවට පත් කරන එක හරිම පහත් දෙයක්.

### පෙබරවාරි 11

කොරෝනා නිසා කාලෙකින් මුහුද වෙරළට ගියේ නෑ. ඉර බහින වෙලාවක මුහුදු වෙරළකට වෙලා ඈත සිතිජය දිහා බලාගෙන ඉන්න, කිසිම කතාවක් නැතුව මුහුදෙ හඬට කන් දීගෙන ඉන්න, මුහුදු රළ කකුල් වටේ එතෙන සනීපය විඳගන්න තියෙනවා නම්. මේ සති අන්තයේවත් මුහුද බලන්න යන්න ඕන.

### පෙබරවාරි 12

ආදරවන්තයින්ගේ දිනය ළඟ නිසා ෆේස් බුක් යන්න බෑ වෙළඳ දැන්වීම් පිරිලා. ඩිස්කවුන්ට් හැමතැනම. වැලන්ටයින් විකුණනවා. ලෝකයේ පැවත්ම තියෙන්නේ ආදරය එක්ක. අනිත් හැම දේකටම වගේ දිනයක් තියෙන නිසා ආදරයටත් දිනයක් වෙන් කරන එක විය යුතු දෙයක්. හැබැයි ආදරය කියන එක මීට වඩා පුළුල් විදියට අර්ථයකින් යුතුව සමරන්න ඕන දෙයක්.

කුශාන්ති අනුරාධා බණ්ඩාර

'යොවුන් ජනතා' දිනමිණ
ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

පසුගිය සතියේ පළ වූ "සංස්කෘතිකයි එකඟයි" ලිපිය සම්බන්ධයෙන් අප වෙත ඒවා තිබු ලිපියකි.

# සංස්කෘතිය කුඩු

*"එළිමහනේ තියෙන විශාල ම සිරගෙදර තමයි සංස්කෘතිය කියලා කියන්නේ. සංස්කෘතිය කියන්නේ මකුළු දැලක්. අපි ඒකේ පැටලිලා , ඒ පැටලුම ලිහා ගන්න බැරුව හතර අතේ දඟලන සත්තු ජාතියක්. බටහිර රටවල ආසියාතික සංස්කෘතිය තරම් හිරවීමක් නෑ .බටහිර රටවල නිදහස් සංස්කෘතිය ඇත්තටම අගය කළ යුතුයි"*

ඉහත ඡේදය පසුගිය සතියේ කලාපයෙන් මා උපුටා ගනු ලැබුවේ එහි සඳහන් කාරණාව පිළිබඳව කතා කළ යුතු යැයි හැඟුණ බැවිනි. එම ලිපියෙහි අන්තර්ගතව පැවතියේ සංස්කෘතිය යනු අප සිරකර තබනා සිරගෙයක් සේම බටහිර සංස්කෘතිය ලංකාවේ පවතින සංස්කෘතියට වඩා අගේය කියනු ලබන කාරණාව ඉස්මතු කරමිනි.

කෙසේ වුවත් අප මතක තබා ගත යුතු ප්‍රධානම කරුණ වන්නේ ලංකාවේ මේ මොහොතේ පවතින්නේ මෙයට සියවස් ගණනකට පෙර පැවැති ලාංකේය සංස්කෘතිය නොවන බවයි.

පෘතුගීසීන්ගෙන්, ලන්දේසීන්ගෙන්, ඉංග්‍රීසින්ගෙන් පමණක් නොව ඉන්දියානුවන්ගෙන් පවා සිදුවූ ආක්‍රමණ හේතුවෙන් සංස්කෘතිය විනාශ වීම සිදුවූ බව මූලිකවම අප සිහි තබා ගත යුතුය. මේ අතරින් වැඩිම බලපෑමක් එල්ල කරනු ලැබූවේ ඉංග්‍රීසි ජාතිකයින් විසිනි.

පසුගිය සතියේ පළවූ ලිපියෙන් පුන පුනා අගය කර තිබුණේ බටහිර රටවල පවතින සුද්දාගෙ සංස්කෘතියයි. එහෙත් කනගාටුවට හේතුව වන්නේ එම ලිපිය ලියා තිබූ සොහොයුරිය ලාංකේය සංස්කෘතිය යනු කවරක්දැයි තවමත් නොදන්නා බවයි. ඇය නොදැන හෝ බටහිර සංස්කෘතිය වර්ණනා කිරීමෙන්ම සිදුකර ඇත්තේ ලාංකේය සංස්කෘතිය යම් තරමකට වර්ණනා කිරීමයි. මන්ද ඉංග්‍රීසි ජාතිකයන් ලංකාව තුළ තිබූ බව භෝග සම්පත් පමණක් නොව අප ගොඩ නගාගෙන තිබූ සංස්කෘතියද කොල්ල කෑමට අමතක නොකළහ. අප සංස්කෘතියේ පැවති යහපත් වූ සියල්ල රැගෙන ගොස් ඔවුනගේ සංස්කෘතිය අලුත්වැඩියා කිරීමට කටයුතු කළහ. ඉතින් බහුතරයක් දෙනා අගය කරනු ලබන බටහිර සංස්කෘතිය තුළ ඇත්තේ ඔවුන් අපෙන් උකහා ගත් දෑය.

සුරාව සූදුව කුමක්දැයි නොදන්නා සිංහලයා ඒ සඳහා ඇබ්බැහි කරනයේද මේ කියන සුද්දාගෙ සංස්කෘතියයි.

ජෝන් ඩොයිලි සිංහල භාෂාව මෙන්ම සිංහල සංස්කෘතියද අධ්‍යනය කළ බවට ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන්ව තිබීමෙන්ම ඉංග්‍රීසි ජාතිකයන්ගේ අවශ්‍යතාවය වූයේ සිංහල ජාතිය විනාශ කිරීම මිස අන් කවරක්වත් නොවන බවද මතක තබා ගත යුතුය.

සුද්දා හීතලට බොන සිගරැට්ටුව ලංකාවේ ගිනි මද්දහනේ බොන්නට තරම් ලාංකිකයන්ව පොළඹවන ලැබුවේ ගිය සතියේ ලිපිය ලියූ සහෝදරිය මෙන්ම බහුතරයක් දෙනා අගය කරනු ලබන බටහිර සංස්කෘතියයි.. කාන්තාවන් රාත්‍රියේ සුරාවෙන් සප්පායම්ව කාණු අයිනේ ඇද වැටී සිටින දසුන් විදෙස් රටවලදී අපූරුවට දැකගැනීමට හැකිය. එසේ නම් අප වැලඳගත යුත්තේ එවන් සංස්කෘතියක්ද?

බෞද්ධ සංස්කෘතිය මූලික කරගනිමින් ගොඩ නැඟුණු ශ්‍රී ලාංකේය සංස්කෘතිය බෞද්ධයන්ට පමණක් නොව අනෙකුත් ආගම් අදහන්නන් සඳහාද නියමානුකූලව ජීවත්වීමේ මග කියා දුන්හ.

අතීතයේ ගොඩ නැගුණු ගමයි පන්සලයි, වැවයි දාගැබයි සංකල්පයට වර්තමානයේදී තරම් ප්‍රශ්න නොතිබිණි. පැවැති කුඩා ගැටලු පවා තම පවුල තුළම, එසේත් නොමැති නම් ගම තුළම විසඳාගැනීමේ හැකියාව පැවතුණි.

විදෙස් සංස්කෘතිය හරි සුන්දරයි පවසන්නට බොහො විට හේතු වන්නට ඇත්තේ ඒ සමාජය තුළ පවතින නිදහස වන්නට පිළිවන. එහෙත් ලාංකේය සමාජය තුළ හදිසියේ කරදරයකදි පවා උදව් කිරීමට බොහෝ පිරිසක් සිටිය ද විදෙස් රටවලදි බහුතරයක් දෙනා හුදකලා ජීවත ගත කරන බැවින් සමාජීය සහභාගිත්වය අවම අගයක පවතී.

> අවසාන වශයෙන් පසුගිය සතියේ ලිපිය ලියා තැබූ සොහොයුරියට පැවසීමට ඇත්තේ සංස්කෘතිය යනු සිරගෙයක් නොව එය සමාජයේ මෙන්ම තමාගේද ආරක්ෂක යාන්ත්‍රණයක් ලෙස සිතා කටයුතු කරන්නෙ නම් ගැටලුවක් නොවනු ඇති බවයි. එහෙත් ඔබ බටහිර ජාතීන් හිස මත තබාගෙන ගිය හොත් බොහෝ විට සමාජය ඔබ දෙස බලන අයුරු වෙනස් වනු ඇත. ඔබට චරිත සහතික ද ලියනු ඇත.

අවසාන වශයෙන් පසුගිය සතියේ ලිපිය ලියා තැබූ සොහොයුරියට පැවසීමට ඇත්තේ සංස්කෘතිය යනු සිරගෙයක් නොව එය සමාජයේ මෙන්ම තමාගේද ආරක්ෂක යාන්ත්‍රණයක් ලෙස සිතා කටයුතු කරන්නෙ නම් ගැටලුවක් නොවනු ඇති බවයි. එහෙත් ඔබ බටහිර ජාතීන් හිස මත තබාගෙන ගිය හොත් බොහෝ විට සමාජය ඔබ දෙස බලන අයුරු වෙනස් වනු ඇත. ඔබට චරිත සහතික ද ලියනු ඇත. මන්ද ලාංකේය අප ඕනෑම දෙයක ලබාගන්නේ හොඳ දේවල් නොව නරක දේවල් නිසාය.



**ක්‍රිෂාන් ගයන්ත වීරගේ**
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය



# අපිට අමතක අපි



**ලංකාව ඈත අතීතයේ සිටම වරින් වර යුද්ධ හා ගැටුම්වලින් පිරි ඉතිහාසයක් ඇති රටකි. මේ විදේශීය ආක්‍රමණ හරහා වෙනත් සංස්කෘතීන්හි ඇතැම් අංගයන් අපේ සංස්කෘතියට එක් වූවද බටහිර ආධිපත්‍යයත් සමඟ ලංකාව තුළ සුවිශාල ආර්ථික දේශපාලන හා සමාජයීය පරිවර්තනයක් සිදුවිය. මින් වැඩිම බලපෑම සිදු වූයේ ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී යුගයේදීය. මෙම වසරේ පෙබරවාරි හතරවන දා ඉංග්‍රීසියටත් විජිත වාදයෙන් නිදහස ලබා වසර හැත්තෑ තුනක් සැමරුව ද ලාංකේය ජන විඥානය අද වන විට ද පරගැති බවින් සම්පූර්ණයෙන් නිදහස් වී නොමැත.**

ඉංග්‍රීසින් විසින් කෝපි සහ කුළු බඩු ආදී ආර්ථික භෝග වගාවන් වෙරළබඩ වරායන් කරා ප්‍රවාහනය කරගැනීමේ ගැටලුවට පිළියමක් ලෙස ලංකාව තුළ මහාමාර්ග ඉදිකර දුම්රිය සේවය ද ආරම්භ කළේය. එනමුදු ප්‍රවාහනය සඳහා නවීන ගුවන්යානා ලොව නිෂ්පාදනය වන්නට පෙර රාවණාගේ දඬුමොණරය නිර්මාණය වී තිබූ බවට ජනප්‍රවාදයේ සඳහන් වෙයි. කැප්ටන් ඩෝසන් විසින් කඩුගන්නාවේ ගල විද මාර්ගය ඉදිකිරීම ගැන පාරම්බාන ඇතැමුන් ලාංකේය විස්මිත නිර්මාණකරුවන් සීගිරිය තුළ භාවිත කළ තාක්ෂණය ගැන පුදුම වන්නේ නැත.

එකල රුවන්වැලිසෑය වැනි අහස උසට ඉදි වූ දාගැබ්හි අඩිතාලම එතරම් සවිමත් වූයේ කෙසේද යන්න නූතනයේත් ප්‍රශ්නාර්ථයකි.ලාංකේය වාරි නිර්මාණ ලොව අන් කිසිදු රටක දක්නට නොවන ආකාරයෙන් සුවිසල් හා විශ්මිත වූ නිර්මාණය. විශේෂයෙන්ම තාක්ෂණයෙන් උසස් යැයි කියා ගන්නා වත්මන් ඉංජිනේරු තාක්ෂණයට පවා හසු නොවන්නා වූ ක්‍රමවේදයක් අපගේ අතීත වාරි නිර්මාණ ශිල්පීන් සතු වූ බව මින්නේරිය වැව, කලාවැව, පරාක්‍රම සමුද්‍රය ආදී වැව් සහ යෝධ ඇළ ආදී වාරි නිර්මාණ අපට පසක් කරයි.

අතීතයේ වැව් 33000ක් පමණ ඉදිව තිබූ වටපිටාවක ගොවිතැන් කරන්නේත් පවත්වාගෙන යාමට ජලය ලබාගන්නේ එම බව ද කිව යුතු ය. තවමත් ජන ජීවිතය අවශ්‍ය වැව්වලින් සටන්වලට හා යුද්ධයට වර්තමානය වන විට විවිධරටවල් නවීන අවි ආයුධ සහ තුවක්කු ආදිය නිෂ්පාදනය කළද ඈත අතීතයේ සිටම පැවතෙන දේශීය සටන් ක්‍රම කඩු හා දුනු ශිල්පය මෙන්ම ලංකාවටම ආවේණික අංගම්පොර සටන් කලාව අමතක කළ නොහැකිය.

> ඇතමුන් ජෙෆ්රි බාවාගේ ගෘහ නිර්මාණ ශිල්පය බොහෝ තැන්හි වර්ණනා කළද අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව, කුට්ටම් පොකුණ, පොළොන්නරුවේ ගල් විහාරය, ඉසුරුමුණිය පෙම් යුවළ ආදී හෙළ කලාකරුවාගේ විස්මිත නිමැවුම්වල අගය නොදකී.

අප රටෙහි වෙදකමෙහි ඉතිහාසය අන් කිසිදු රටකට සම කළ නො හැකි තරම්ය. ලෝකයේ ප්‍රථම අංග සම්පූර්ණ රෝහල වන මිහින්තලේ රෝහල, ව්‍යුහයෙන් වත්මන් නවීන රෝහලකට සමාන ය. ඉපැරණි බෙහෙත් ඔරු සහ ශල්‍ය උපකරණවල නටඹුන් පෙන්වන්නේ එවකට පවා දේශීය වෙදකමෙහි තිබූ දියුණුවයි.

කොරෝනා වසංගත සමය තුළදී දේශීය ආයුර්වේද ක්‍රමය හා බැඳි ප්‍රතිකාර ක්‍රම කෙරෙහි යළිදු අවධානය යොමු විය. පුංචි හිසේ කැක්කුමකට ගන්නා පැනඩෝල් පෙත්තේ සිට දියවැඩියාව, කොලොස්ටරෝල් වැනි රෝග දක්වාම බටහිර වෛද්‍ය ක්‍රමයන්හි අතුළත් බෙහෙත් පෙති හා කරල්වල පිහිට පැතූ ලාංකිකයෝ නැවතත් කොත්තමල්ලි වීදුරුවේ ගුණ අගයන්නටත් කොහොඹ අත්තේ, දෙහි ගෙඩියේ ආරක්ෂාව සොයන්නටත් පටන් ගත්හ.

ලංකාවේ අතීතයේ පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව ලංකාවේ ආධිපත්‍ය තහවුරු කර ගැනීමේදී ඉංග්‍රීසින්ට අවාසිදායක බව තේරුම් ගත් නිසාම විදේශීය යැපුම් ආර්ථික ක්‍රමයක් රට තුළ ඇති කළහ. සහල් ආනයනය කිරීම සඳහා එදා ඔවුන් ආරම්භ කළ ක්‍රමවේදය අද වන විට නිදා ගන්නා පැදුර දක්වාම පිටරටින් ආනයනය කිරීම දක්වා පැමිණ ඇත.

දේශීය සහල් සමඟ කොස්, අල, බතල, පලා වර්ග ආහාරයට ගෙන සවි ශක්තිමත්ව සිටි ලාංකිකයන් වන අපේ දේශීය ආහාර සංස්කෘතිය තුළින් ප්‍රතිශක්තිකරණය ශරීරය තුළ වර්ධනය කළ අතර වර්තමානය වන විට ක්ෂණික හා රසකාරක යෙදූ ආහාරවලට ගිජු වීමෙන් ලෙඩ ජාතියක් බවට පත්ව හමාරය.

ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයේ මෙන්ම සමාජයේ සුරක්ෂිතතාවය සඳහා ප්‍රබල ලෙස බලපෑ සාධකය වූ පන්සලෙන් ජනතාව ඈත් කිරීමට විදේශීය ජාතීන් ගත් ප්‍රයත්නය අද වන විට භික්ෂුන් හා ධර්මය විවේචනය කරමින් පන්සලෙන් ඈත්වීම පමණකුදු නොව අන්‍යාගමිකකරණයට පවා සමාජය සීඝ්‍රයෙන් ලක් වෙමින් සිටින වටපිටාවක බටහිර ජාතීන් භාවනා කරන්නටත් බෞද්ධ දර්ශනය හැදෑරීමටත් කටයුතු කරමින් සිටින බව කිව යුතු ය.

1948 වසරේදී ඉංග්‍රීසින් අපට නිදහස ලබා දුන්නද සැබවින්ම ඔවුන් අපට නිදහස ලබා දුන්නේ ඔවුන්ගේ සමාජ මනසට අවශ්‍ය පරිදි ක්‍රියාකරන ජන සමාජයක් ලංකාවේ ස්ථාපිත වූ බව තහවුරු කරගත් පසුවය. එම නිසා වර්තමානයේ බොහෝ ලාංකිකයන් සිටින්නේ ලාංකික වුවත් මනසින් ඉංග්‍රීසින්ගේ වහල් බවකය. මේ චින්තනය තුළ දේශීයත්වයට ඉඩක් නොමැති අතර එම නිසා නිදහස් රටක් ජාතියක් ලෙස තනි අරමුණක් ඔස්සේ ක්‍රියාත්මක වීමට ද නොහැකිය.

උෂ්ණයි කියමින් හොඳම කෑම පසෙක තබා ගෙයි වත්තෙහි පුංචි වගාවක් හෝ කරන්නට අත පය නොවෙහෙසා වැඩිම වස විස කන ජාතියක් බවට පත් වී ඇත්තේ අතීතයේ ස්වයංපෝෂිත නීරෝගී ජාතියක් වූ ලාංකිකයන්ය. සූට්බූට් දමා බටහිර පන්නයේ ඇඳුම් පැළඳුම් ඇඟලා ලේඩීස් ෆස්ට් යනුවෙන්සමාජ මාධ්‍යවල හඬ නඟන සැමියන් සිටිය ද ලංකාව යනු ගෘහස්ථ හිංසනය වැඩිම රටකි.

තව ද දැන් බොහෝ විට දක්නට හැක්කේ එකම හැඟීම වචන කීපයකින් කිව හැකි ඉතාමත් සුන්දර සිංහල භාෂාව අමතක කර කලවම් භාෂාවක් දවස පුරාම කතා කරන යොවුන් පරපුරක් සහ මව්වත්කම අමතක කර කාන්තා විමුක්තිය වෙනුවෙන් සටන් කරන ගුණයහපත්කම් පසෙක තබා රැඩිකල් මතවාදවලින් හිස උදුම්මවාගත් අම්මාවරුන් ය.

නිදහස ලබා වසර හැත්තෑ තුනක් ගතවී ගිය ද දියුණු රටක් බවට පත් වන්නට නොහැකි වී ඇත. මෙහි පූර්ණ වගකීම රාජ්‍ය තන්ත්‍රයට හෝ පාලකයන්ට පමණක් නොපවරා අප අපේ වගකීම ඉටු කළ යුතු ය. රටක් ලෙස ඉදිරියට යාමට නම් කළ යුත්තේ විදේශීය යැපුම් මානසිකත්වයෙන් මිදී අපේ වටිනාකම් හා අගයන් නිවැරැදිව වටහාගෙන දේශීයත්වය තුළින් සියලු ජාතීන් හා ආගමිකයන් එක්ව ශ්‍රී ලාංකිකයන් ලෙස දියුණුව කරා පියනැගීමයි.

**නිසංසලා සංගීතා සමරතුංග**

# අරලියා



මං ඉස්සර ඉදන්ම කහපාට මල්වලට ආසා කළා. ඒකෙනුත් ගොඩක්ම කහපාට අරලිය මල් වලට. අනේ මන්දා මට කියාගන්න බැරි අමුතු හැඟීම් ගොඩක් එනවා කහ අරලිය දැක්කම. ඒ සුවඳටත් මාරම විදියට ආසා කළා..ආත්මීය ආදරයක් ද කියලත් වෙලාවකට හිතුණා.

ඒ දවස්වල මම කෙල්ල කාලේ. මං හරිම හුරුබුහුටි කෙල්ලක්..යාන්තම් අවුරුදු විසිඑකක් වුණා විතරයි. පේරාදෙණිය කැම්පස් එකේ පළමු වසරේ සිසුවියක්. කැම්පස් එක ළඟම බස් හෝල්ට් එකේ කහ පාට අරලිය ගහක් තිබුණා. මම හැමදාම බිම වැටිලා තියෙන මලක් ඇහිඳගෙන එන්න පුරුදු වෙලා හිටියා. හරියට, ඒ දවසට මලක් ඇහිඳගන්න බැරිවුනොත් බත් කෑවේ නෑ වගේ.

එදත් එහෙම දවසක්. හරියටම හවස 3ට විතර මං පාරට ආවා. පොඩ්ඩක් විතර අහස අඳුරු කරලා තිබ්බත් වහින්න ළඟ බවක්නම් පෙනුණේ නැහැ. කරුමෙට අද කුඩෙත් දාලා ඇවිත්. වැස්සොත් නම් අතේ තුරුලු කරන් ඉන්න නෝට්ස් ටිකත් තෙමෙනවා. බිම ඇතිල්ලෙන්න ඔන්න මෙන්න දඟලන මගේ දිග සාය කීකරු වෙන්නෙම නෑ. ඒ මදිවට ඉණ ගාවට දිගට තිබුන රැලි රැලි කොණ්ඩේ මගේ මූණෙන් බාගයක්ම වහගෙන. මං අරලිය මලක් හොයාගන්න සෑහෙන්න උත්සහයක.

මේ හුළඟත් කෝලම් කරන්නේ මේ වෙලාවට තමා..

මං හිතින් බැණ බැණ වටපිට බැලුවා.

"දෙයියනේ..."

මට ඉබේටම කියවුණා ..

මලක් දැක්කම මගේ හැඟීම් යටපත් කරගන්න හරි අමාරුයි.. ඇත්තටම මං අරලිය මල්වලට හරි ආදරෙයි.

හිමින් හිමින් මල ඇහිඳගන්න කිට්ටු කරද්දි දිගංචියෙක් ඇවිත් බිම වැටිලා තිබුන අරලිය මල ළඟ හිටගත්තා.

"හුටා..දැන් අරන් ඉවරනේ මල.."

එහෙමයි කියලා මගේ උත්සහය අතාරින්න පුළුවන්ද?

බැලූ බැල්මට මට වඩා සුදු උස කොල්ලෙක්. සින්නෙක් වගේ.

ඒත් දෙයියනේ මගේ මල?

හිතට හයිය අරන් ඒ කොල්ලා ළඟට ගියා.

"අයියේ පොඩ්ඩක් එහාට වෙනවද මේ මල ඇහිඳගන්න"

කියපු සැණින් විදුලියක් කෙටුවා වගේ එයා අයිනට වුණා. ඒත් එයා මගේ දිහා බලලා ලස්සනට හිනාවුණා.

මම මලක් ඇහිඳගෙන මෙහාට ඇවිත් හරි පරිස්සමට අතේ හංගත්තා. ඒක කවුරුහරි උදුරගෙන යයි කියලා බයට වගේ. විනාඩි දෙකක් යන්නත් කලින් අපේ ඉස්සරහා ගම්පොළ පැත්තට යන බස් එකක් නැවැත්තුවා. අද මගේ සගයෝ එක්කෙනෙක්වත් නැති හින්දම දුවලා දුවලා ඇවිත් බස් එකට නැග්ගේ තනියම හිටගෙන යන්න කම්මැලි නිසා. සීට් එකක් අල්ලගන්න. වෙනදටනම් යාළුවෝ ඉන්න නිසා හිටගෙන කයියක් දාගෙන යනවා. වෙලාවට පිටිපස්සේ හරියට වෙන්න සීට් දෙකක් තිබ්බා.

මං ඕනේ දෙයක් වෙච්චදෙන් කියලා ජනේලේ අයිනේ සීට් එකේ ඉඳගත්තා. හරිනම් සීට් එකට පැන්නා කිව්වොත් හරි. අර දිගංචියත් වෙන සීට් නැතුවම වගේ මගේ එහා පැත්තෙන් වාඩිවුණා.

බස් එක උඩරට මැණිකේ බලන කපොල්ල හරියෙදි උඩට ඇදෙනවා වගේ හිමින් හිමින් යනවා. ජනේලෙන් සීතල හුළං පාරක් ඇවිත් කම්මුලට හාදු කෝටියක් විතර දෙනවා. සීතල මට වැඩිය අල්ලන්නේ නැති නිසාම ජනේලේ වහලා දැම්මා.

ඩ්‍රයිවර්ටත් ඕනේ හැටක් විතර යන්න ඕනේ බස් එකේ එකසිය පනහක් විතර පටවගන්න.

ඒ අස්සේ රේඩියෝ එකෙන්,

"අරලිය ලන්දට සඳ පායනකොට
තුරුලිය මල් වට බඹරු බමන විට
සිය සිය සිය දහසට ඇඟිලි ගණිනා මට
ඔබ ගැන සිහිවෙනවා එතකොට ගී පද ලියැවෙනවා...."

හරිම මියුරු හඬින් නන්දා මාලිනිය ගයනවා. මං සමවැදිලා වගේ අහගෙන හිටියා.

බස් එක නොදැනීම මගේ ගමනාන්තයට ළඟා වෙලා. මං දිගංචියට පොඩි හිනාවක් දාලා බැස්සා. ඔහොම සතියක් විතර යන්න ඇති. දිගංචියයි මායි දැන් යාළුවෝ. හිනාවෙනවා, කතා කරනවා.

එයාගේ නම සතිශ්. මං හිතුවා හරි. එයා දෙවෙනි වසරේ.

මං හැමදාම අරලිය මල් ඇහිඳිනවා එයා බලාගෙන ඉඳලා තිබුණා. අපි මල් ගැන කතා කළා. සත්තු ගැන, රටතොට ගැන ගොඩක් මාතෘකා ගැන අදහස් හුවමාරු කරගත්තා.

ඔහොම යද්දි සතිශ් එයාට මං ගැන එයාගේ හිතේ තියෙන ආදරේ ප්‍රකාශ කළා. මං අකමැත්තක් පෙන්නුවේ නෑ. මොකද මමත් එයාට ආදරේ කරන්න පටන් අරන් තිබුන නිසා.

කැම්පස් අවුට් වෙලා අපි දෙන්නටම රජයේ රැකියා ලැබුණා. එහෙමට කියලා අපි දෙන්නගේ නොගැළපීමක් නොතිබුන නිසා අම්මලා තාත්තලාගේ ආශිර්වාදය අරන් බිනර මාසයක අපි ලස්සන වෙඩින් එකක් ගත්තා. අපිට අවුරුදු එකහමාරකින් විතර පුංචි හුරතල් මැණික් කැටයක් ලැබුනා. අපි දෙන්නා මුණ ගැහුණේ අරලිය මල් නිසා අපේ පුංචි මැණිකට "අරලියා දේදුනී" කියලා නම තිබ්බා.

කෙල්ලට සතිශ් හරිම ආදරෙයි. කෙල්ලත් දැක්ක ගමන් "වාච්චෝ.." කියලා දණගාගෙන යනවා. කෙල්ලට අවුරුදු තුනක් විතර වෙද්දි සතිශ්ට කැනඩාවට යන්න චාන්ස් එකක් හම්බෙනවා. අවුරුදු දෙකකට. එයා ගියාමත් පාළුයි. ඒත් අපේ හොඳටමනේ කියලා හිත හදාගන්න මං පුරුදු වුණා.

කාලේ ඔහොම ගෙවුණා අවුරුදු දෙකක්ම. කාලයට තටු තියෙනවා කියලා කියන්නෙත් නිකන් නෙමේනේ. අද තමා එයා ලංකාවට එන දවස. මම එයා ආසම කෑම ජාති ගොඩක් හදාගෙන බලාගෙන හිටියේ හරිම ආසාවෙන්. දවල් 2.30ට වගේ මට කෝල් එකක් ආවා. මං හිටිතැනම බිම ඉන්දුනා. මට කතා කරගන්නත් බෑ. කෝල් එකේ එහා පැත්තේ කෙනා කිව්වේ මට දරාගන්න අමාරු කතාවක්..

"දුනී, කලබල වෙන්න එපා. සතිශ් හයිවේ එකේ එන අතරමඟ ඇක්සිඩන්ට් එකකින් නැතිවුණා "

මට කිසිම දෙයක් පේන්නේ නැතුව බොඳ වුණා විතරයි මතක. සිහිය එද්දි මං දැක්කේ සතිශ් කිසිම හැලහොල්මනක් නැතිව නිදාගෙන ඉන්න විදිය. මට කඳුළු එන්නේ නෑ. මට අඬන්න බෑ.පුංචි එකාට ඕවා තේරෙන්නේ නෑ. මං හිතාගත්තා, මම අඬන්නේ නෑ කියලා.

මං 'අරලියා' වෙනුවෙන් ජීවත් වෙන්න ඕනේ. මං හයිය වෙන්න ඕනේ. ගැහැනියකට තියෙන එකම හයිය හිතේ හයිය.

මං නැගිට්ටා. සතිශ්ගේ අවසන් කටයුතු අඩුවක් නැතුව කෙරුණා.

සතිශ්ගේ අඩුව පුරවන්න, මාව සනසන්න කිසිම කෙනෙකුට බැරිවුණා. මට හිටිය එකම සැනසිල්ල 'අරලියා' විතරයි.

ශීත සමයක කුණාටුවකට අහුවෙලා වගේ මාස තුනක් ඔහේ ගෙවිලා ගියා. දරුවා තාත්තා නැතුව ටික ටික ලොකු වෙනවා. අද එයා අපිව දාලා ගිහින් හරියටම මාස තුනක්. පන්සලට හීල් දානේ පූජා කරලා අරලියාව අම්මට පොඩ්ඩක් බලාගන්න කියලා මං කෙලින්ම ගියේ සතිශ්ව බලන්න.

අපිව මුණගස්සපු අරලිය අපිව ඈත් කරකනකම් අපි ළඟ හිටියා.

මං එයාගේ සොහොන් කොත ළඟින් වාඩිවෙලා ඉකිගගහා ඇඬුවා.

මේ අවසන් වතාව අඬන.

එයාට දෙන්න තෑග්ගකුත් මං අරගෙනමයි ගියේ.

ඒ 'අරලිය මල් පොකුරක්'!..

ඉතින් එයාට මාව හැමදාටම මතකයේ තියේවි!.

**පියුමි දේවනාරායන**

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk





## ලොකු සර්....

හැමදාම නුඹ ගියා ඉර දිහා බලාගෙන
දොර ඇරලා මම දුන්නෙ බත් මුලත් ඔතාගෙන
පොඩි පැටව් අන්දලා කවාගෙන පොවාගෙන
ලහි ලහියෙ පිටවුණේ මහ දොරත් වසාගෙන

පොඩි එවුන් ඉස්කෝලෙ දොර ළඟින් දමාගෙන
මම ගියේ මීටරේ කටු අතේ තියාගෙන
හදිසියට මහ මගේ සුදු ඉරත් කපාගෙන
මම යද්දි මුල් පොතේ රතු ඉරත් වැදීගෙන

හතේ පන්තියෙ ළමයි අත් මුදුනෙ තබාගෙන
දැනුම් සවි සිහි සවිය යදියි ඇස් පියාගෙන
දෙකන්සෙන් බේරෙනා මුගුරු පිස දමාගෙන
අලුත් පාඩමක් මම හොයනවා පෙරළගෙන

ඉන්ස්පෙක්ෂන් වලට පළාතෙන් ඇවිල්ලලු
වාර සටහන් එහෙම අකුරටම බලනවලු
සාපෙළ ට ඔන්ලයින් කරපු හැටි අහනවලු
පන්ති කවයට අදත් දෙමව්පියො ඇවිල්ලලු

ගුත්තිලයෙ වෙණ වැයුම අද ඉවර කරන්නලු
ටීචර් ට ලොකු සර් ප්‍රමිති ටික ගේන්නලු
එලසපිරි දර්ශකේ ලකුණු කොල බලනවලු
පන්තියේ දරුවෙකුට කලන්තය හැදිලාලු

පන්තියෙන් පන්තියට සීනුවෙන් සීනුවට
ගිහින් පොඩිඋන් එක්ක ටයිම් ටේබල් එකට
කවි සින්දු කිය කියා උන් සිනා ගන්වන්ට
නැති දාට ලොකු සර් මට නිවාඩුව දෙන්ට

**අසන්ති කරුණානායක**

## ජීවිත පොත

කුසේ ගිනි ඉවසාන බැරි වී
ළතැවෙනා ගිනියම් පැයේ..
ගතේ ගිනි ගෙඩි පුපුරු වී
දැවෙනවා සරදම් ලෙස පැයේ..
අතේ හුන් රුපියලේ කාසිය
ගුලිවෙනා සිතදුක් ලෙසේ....
වතේ හුය පමණක් තියේවි ද
හඬවෙනා නිදි නැති

දවසින් දවස ගෙවෙනා හැම ක්ෂණයකම
අග මුල මැද නුඹේ නම හා රූපයම
වැතිරුණු නමුදු සයනය වෙත නිදි නොඑන
ඇර නෙත් යුගල දකිනෙ ද සිහිනය කෙලෙස

රුදුරුය නුඹේ මා කුල්මත් කළ වදනන්
වියරුය නුඹේ සිත තුළ උන් නෙක පැතුමන්
දරුණුය නුඹේ නෙතඟින් බැලු හැම බැල්මන්
අඳුරුය මගේ දිවි මඟ අද නුඹ ආයෙන්...

සුදු මල් ගිලිහි සොහොනක් මෙනි මා දිවිය
පෙළින් පෙළ ලියපු මගෙ පොත නිශ්චලය
ගෙත්තම් කළ වචන හැම කළු ඉරි වැනිය
ස්තුතිය කෙලෙස ලියම් ද පිටු නැතිව.....

**සඳුනි අරවින්දිනී**

## දැවැද්ද අගෙයි මද

නුඹ කලේ පෙමක්මද
සිතනවා තවද මම
දෑවැද්ද නොමැති කළ
මටත් අගයක් නැතිද

අද රජෙක් වගේ  ඔබ
ලෝකයට පෙනෙන්නට
කද බැදන් පොදි ගසන්
පෙන්වන්නෙ ලොකු කමද

මේ සියලු දෙය නොවෙයි
අවැසි මට ආදරෙයි
එය නොමැති නම් ඉතින්
කිසි පලක් මට නැතයි

හොඳින්  තේරුම් ගන්න
ආදරේ පුද දෙන්න
හැකියි සැම දේ ගන්න
එකට හැකි නම් යන්න !

**ගයාන් මලින්ත**

## තේරු කරත්තෙන් බහින්න පත්තිනි දේවී

පුවක්, කෙසෙල් ගස් ගොක්කොල සමඟ මිතුරු වී
මහ වීදිය හැඩ කරනවා නුඹටම පේවී
අතුරු පාර දෙස බලන්න මඳක් සැපත් වී
තේරු කරත්තෙන් බහින්න පත්තිනි දේවී

හරෝ හරා හඬ ටිකකට නැවතී යද්දෙන්
සිහල දමිල කැල පොඩ්ඩක් විවේක ගද්දෙන්
හඳුන් කපුරු මල් පලතුරු ඔහේ තිබුණාදෙන්
වඩින්න දෙවියනි තේ වත්තේ ලැයිම මැදින්

පසු කරගෙන ආව ගෙදර රාසයියාගේ
උන්දැගෙ දුව පාර්වතී වැඩ පැක්ටරියේ
අප්පා නැති කොළුවට ඇගෙ මන්දපෝෂණේ
නුඹ පුදන්න පලතුරු ගෙන ඇයත් පෝලිමේ

පිච්ච මල් දෙවැටෙ අයිතිය මුන්ට නෑ තවත්
ඒක බදු අරන් ජුවලරි මුදලාලි කෙනෙක්
කැකුළු හුණ්ඩුවක් කැඩුවම දෙනවා සොච්චමක්
යාරෙ දෙසීයයි කොහොමද ගන්නෙ මල් වැලක්

බෙලෙක් තහඩු හිල් අස්සෙන් වතුර වැටෙනවා
තෙත බරි පොලවේ ඉඳගෙන නුඹට යදිනවා
තේරු කරත්තෙන් වඩිද්දි මුන් පෑගෙනවා
රෝද දෙකට උඩින් කපුවො සල්ලි ගනිනවා

කටු ගහලා පුවක් ගහේ එල්ලන්නෙත් මුං
අඟුරු ගොඩේ දුව දුව ගිනි පාගන්නෙත් මුං
එලකිරි ටික ගෙනත් නුඹව නාවන්නෙත් මුං
තේරුව උඩ යද්දි නුඹට නොපෙනෙන්නෙත් මුං

අනේ මෑණියනි දැන්වත් කරුණා කරලා
පිහිට වෙන්න ගැත්තන්ගේ මේ දුක දැකලා
ප්‍රාඩෝවල යන උන් බොරු පොරොන්දු දීලා
දැන්වත් අතුගා දමන්න බලය පෙන්නලා

**රවීන්ද්‍ර දයාවංශ**

## පිච්ච මල්

බුදු පුදට යන ගමන්
මල් වට්ටියේ මැද ඉඳන්
බැලුවාලු ඔරවන්
වන පස මලක් දෙස හොරැහින්

**සංජය ප්‍රියදර්ශන**
**උඩුගම්පොල**

## කස්තුරි විවරය

*(නිමිත්ත - මා අසලටම විත් ක්ෂනයක සිතුවිල්ලකට මුලා වී සරාගික චිත්තක්ෂණයක පැටලී හිතාමතා නාහිය පෙනෙන පරිදි හිදි විවාහක මිතුරිය වෙතටයි)*

හදිසියේම හැමූ
ඒ මුදු නලමත
සලිතව
මා අසලටම විත්
දුහුල් විවර කර
මා ඇසගත්
නාසගත් කස්තුරි සුවඳ
තැවරූ මුවැත්තිය......

ඇයි අමතක කලේ
චිත්තක්ෂනයකින්
කුලුඳුලේ පැටවාත්
නුඹට හිමි වූ
නුඹටම හිතැති
ඒ පිනිමුවාත්.....

කිමද ඉඟි කලේ
නෙලන්නට තහනම් මලක්
අමතකද නුඹ සස්වාමික මලක්
සොයන්නේ මා තවමත්
මට කියා පිබිදෙන මලක්

ඉසිණු නුඹගේ
ඒ කස්තුරි විලවුන්
හිමිව ඇති පිනිමුවා
නෙත් දෑලේම පමණක් ..

ගොදුරු ලුහුබඳිමින්
සරයි වගවලසුන්
ඉතින් ඉනු සතියෙන්
නික්ම යන් මා අසලින්
වසාගෙන
කස්තුරි විවරය
සොඳින්

**වජිර කුමාරසිංහ**

# වැඩේ ගොඩදාගන්න නම් අලුතින්ම හිතමු

වෙනස්වීම කියන්නේ ලොව බලගතුම වචනයක් . මේ ලෝකය වෙනස් කරේ වෙනස් විදියට හිතපු මිනිස්සු බව අප කවුරුත් දන්නා කරුණක්. ඔබ භාවිත කරන දුරකථනය ඔබ භාවිත කරන ලද ඔරලෝසුව, ඔබ අඳින ඇඳුම පවා කිසියම් පුද්ගලයකුගේ වෙනස් ලෙස සිතීමේ ප්‍රතිඵලයක්. ගුරුවරයෙක්, ඉංජිනේරුවෙක්, මාධ්‍යවේදියෙක්, ටියුබර් කෙනෙක් ආදී විවිධාකාර අරමුණු අපේ ජීවිතවල තියෙනවා. අපි තෝරාගන්නෙ කිනම් ක්ෂේත්‍රයක් වුවද එම ක්ෂේත්‍රය තුළ ඉදිරියට යාමට නම් අප තුළ වෙනස් ලෙස සිතීමේ හැකියාව තිබිය යුතුය.

ඔබ ගුරුවරයෙක් වෙන්නට සිතනවා යැයි සරලව සිතන්න. ඔබට අනෙක් ගුරුවරුන්ට වඩා සුවිශේෂ වෙන්නට නම් අනෙක් ගුරුවරුන්ට වඩා සාර්ථක ඉගැන්වීම් රටා හඳුන්වා දෙන්නට නම් ඔබට වෙනස් ලෙස සිතීමේ හැකියාව වැදගත් වෙනු ඇත.



වෙනස් ලෙස සිතීම මගින් ඔබේ ජීවිතය වෙනස් කර ගැනීමට හැකි බවට ඔබ දැනුවත් ඇත. ඔබට ගුරුවරු දේශකවරු වෙනස් ලෙස සිතන පුද්ගලයකු වන්නට යැයි දහස් වාරයක් මන්ත්‍රයක් සේ පවසා ඇති බවට විශ්වාසය. නමුත් ඔබට එවැනි පුද්ගලයකු වීමට හැකි වූවා ද? එය ඔබ ඔබෙන්ම ප්‍රශ්න කරගත යුතුය. වෙනස් ලෙස සිතන කෙනෙක් වෙන්නට යැයි කියූ පමණින් අපට වෙනස් ලෙස සිතිය නොහැකිය . එයට දිගුකාලීන පුහුණුවීමක් අභ්‍යාසයක් අවශ්‍යය.

වෙනස් ලෙස සිතීමට නම් වෙනස් අදහස් ඔබ තුළ තිබිය යුතුය. වෙනස් අදහස්වලින් යුක්ත පුද්ගලයෙකු වීමට නම් ඔබ කියවීම ප්‍රගුණ කළ යුතු ය. ඔබට කිය වූ පමණින් වෙනස් ලෙස සිතීමට හැකිවෙන්නේ නැත. අන් අයට එතරම් කියවීමට ග්‍රහණය නොවන කෘති ඔබ කියවිය යුතු ය. ලංකාවේ පාඨකයන් බහුලව නොකියවන විවිධ ලේඛකයන්ගේ දාර්ශනිකයන්ගේ කෘති කියවීම තුළින් ඔබේ අදහස්වල ඔබේ සිතුවිලිවල නැවුම් බවක්, වෙනස් බවක් ඇතිකර ගත හැකිය. අන් අයගේ ද බහුල අවධානයට පත්වන කෘති කියවීම තුළින් පමණක් ඔබේ වෙනස්වීමේ අභිමතාර්ථය සාක්ෂාත් වීමේ සම්භාවිතාව අඩු මට්ටමක පවතී.

අප විසින් අපේ මට්ටමෙන් සිතනා විට සමාන මට්ටම්වල මිතුරන් පමණක් ඇසුරු කිරීමට වඩා අප අරමුණු කරගන්නා ක්ෂේත්‍රයේ අපට වඩා සාර්ථකත්වය කරා ළඟා වූ පුද්ගලයන් ඇසුරු කිරීම තුළින් ඔවුන් සමඟ කතා කිරීම තුළින් අපි සිතන සිතුවිලි සට්ටනයන්ට පත්වෙමින් වර්ධනය වෙමින් ඉදිරියට යනු ඇත.

අන්තර්ජාලය හරහා ඔබ අරමුණු කරගන්නා ක්ෂේත්‍රයේ නව යාවත්කාලීනවීම් සොයා බලන්න. නිරන්තරයෙන් අන්තර්ජාලයේ දී පවා නව අදහස් සමඟ ගැවසෙන්න. ඔබ සරලව මෙලෙස සිතන්න. ඔබ කැමරාකරණයේ නිරතවන පුද්ගලයෙක් නම් විවිධාකාරයේ වෙනස් ඡයාරූප, වෙනස් කැමරාකෝණ භාවිතා කළ ඡයාරූප බැලීම තුළින් එම ක්ෂේත්‍රය පිළිබඳ වෙනස් ලෙස සිතීමට ඔබට ඔබේ මනස අවදිකර ගත හැකි ය.

ඔබට පුද්ගලිකව පැන නැගෙන ප්‍රශ්නවලට සහ සමාජය තුළ පැන නැගෙන ප්‍රශ්නවලට වෙනස් නිර්මාණශීලී පිළිතුරු සැපයීම තුළින් ඔබට වෙනස් ලෙස සිතන පුද්ගලයකු බවට පත්විය හැකි ය.

වෙනස් ලෙස සිතන්නට ප්‍රගුණ කිරීමේ දී අප අප තුළ පරිකල්පන හැකියාව වර්ධනය කරගත යුතු ය. එනම් අප නව නිෂ්පාදනයක් කරන්නට පෙලඹෙනවා නම් එම නිෂ්පාදනය පිළිබද යම්කිසි චිත්‍රයක් අප සිත තුළ තිබිය යුතුය.අප එම හැකියාව වර්ධනය කර ගැනීමට නම් අප චිත්තරූප මැවීමේ හැකියාව වර්ධනය කරගත යුතු ය. මෙහි දී චිත්තරූප මැවීමේ හැකියාව ලෙස සඳහන් කරන්නේ යමක් නිශ්පාදනය කරන්නට පෙර ඒ පිළිබද කිසියම් චිත්‍රණයක් සිත තුළ මවාගැනීමේ හැකියාවයි.

ඔබට පුද්ගලිකව පැන නැගෙන ප්‍රශ්නවලට සහ සමාජය තුළ පැන නැගෙන ප්‍රශ්නවලට වෙනස් නිර්මාණශීලී පිළිතුරු සැපයීම තුළින් ඔබට වෙනස් ලෙස සිතන පුද්ගලයකු බවට පත්විය හැකි ය.

ලෝකයේ තම අරමුණුවලින් ඉහළම ස්ථානවලට ළඟා වූ කලාකරුවන්, මාධ්‍යවේදීන්, ඉංජිනේරුවරුන්, චින්තකයන්, ආදී නොයෙක් පුද්ගලයන්ගේ සාර්ථක වීමේ රහස වෙනස් ලෙස සිතීම බව අප අවබෝධ කරගත යුතු ය.

වෙනස් ලෙස සිතීම යනු සමාජය දෙස හෝ ඔබේ ක්ෂේත්‍රය දෙස වෙනස් වර්ණයකින් වෙනස් දෘෂ්ටියකින් බැලීමයි. එවිට අලුත් ආකාරයකට වෙනස් ආකාරයකට පෙනෙන්නට පටන්ගනු ඇත. අද සිටම වෙනස් ලෙස සිතීමට ආරම්භය සකසා ගන්න. මන් ද වෙනස් ලෙස සිතීම එකවර කිරීමට නොහැකි බැවිනි.

අශාන් ප්‍රමුදිත ජයසිංහ

# ඉතින් මොකටද වැලන්ටයින්



අවුරුදු 15 /16 කියන්නේ ජීවිතේ හරි අමාරු කාලයක්. ඒ දවස්වල මට මතකයි සර්ලා, මිස්ලා කියන්නේ ඔය තමයි උඹලගේ කුණාටු සමය කියලා. ඔය කාලෙට ඉතිං පංතියේ ඉන්න කෙල්ලො කොල්ලො ගැන පොඩි මෙවුවා එකක් හිතට වදිනවා. ඒ කාලෙට love එකක් කියන්නේ ඉතිං මුළු රටක් රාජ්‍යයක් ලැබුණා වගේ කවුරු මොනවා කිවුවත් හිත මුරණ්ඩුයි. බහුතරයක් කතන්දර ඉතිං අවසානෙට අහෝ දුකකි. ඉරකි. තිතකි. ඕකට කියන්නේ ආකර්ෂණය කියලා. අවුරුදු විස්ස විසිපහ වෙනකොට අපි හොයනවා ජීවිතේට හයියක්, අපේ හැඟීම් බෙදාගන්න කෙනෙක්. “ලස්සන කන්නද බං හිත තමයි හොඳ වෙන්න ඕන”. ඔය කාලෙට අපි හැමෝගෙම තියරිය ඕක තමයි. ලස්සන කියන දේ එක මොහොතකින් නැතිවෙලා යන්න පුළුවන්. එක පාරක් දෙපාරක් ආදරේ මඟහැරෙන්න පුළුවන්. ඒ වෙලාවට අපි ඔක්කොම කරන්නේ මුළු ජීවිතයම එපා කරගන්න එක. ඒ වෙලාවට හිතුනොත් මේ ලෝකේ ආදරේ කියලා දෙයක් නෑ කියලා , ඉක්මනට ගිහින් තාත්තාගේ අත්දෙක අල්ලා බලන්න. අම්මගේ යට ගියපු ඇස් දිහා බලන්න. ඒ ඇස් යට ගියේ , ඒ අත් රළු වුණේ අපිව ජීවත් කරන්න මහන්සි වෙලා. ඉතින් මේ හැමදේම ආදරේ හින්දා නේද...? එක පාරක් වැරදුනාම මේ ලෝකේම ප්‍රශ්න තියෙන්නේ මට විතරයි කියලා හිතලා අපි හැමෝම ජීවිතේ අත්හරින්න හිතුවොත් මේ මුළු ලෝකේම අමුම අමු සොහොනක්.

ගහට කොළට සතා සිවුපාවට මේ හැමෝටම මනුෂ්‍යයෙක් වගේ ආදරේ බෙදන්න පුළුවන් නම් ඔයා හොඳ ආදරවන්තයෙක්. කාටත් කලියෙන් තමන්ට ආදරේ කරන්න ඕන. මොකද තමන්ට ආදරේ නොකරන තාක් අනිත් අයට ආදරේ කරන්න ඔය කිසි කෙනෙකුට බෑ.

face book post දාගෙන ඔයා මගේ මං ඔයාගේ කියලා රඟන උන් අතරින් ඒක Practically දෙන්න පුළුවන්, මොන බාධක ආවත් ලඟින් රැඳෙන ආදරයක් හොයාගන්න. ගහට කොළට සතා සිවුපාවට මේ හැමෝටම මනුෂ්‍යයෙක් වගේ ආදරේ බෙදන්න පුළුවන් නම් ඔයා හොඳ ආදරවන්තයෙක්. කාටත් කලියෙන් තමන්ට ආදරේ කරන්න ඕන. මොකද තමන්ට ආදරේ නොකරන තාක් අනිත් අයට ආදරේ කරන්න ඔය කිසි කෙනෙකුට බෑ. ඉතිං හැමෝටම කලින් මං දෙයක් කියනවා. මේ ලෝකේ තාමත් ආදරේ කියලා දෙයක් තියනවා. මේ මොහොතෙත් මං මේ අකුරු ලියන්නේ ඇත්තටම ආදරයක් තියෙන නිසයි. වැලන්ටයින් දවසට විතරක් නෙවෙයි හැම මොහොතකම තමන් ආදරේ කරන අයට, තමන්ට ආදරේ කරන අයට මුල් තැන දෙන්න. එතකොට ආයේ අමුතුවෙන් වැලන්ටයින් කියලා දවසක් ඕනිම නෑ.

හර්ෂමාලී වීරරත්න





# සමන්ත

## පැන්සල් තුඩට දාන කැටයම්





කවී විජේසූරිය

නිර්මාණකරුවෙකුගේ සිතුම් පැතුම් රටාව, කලා රසඥතාව හා විද්‍යාත්මක තාක්ෂණික දැනුම මනාව නිරූපණය වන කලා මාධ්‍යක් ලෙස කැටයම් කලාව හැඳින්වීමට පිළිවන . ඒ අතරින් පැන්සල් තුඩක සියුම් වූ කැටයම් නිර්මාණය යනු මනා ඉවසීමකින් යුතුව කළ යුත්තකි .ඉතිං යොවුන් ජනතා මෙවර කතාබහ තමන්ගේ හැකියාව විනෝදාංශයක් කරගත් අපූරු තරුණයකු පිළිබඳවයි

ඔහු නමින් සමන්ත දසනායක. තම මව පියා සහ සොහොයුරා සමග සමන්තගේ පදිංචිය ඕපනායකයි. ඕපනායක ගල්හිර විද්‍යාලයෙන් සහ බලංගොඩ ආනන්ද මෛත්‍රී විද්‍යාලයෙන් අකුරු කළ සමන්ත මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළත් වන්නට සුදුසුකම් ලබා තිබේ

සමන්ත පවසන ආකාරයට පැන්සල් තුඩක කැටයම් පිළිබඳව ඔහු මුලින්ම දැනගෙන ඇත්තේ රූපවාහිනියෙනි. ඉන් වසර ගණනාවක් යනතෙක් එම පුදුමසහගත අත්දැකීම හිතේ තබාගෙන හුන් සමන්ත මුල්මවරට පැන්සල් තුඩෙන් නිර්මාණයක් කරනු ලැබුවේ තම මිතුරකුගේ උපන්දිනයක් වෙනුවෙන් ත්‍යාගයක් ලබාදීම වෙනුවෙනි.

එහිදී ලැබුණු අගය කිරීම් මත අන්තර්ජාලයේ විවිධ වෙබ් අඩවි වෙත නිතර නිතර ඔහුගේ තව තවත් නිර්මාණ ඉදිරිපත් කළ ද ඒවා ප්‍රතික්ෂේපවීමෙන් අනතුරුව ෆේස්බුක් හරහා නිර්මාණ ඉදිරිපත් කරන්නට යොමු විය. ඒ අනුව ෆේස්බුක් හරහා ලැබුණු ඇනවුම් මත මේ වන විටත් නිර්මාණ කටයුතුවල නියැළේ.

මේ වන විට ඉහළ ප්‍රතිචාර හිමිවන සමන්තගේ මෙම කැටයම් වෙළෙඳපොළට යොමු කිරීම සම්බන්ධයෙන් පැවසුවේ මෙවැන්නකි .

"පැන්සල් තුඩේ කරන කැටයමක් නිසා ඉතා සුළු ගැටීමකින් උනත් මේව කැඩෙන්න පුළුවන්. ඒ නිසා විනිවිද පෙනෙන වීදුරු ආවරණයක් සහිතව තමයි මේ නිර්මාණ වෙළඳපොළට යවන්නෙ. දැනට දේශීය මෙන්ම විදේශීය වෙළඳපොළ සඳහා නිර්මාණ සිදු කරනවා. දේශීයව නම් මේ නිර්මාණවලට නියම වටිනාකම කොහොමටවත් ලැබෙන්නෙ නෑ. සාමාන්‍යයෙන් නිර්මාණයක මිල රුපියල් වලින් 10 000ක් වත් වෙනව. ඒත් මම දේශීය ගැනුම්කරුවන්ට රුපියල් 700 සිට ඉහළට විවිධ මිල ගණන් යටතේ නිර්මාණ සිදු කරනවා. නිර්මාණයේ සංකීර්ණ බව අනුව මිල ගණන් වෙනස් වෙනවා. දේශීයව නම් අපේ නිර්මාණයක් අපේ කෙනෙක්ට දෙනවා කියන ආත්ම තෘප්තිය විතරයි ලැබෙන්නෙ. අඩු මිලට නිර්මාණ කරන්න ගියාම මේ නිර්මාණවල වටිනාකමට හානි වෙන බව මමත් පිළිගන්නවා. ඒත් අපි ගනුදෙනු කරන්නෙ මිනිස්සුන්ගෙ සිතුවිලි හා ආශාවන් එක්ක. මගේ ළඟට එන අය බොහොම දෙනෙක් මේ නිර්මාණ කරගන්නෙ තමන් ආදරේ කරන කෙනාට දෙන්න. එහෙම කෙනෙක්ට දහස් ගණනකින් මිලක් කියල එයාගේ ආදරය සහ වත්කම අතර ගැටුමක් ඇති කරන්නෙ කොහොම ද ඉතිං ඒ ගැටුමට හේතුවක් වෙන්න මට බෑ."

මේ දක්වා වූ කෙටි වූ ගමන තුළ මුහුණ දුන් ගැටලු හා බාධාවන් ඇති බව පවසන සමන්ත එහිදී විදේශීය වෙළෙඳපොළ සඳහා සම්බන්ධවීමේ ගැටලුව හා විදේශීය නිර්මාණ යැවීම වෙනුවෙන් වැයවෙන අධික මිල ප්‍රධාන ගැටලුවක්ව පත්ව ඇති බවත් එමෙන්ම අවශ්‍ය පැන්සල් හා කැපුම් උපකරණ ඔහු වෙසෙන ප්‍රදේශය තුළ නොමැතිවීමත් තවත් ගැටලුවක් බවත් ඔහු පවසයි..

මේ දක්වා පැමිණි ගමන තුළ උදවු උපකාර කළ විශාල පිරිසක් සිටින බවත් ඒ අතරින් පවුලේ සියලු දෙනාටමත්, සියලු ගුරුවරුන්ටත්, වචනයකින් හෝ උදවු උපකාර කළ සියලු දෙනාත් මතක් කිරීමට ඔහු අමතක කළේ නෑ. සමන්තගේ අනාගත බලාපොරොත්තුව ලෙසින් ඔහු පවසන්නේ තම හිතවතුන්ට උදවු උපකාර කරමින් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමයි.



අවසාන වශයෙන් අනාගතයේදී කලා නිර්මාණ වෙත යොමුවීමට අදහස් කරමින් සිටිනා තරුණ තරුණියන්ට ඔහු පැවසුවේ මෙවැන්නකි.

"කාල්මාක්ස් කියලා තියෙනවා, ලේඛකයා ජීවත් වීම සඳහාත්, ලිවීමේ හැකියාව වැඩි දියුණු කරගැනීම සඳහාත් අනිවාර්යෙන්ම වැටුපක් ලබාගත යුතුයි.. නමුත් ඔහු ජීවත් වීම සඳහාවත් අන් කිසිදු අරමුණක් උදෙසාවත් ලිවීම නොකළ යුතුයි." කියලා. ලේඛකයා ගැන කිවුවට හැම කලාකරුවෙක්ටම ඒ දේ පොදුයි. ඉතිං යහපත් චේතනාවෙන් අපි හැමෝම කටයුතු කරනවා නම් එයයි සාර්ථකත්වය."






# ජීවිතේ ජයගන්න ඉලක්කයටම යමු

ජීවිතය ජයගැනීමට නම් කළයුතු වන්නේ යහ සංකල්පයන් වපුරා ඒවා ඉටු කරගැනීමේ බලාපොරොත්තු අස්වනු ලෙස නෙළා ගැනීම තුරුණු වියේදිම ආරම්භ කිරීමය. ඒ බණ්ඩි වැදෙන කිරි ගොයම සේ සාර්ථකත්වයේ අස්වනු තුරුණු වියේදි ඇට මස් ලේ නහර තුළට කිරි වදින්නට සුදුසුම වයස තරුණ කාලය නිසාය. මේ අයුරින් සංවර්ධනය වන පුද්ගල චරිත වෙනස් වන සමාජ ක්‍රියාවලිය තුළ සිය සිතිවිලි මතින් ගොඩ නැගෙන ක්‍රියාදාමයන් මනාව හා බුද්ධිමත් ලෙස හසුරුවා ගැනීමට එය මහත් සේ උපකාරී කර ගනී. සමාජය වෙනස් වීමේ ක්‍රියාවලිය වටහා ගැනීම සමාජ ක්‍රමය භෞතික ක්‍රියාවලියක් තුළ විසඳා ගැනීමට උනන්දු වීමේ කුසලතාව ලැබීම මේ නිසා ඇතිවේ.

තරුණ ජීවිත උඩු යටි කරනු ලබන සමාජ ප්‍රශ්නවල ස්වභාවය කෙසේද?

මානව සම්බන්ධතා කෙරෙහි අහිතකර ලෙස බලපාන සමාජයේ භෞතික හෝ අභෞතික ක්‍රියාවලිය මත පැන නැගී ඇති සිද්ධි වාචකයක් සමාජ ගැටලුවක මූලාරම්භය ලෙස හැඳින්විය හැකිය. සමාජ පර්යාය බිඳවැටීම සමාජ ප්‍රශ්නවලට හේතුවකි. එසේම සමාජ පර්යායේ බිඳවැටීම සිදුවන්නේ සමාජ හැසිරීමේ බිඳවැටීම නිසාය.

මේ අනුව පෙනී යන්නේ සමාජය තුළට පිවිසෙන පිරිස් ක්‍රියා කරන ආකාරය අනුව සමාජය දෝලනය වන බවය. සමාජය තුළට පිවිසෙන්නා තුල ඇති අභ්‍යන්තර විනය හා බැඳී ආකල්ප කෙනෙකුගේ සාර්ථකත්වය හා දියුණුව සදහා හේතුවන බව රිචර්ඩ් බ්‍රැන්සන් ප්‍රකාශ කර ඇත්තේ ඒ නිසාය.

අධ්‍යාපනයේ පිබිදීම අවධාරණය කරනු ලබන්නේ දැනුම කුසලතා මුල් කොට ගැනීමෙනි. වර්තමානයේදී දක්නට ඇත්තේ ආකල්ප පෙරට පැමිණ ඇති බවකි.

දැනුම කුසලතා වේගයෙන් ලබා ගත හැකි වුවද ආකල්ප ලබා ගැනීමට කිසියම් කාලයක් අවශ්‍යය. ඒ සමගම ඉහත කී අභ්‍යන්තර විනයද අත්‍යවශ්‍යය. මේ සදහා හොඳම මග වන්නේ තරුණ තරුණියන් තම තමනට අභියෝග කරගැනීමයි. එසේම තරුණ ජීවිතයක වැදගත්ම සංකල්පය විය යුත්තේ ඉලක්කයයි. කිසියම් යහ අරමුණක් වෙත යාමේ ඉලක්කය නොහොත් එල්ලය තරුණ ජීවිතයක සමාජමය ප්‍රගතිය යහපත් කරවන ප්‍රධාන සාධකයකි. එබැවින් ඉලක්ක වෙත ගමන් කිරීමේදී හමුවන අභියෝග හමුවේ නොසැලී ඒවා ජයගැනීම ඉහත කී කරුණ කෙරෙහි සෘජුව බලපානු ලබයි.

බොහෝ සමාජ ප්‍රශ්න කෙරෙහි නූගත්කම විරැකියාව හා දිළිඳු බව බලපාන බැවින් ඒවා අභියෝග ලෙස ගෙන ජය ගැනීම කෙරෙහි හුරු වීම යහපත් සමාජ ධූරාවලියක ආරම්භයයි.

කපිල කුලසිංහ
කළුතර බෝම්බුවල මහ විද්‍යාලය

2021 පෙබරවාරි 13 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.